ප්‍රජාතන්ත්‍රවාදය අනුව යම් යම් ආණ්ඩු වෙනස් වන විට එහි සේවකයන් වෙනස් කිරීම සම්පූර්ණයෙන්ම වැරදියි. එසේ කරනවා නම් කරුණා කර ඒ සඳහා සම්ප්‍රදායයක් ඇති කළ යුතුයි. එසේ කළ විට අප ආ කලෙක අපටත් පුළුවනි, ඒ අනුව ක්‍රියා කරන්නට. තමුන්නාන්සේලා නම් හිතනවා ඇත්තේ අප කවදාවත් බලයට එන එකක් නැත කියායි. කවදා හෝ අප එනවායයි සිතමු. අප බලයට ආවේ නැතත් සමහරවිට ඇමති මණ්ඩලයේ වෙනස්වීමක් කොට—කුමන්ත්‍රණයක් කිරීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් හෝ—වෙන ආණ්ඩුවක් බලයට ආවාය කියා සිතමු. එම අවස්ථාවේදී කුමන අන්දමකට ක්‍රියා කරනවාද කියා දැනගෙන සිටින්නට ඕනෑ. ඇමෙරිකානු ආණ්ඩු ක්‍රමයේ හැටියට ආණ්ඩුවක් වෙනස් වී අලුතෙන් ආණ්ඩුවක් ආවාම රාජ්‍ය සේවකයින්ගේ වෙනස්වීමක් වුණත් එම ආණ්ඩුවට කරන්න පුළුවන්. එංගලන්තයෙ ක්‍රමය ඊට වඩා වෙනස්. අප රටෙත් දැන් අනුගමනය කරගෙන යන ක්‍රමය අප දැනගන්න ඕනෑ. ආණ්ඩුවක් ඉවත් වී අලුතෙන් ආණ්ඩුවක් ආවාම කලින් ආණ්ඩු කාලයේදී සේවයට බඳවා ගත් අය ඉවත් කරන ස්වරූපයක් දැන් තිබෙනවා. විශේෂයෙන්ම මෙය බලපා ඇත්තේ සංස්ථාවලටයි. ලොතරැයි මණ්ඩලයේ සේවයේ යෙදී සිටි සේවකයින් බොහෝ දෙනකුගේ සේවය අත්හිටුවා තිබෙනවා. එසේ වුණත්, නතර කළ සේවකයින් වෙනුවෙන් අලුතෙන් සේවකයින් බඳවා ගෙන තිබෙනවා. සමහර විට, ආණ්ඩුවේ සේවකයින් මහාරාජිනියට වුවමනා කරන කාලය තුළදී පමණයි සේවය කරන්න පුළුවන් කියන කියමන මේ උදවියත් කියන්න පුළුවනි. ඒ හැරෙන්න, මෙසේ ඉවත් කරන සේවකයින් සේවයට නුසුදුසුයි, එහෙම නැතිනම් සේවක සංඛ්‍යාව වැඩියි ආදි දේවල් කියන්න පුළුවනි. හොඳයි, සේවකයින් වැඩියි කියනවා නම් ඒ වෙනුවට අලුතෙන් බඳවා ගන්නෙ ඇයි? කුමන පදනමක් උඩද මෙසේ අස් කරන්නෙ? තමුන්නාන්සෙ දන්නවාත් ඇති, මෙසේ සේවයෙන් ඉවත් කරන ලද සේවකයෙක් නඩු පවරා අයිතිවාසිකම් දිනාගෙන තිබෙන බව.

එයින් පෙනෙන්නෙ රැකී රක්ෂා ප්‍රශ්නය සම්බන්ධයෙන් නරක ආදර්ශයක් ආණ්ඩුවෙන්ම දෙන බවයි. යම්කිසි විධියකින් පෞද්ගලික ආයතනයක ඔවැනි දෙයක් කළා නම්, සේවකයින් සේවයෙන් අත්සිටුවා ඒ වෙනුවට වෙනත් සේවකයින් බඳවා ගත්තා නම් එය විශාල අපරාධයක් ලෙසටයි කම්කරු උසාවිය ගණන් ගන්නෙ. එපමණක් නොවෙයි, මෙය විශාල වරදක් ලෙසින් සලකා ජාත්‍යන්තර කම්කරු සම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේලනවල පවා, ආණ්ඩුවට දොස් නගන බව මතක කර දෙන්න කැමතියි. එහෙම නම් දැන් ආණ්ඩුවම ගෙන යන වැඩ පිළිවෙළ කුමක්ද? මොනවා හරි කාරණයක් ඉදිරිපත් කර සංසථාවල සේවයේ යෙදී සිටින අය නතර කරනවා. නුසුදුසුකම් උඩ, සංඛ්‍යාව වැඩියි කියන ප්‍රශ්නය උඩ සේවක යින් නතර කළත්—මේවා ඔප්පු කරන්න බැහැ—ඉන් පසුව ඒ වෙනුවට වෙනත් පිරිස් බඳවා ගත් අවසථා තිබෙනවා. අපේ ආණ්ඩුව තිබුණු කාලයේදී නුසුදුසුයි කියන පිරිසක් බඳවා ගෙන සිටිනවා නම්, සාධාරණ පරීක්ෂණයක් කර සුදුසු අය පත් කර නුසුදුසු අය ඉවත් කළාට අපේ විරුද්ධත්වයක් නැහැ. අප කියන්නෙ මේ ප්‍රශ්නයේදී මොනවා හරි සම්ප්‍රදායයක් අනුගමනය කරන්න ඕනෑ බවයි.

ලොතරැයි මණ්ඩලය ගැන සඳහන් කරන විට ඒ කාලයේදී, ආරෝග්‍ය ශාලා ලොතරැයිය ආදී ලොතරැයි කීපයක්ම තිබුණු බව තමුන්නාන්සේට මතක ඇති. යම්කිසි ජාතික, පොදු වැඩකට යම් ආයතනයකට මුදලක් වුවමනා කළා නම්, ලොතරැයියක් පවත්වා ගැනීමට ඉඩ දීම ඒ කාලයේදී සිරිතක් වශයෙන් පැවතුණා. ඒ කාලයේදී, මා මුදල් ඇමතිවරයා වශයෙන් කටයුතු කරන විට, ලොතරැයි කීපයක් පවත්වනවා වෙනුවට එක් ලොතරැයියක් පැවැත්වීමට කටයුතු යෙදුවා. අද එසේ සකස් කළ ජාතික ලොතරැයියෙන් විශාල ප්‍රයෝජනයක් සැලසී ඇති බව තමුන්නාන්සේ දන්නවා ඇති.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා දැන ගන්න කැමතියි, ලොතරැයි ඇදීම සඳහා පිටරටින් කාර් ගෙන්වීමට වුවමනා කරන්නෙ මන්ද කියා. විදේශ විනිමය බොහොම අමාරු නම් කාර් පිටරටින් ගෙන්වන්නෙ නැතුව ගෙයක් හෝ ඉඩමක් අත්පත් කර දීම සඳහා, වත්තක් අත්පත් කර දීම සඳහා, වෙළඳ ව්‍යාපාරයක කොටස් අත්පත් කර දීම සඳහා, එහෙමත් නැති නම් තමන් කැමති ශිෂ්‍යත්ව ලබාදීම සඳහා ලොතරැයි පවත්වනවා නම් එයින් විශාල ප්‍රයෝජනයක් සැලසෙනවා නොවේද? ඒ වාගේම විදේශ විනිමය සඳහා මුදල් වැය වෙන්නේත් නැහැ. ඒ හැර විදේශ විනිමය වැය කර ගෙන්වන්නෙ, තෑගි දෙන්නෙ, අපේ ආණ්ඩු කාලයේදී ඇමතිවරුන්ට ඇකැප යයි කී බෙන්ස් කාර් නොවේද? සමහර විට මේ විධියට සාමාන්‍ය මිනිසාටත් බෙන්ස් කාර් තෑගි දෙන්නෙ, අනික් අයත් යන නිසා ඇමතිවරුන් බෙන්ස් කාර්වල ගියාම දෙස් කියන්නෙ නැතැයි යන හැඟීම නිසා වෙන්න පුළුවනි. මේවා ආරම්භ වුණේ කොහොමද? පටන් ගත් හැටි කියන්න ගියොත් ලජ්ජා ඇති කෙනෙකුට නම් ඔළුව උස්සාගෙන අසාගෙන සිටින්න බැහැ.

පූ. භා. 11.15

පළමුවෙන්ම, සතොස කොමිසම පැවැත්වීම ආරම්භ කළා, මා ඇමතිවරයා වශයෙන් සිටියදී පාවිච්චි කළ බංගලාවෙ. ආණ්ඩුවේ බංගලා ඇමතිවරුන් පාවිච්චි කිරීම හොඳ නැහැ; ඒවා තහනම්; ඒවා ඇකැප, පාරාජිකා වැඩ කියා කීවා. මේවා කිසි කෙනෙකුට නොදී වහන්න ඕනෑ බවත් කීවා. එම නිසා පුද්ගලයන්ට බංගලා නොදී කොමිසම පැවැත්වූවා. අනික් වැදගත් කාරණය, ලොකුම දූෂණ කළාය කියන සතොස භාරව සිටි ඇමතිවරයා හිරේ යවන්න ඕනෑය, එම නිසා කොමිසම පැවැත්වීම ඒ බංගලාවේම කරන්න ඕනෑය කියා, පළමුවෙන්ම මා පාවිච්චි කළ බෙන්ස් රථය ලොතරැයි ඇදීම පිණිස තෝරා ගැනීමයි. විලිලජ්ජා ඇති ආණ්ඩුවක් නම්, ලජ්ජාව කඳුලක්වත් තිබෙනවා නම් එදා ඒ විධියට කථා කර අද මේ විධියට වැඩ කරනවාද? අද මොකද කියන්නෙ? මා ඇමතිවරයා වශයෙන් එදා සිටියෙ "සී" ග්‍රේඩ් බංගලාවක. අද මුදල් ඇමතිවරයා සිටින්නෙ 'ඒ' ග්‍රේඩ් ආණ්ඩුවේ බංගලාවක. එපමණක් නොවෙයි, ප්‍රවාහන ඇමතිතුමා, ආහාර ඇමතිතුමා, සමාජ සේවා ඇමතිතුමා ඔය ආදී ඇමතිවරුන් ඉන්නෙත් ආණ්ඩුවේ බංගලාවල නොවෙයිද? එපමණකුත් නොවෙයි, අප බලයේ සිටින කාලයේදීවත් නොකළ අන්දමට, අගමැතිතුමාගෙ පෞද්ගලික ලේකම්ට පවා ආණ්ඩුවේ බංගලාවක් දී තිබෙනවා. අපේ කාලයේ රජයේ බංගලාවල හිටියේ කවුරුන්දැයි මම පැහැදිලි කරන්නම්. ඩන්කන් ද අල්විස් මහත්මයා දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ පෞද්ගලික ලේකම් වශයෙන් කටයුතු කළ කාලයේදී රජයේ බංගලාවක් පාවිච්චි කළා. එහෙත් ඒ මහත්මයා

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
රජයේ සේවකයකු වශයෙන් අවුරුදු 5ක් ම "ප්‍රයොරිටි ලිස්ට්" එකේ හිටියා. රජයේ සේවකයකු වශයෙන් සුදුස්සකු හැටියට ඩන්කන් ද අල්විස් මහත්මයාගේ නම අවුරුදු 5 ක් ම "ප්‍රයොරිටි ලිස්ට්" එකට ඇතුළත් වී තිබුණත්, ඔහුට බංගලාවක් ලැබුණේ දිවංගත බණ්ඩාරනායක අගමැති තුමාගේ පෞද්ගලික ලේකම් වශයෙන් පත් වුණාට පසුවයි. එහෙත් තමුන්නාන් සේලාගේ ජෝ. කරුණාරත්න මහත්මයා කොහෙන් ආ කෙනෙක් ද? ඔහු රජයේ සේවයට ගැව්ලාවත් නැති කෙනෙක්. රජයේ සේවයට ගැව්ලාවත් නැති, අහ සින් වගේ වැටුණු එවැනි පුද්ගලයකුට තමුන්නාන්සේලා රජයේ බංගලාවක් දුන්නා.

ගරු අගමැතිතුමා සමග විවාද කරන්න බොහොම අමාරුයි. තමුන්නාන්සේලා නම් තර්කයට තර්කයක් ඉදිරිපත් කරන නිසා විවාද කරන්නට පුළුවන්. එහෙත් අගමැතිතුමාට නම් බොහොම කේන්ති යනවා. හයියෙන් කෑකෝ ගසා සමහර විට එතුමා අපට වචනයක්වත් කථා කරන්ට ඉඩ දෙන්නේ නැහැ. අපේ විවේචන නියම විධියට කවදාවත් තමුන්නාන්සේලාගේ පත්තරවල—විශේෂයෙන් ලේක් හවු සියේ "ඩේලි නිව්ස්", "ඔබ්සර්වර්" ආදී පත්තරවල—පළ වන්නේ නැහැ. නියම තත්ත්වය වහන්නට තමුන්නාන්සේලා ගේ පත්තර කොයි තරම් උත්සාහ කළත්, මහජනයා ඇත්ත තත්ත්වය දන්නවා. "මෙන්න මේ ආකාරයට, නරක විධියට, මේ ආණ්ඩුව ගෙන යනවායි" අප මහජන යාට ගිහින් කියනවා.

ජෝ කරුණාරත්න මහත්මයා පිටස් තර කෙනෙක්. තමුන්නාන්සේලා එවැනි නැනැත්තකුටත් රජයේ බංගලාවක් දුන්නා. ඉතින් කොහොමද ජෝ කරුණා රත්න මහත්මයාත්, ඩන්කන් ද අල්විස් මහත්මයාත් එකට සංසන්දනය කරන් නේ? යම්කිසි විධියකින් අප බලයට ආවාම—විදේශ විනිමය නැති නිසාත්, හිතු විධියට විදේශ ආධාර ලැබෙන්නේ නැති නිසාත්, ලෝක බැංකුව පවා තමුන් නාන්සේලාට අවහිරකම් කරන නිසාත්, "මේක දමල ගහල යන්නට ඕනෑ" කියා ඩඩ්ලි සේනානායක මහත්මයාට හිතු ණොත්, ඒ අනුව ගියොත්—ජෝ. කරුණා රත්න මහතා බංගලාවෙන් පිට යවන්නේ කොහොමද? රජයත් සමග ඔහුගේ කිසිම බැඳීමක් නැහැ. සමහර විට නඩු කියා එයාට බංගලාවේ ඉන්නටත් පුළුවනි. ඒ නිසා තමුන්නාන්සේලා මොනවා හෝ කියන විට, තර්කයක් අනුව මහජනයාටත් ඇහෙන්නට කියන හැටියට මා ඉතා කරු ණාවෙන් ඉල්ලා සිටිනවා.

බුකි නීතිගත කරන්නට තමුන්නාන් සේලාට විශාල බලපෑමක් තිබෙනවා. බුකි නීතිගත කළ යුතුයැයි කියන උදවිය—නියෝජ්‍ය සභාපතිතුමාට ඇණුම්පදයක් කියනවා නොවෙයි—ඒ ඒ අයට යම්කිසි මුදලක් දමා, තමන්ගේ පිනේ හැටියට හෝ වෙන විධියකට හෝ මුදලක් හම්බ කර ගන්නට අවස්ථාව දීම යුක්තිසහගත යැයි කියනවා. මේ අවස්ථාවේදී විශේෂ යෙන් බුකිවල සේවකයන් සම්බන්ධ යෙන් අප සලකා බැලිය යුතුව තිබෙනවා. බුකි සංහාරය ගැන නම් අප සන්තෝෂ වෙනවා. එහෙත් බුකි සංහාරය නිසා රැකී රක්ෂා අහිමි වන සේවකයන්ට වන්දියක් වශයෙන්, අඩු ගණනේ මාස හයකවත් පඩිය ඒ බුකි අයිතිකරුවන්ගෙන් ලබා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

බුකි නීතිගත කරන්නේ නැත්නම් මා තමුන්නාන්සේලාට එක යෝජනාවක් ඉදිරිපත් කරන්නට කැමතියි. සතිපතා නොව පුළුවන් නම් දිනපතාම ජාතික ලොතරැයියක් පවත්වන්න. එවිට බුකි සංහාරය නිසා රැකීරක්ෂා අහිමි වන අයට ඒ ලොතරැයි මඟින් රැකීරක්ෂා සපයන්නට පුළුවන්කම ලැබෙනවා. බුකී සම්බන්ධයෙන් මීට වඩා කථා කරන්නට මා අදහස් කරන්නේ නැහැ. අපේ අදහස් වලට වඩා ත්‍රෛනිකායික සඟ පෙරමුණේ අදහස් සලකා බලන්නට තමුන්නාන්සේ ලාට සිදු වෙනවා ඇති.

ජීවන අංකය ගැන විග්‍රහයක් කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් අප නිතරම කියනවා, මේ ජීවන අංකය සකස් කරන විධිය සම්පූර්ණයෙන් ම වැරදි බව. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඒ සම්බන්ධ යෙන් අදහස් පළ කර තිබෙනවා. මට ඊයේ කම්කරුවෙක් හමු වුණා. ඔහුගේ පවුලට සතියකට හාල් සේරු 22ක් ගන්නට ඕනෑ බව ඔහු මා සමග කීවා. බණ්ඩාරනායක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැතිණියගේ කාලයේ ඒ හාල් සේරු 22ම සඳහා වියදම් වුණේ රුපියල් 5.50ක් නමුත්, දැන් ඒ සඳහා රුපියල් 11ක් යන බව ඒ කම්කරුවා මා සමග කීවා. පොතකට සේරුව බැගින නොමිලයේ ලැබුණත්—හාල් සෙරු 11ක් නොමිලයේ ලැබුණත්—පවුලට වුවමනා හාල් සෙරු 22 සඳහා දැන් රුපියල් 11ක් ගෙවන්නට සිදු වී තිබෙනවා. ඉස්සරට වඩා රුපියල් 5.50ක් ඒ සඳහා ගෙවන්නට ඒ කම්කරුවාට සිදුවී තිබෙනවා. ඒ අනුව බලන විට, පොතකට හාල් සේරුව බැගින් නොමිලයේ ලැබුණත්, පවුලට වුවමනා කරන හාල් සඳහා යන වියදම සියයට සියයකින් වැඩි වී තිබෙනවා.

1965 අවුරුද්දේ ජීවන අංකය 112යි. එය දැනට වැඩි වී තිබෙන්නේ සියයට 2.6කින් පමණයි. දැන් ජීවන අංකය 114.6යි. හාල් සඳහා පමණක් සියයට සියයක් වැඩිපුර ගෙවන්නට සිදු වී තිබෙනවා නම් ජීවන අංකය මීට වඩා වැඩි විය යුතු නේද? සාමාන්‍ය පවුලකට හාල් සඳහා පමණක් සියයට සියයක් වැඩිපුර ගෙවන්නට සිදු වී තිබෙද්දී ජීවන අංකය කොයි තරම් වැඩි විය යුතුද කියන එක අප කී හැටියේම සාමාන්‍ය මහජනතාව පිළිගන්නවා. ඉලක්කම් හංගා කරුණු ප්‍රකාශ කිරීමෙන් නම් සැනසීමක් ලබන්නට බැහැ. ඉස්සර හාල් සේරු 22ක් රුපියල් 5.50ක් වුවත් දැන් හාල් සේරු 11ක් නොමිලයේ ලැබෙද්දීත් ඉතිරි හාල් සේරු 11 ගන්නට රුපියල් 11ක් වියදම් වෙනවා. එතකොට හාල් සඳහා යන වියදම සියයට සියයකින් වැඩි වෙලා. එහෙත් ජීවන වියදම් අංකය සාදන්නේ හාල් ගැන නොසලකායි. හාල් නොමිලයේ දෙන හෙයින් හාල් ගැන නොසලකා ජීවන වියදම් අංකය හදනවා. එසේ වුවද ඇත්ත නම් හාල් සඳහා කලින් වියදම් කළ මුදල මෙන් දෙගුණයක් දැන් වියදම් කරන්නට සිදු වී තිබීමයි. හාල් සම්බන්ධයෙන් පමණක් නොව, කොත්තමල්ලි, පරිප්පු ආදිය සම්බන්ධයෙන්ද අවංකව ඉලක්කම් සාදන්න. එදා අපට කොතරම් චෝදනා කළත් අප අඩුවෙන් ගණන් බලා ඉලක්කම් පිළියෙල කළේ නැහැ.

එදා ජීවන වියදම වැඩි වූ විට ආණ්ඩුවේ සේවකයන් සියලු දෙනාටම රුපියල් 17.50 බැගින් විශේෂ දීමනාවක් දුන්නා. ආණ්ඩුවේ සේවකයන්ට එම මුදල කෙළින්ම දුන් අතර, අනෙක් අංශවල සේවකයන්ටද එම මුදල දෙන ලෙස කම්කරු ඇමතිවරයා වශයෙන් එදා මා අනෙක් සියලුම අංශවලට ආයාචනා කළා. නොදුන් අයට දඬුවම් කළා. එහෙත් මේ ආණ්ඩුව මෙදා ක්‍රියා කෙළේ ආණ්ඩුවේ සෙවකයනට පමණක් රුපියල් 20 බැගින් හා 10 බැගින් දීමටයි. මේ මුදල ප්‍රමාණවත් නැහැ. මේ මුදලින් සෑහීමකට නොපත් ආණ්ඩුවේ සේවකයන් කරන උද්ඝෝෂණය මැඩ පැවැත්වීම සඳහා තුවක්කු පෙන්වා තිබෙනවා. කෙසේ වෙතත් ආණ්ඩුවේ සේවකයන්ට දෙන මුදල අනෙක් සියලුම සෙවකයනටද ලබා දීම සඳහා කටයුතු සලස්වන්නැයි මා ඉල්ලා සිටිනවා. ඒ දීමනාව හැම දෙනාටම දිය යුතුයි. විශේෂයෙන්ම සංස්ථාවල සිටින සේවකයන්ට මෙම දීමනාව ලබා දීම සඳහා ගරු මුදල් ඇමතිතුමාට ක්‍රියා කරන්නට බලයක් තිබෙනවා.

මේ ආණ්ඩුව පෞද්ගලික අංශය ගැන ලොකු සැලකිල්ලක් දක්වනවා. මුලින්ම පෞද්ගලික අංශයේ උදවියට ලක්ෂ 514ක අයබදු සහනයක් දුන්නා. ඒ වගේම නොයෙකුත් විධියට පෞද්ගලික අංශයට ධෛර්‍ය දෙනවා. ඒ අතර පෞද්ගලික අංශයේ සිටින සේවකයන්ටද කිසියම් සහනයක් සලසා දීමට තමුන්නාන්සේ ක්‍රියා කරනවා ඇතැයි මා කල්පනා කරනවා.

ආදායම් නිලධාරීන්ගේ සේවය ගැනත් වචනයක් කියන්නට කැමතියි. උතුරු, නැගෙනහිර, උඩරට ආදී වශයෙන් ආදායම් නිලධාරීන්ගේ සේවය ප්‍රාදේශීය සේවයක් හැටියට පටන් ගත් බව තමුන්නාන්සේ දන්නවා ඇති. එහෙත් දැන් ඒ ප්‍රතිපත්තිය හුඟක් දුරට කැඩී බිඳී ගොස් තිබෙනවා. මා නම් කොටස් වශයෙන් දේශපාලනය කරන්නට අදහස් කරන්නේ නැහැ. එහෙත් යම්කිසි කණ්ඩායමකට අඩුවෙන් අවස්ථා ලැබී තිබෙනවා නම් ඒ අඩුවෙන් අවස්ථා ලැබී තිබෙන අයටත් වැඩියෙන් අවස්ථා ලැබී තිබෙන අයටත් සමාන විධියට සංග්‍රහ කිරීම යුතු නැහැ. දැන් සියලු දෙනාම පරිපාලන සේවයට ඇතුළු වෙලා. මේ ප්‍රශ්නය පැන නගිද්දී අප නොයෙක් විධියට සාකච්ඡා කරගෙන ගියා. අපේ ආණ්ඩුව බිඳ වැටුණේ අන්න ඒ අවස්ථාවේදීයි. මම ගරු මුදල් ඇමතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කරන්නම්. ප්‍රාදේශීය ආදායම් නිලධාරී සේවයට ප්‍රාදේශීය වශයෙන් ඇතුළු කර ගන්නා උදවිය අවුරුදු පහක

3——එච 6371 (67/8)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
සේවයෙන් පසුව පරිපාලන සේවයට ඇතුළු කර ගන්න. ඒ අතර කලින් මෙන් ආදායම් නිලධාරීන් ප්‍රාදේශීය වශයෙන් එම සේවයට ඇතුළු කර ගන්න.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
පරිපාලන සේවය පටන් ගන්න කොට ඒ නිලධාරීන්ගේ සේවයත් තිබුණා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
පරිපාලන සේවය පටන් ගන්නා විට ආදායම් නිලධාරීන්ගේ සේවය තිබුණේ පිටස්තර වශයෙනුයි. මෙම ප්‍රශ්නය විස දන්නේ කෙසේදැයි අප සාකච්ඡා කර ගෙන යමින් සිටි අවසථාවේදීයි, පසුගිය ආණ්ඩුව බිඳ වැටුණේ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
පරිපාලන සේවය හැදුවේ ඒ රජයයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ඒක ඇත්තයි. ඒ අතර ආදායම් නිලධාරීන්ට සහන දිය යුත්තේ කෙසේදැයි අප සාකච්ඡා කර ගෙන ගියා. ඒ ගැන තීරණයකට බැස්සේ නැහැ. තුන් දෙනකු ගෙන් යුත් ඇමති අනුකාරක සභාවක් ඒ ගැන සාකච්ඡා කළා. තීරණයක් ගත්තේ නැහැ. එදා තීරණයක් ගෙන තිබුණත් එය වෙනස් කරන්නට මේ ආණ්ඩුවට බලයක් තිබෙනවා. එසේ හෙයින් මේ ගැන කල්පනා කර බලා කලින් මෙන්ම ප්‍රාදේශීය වශයෙන් ආදායම් නිලධාරීන් තෝරා ගන්න. අවුරුදු පහක සේවයෙන් පසුව ඔවුන් පරිපාලන සේවයට ඇතුළු කර ගන්න. එසේ නැත්නම් ව්‍යාකූල තත්ත්වයක් ඇති වන්නට පුළුවනි. යහපතක් වන අන්දමට වෙනසක් සිදු වෙතොත් අප විරුද්ධ වන්නේ නැහැ. හැම එකක්ම සමාජවාදී පියවරවල් අනුව යමින් වෙනස් කරනවා නම් අපේ විරුද්ධත්වයක් ඇති වන්නේ නැහැ. එසේ නැත්නම් මේවා බස්නායක කම්වලට බල පානවා; දියවඩන නිලමකම් වලට බල පානවා. නොයෙක් පත්වීම්වලට බල පානවා. මට්ටම් කරනවා නම් හැම එකම මට්ටම් කරන්නට ඕනෑ. එකම තැන පමණක්, මිටි තැන පමණක් තවත් මට්ටම් කරන්නට ගියාම අමාරුවට පත් වෙනවා. එම නිසා මේ කාරණය ගැනත් කල්පනා කර බලන මෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, රේගු දෙපාර්තමේන්තුව ගැන දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාත් (බර්නාඩ් සොයිසා මයා.) කියන්නට යෙදුණා. රේගු දෙපාර්තමේන්තුවට හොරෙන් කරන ජාවාරම් පිළිබඳව අද රටේ ඉතාම නරක ආරංචි තිබෙනවා. විශේෂයෙන්ම ලොකු තැන් සම්බන්ධ වී මේවා කෙරෙන වාය කියා නොයෙකුත් දූෂමාන ආරංචි පැතිර ගොස් තිබෙනවා. එම නිසා ආණ්ඩුව ස්ථිර පියවරක් නොගත්තොත්, මහ ජනතාවගේ සැක දුරු වන අන්දමට ක්‍රියා නොකළොත්, මේ දූෂමාන ආරංචි තව තවත් පැතිර යනවා. විශේෂයෙන්ම රේගුවට හොරෙන් කළ මැණික් ජාවාරම් දෙකක් පිළිබඳව නරක ආරංචි පැතිර ගොස් තිබෙනවා. පූජක වෙස් ගත් පුද්ගලයකු මේ රටට ඇවිත් විශාල මුදලක් වටිනා මැණික් තොගයක් අරගෙන ගියාය කියා එක් කථාවක් තිබෙනවා. තවත් කථාවක් සම්බන්ධව රජයේ වැඩ පිළිබඳ ඇමතිතුමා නඩුවක් දමන්නට යනවාය කියනවා.

ඒවාගේම ඉන්දියාවට යන ගමන් බිමන් දැන් "සාරි සවාරි" කියා ප්‍රසිද්ධයි. මා සිතන්නෙ සෙනසුරාදා දිනවලයි ගගන යාත්‍රාවලින් ඉන්දියාවට යන්නෙ. ඒ ගමන් බිමන් දැන් අඩු කර තිබෙනවාද කියා මා දන්නේ නැහැ. දැන් ඒ කථා නම් ටිකක් අඩුව තිබෙනවා. කොයි තරම් ලොකු උදවිය මේවාට සම්බන්ධ වුණත් මේවා ගැන සොයා බලා කටයුතු කරන්නට ගරු මුදල් ඇමතිතුමාට බලය තිබෙනවා. මුදල් ඇමති වශයෙන් මමත් ටික කාලයක් රාජකාරි කළා. ඇත්ත වශයෙන්ම ආර්ථික ප්‍රශ්න සම්බන්ධව අගමැතිතුමාටත් වැඩි බලයක් තමුන්නාන්සේට තිබෙනවා. අගමැතිතුමා කියන කියන දේ තමුන්නාන්සේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නට ඕනෑ බව ඇත්තයි. එහෙත් බලයේ සිටීමත් බලය ආරක්ෂා කර ගැනීමත් තමුන්නාන්සේට භාරයි. කොයි තරම් ලොකු උදවිය සම්බන්ධ වුණත් ඇඟිල්ල අමෝරා කිව්වොත් තමයි මේව නතර කරන්නට පුළුවන් වෙන්නෙ.

විදේශ බැංකු ගැනත් මා වචනයක් කියන්නට සතුටුයි. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාත් විදේශ බැංකු ගැන කථා කළා. විදේශ බැංකුවලට අප අහිමි කළ දේවල් නැවතත් ලබා දෙන්නට ගියොත් ලාංකික කිරීමේ ප්‍රතිපත්තිය අහෝසි වෙනවා. විශේෂයෙන්ම ලාංකික උදවියගේ කර්මාන්ත නිෂ්පාදනවලට ආධාර ලබා ගන්නට පුළුවන් වුණේ අප පිළියෙළ කළ ඒ නීතිරීති නිසයි. විදේශ බැංකුවලට අප අහිමි කළ බලතල නැවතත් දුන්නොත් අයහපත් ප්‍රතිඵල ඇති වෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ අය වෙළඳාම ගැනම කල්පනා කරනවා මිස මේ රටේ කර්මාන්තවල දියුණුවට වැඩ කරන්නේ නැහැ. මේ රටේ කර්මාන්තවලට ඒ අය කැමති නැහැ. මේ රටේ කර්මාන්ත ඇති කර, ඒ නිෂ්පාදන මේ රටේ පමණක් අලෙවි කර ලාභයක් ගන්නට බැරි නිසා ඒ අය මේ රටේ කර්මාන්ත ගැන සැලකිල්ලක් දක්වන්නේ නැහැ. ඒ අය කැමති ඒ අයගේ රටවල නිෂ්පාදනය කරන බඩු මේ රටේ අලෙවි කරන්නටයි. එම නිසා ඔවුන් තම මවු රටවල වෙළඳාමට ආධාර කරනවා මිස මේ රටේ කර්මාන්තවලට කිසිම ආධාරයක් කරන්නේ නැහැ. ළඟදී, අර වර්ජනය ඇතිවූ කාලයේ, බැංකුවක ලොක්කෙක් මේ රටට පැමිණි බව තමුන්නාන්සේට මතක ඇති. ඔහු මොන මොන අදහස් ඉදිරිපත් කළාද කියා තමුන්නාන්සේ දන්නවා. තමුන්නාන්සේලා මේ අන්දමට ක්‍රියා කළොත් මහජන බැංකුව වැසෙනවා. ලංකා බැංකුවේත් තත්ත්වය එතරම් හොඳ නැහැ. ඒවාගේම මේ බැංකුවල වැඩ කරන සේවක සේවිකාදීන්ටත් අමාරුකම්වලට මුහුණපාන්නට සිද්ධ වෙනවා. එම නිසා මේ කාරණය ගැනත් කල්පනා කර බලන මෙන් මා ඉල්ලා සිටිනවා.

පූ. භා. 11.30

ඊළඟට, උපාලි විජේවර්ධන මහත්මයාට දුන් විදේශ විනිමය ගැන යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) මමත් මතක් කළා. ගුවන් විදුලි යන්ත්‍ර කොටස් ගෙන්වා මෙහි සවි කරන්නට කර්මාන්ත ඇමතිතුමාගෙන් නොවෙයි රාජ්‍ය ඇමතිතුමාගේ ස්ථිර ලේකම්තුමාගෙන් අවසර පත්‍රයක් ලබා දී තිබෙනවා. රාජ්‍ය ඇමතිතුමාගේ ස්ථිර ලේකම්තුමාත් උපාලි විජේවර්ධන මහත්මයාත් නෑදෑයි නුයි. නෑදෑකමට මේ අවසර පත්‍රය දුන්නාය කියා මා කියන්නේ නැහැ. නමුත් මේ අමාත්‍යාංශ කීපයේම නිලධාරීන් ගෙන්වා මේ පිළිබඳව සාකච්ඡාවක් කරන්නට ගරු මුදල් ඇමතිතුමාට බලතල තිබෙනවා. මුලින් එවැනි කර්මාන්තයක් වුවමනාද නැද්ද කියා බලන්නට ඕනෑ. ඒ කර්මාන්තය වුවමනා නම්, අවශ්‍යම නම්, "ප්‍රයොරිටි ලිස්ට්" එකේ උඩින්ම තිබෙනවා නම් තමයි සාමාන්‍යයෙන් විදේශ විනිමය දෙන්නෙ. ජාත්‍යන්තර සම්බන්ධකම් තිබෙන නිසා, නම් ලොකු නිසා, මැති ඇමතිවරුන්ට සම්බන්ධකම් තිබෙන නිසා විදේශ විනිමය වෙන් කරන්නට ගියොත් අපේ ජාතික ධනය නාස්ති වෙනවා. විදේශාධාර ලබා ගැනීමේදීත් විදේශ විනිමය සලාකය සකස් කිරීමේදීත් රටට උපරිම ප්‍රයෝජනය ලැබෙන පරිදි ක්‍රියා කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, විශ්‍රාම වැටුප් සම්බන්ධව මා වචන ස්වල්පයක් කිව යුතුයි. අද විශ්‍රාම වැටුප් ලබාගත හැකි ක්‍රම තුනක් තිබෙනවා. සමහර උදවිය නැත්නම් නියෝජිතවරුන් භාණ්ඩාගාරයට ඇවිත් අත්සන් කර විශ්‍රාම වැටුප ලබා ගන්නවා. සමහර උදවිය තැපැල් කාර්යාල මගින් විශ්‍රාම වැටුප ලබා ගන්නවා. සමහර උදවිය බැංකු මගින් විශ්‍රාම වැටුප ලබා ගන්නවා. බැංකු මාර්ගයෙන් විශ්‍රාම වැටුප ලබා ගැනීමේ දී සෑම වාරයකදීම ඒ අයට සහතිකයක් දෙන්නට ඕනෑ. ඔහු යහතින් ජීවත්වෙනවාය, විවාහකය, අවිවාහකය ඔය ආදී වශයෙන් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට අත්සන් කළ සහතිකයක් සෑම අවසථාවකදීම භාර දෙන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

බැංකු ක්‍රමය වැඩි වශයෙන්ම පාවිච්චි කරන්නේ ඈත ඉන්න අයයි. නිතර නිතර භාණ්ඩාගාරයට එන්නට අපහසු නිසාත්, ළඟපාත තැපැල් කන්තෝරු නැති නිසාත්, ඒ අය එසේ කරනවා. මේ ක්‍රමය බැංකුවේ ගිණුමක් තිබෙන උදවියට කරදරයක් නැතිව තමන්ගේ වැඩ කටයුතු කරගෙන යාමට ආධාරයක් විය යුතු නමුත්, ඇත් තෙන්ම ඒ බලාපොරොත්තුව ඒ තරම් දුරට ඉෂ්ට වී නැහැ. ඇතැම් උදවියට මෙයින් කරදර විඳින්නට සිදු වූ අවස්ථා තිබෙනවා. සාමදාන විනිශ්චයකාරවරයකු හෝ වෙනත් සුදුසුකම් ඇති කෙනකු ඉදිරිපිට අත්සන් කළ යුතු වන නිසාත් මා සඳහන් කළ වෙනත් කරුණු නිසාත් ඒ හැටි පහසුවක් මෙයින් ලැබී නැහැ. මේ තත්ත්වය ගැන ඇමතිතුමාට පැමිණිලි ලැබී ඇතැයි මා කල්පනා කරනවා. එයින් විශාලම පැමිණිල්ල කර තිබෙන්නේ හිටපු මිනින්දෝරු මහත්මයකු වන එස්. ආර්. යාපා මහත්මයායි. ඒ මහත්මයා මිනින්දෝරු මහතුන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයෙක්. ඒ මහත්මයා ඉදිරිපත් කළ පැමිණිල්ලට පිළිතුරු ලෙස එතුමාට බොහොම තද ලියමනක් ලැබී තිබෙනවා, කන්තෝරුවෙන්. ඒ පිළිතුරු ලියමනේ සඳහන් කර තිබෙන්නේ "කියන කාරණය තේරුම් ගන්නට බැරි නම් කරුණාකර මගේ කාලය කන්න එපා," යන්නයි. තමන් විඳින්නේ මෙන්න මේ අමාරුකම්ය, ඒ නිසා සහන යක් දෙන්න කියායි, ඒ මහත්මයා කියා සිටින්නේ. ඊට ලැබී තිබෙන්නේ ඔය ආකාරයේ පිළිතුරකුයි. යහතින් ඉන්න බවට බැංකුව සහතික කරනවා නම් එය හැමදාම කරන්නට අවශ්‍ය නැත යන්නයි ඒ මහත්මයාගේ කල්පනාව. මා එය පිළිගන්නවා. බැංකුවටයි චෙක් පත යවන්නේ. ඒ නිසා හැම විතාවේදීම ඔය කියන සහතිකය වුවමනා නැහැ. මේ වැඩ පිළිවෙළ නිසා හුඟක් කරදර සිද්ධ වෙනවා. ඒ ගැන යම් කිසි විධිමත් වැඩ පිළිවෙළක් යොදන්නැයි මා ඉල්ලා සිටිනවා.

ඔබතුමා මුදල් උපදේශක මණ්ඩලයේ ඉන්න කාලයේ ඉදිරිපත් කළ හොඳ යෝජනාවක් ඔබතුමාට මතක ඇතැයි මා කල්පනා කරනවා. "කොමියුටඩ් පෙන්ෂන්" ගත් උදවියට හතරෙන් එකක් අඩු කර අවුරුදු දොළහමාරකට පසු නැවත සම්පූර්ණයෙන් ගෙවනවා. එය දැන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඔබතුමාගේත්, පත් කරන ලද මන්ත්‍රී පෝලියර් මහත්මයාගේත් උපදෙස් අනුවයි එය ක්‍රියාත්මක කළේ. එහෙත් එහි අඩුපාඩු දෙකක් තිබෙනවා. හතරෙන් එකක් අඩු කළාම, ඊට විශේෂ ජීවනාධාර මුදල ගෙවන්නේ නැහැ. විශේෂ ජීවනාධාර මුදල එකතු කරන්නේ නැතිවයි ඒ මුදල ගෙවන්නේ. හතරෙන් තුනකට පමණයි විශේෂ ජීවනාධාර මුදල දෙන්නෙ. ඒ නිසා ඒ හතරෙන් එකත් එකතුකර විශේෂ ජීවනාධාරය දෙනවා නම් මහලු වයසේ ඉන්න, නැතිබැරි උදවියට ලොකු සහනයක් එයින් ලැබෙනවා. ඒ ගැන ගරු ඇමතිතුමාටත් සැල කර තිබෙනවා. ඒ නිසා ඒ ගැන කල්පනා කරන මෙන් ඉල්ලනවා. මේ කාරණය පළාත් පාලන සේවකයන්ටත් බල පානවා. ඒක පුද්ගල කමිටුවක් ඒ සඳහා පත් කළා. ඒ කමිටුවත් මෙය පිළිගත යුතුයි නිර්දේශ කර සිටියා. එහෙත් එය ක්‍රියාත්මක කළේ නැහැ. ඒ ගැනත් සොයා බලන්නැයි ඉල්ලනවා.

ගණකාධිකාරීන් විශාල සංඛ්‍යාවක් ශ්‍රේණි තුනක මුදුන් පෙත්තමට ගොස් ඉන් එහාට යන්නට පිළිවෙළක් නැතිව, මොකක්වත් කර ගන්නට බැරිව ඉන්නවා. ඒ අය එක තැනම පල් වෙවී ඉන්න නිසා යම්කිසි අන්දමකින් පහළ ශ්‍රේණි දෙක එකතු කිරීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් හෝ විශේෂ ශ්‍රේණියක් සාදා හෝ ඒ උදවියගේ හිත් අමාරුව—වේදනාව—නැති වන විධියට යම් වැඩ පිළිවෙළක් ඇති කළොත් ඒ අයගේ සේවය වඩාත් හොඳින් ලබා ගන්නට පුළුවන් වේවි. ඒ කාරණයත් කල්පනාවට භාජන කරන මෙන් ඉල්ලා සිටිනවා.

මහජන බැංකුවෙන් ණයට මුදල් දෙන විට ඇපයක් වුවමනා කරනවා. දැන් තිබෙන හැටියට, ඇපකාරයා ආණ්ඩුවේ සේවය කරතොත් රුපියල් 520ක මාසික වැටුපක් ලබන්නකු වෙන්නට ඕනෑ. වෙනත් කෙනකු නම් අවුරුද්දකට රුපියල් 6,000ක් ආදායම තිබෙන කෙනකු වෙන්නට ඕනෑ. මෙය අලුත් දෙයක් නොවෙයි. අප ඉන්න කාලයේදීත් මෙය තිබුණා වෙන්නට ඇති. මෙය තරමක් කරදර සහිත වැඩ පිළිවෙළක් නිසා එය තරමක් දුරට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හෝ ලිහිල් කරන්නට පුළුවන් නම් හොඳයි. ණය ඉල්ලන අය වෙනුවෙන් තමුන්නාන්සේ වෙත මතක් කරන්නේ එයයි. ඒ ගැනත් විපරම් කර බලන්නැයි ඉල්ල නවා.

ගරු අගමැතිතුමාත්, ගරු ඇමතිතුමාත් තර්කවලට තර්ක ඉදිරිපත් කළා මිස අප ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දීමක් කළේ නම් නැහැ. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) ප්‍රකාශ කළ පරිදි ආදායම් බද්ද, මුදල් බද්ද සහ මුද්දර ගාස්තු බද්ද යන මේවා විශාල ආදායමක් බලාපොරොත්තු වන බදු හැටියට පෙනෙනවා. හැම අවුරුද්දකම වාගේ අයවැය පරතරය පියවීමට එයින් හුඟක් බලාපොරොත්තු වෙනවා. එහෙත් ඒ බලාපොරොත්තුව දෙවරක්ම සුන් වී තිබෙනවා. එය පැහැදිලි කරන්නට ඉලක්කම් ඉදිරිපත් කරන්නට කැමතියි.

1963-64=ලක්ෂ 3,238
1965-66=ලක්ෂ 3,225
1966-67=ලක්ෂ 3,090
1967-68=ලක්ෂ 3,025

මේ අන්දමට අවුරුද්දෙන් අවුරුද්ද බැසගෙන යනවා. අපි සිටින කාලයේ නම් ආදායම් බදු ගත්තේ ලොකු අයගෙන්. ඒ අයට ගරු ඇමතිතුමා ලක්ෂ 511 ක සහන යක් දුන්නා. මා මුදල් ඇමතිව සිටියදී පුංචි අය 25,000 ක් ආදායම් බද්දෙන් නිදහස් කළා. අපි එහෙම කරලත් අපට ආදායම් බද්දෙන් වැඩි ආදායමක් ලැබුණා. එදා ජනගහනයත් අඩුයි. දැන් පෞද්ගලික අංශයටත් හුඟක් ලාභ ලැබෙනවා. රජයේ සංස්ථාවලිනුත් ආදායම් බදු ගන්නවා. එසේ තිබියදීත් ආදායම අඩු වීගෙන යනවා. ඒ අඩුව පිරිමැසීමට විදේශාධාර ගන්නට හෝ ප්‍රාදේශීය ණය මුදල් ලබා ගන්නට හෝ සාමාන්‍ය දුප්පත් අයගෙන් වෙනත් නොයෙකුත් අන්දමේ ආදායම් ලබා ගන්නට හෝ ගරු ඇමතිතුමාට සිදු වී තිබෙනවා.

1965-66, 1966-67, 1967-68 යන වර්ෂවල කොපමණ ණය ගන්නට සිදු වී තිබෙනවාද කියා මා ගණන් බැලුවා. දේශීය ණය වශයෙන් රුපියල් ලක්ෂ 10,730 යි. භාණ්ඩාගාර බිල්පත් ලක්ෂ 1,240 යි. මහ බැංකු අත්තිකාරම් ලක්ෂ 500 යි. විදේශාධාර යෝජනා ක්‍රම සහ වෙළඳ ද්‍රව්‍ය ආධාර වශයෙන් ලක්ෂ 6,860 යි. පරිපාලන ණය ලක්ෂ 1,620 යි. සංස්ථාවල ලාභවලිනුත් ගත්තා ලක්ෂ 300 ක්. ඔක්කොම ලක්ෂ 21,250 ක් දැන් ගරු ඇමතිතුමා ණය වී සිටිනවා. මගේ කථාවෙන් මා පෙන්වා දුන් පරිදි 1969 වන විට විදේශ ණය වශයෙන් රුපියල් ලක්ෂ 3,000 ක් ගන්නවා. එහෙත් 1969 වන විට ලක්ෂ 3,000 ක් ගෙවන්නත් වෙනවා. ඒ අනුව ලැබෙන ලක්ෂ 3,000 න් රුපියල් ලක්ෂ 3,000 ක් ණයට කැපෙන විට සතයක්වත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ආර්ථික ප්‍රශ්නය විසඳන්නට යන්නේ කොයි ආකාරයටද කියන ප්‍රශ්නය පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර එයට පිළියමකුත් යොදා ඒ පිළියම කුමක්ද කියා අපටත් කියන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1965 වන විට විදේශ ධනය රුපියල් දස ලක්ෂ 440 යි. 1966 දෙසැම්බර් වන විට විදේශ ධනය දස ලක්ෂ 318 යි. ණය අරගෙන තිබෙනවා දස ලක්ෂ 108.3 ක්. ඒ අන්දමටත් අරගෙනයි ඔය තත්ත්වය ඇති වී තිබෙන්නේ. දැන් විදේශ විනිමය රුපියල් ලක්ෂ 3,180 කට බැස තිබෙනවා. ඒ නිසා ජාතික වශයෙන් දැන් විශාල අවදානම් තත්ත්වයකට මුහුණ පා තිබෙනවා.

මගේ කථාව මීට වඩා දීර්ඝ කරන්නට යන්නේ නැහැ. අවසාන වශයෙන් තවත් කරුණක් කියන්නට කැමතියි. රාජ්‍ය සේවකයින්ගේ දේශපාලන අයිතිය ගැනත් නොයෙක් විට සඳහන් කරන්නට යෙදුණා. පසුගිය මහ මැතිවරණය කාලයේදී හැම පක්ෂයක් විසින්ම රාජ්‍ය සේවකයින්ට දේශපාලන අයිතිය දීම ගැන ප්‍රතිඥාවක් දුන්නා. එහෙත් දේශපාලන අයිතිවාසිකම තිබුණු සංස්ථාවල සේවකයින්ටත් ගරු ඇමතිතුමාගේ අනුමැතිය ඇතිව එය නැති කරන්නට යෙදුණා. එසේ කිරීම 1965 දී තමුන්නාන්සේලා දුන් මැතිවරණ ප්‍රතිඥාවට සම්පූර්ණයෙන්ම පටහැණි බව මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික යකුගේ භාර්යාවක් අද පැල්මඩුල්ලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
නාමයෝජනා පත්‍ර බාර දෙනවා. එහෙත් සංස්ථාවල වැඩ කළ සේවකයින්ට තිබුණු අයිතිවාසිකමත් නැති වී ගියා. සංස්ථාවල වැඩ කරන අයගේ භාර්යාවනට මැතිවරණවලදී "කැන්වස්" කිරීමට තිබුණු අයිතිවාසිකමත් නැති කළා. ආණ්ඩුවට සම්බන්ධ නැති සංස්ථාවල වැඩ කරන අයගේ භාර්යාවනට "කැන්වස්" කිරීමට හෝ වෙනයම් දේශපාලන වැඩකයෙදීමට හෝ බැරි නම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වැදගත් සාමාජිකයකුගේ භාර්යාවක් මැතිවරණයකට තරඟ කිරීම නිසා නරක රාවයක් හා ආදර්ශයක් රාජ්‍ය සේවය තුළ ඇති වීගෙන යනවා. මේ කරුණු ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසාන කරනවා.

**ඩී. බී. විජේතුංග මයා.** (උඩුනුවර)
*(திரு. டீ. பி. விஜேதுங்க—உடுநுவர)*
Mr. D. B. Wijetunga—Udunuwara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුදල් ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කරුණු කීපයක් ගැන ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට මම කැමතියි. පසුගිය අය වැය ලේඛන විවාදයේදීත් මුදල් ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ ලංකා පරිපාලන සේවය ගැන කරුණු කීපයක් මා ගරු මුදල් ඇමතිතුමාට දැන්නුවා. එදා මා සඳහන් කළ, පරිපාලන සේවයේ විෂමතා රාශියක් මගහරවා ලීමට ගරු මුදල් ඇමතිතුමා ක්‍රියා කර තිබීම ගැන මා සන්තෝෂ වෙනවා. එහෙත්, තවත් සුද්ධ කළ යුතු තැන් කීපයක් පරිපාලන සේවයෙහි තවමත් තිබෙනවා.

1963 මැයි මාසයේ 1 වැනිදා ලංකා පරිපාලන සේවය ඉතා හදිසියෙන් ඇති කළ නිසා එය කැඳ හැළියක් බවට පත් වුණා. මේ රජය බලයට පැමිණෙන තෙක්ම, පරිපාලන සේවයෙහි පැවැති විෂමතා රාශියක් නිසා එම සේවයෙහි යෙදී සිටි අයට දුක් විඳින්නට සිදු වී තිබුණා. පරිපාලන සේවය පිළිබඳ කරුණු කීපයක් ගැන නැවතත් ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට මා අදහස් කරනවා.

ලංකා පරිපාලන සේවය පටන් ගන්නට පෙර ලිපිකරු සේවයෙන් සිවිල් සේවයට උසස් වුණු 3 වැනි ශ්‍රේණියේ සිවිල් සේවකයන් අවුරුදු ගණනක් සේවය කළායින් පසු ඔවුන්ට 2 වැනි ශ්‍රේණියට ඒම සඳහා ස්ථාන 11 ක් වෙන් කර තිබුණා. ලංකා පරිපාලන සේවය ඇති වුණායින් පසු එදා 3 වැනි ශ්‍රේණියේ සිවිල් සේවකයින් වශයෙන් සිටි නිළධාරීන් 5 වැනි ශ්‍රේණියේ පරිපාලන සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබුවා. අද ඒ සැම දෙනාම ඉතාමත් අමාරු තත්ත්වයකට පත්ව සිටිනවා. රු. 8,880 පඩි මට්ටමට නැගීමේදී බොහෝම බැරෑරුම් කඩඉමක් පසු කරන්නට ඔවුන්ට සිදු වී තිබෙනවා. ඒ කඩඉම පසු කිරීමේදී, නීති ප්‍රශ්නවලට උත්තර දීමට ඒ නිළධාරීන්ට කොහෙත්ම හැකියාවක් නැහැ. එදා 3 වැනි ශ්‍රේණියේ සිවිල් සේවයට ලිපිකරු සේවයෙන් උසස් වුණු නිළධාරීන් 30 දෙනකු පමණ අද රු. 8,880 පඩි මට්ටමේ දැන් අවුරුදු ගණනක් තිස්සේම සේවය කරන බව මා දන්නවා. පඩියේ උසස් වීමක්වත්, පරිපාලන සේවයේ 4 වැනි ශ්‍රේණියට උසස් වීමට පුළුවන්කමක්වත් නැතිව මේ අය දැන් අවුරුදු ගණනක් තිස්සේ එකම තැන සිටිනවා. ලංකා පරිපාලන සේවයේ මුදුන් මල්කඩ හැටියට සලකන්නට පුළුවන් මෙම නිළධාරීන් සමහර විට කච්චේරිවල දිසාපතිවරුන්ගේ දෙවැනියන් හැටියට පවා කටයුතු කරනවා. එම නිසා මේ ගැන ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට මා කැමතියි. මේ පිරිස පරිපාලන සේවයේ 4 වැනි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරෙන්නේ නැත්නම් අඩු වශයෙන්, 5 වැනි ශ්‍රේණියේ අන්තිම පඩි මට්ටම වන රු. 11,260 දක්වා ඔවුන්ගේ පඩියවත් නංවාලීමට සැලැස්මක් ඇති කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

පූ. භා. 11.45

ලංකා පරිපාලන සේවය ඇති කළ අවස්ථාවේදී එහි නියමිත ශ්‍රේණියකට අන්තර්ග්‍රහණය නොකරන ලද නිළධාරී ශ්‍රේණියකුත් තිබෙනවා. එනම්, දිස්ත්‍රික් ඉඩම් නිළධාරී සේවයයි. මේ සේවයට නියමිත පඩි සැලැස්මත් ලංකා පරිපාලන සේවයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

4 වැනි ශ්‍රේණියේ පඩි සැලැස්මත් එක හා සමානයි. ශතයකින්වත් වෙනසක් නැහැ. පටන් ගැනීමත් අවසානයත් එක සමානයි. පරිපාලන සේවය ඇති කරන අවස්ථාවේදී වැඩි පඩි ගනිමින් සිටි සමහර දිස්ත්‍රික් නිළධාරීන් ඔවුන්ගේ පඩි ක්‍රමය අනුව 4 වැනි ශ්‍රේණියට අන්තර් ග්‍රහණය නොකර 5 වැනි ශ්‍රේණියට අන්තර් ග්‍රහණය කර තිබෙනවා. මා දන්නා දිස්ත්‍රික් ඉඩම් නිළධාරීන් 5 දෙනකු පමණ මේ නිසා කනස්සල්ලට පත් වී සේවය අතහැර ගොස් සිටිනවා.

ඉඩම් නිලධාරීන් හැටියට ඉඩම් සම්බන්ධ කටයුතුවලදී උසස් සේවයක් කරන නිසාත්, ඒ සේවයට අයත් වැටුප ලංකා පරිපාලන සේවයේ 4 වෙනි ශ්‍රේණියේ වැටුපම නිසාත්, ඒ නිළධාරීන් සැම දෙනකුම ලංකා පරිපාලන සේවයේ 4 වෙනි ශ්‍රේණියට අන්තර්ග්‍රහණ කිරීම සඳහා කැබිනට් තීරණයක් ගැනීමට ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි.

දෙවැනි ශ්‍රේණියේ ආරෝග්‍යශාලා ලේකම්වරුන් හැටියට අද පිටින් බඳවාගනු ලබන්නේ උපාධිධරයන් බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ වාගේම තුන්වෙනි ලේකම් ශ්‍රේණියේ වැටුප අනුක්‍රමයෙන් වැඩි වී දෙවෙනි ශ්‍රේණියට පැමිණි විට ඒ වැටුප ලංකා පරිපාලන සේවයේ 5 වෙනි ශ්‍රේණියේ වැටුපට සමානයි. මේ අනුව දැනටත් මේ ලේකම්වරුන් රාජ්‍ය සේවා කොමිසම වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ඉල්ලීම සලකා බැලීමට වටිනවාය කියා මාත් අදහස් කරනවා. ඊට හේතුව ආරෝග්‍යශාලා ලේකම්වරුන් 2 වෙනි ශ්‍රේණියේ සිට 1 වෙනි ශ්‍රේණියට ගියාට පසුව ඉන් එහාට උසස්වීමක් නැති නිසයි. එවැනි තත්ත්වයක් තිබෙන නිසා සමහර විට හොඳ උපාධිධරයන් මේ තනතුරුවලට පත් කර ගැනීමට නොහැකි වනවා ඇති. අන්තිමේදී ඉන් එහාට උසස් වීමක් නැති නිසයි. යම් විධියකින් මේ තනතුරුත් ලංකා පරිපාලන සේවයට අන්තර්ග්‍රහණය කරන්නට පුළුවන් වෙතොත් පරිපාලන සේවා විභාගයෙන් සමත් වන ඉතාමත් දක්ෂ උපාධිධරයන් මෙම තනතුරුවලටත් ඇතුළු කර ගැනීමට පුළුවන් කමක් තිබෙනවා. ඒ නිසා දෙවෙනි ශ්‍රේණියේ ආරෝග්‍යශාලා ලේකම්වරුනුත් ලංකා පරිපාලන සේවයට ඇතුළත් කිරීම පිණිස ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලනවා.

ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ නීති උපදේශක තනතුර කියා නිලයක් තිබෙනවා. නීති උපදේශක යන නාමයෙන් සිටියත් ඒ අය සාමාන්‍ය වශයෙන් කරන්නේ පරිපාලන වැඩයි. නීති පිළිබඳ වැඩක් කෙරෙන්නේම නැහැ. නීති උපදේශක වශයෙන් ඔප්පු තිරප්පු ආදියේ වැඩ කටයුතු කරන්නේ නැහැ. නීති උපදේශක යනුවෙන් නිලධාරියෙකු ජාතික නිවාස දෙපාර්තමේන්තුවට අවශ්‍ය වී ඇත්තේ සාමාන්‍ය පරිපාලන සේවයේ ගැටලු ගැන උපදෙස් ගැනීමට පමණයි. ඒ නිසා ඒ නිලය විශෙෂයෙන් පරිපාලන නිලයක් හැටියට සැලකිය යුතුයි. ඒ නිලයට ඇත්තේ පරිපාලන වැඩ කටයුතු බව ඔප්පු කිරීම පිණිස ඉදිරිපත් කළ හැකි තර්කයක් නම් සමහර අවස්ථාවලදී දෙවැනි නිවාස කොමසාරිස් හැටියට වැඩ බලන බවයි. එවැනි අවස්ථා ගණනාවක්ම තිබෙනවා. ඒ නිසා ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ නීති උපදේශක නිලයත් ලංකා පරිපාලන සේවයට අන්තර්ග්‍රහණය කළ යුතුයි කියා ඉල්ලීමක් කර තිබෙනවා. එම ඉල්ලීම ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වෙනවා ඇත කියා මා බලාපොරොත්තු වෙනවා.

අද භාණ්ඩාගාරය ගැන ලොකු විචිකිච්ඡාවක් තිබෙනවා. භාණ්ඩාගාරයේ ලේකම් ගරු මුදල් ඇමතිතුමාගේද ස්ථිර ලේකම්. මේ දෙවැනි වැඩ පිළිවෙළ නිසා භාණ්ඩාගාරයේ ලේකම් මහතා තමන්ගේ බලය කොයි විධියට පාවිච්චි කරනවාද කියා ලොකු ආකූල තත්ත්වයක් පවතිනවා. සමහර ප්‍රශ්නවලදී භාණ්ඩාගාරයේ ලේකම් මහතා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණත් ක්‍රියාත්මක කරන අතර ගරු මුදල් ඇමතිතුමාගේ ස්ථිර ලේකම් හැටියට මුදල් ඇමතිතුමාගේ අණත් ක්‍රියාත්මක කරනවා. දෙපැත්තෙන් එන කුමන අණ ක්‍රියාත්මක කරනවාද කියා අප දන්නේ නැති නමුත්, අප එක් කාරණයක් ගැන

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[විජේතුංග මයා.]

නම් හොඳින් දන්නවා: භාණ්ඩාගාරයේ ලේකම් හැටියටත්, ගරු මුදල් ඇමතිතුමාගේ ස්ථිර ලේකම් හැටියටත් තමන්ගේ බලය අනිසි අන්දමින් පාවිච්චි කරමින් මෙම සේවා කටයුතු අද අවුලෙන් අවුලට පත් කර තිබෙන බවයි. ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ හැකි සාධක බොහෝ තිබෙනවා. එහෙත් 12 වන විට මගේ කථාව අවසන් කළ යුතු බැවින් ඒ සියල්ලක්ම ඉදිරිපත් කිරීමට මට අවස්ථාවක් නැහැ. එසේ වුවද ගරු සභාවේ දැන ගැනීම සඳහාත් ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු වීම සඳහාත් එක ඉල්ලීමක් කරන්න කැමතියි. භාණ්ඩාගාරයේ ලේකම් ගරු මුදල් ඇමතිතුමාගේ ස්ථිර ලේකම් හැටියට වැඩ කිරීම සුදුසු නැහැ. ඒ වාගේම ගරු මුදල් ඇමතිතුමාගේ ස්ථිර ලේකම් භාණ්ඩාගාරයේ ලේකම් හැටියට වැඩ කිරීමත් සුදුසු නැහැ; සතුටුදායක නැහැ. භාණ්ඩාගාරයේ ලේකම් මහත්මයා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පත් කරන නිලධාරියකු හැටියට ඊට අවනත වීම යෝග්‍යයි. භාණ්ඩාගාරයේ ලේකම් මහත්මයා ගරු මුදල් ඇමතිතිතුමාගේ ස්ථිර ලේකම්තුමාගේ අණටත් යටත්ව ක්‍රියා කිරීම සඳහා ගරු මුදල් ඇමතිතුමාගේ ස්ථිර ලේකම්තුමාගේ නිලය ස්ථිර ලේකම් නිලයක් හැටියට තිබිය යුතුයි. මේ නිල දෙක එකට මිශ්‍ර වීම නිසා භාණ්ඩාගාරයේ ලේකම්තුමා තමන්ගේ බලතල පටලවා ගැනීමෙන් රජයේ උසස් පරිපාලන සේවයේ කටයුතුවල අවුල් වියවුල් තත්ත්වයක් ඇති කර තිබෙනවා. ඒ ඒ සේවකයන්ගේ පඩි ප්‍රශ්න ගැන ඒ නිලධාරි මහත්මයා ක්‍රියා කරන්නේ භාණ්ඩාගාරයේ ලේකම් හැටියටයි. රජයේ ප්‍රතිපත්ති ගැන කටයුතු කරන විට ඒ මහත්මයාම ගරු මුදල් ඇමතිතුමාගේ ස්ථිර ලේකම් හැටියට කටයුතු කරමින් තමන්ගේ බලතල ඒ අන්දමින් පාවිච්චි කරනවා. මේ දෙක පටලවා ගනිමින් මේ නිලධාරි මහත්මයා තමන්ගේ බලතල සතුටුදායක නොවන අන්දමට පාවිච්චි කර තිබෙන අවස්ථා රාශියක් අපට පෙන්වා දෙන්නට පුළුවන්. ඒ නිසා මේ ආකුල ව්‍යාකූල තත්ත්වය තව ඉදිරියටත් පවත්වාගෙන යාම සතුටුදායක නොවේ. භාණ්ඩාගාරයේ ලේකම් රාජ්‍ය සේවයේ මුදුන්මල්කඩ හැටියට වෙනම නිලධාරියකු වශයෙන් සිටිය යුතුයි. ගරු මුදල් ඇමතිතුමාගේ ස්ථිර ලේකම් මහත්මයා ස්ථිර ලේකම් කෙනකු හැටියට රජයේ ප්‍රතිපත්ති අනුගමනය කරමින් ගරු මුදල් ඇමතිතුමාගේ අණට කීකරු වී ඒ කටයුතු ක්‍රියා කිරීම සඳහා වෙනම නිලධාරියකු වශයෙන් සිටිය යුතුයි. භාණ්ඩාගාරයේ ලේකම් තනතුරත්, මුදල් ඇමතිතුමාගේ ස්ථිර ලේකම් තනතුරත් නිල දෙකක් වශයෙන් තබා ඒ නිල දෙකට දෙදෙනෙකු පත් කර කටයුතු කරනවා නම් රජයේ උසස් සේවය මීට වඩා පිරිසිදු සේවයක් බවට පරිවර්තනය වෙනවාට කිසිම සැකයක් නැහැ.

ඒකාබද්ධ ඉංජිනේරු සහ විශේෂඥ සේවයක් ඇති කිරීම සඳහා ගරු මුදල් ඇමතිතුමා මෑතදී කොමිෂන් සභාවක් පත් කළා. ඒ ගැන අප ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ කොමිෂන් සභාවේ වාර්තාව දැන් ගරු මුදල් ඇමතිතුමාට ඉදිරිපත් කර තිබෙනවා. ඉංජිනේරු සේවය සහ විශෙෂඥ සේවය අද දෙපාර්තමේන්තුවල වෙන් වෙන් වශයෙන් තිබෙන නිසා—ඒ ඒ අය වෙන් වෙන්ව කටයුතු කරන නිසා—ඒ නිලධාරින්ගේ පඩි සැලැස්මවල් ගැනත් අයිතිවාසිකම් ගැනත් අද ලොකු වාද භේද ඇති වී තිබෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේත්, ගොවි කර්මාන්ත දෙපාර්තමේන්තුවේත්, වෛද්‍ය දෙපාර්තමේන්තුවේත් සේවාවල නිලධාරින්ගේ උසස්වීම් ගැනත් පඩි සැලැස්මවල් ගැනත් අද විෂමතා රාශියක් ඇති වී තිබෙන නිසා තමයි, ගරු මුදල් ඇමතිතුමා මේ කොමිෂන් සභාව පත් කර තිබෙන්නේ. ඒ වාර්තාව සතුටුදායක වාර්තාවක් බව අප කව්රුත් පිළිගෙන තිබෙන නිසා හැකි තරම් ඉක්මණින් ඒ ඒකාබද්ධ සේවා වාතීව ක්‍රියාත්මක කරන ලෙස අප ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. ඉලංගරත්න මයා.) විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් ගැන මා සතුටු වුණා. ලංකා පරිපාලන සේවය ඇති කරන අවස්ථාවේදී කොළොන්නාවේ මන්ත්‍රීතුමාටම—හිටපු මුදල් ඇමති හැටියට—පුළුවන්කම තිබුණා, ප්‍රාදේශීය ආදායම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේවය පරිපාලන සේවයෙන් අයින් කර කටයුතු කිරීමට. එදා එසේ නොකර අද එතුමා යෝජනාවක් ඉදිරිපත් කළා. කෙසේ වෙතත් ඒ යෝජනාවේ වැදගත්කමක් තිබෙන නිසා ඒ ගැන වචන ස්වල්පයක් කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

එදා ලංකාවේ ආදායම් පාලක නිලධාරි වරුන් බඳවා ගත්තේ පළාත් අනුවයි. දෙමළ පළාත්වලටත්, උඩරට පළාත්වල ටත්, පහතරට පළාත්වලටත් ඒ ඒ නිලධා රීන් වෙන් වෙන් වශයෙන් තෝරා ගත්තා. ලංකා පරිපාලන සේවය ඇති කළ විට එදා තිබුණු ආදායම් පාලක නිලධාරි වරුන්ගේ සංගමයේ බලවත් ඉල්ලීමකට ඇහුම්කන් දීම නිසා එදා සිටි මුදල් ඇමති තුමා මේ සේවාව සම්පූර්ණයෙන්ම පරිපා ලන සේවයට අන්තර්ග්‍රහණය කළා. ඒ වැරැද්ද කිරීමේ ආදි කර්තෘවරයා වන කොලොන්නාවේ මන්ත්‍රීතුමාම අද එය වැරදි බව මේ ගරු සභාවේදී කීවා. එතුමා යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මා සන්තෝෂ වෙනවා. ඒ සේවය පරිපාලන සේවයට අන්තර්ග්‍රහණය කිරීමෙන් අද රටේ ආකුල ව්‍යාකුල තත්ත්වයක් ඇති වී තිබෙනවා. තරඟ විභාගයකින් උසස් අන් දමින් ලකුණු ලබා ගත් පුද්ගලයින් ලංකා පරිපාලන සේවයට තෝරා ගන්න නිසා ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි සේවය ට සුදුසු නිලධාරීන් පත් කර ගැනීමේ ආමාරුකමක් ඇතිවී තිබෙනවා. මේ සම්බන් ධයෙන් කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කළ ඉල්ලීම වගේම මමත් ඉල්ලීමක් කරන්ට කැමතියි. ආදායම් පාලක නිලධාරි සේවය නැවතත් පරිපාලන සේවයෙන් වෙන් කර, ආදායම් පාලක නිලධාරි සේව යට නිලධාරීන් තෝරා ගැනීම සඳහා වෙනම පරීක්ෂණයක් පවත්වා නිලධාරීන් බඳවාගෙන ඔවුන් ආදායම් පාලක නිලධා රීන් වශයෙන් අවුරුදු ගණනක් සේවය කිරීමෙන් පසු එක්තරා පඩි මට්ටමකදී පරිපාලන සේවයට අන්තර්ග්‍රහණය කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එහෙම කළොත් අපට ලොකු ප්‍රයෝජනයක් සැලසෙනවා. අපගේ පළාත්වල සේවය හරිහැටි ඉටු කර ගන්ට පුළුවන් වෙනවා. එම නිසා මුදල් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම මේ ගැන කල්පනා කර බලන්න කියා. ආදායම් පාලක නිලධාරි සේවය ලංකා පරිපාලන සේවයෙන් වෙන් කර, වෙනම තරඟ විභාගයක් පළාත් අනුව පවත්වා සුදුසු නිලධාරීන් ඒ සේවයට බඳවාගෙන එක්තරා කාලසීමා වකදී නැතහොත් එක්තරා පඩි මට්ටමකදී ඔවුන් ලංකා පරිපාලන සේවයට අන්තර් ග්‍රහණය කරන ලෙස මා යෝජනා කරනවා. ආදායම් පාලක නිලධාරීන්ගෙන් මීට වඩා සේවයක් ලබා ගැනීමේ පරමාර්ථයෙන් එසේ කිරීමට ගරු මුදල් ඇමතිතුමා ක්‍රියා කරනවා ඇතැයි මං බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට මුදල් ඇමතිතුමාගෙන් තවත් ඉල්ලීමක් කරන්ට කැමතියි. එනම්, මුදල් ඇමතිතුමා ගේ සැලැස්ම යටතේ යම් යම් සේවාවලට නිලධාරීන් තෝරා ගැනීම පළාත් අනුව සිදු කරනව නම්, ජාතික නිදහස් අධ්‍යා පන ක්‍රමයේ සම්පූර්ණ ප්‍රතිඵල අපට ලබා ගන්ට පුළුවන් බව මා මුදල් ඇමති තුමාට මතක් කරනවා. අද ලංකාවේ සෑම පළාතකම වගේ දියුණුවට පත් වූ ළමයින් සිටිනවා. සමහර විට බදුල්ල, සබරගමුව, උතුරුමැද ආදි පළාත්වල ළමයින්ට කොළඹ ළමයින් සමග තරඟ විභාගයකදී එකම විධියට සමත්කම් දක්වන්න බැරි වෙන්ට පුළුවනි; සමහර විට එකම විධියට සමත්කම් දක්වන්න හැකි වෙන්ට පුළුවනි. කෙසේ වෙතත් අපට අවශ්‍ය සේවා වල සුදුසු අන්දමේ තරුණ තරුණියන් ලංකාවේ ඒ ඒ ප්‍රදේශවලින් තෝරා ගන්න පුළුවන්කම තිබෙන නිසා, ජාතික නිදහස් අධ්‍යාපන ක්‍රමයෙන් ඒ උදවියට ලැබී තිබෙන ඒ වරප්‍රසාදයේ ප්‍රතිඵල ඔවුන්ට ලබා දීම සඳහා භාණ්ඩාගාරය මාර්ගයෙන් යම් යම් සේවාවලට නිලධාරීන් තෝරා ගැනීමේදී ඒ ඒ පළාත් අනුව නිලධාරීන් තෝරා ගැනීමට ක්‍රමයක් සකස් කරන මෙන් මා ඉල්ලා සිටිනවා. ඒ විධියේ ක්‍රම යක් ඇති කළොත් නිලධාරීන් එහාට-මෙ හාට මාරු කිරීමේදී ඇතිවන දුෂ්කරතා වැළ කෙන අතර වඩා යහපත් සේවාවක් පවත් වාගෙන යාමටත් හැකි වන බව මතක් කරන්ට ඕනෑ.

ඊළඟට භාණ්ඩාගාරයේ විශ්‍රාම වැටුප් අංශය ගැනත් වචනයක් කියා මගේ කථාව අවසන් කරන්ටයි මා අදහස් කරන් නේ. විශ්‍රාම වැටුප් අංශයේ අධ්‍යක්ෂතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේතුංග මයා.]

දක්ෂ නිලධාරියකු හැටියට අද ඒ වැඩ කට යුතු හොඳින් කරගෙන යන බව මතක් කරන්ට කැමතියි.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**

*(குழுக்களின் உப அக்கிராசனர்)*

(The Deputy Chairman of Committees)

Order, please! The Sitting is suspended till 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி.ப. 2.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 2 P.M., and then resumed.*

**කාරකසභා නියෝජ්‍ය සභාපති**

*(குழுக்களின் உப அக்கிராசனர்)*

(The Deputy Chairman of Committees)

උඩුනුවර ගරු මන්ත්‍රීතුමාට (විජේතුංග මයා.) තව මිනිත්තු 5ක පමණ වේලාවක් පමණයි, දිය හැක්කේ. තව මන්ත්‍රීන් කීප පොළක් කතා කරන්නට බලාපොරොත්තුවෙන් සිටින නිසා මන්ත්‍රීතුමාගේ කතාව ඉක්මණින් අවසාන කරනවා ඇතැයි විශ්වාස කරනවා.

**විජේතුංග මයා.**

*(திரு. விஜேதுங்க)*

(Mr. Wijetunga)

දිවා භෝජනයට ප්‍රථම මා කතා කරමින් සිටියේ විශ්‍රාම වැටුප් පිළිබඳවයි. භාණ්ඩාගාරයේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂතුමා පිළිබඳව අප කවුරුත් පාහේ දන්නවා. එතුමා දක්ෂ නිලධාරියකු වශයෙන් හඳුන්වා දෙන්නට පුළුවනි. ඒ කෙසේ වෙතත් විශ්‍රාම වැටුප් දීමේදී දෙපාර්තමේන්තුවලින් ලැබෙන තොරතුරු ප්‍රමාදය නිසා එහි සෑහෙන පසුබෑමක් ඇති වන බවට පැමිණිලි රාශියක් අපට ලැබී තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමාගේ සථිර ලේකම්තුමා ඒ ප්‍රමාදයන් වැළැක්වීම සඳහා තදබල නිර්දේශයක් ඉදිරිපත් කළොත් ඉතා වැදගත්ය කියා මා විශ්වාස කරනවා. විශ්‍රාම වැටුප් දීම පිළිබඳ ප්‍රතිඥව දුන් විගසම ඔහුට අයත් පුද්ගලික ලිපි ගොණුව සම්පූර්ණ කර එවන්නය කියා නිර්දේශ කළොත් හොඳයි. විශ්‍රාම වැටුප් ගෙවීම ඉක්මන් කරන්නට එය විශාල උපකාරයක් වෙනවා ඇති.

විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් විශේෂ ඉල්ලීමක් කරන්නට මා කැමතියි. යම්කිසි විශ්‍රාමිකයකු මිය ගිය පසු ඔහුගේ ඇවැමෙන් ජීවත් වන වැන්දඹු භාර්යාවට හෝ දරුවන්ට ඔහුට අයිති විශ්‍රාම වැටුප් අරමුදලෙන් කොටසක් ලැබෙන්නේ නැහැ. විශ්‍රාමිකයාගේ වැන්දඹුවට වැන්දඹු අරමුදලෙන් සුළු කොටසකුත් අවුරුදු 18න් පහළ ළමයින්ට සුළු කොටසකුත් ලැබෙනවා. විශ්‍රාමිකයාට ලැබෙන විශ්‍රාම වැටුපෙන් සුළු ගණනක් තමයි විශ්‍රාමිකයාගෙන් ජීවත් වන අයට ලැබෙන්නේ යන්න ඒ අනුව පැහැදිලි වෙනවා ඇති. රජයට ලොකු මුදල් සම්භාරයක් මෙයින් ඉතිරි වන නිසා යම්කිසි විශ්‍රාමිකයකු මිය ගිය විට ඔහු වෙනුවෙන් ජීවත් වන උදවියටත් සෑහෙන ආධාරයක්—ex-gratia payment—ගෙවන්නටය කියා මා යෝජනා කරනවා.

නුදුරු අනාගතයේදී පවත්වන්නට යන ලිපිකාර විභාගය පිළිබඳව වචන සවල්පයක් ප්‍රකාශ කරන්නට කැමතියි. එම විභාගයේ නිර්දේශයන්ට අනුව ඊට පෙනී සිටිය හැක්කේ ජ්‍යෙෂ්ඨ විභාගයෙන් හෝ පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයෙන් සම්මාන 4ක් ලබා ගත් උදවියට පමණයි. එම විභාගය සඳහා ලැබෙන ඉල්ලුම් පත්‍ර සීමා කිරීම සඳහා වෙන්නට ඕනෑ, මෙසේ කරන්නට ඇත්තේ. ඒ කෙසේ වෙතත් මෙතෙක් තිබුණු සම්ප්‍රදායය අනුව වයස් සීමාව තුළ ඉන්න ජ්‍යෙෂ්ඨ සමතුන් සියළු දෙනාටම එම විභාගය ගැනීමේ වරප්‍රසාදය සලසා දීම අවශ්‍ය බව කියන්නට ඕනෑ. විභාගයෙන් සමත් වෙනවාද නැද්ද යන්න එම විභාගයට වැඩ කර තිබෙන අන්දම අනුව තීරණය කළ යුතුයි. එය එම විභාගයේ වැඩ කටයුතුවලදී කෙරෙන පරීමාණයක්. එසේ හෙයින් සම්මාන හතරක් හෝ පහක්ය කියා සීමා කරන්නට වුවමනා නැහැ. මෙම වැඩ පිළිවෙළ සංශෝධනය කොට පරණ ක්‍රමයට අනුව ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් හැමටම එම විභාගය ගැනීමට අවසර දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ඉඩම් වැඩ අධිකාරිවරුන්ගේ ශ්‍රේණි උසස් කිරීම පිළිබඳව ඉඩම් කොමසාරිස්තුමා කර තිබෙන නිර්දේශයට භාණ්ඩාගාරයේ විරුද්ධතාවයක් තිබෙන බව පෙනෙනවා. ඉඩම් වැඩ අධිකාරිවරුන්ට අද වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කටයුතු රාශියක් පැවරී තිබෙන බව කියන්නට ඕනෑ. ජනපද දියුණු කිරීමාදිය ඔවුන්ට පැවරී තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ පමණක් ලක්ෂ 13ක වැඩ ඒක් ඉඩම් අධිකාරිවරයකු විසින් කර ගෙන යනවා. අද ඔවුන්ගෙන් වැඩි දෙනෙක් සිටින්නේ පළමුවන ශ්‍රේණියේයි. එතැනින් ඉහළ යාමට ඔවුන ට අවසථාවක් ඇත්තේ නැහැ. ඉංජිනේරු විභාගය ගැනීමටවත් අද ඔවුන් ට වරප්‍රසාද ඇත්තේ නැහැ. එම නිසා ඉඩම් වැඩ අධිකාරිවරුන්ගේ පළමුවන ශ්‍රේණි යට ඉහළ විශේෂ ශ්‍රේණියක් ඇති කරන්නටය කියා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් ඉල්ලීමක් කළා. පළමුවන ශ්‍රේණියට උසස් වීම හේතු කොට ගෙන ඒ තරම් වැඩි පඩියක් ලැබෙන්නේ නැහැ. රුපියල් 25ක් 30ක් පමණයි, වැඩි වෙන්නේ. එහෙත් එම ශ්‍රේණිය ලබා ගැනීමට ඔවුන් විශාල උනන්දුවක් දක්වනවා. ඊට හේතුව නම්, ඒ හේතුකොටගෙන විශ්‍රාම වැටුප වැඩි වන නිසාත් තත්ත්වයේ යම්කිසි උසස් වීමක් සිදු වන නිසාත් බව පෙනෙනවා. එම තත්ත්වය ඇති කර ගැනීමට විශාල උත්සාහයක් දරන ඔවුන් තව දුරටත් උනන්දු කරවීම සඳහා ඉඩම් කොමසාරිස් තුමාගේ නිර්දේශයට ඇහුම්කන් දෙන ලෙස මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා මීට වඩා කතා කරන්නට අදහස් කරන්නේ නැහැ. තවමත් ලංකා පරිපාලන සේවයේ විෂමතා රාශියක් තිබෙන නිසා ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය එම ප්‍රශ්නය කෙරෙහි යොමු වේවායි ප්‍රාර්ථනාය කරමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

I want to deal with one or two matters. First of all, I want to deal with the question of Tide Surveyors of the Customs Department. They have submitted a number of grievances which I would like the Hon. Minister to look into. I do not know what the reorganization is that is going to take place in the Customs Department, but when that reorganization takes place, I would like him to consider the claims and the grievances of the various sections.

Tide Waiters are a category of people who have been long in service. Previously they had opportunities of promotion which have now been more or less closed to them. They used to be promoted to the Clerical Service, Grade 2, at one stage. That avenue is now closed to them. I do think that some effort should be made to study the grievances of some of these people.

Now I wish to speak a few words on the Ceylon Administrative Service, which I have on previous occasions dealt with at length. I am not satisfied that the Ceylon Administrative Service has enabled us yet to break the power of the quondam Ceylon Civil Service. The Hon. Minister keeps on appointing committees. That is not good. If the Hon. Minister will do me the favour of going through a fairly substantial document I left behind when I left the Ministry, he will find that I have gone into the whole question of Grade V officers, the question of promotion and the necessary avenues for the new recruits. All those matters have been dealt with, and I would like him to go into this whole question instead of depending upon the officers of the former Civil Service to provide him with an administrative service which, from their point of view, eats into their own position. So they are not likely to make things easy for the Minister in his endeavour to reform the Administrative Service in a manner suitable for the future development of this country.

There are one or two other major matters about which I want to say a word or two. First of all, the Hon. Minister is aware of the Kennedy round of trade negotiations that took place in Europe. The repercussions of that Kennedy round of trade negotiations on under-developed countries have to be carefully looked into by the Hon. Minister. There is no use in the Hon. Minister going to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

Finance Ministers' Conferences and conferences of the Governors of Central Banks unless he studies the full impact of those proposals on Ceylon.

I shall read to you from the "Economist" of May 20, 1967. This is the heading of the article in the "Economist": "The Kennedy Round is a Rich Man's Deal."—That is in thick letters. The "Economist" is hardly to be treated as a socialist document. You know what that means so far as a poor country like Ceylon is concerned. It provides various facilities for the development of the developed countries.

I am reading from page 81 of the "Economist" of the 20th May, which says this:

> "But they have done something very worthwhile as between the main industrialised countries."

In other words, they have made arrangements for the further development of the already developed countries; their difficulties with regard to tariff adjustments and so on have been attended to. But for the under-developed countries they have not provided any benefits at all. My fear is that the net result of this would be adverse effects on the under-developed countries.

The article continues:

> "Snags remain. Concessions to the underdeveloped world are no more than apologetic, although time just remains for bilateral deals to improve the package here a little. If Washington felt up to passing yet another extra piece of legislation, tariff cuts could be made in one year (instead of the five allowed by the Trade Expansion Act) where this would help less-developed countries. President Johnson has powers to reduce tariffs on tropical products from poor countries to zero; but only if other rich men—like the common market and Britain—do the same, which, as they both have existing tariff preferences with selected parts of the underdeveloped world, neither seems prepared to do."

Really, what they are going to do is to provide facilities for their own trade as between the United States and Europe, but so far as any facilities for the primary products of our countries are concerned, there is no serious attempt even to consider this.

> "The new anti-dumping rules agreed earlier in the Kennedy round will stop rich countries from imposing special tariff restrictions on goods from low-wage countries, on the pretence that low wage goods are automatically dumped."

In other words, all these under-developed countries are to be treated as low-wage countries. So, you see, this is one of the things which militate against the expansion of our own trade.

The Hon. Minister must have seen today's newspapers and the editorials about the sudden drop in the price of rubber to the lowest level within the last ten to fifteen years—69 cents. The Hon. Minister will appreciate that this drives out a good many of the middle and small producers so far as rubber is concerned.

To quote again:

> "But nothing has been done to ease quota restrictions in such jealously guarded areas as cotton-textiles, or to help commodities that are in glut, even at rock-bottom prices, like coffee."

I am reading this in order to draw your attention to the fact that this matter of tariffs, as well as the whole question of liquidity, which have been apparently satisfactorily solved to meet the financial difficulties of Great Britain, are going to have adverse effects on us.

I remember raising this question specifically at Tokyo and also at Kuala Lumpur at the Commonwealth Finance Ministers' Conference. I made it a point to make a case against this concept of liquidity which means in point of fact restricting credit facilities for the under-developed countries and providing certain facilities for Great Britain and the European Six or the European Ten.

Now all these developments are going to have very serious repercussions on us. Already the position is bad enough with the prices of our

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

primary products going down and down, and we must take strong action to present our case at these international assemblies. I think it is not going to be easy for us.

ඦ. භා. 2.15

Similarly, I would draw the attention of the Hon. Minister to the present position of UNCTAD. It is unfortunate that we in this House do not pay sufficient attention to some of the major problems. We are not paying sufficient attention to the pressing problems over which we are expending a considerable amount of time. Here we can howl as much as we like about the drop in the price of rubber, tea, coconut products and so on. But the real difficulties with regard to our products arise in the Western countries where they are already solving their problems at our expense to suit their needs. That matter has to be taken up at that end. We do not create sufficient public opinion on those problems here in our country, particularly in Parliament. We have completely ignored those problems. We are here talking about small things that affect us. One Member will raise a matter pertaining to one constituency while another will raise a matter regarding another constituency, and so on. But in the meanwhile our economic position gradually deteriorates and I think it will soon come to a position when it will be beyond repair.

In the meanwhile my good Friend the Hon. Minister is going to take further action to make things a little more difficult for us. The Hon. Acting Minister of Industries came out with a great deal of facts about what is happening in the exchange banks at the present moment—the amount of overdraft facilities they have given to the various sterling companies in Ceylon. These companies are all operating on our money. He worked out the figure at Rs. 300 million. That is the figure that he presented. I do not know whether it is accurate. Anyhow I think it is a big slice. If that were so what are the prospects for local industrialists? How are they going to get their money? That is the problem. The Hon. Minister is now going to make things still easier by allowing further opportunities to these exchange banks to take in deposits from people who have now switched on to the Bank of Ceylon and the People's Bank. I think he will be opening the gateway to further complications so far as our economy and financial position are concerned.

I must strongly advise the Government against any attempt to accommodate these exchange banks. If the Hon. Minister would only be so kind as to study some of the rules and regulations which obtain in places like Australia or even in the United States of America with regard to these foreign banks, he will find that they are very severely restricted with regard to their freedom of operation. Even in the United States of America you have not got that freedom of operation. Why is it that we, a nation that is struggling to put ourselves right with regard to our economic position, are granting all these facilities and enabling these people to continue to exploit us? I do not understand this. Instead of making things more difficult for these people who have continued to exploit us for the last one hundred years or more, the Hon. Minister is now contemplating giving them further facilities. I do not think this is a wise policy that the Hon. Minister wants to adopt. I do urge strongly that the Minister should seriously reconsider this position.

*Question, "That the sum of Rs. 2,358,445 for Head 43, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 43, Vote 1, ordered to stand part of the Schedule.*

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 9,77,116

வாக்குப்பணம் இல. 2—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 9,77,116

*Vote No. 2.—Administration Charges—Recurrent expenditure, Rs. 977,116*

"43 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 9,77,116 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

43 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"43 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 9,77,116 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

43 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 977,116 for Head 43, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 43, Vote 2, ordered to stand part of the Schedule.*

3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 32,000

வாக்குப்பணம் இல. 3—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட்செலவு, ரூபா 32,000

*Vote No. 3.—Administration Charges—Capital expenditure, Rs. 32,000*

"43 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 32,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

43 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"43 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 32,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

"43 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையிற் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 32,000 for Head 43, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.*

*Head 43, Vote 3, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

44 වන ශීර්ෂය.—ජාතික මුදල් ඉතිරි කිරීමේ දෙපාර්තමේන්තුව

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 2,13,584

44 ஆம் தலைப்பு.—தேசிய சேமிப்பு இயக்கம்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 2,13,584

HEAD 44.—NATIONAL SAVINGS MOVEMENT

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 213,584*

"44 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 2,13,584 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

44 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"44 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், ரூபா 2,13,584 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

44 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 213,584 for Head 44, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 44, Vote 1, ordered to stand part of the Schedule.*

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 74,865

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 74,865

*Vote No. 2.—Administration Charges—Recurrent expenditure, Rs. 74,865*

"44 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 74,865 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

44 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"44 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 74,865 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

44 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 74,865 for Head 44, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 44, Vote 2, ordered to stand part of the Schedule.*

45 වන ශීර්ෂය.—වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලය

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 3,14,705

45 ஆம் தலைப்பு.—விதவை அநாதைகள் உபகாரச் சம்பள அலுவலகம்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 3,14,705

HEAD 45.—WIDOWS' AND ORPHANS' PENSION OFFICE

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 314,705*

"45 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 3,14,705 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

45 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"45 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், ரூபா 3,14,705 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

45 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 314,705 for Head 45, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 45, Vote 1, ordered to stand part of the Schedule.*

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 19,295

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 19,295

*Vote No. 2.—Administration Charges—Recurrent expenditure, Rs. 19,295*

"45 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 19,295 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

45 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"45 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 19,295 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

45 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*Question, "That the sum of Rs. 19,295 for Head 45, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 45, Vote 2, ordered to stand part of the Schedule.*

### 46 වන ශීර්ෂය.—ඒකාබද්ධ සේවා

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩි නඩි සහ අනිකුත් දීමනා, රු. 3,75,500**

*46 ஆம் தலைப்பு.—இணைத்த சேவைகள்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 3,75,500

HEAD 46.—COMBINED SERVICES

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 375,500*

**"46 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 3,75,500 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**46 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"46 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், ரூபா 3,75,500 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

46 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 375,500 for Head 46, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 46, Vote 1, ordered to stand part of the Schedule.*

### 47 වන ශීර්ෂය.—විවිධ සේවා

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම රු. 6,03,11,020**

**අළුත් 33 වන උප ශීර්ෂය.—ආණ්ඩුවේ සේවකයන්ට හා පළාත් පාලන සේවකයන්ටත්, ආණ්ඩුවේ හා පළාත් පාලන සේවයේ විශ්‍රාමිකයන්ටත් (වැන්දඹුවන් ඇතුළුව) අන්තර දීමනා ගෙවීම, රු. 6,00,00,000**

*47 ஆம் தலைப்பு.—பலவினமான சேவைகள்*

வாக்குப்பணம், இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 6,03,11,020

புதிய உபதலைப்பு 33.—அரசாங்க சேவையினர், உள்ளூராட்சி ஊழியர், அரசாங்க, உள்ளூராட்சி இளைப்பாற்றுச் சம்பளக்காரர் (விதவைகள் உட்பட) ஆகியோருக்கு இடைக்காலப் படிகள் வழங்கல், ரூபா 6,00,00,000

HEAD 47.—MISCELLANEOUS SERVICES

*Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 60,311,020*

*New Sub-head 33.—Payment of Interim Allowance to Public Servants, Local Government Service employees and Government and Local Government Service Pensioners (including Widows), Rs. 60,000,000*

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය.**

*தீர்மானிக்கப்பட்டது :*

*Resolved :*

"That the Vote be increased by Rs. 60,000,000 in respect of new Sub-head 33, "Payment of Interim Allowance to Public Servants, Local Government Service employees and Government and Local Government Service Pensioners (including widows)".—[ගරු වන්නිනායක]

**"47 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 12,03,11,020 ක වැඩි කරන ලද මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**47 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය, සංශෝධිතාකාරයෙන්, උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

"47 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அதிகரிக்கப்பட்ட ரூபா 12,03,11,020 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

47 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம், திருத்தப்பட்டவாறு அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the increased sum of Rs. 120,311,020 for Head 47, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 47, Vote 2, as amended, ordered to stand part of the Schedule.*

**4 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම, රු. 6,10,000**

வாக்குப்பணம் இல. 4.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 6,10,000

*Vote No. 4.—Services provided by the Department—Recurrent Expenditure, Rs. 610,000*

**"47 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය සඳහා රු. 6,10,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

47 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 47 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் ரூபா 6,10,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

47 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, " That the sum of Rs. 610,000 for Head 47, Vote No. 4, be inserted in the Schedule ", put, and agreed to.*

*Head 47, Vote 4, ordered to stand part of the Schedule.*

5 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම, රු. 1,50,00,010

வாக்குப்பணம் இல. 5.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—ஆக்கப்பொருட் செலவு, 1,50,00,010

*Vote No. 5.—Services provided by the Department—Capital Expenditure, Rs. 15,000,010*

" 47 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය සඳහා රු. 1,50,00,010 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

47 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 47 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் ரூபா 1,50,00,010 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

47 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, " That the sum of Rs. 15,000,010 for Head 47, Vote No. 5, be inserted in the Schedule ", put, and agreed to.*

*. Head 47, Vote 5, ordered to stand part of the Schedule.*

6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම, රු. 5,000

வாக்குப்பணம் இல. 6.—பொருளாதார அபிவிருத்தி, —மீண்டுவருஞ் செலவு, ரூபா 5,000

*Vote No. 6.—Economic Development—Recurrent Expenditure, Rs. 5,000*

" 47 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 5,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

47 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" 47 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் ரூபா 5,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

47 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, " That the sum of Rs. 5,000 for Head 47, Vote No. 6, be inserted in the Schedule ", put, and agreed to.*

*Head 47, Vote 6, ordered to stand part of the Schedule.*

7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 51,69,000

வாக்குப்பணம், இல. 7.—பொருளாதார அபிவிருத்தி —ஆக்கப்பொருட் செலவு, ரூபா 51,69,000

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 5,169,000*

" 47 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 51,69,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

47 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" 47 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் ரூபா 51,69,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

47 ஆம் தலைப்பு, 7 ஆம் வாகுப்பணம் பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, " That the sum of Rs. 5,169,000 for Head 47, Vote No. 7, be inserted in the Schedule ", put, and agreed to.*

*Head 47, Vote 7, ordered to stand part of the Schedule.*

ආචාර්ය එන්. එම්. පෙරේරා

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

One moment, Sir. What about Heads 48 and 49 ?

ගරු වන්නිනායක

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

Provision made by special law.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Apparently, in the Appropriation Bill there is no provision for Heads 48 and 49, although in the Schedule there is.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

Do you not think that it is a matter for the Minister?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Special laws cannot provide for personal emoluments. There is provision here for personal emoluments, cadres and salaries, cost of living and other allowances. I do not see how a special law can provide for all these. If you look up the Appropriation Bill you will see that there is no provision for Heads 48 and 49.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

That is the usual practice.

**50 වන ශීර්ෂය.—රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩි නඩි සහ අනිකුත් දීමනා, රු. 5,94,737**

*50 ஆம் தலைப்பு.—அரசகரும மொழித் திணைக்களம்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 5,94,737

HEAD 50.—OFFICIAL LANGUAGE DEPARTMENT

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 594,737*

"50 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 5,94,737ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

50 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"50 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், ரூபா 5,94,737 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

50 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப்பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 594,737 for Head 50, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 50, Vote 1, ordered to stand part of the Schedule.*

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 13,750**

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 13,750

*Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 13,750*

"50 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 13,750 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

50 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"50 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 13,750 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

50 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 13,750 for Head 50, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 50, Vote 2, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**55 වන ශීර්ෂය.—ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල අමාත්‍යවරයා**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 5,57,534**

*55 ஆம் தலைப்பு.—காணி, நீர்ப்பாசன, மின் விசை அமைச்சர்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும் ரூபா 5,57,534

HEAD 55.—MINISTER OF LAND, IRRIGATION AND POWER

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 557,534*

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ** (අකුරැස්ස)

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குரஸ்ஸ)*

(Dr. S. A. Wickremasinghe—Akuressa)

I move,

"That the Vote be reduced by Rs. 10."

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැදගත් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ සාකච්ඡාව ආරම්භ කිරීමේ කාර්යය මට පවරා තිබීම සම්බන්ධව මා පළමුවෙන්ම මගේ කෘතඥතාව ප්‍රකාශ කරනවා. ඉඩම් වාරිමාර්ග සහ විදුලි බල අමාත්‍යාංශය භාරව මේ ඇමතිතුමා දැන් අවුරුදු දහයක පමණ කාලයක සිට නොකඩවාම කටයුතු කරගෙන යනවා. නමුත් එන්න එන්නම ඉඩම් සංවර්ධනය කිරීමේ ප්‍රශ්නය, ආහාරයෙන් රට ස්වයංපෝෂිත කිරීමේ ප්‍රශ්නය උග්‍ර වන බවයි අපට පෙනෙන්නෙ. ප්‍රශ්නය විසඳෙන තත්ත්වයක් තවම පෙනෙන්නට නැහැ. එම නිසා මේ සාකච්ඡාවේදී අප ඉදිරිපත් කරන විවේචනාත්මක තර්ක පිළිබඳව වැරදි අවබෝධයක් ඇති කර ගන්නට වුවමනා නැහැ. ආහාරයෙන් ස්වයංපෝෂිත කිරීම සම්බන්ධව, ඉඩම් සංවර්ධනය කිරීම සම්බන්ධව විරුද්ධ පක්ෂය කඩාකප්පල්කාරී අදහසින් අවහිර කම්, විරුද්ධකම් කරනවාය කියා වැරදි අවබෝධයක් ඇති කර ගන්නට වුවමනා නැහැ. ඉඩම් ඇමතිතුමා පසුගිය ආණ්ඩුවේ ඉඩම් ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේදීත් එතුමා ගෙන ගිය ව්‍යාපාර සම්බන්ධවත් එතුමාගේ ප්‍රතිපත්ති සම්බන්ධවත් අපේ තදබල විරුද්ධත්වය නිතරම, හැම අවුරුද්දකම පෙන්වූ බව තමුන්නාන්සේ දන්නවා ඇති.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1931 සිට 1951 දක්වා ඉඩම් සංවර්ධනය කිරීමත් වාරිමාර්ග කටයුතුත් භාරව කටයුතු කළේ ඩී. එස්. සේනානායක මහත්මයායි. ඉන් පසු එතුමාගේ පුත්‍රයා වන වර්තමාන අගමැතිතුමාට ඒ අංශය පැවරුණා. වර්තමාන අගමැතිතුමාත් තම පියා වන ඩී. එස්. සේනානායක මහතා අනුගමනය කළ ප්‍රතිපත්තිම අනුගමනය කළා. එදා සිටම ඒ මූලික ප්‍රතිපත්ති සම්බන්ධව අපේ විරුද්ධතාව නොකඩවාම ප්‍රකාශ කරගෙන ආවා.

**ගරු සී. පී. ද සිල්වා** (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)

*(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

මගේ පෞද්ගලික ප්‍රතිපත්ති නොවෙයි.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*

(Dr. S. A. Wickremasinghe)

"මගේ ප්‍රතිපත්ති ඩී. එස්. සේනානායක මහතාගේ ප්‍රතිපත්තියි" කියා තමුන්නාන්සේ කීප වතාවක්ම ප්‍රකාශ කර තිබෙනවා. එය එසේ නොවෙයි නම් මා සතුටු වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

These are not my private policies.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වාරිමාර්ග පහසුකම් පිළිබඳව එතරම් සැලකිල්ලක් නොදක්වන තෙත් කලාපය පිළිබඳව, අප ජීවත් වන තෙත් කලාපය පිළිබඳව, මා පළමුවෙන් කරුණු ස්වල්පයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. තෙත් කලාපයේ වාරිමාර්ග කටයුතු සම්බන්ධවත්, ආහාර වගා කිරීමේ ප්‍රශ්නය සම්බන්ධවත්, ඉඩම් සංවර්ධනය කිරීම සම්බන්ධවත් මේ දක්වා එතරම් සැලකිල්ලක් දක්වා නැහැ. මේ ආණ්ඩුවෙන් පමණක් නොවෙයි, මීට පෙර තිබුණු ආණ්ඩුවලිනුත් එතරම් සැලකිල්ලක් දක්වා නැහැ. එදා සිටම මේ තත්ත්වය පවතිනවා. එම නිසා පළමුවෙන් තෙත් කලාපය සම්බන්ධව මා කරුණු ස්වල්පයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තෙත් කලාපය ලංකාවෙන් තුනෙන් පංගුවක ප්‍රදේශයක්. ඒ වාගේම ලංකාවේ ජනගහනයෙන් හතරෙන් තුන් පංගුවක් වාසය කරන්නේත් තෙත් කලාපයේයි. එම නිසා මේ ප්‍රදේශයේ අවශ්‍යතාවන් සම්බන්ධව විශේෂ සැලකිල්ලක් දක්වා කටයුතු කරන්නට ඕනෑ. ප්‍රධාන වශයෙන්ම මේ ප්‍රදේශවලට තිබෙන දුෂ්කරතා මොනවාද කියා අපි බලමු. ජලය වැඩිකම නිසා ජල ගැල්මෙන් ඉඩම් විනාශ වීමේ ප්‍රශ්නය තමයි මූලික වශයෙන් බල පාන්නෙ. ඊළඟට, අධික වර්ෂාපතනය නිසා, තෙත් කලාපයේ ජලය බැස්වීමට මාර්ග නොමැති නිසා, සරුසාර කුඹුරු ඉඩම් අක්කර ලක්ෂ ගණන් මඩ වගුරු බවට පත් වීමේ ප්‍රශ්නය තිබෙනවා. ඊළඟට, තෙත් කලාපයේ මැද කොටසට නියම කාලයට ජලාශවලිනුත් කුඩා වැව්වලිනුත් ජලය ලබා ගන්නට බැරි කම නිසා ගොවිතැන් කරන්නට නුපුළුවන් වී තිබෙනවා.

වෙනත් ප්‍රදේශවල වතුර නැතිකමින් වගා කළ හැකි නොවුණත් ගම් ප්‍රදේශවල වතුරු වැඩි කම නිසා ගොවිතැන පාළු වෙනව, වගා කරන්න බැරි වී යනවා. ජනගහනයෙන් හතරෙන් තුනක් පමණ ජීවත්වන මෙම ප්‍රදේශවල ගොවිතැන පමණක් නොවෙයි, පාළු වී යන්නේ, කොළඹ සිට අවිස්සාවේල්ල මාර්ගයේ, ගංගා නිම්නයේ ජීවත්වන ජනතාව හොඳින්ම දන්නව, කැළණි ගඟ ගලා ඒම නිසා ගංගා නිම්නයේ පිහිටුවා ඇති කර්මාන්ත රාශියකටම බරපතල හානි සිදු වන බව. මේ අන්දමට ගංගා නිම්නයේ ආහාර වගාව පාළු වෙනවා පමණක් නොවෙයි, කර්මාන්තවල නියුක්ත අයවලුන්ටත් වර්ෂයක් පාසා විශාල පාඩුවකට මුහුණ දෙන්න වෙනවා. මෙය තෙත් කලාපයේ සිදු වන දෙයක්. මේ සම්බන්ධයෙන් හිත් යොමු කරන අපට පැහැදිලිව පෙනී යන කාරණය නම්, මෙතෙක් කල් වැරදි ප්‍රතිපත්තියක් ගෙන යාම නිසා මෙම විනාශය වළක්වා ගන්නට බැරි වී ඇති බවයි. කලින් තිබුණු ආණ්ඩුව කළ නිසා අපත් කරනවාය කියන තර්කය හැම දෙයකටම ඉදිරිපත් කළොත් ජාතියක් වශයෙන් අපට කවදාවත් දියුණු වන්න බැහැ. එමනිසා, 1931 කාලයේ සිටම අප අනුගමනය කරගෙන ආ ප්‍රතිපත්තිය වෙනස් කර නවීන විද්‍යාව උපයෝගි කොට ගෙන වර්ෂයක් පාසා සිදුවන මේ හානිය වළක්වා ගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් යෙදිය යුතු බව විශෙෂයෙන්ම මතක් කර දෙන්න කැමතියි. එවැනි ක්‍රමවත් වැඩ පිළිවෙළකින් පමණයි, මෙම ජලරකුසා මර්ධනය කර ගැනීමට හැකි වෙන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

නිල්වලා ගඟ පරීක්ෂා කරගෙන යනවා.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

නිල්වලා ගඟ, ගිංගඟ, කළු ගඟ ආදී ගංගාවලින් සිදුවන ජලගැල්ම වැළැක්වීමටත් ගංගා නිම්නයන් දියුණු කිරීමටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම ගංගාවලින් ජලවිදුලි බලය ලබාගැනීම වත් ක්‍රම සකස් කිරීම සඳහා, එම ගංගා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට විශෙෂඥයින්ට කොන්ත්‍රාත් දීම සඳහා, මේ අවුරුද්දෙ අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කිරීම ගැන මා කෘතඥ වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

බෙන්තර ගඟ අපේ ඉංජිනේරු මහත්වරුන් කරනවා.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

මේ අවුරුද්දේදී වී ගොවිතැන ඉතා සශ්‍රික වී, වැඩි අස්වැන්නක් ලැබුණේ මාතර දිස්ත්‍රික්කයෙන්. අක්කරයකට බුසල් 40 කට වැඩි ප්‍රමාණයක් ලැබී ඇති බව නිලධාරීන්ගෙන් අපට දැනගන්න ලැබුණා. එය විශ්වාස කරන්න පුළුවන් ආරංචියක් බව මාත් පිළිගන්නවා. එයට හේතුව මේ අවුරුද්දේදී බලාපොරොත්තු නොවුණු නියඟයක් ඇති වීමයි. වර්ෂාව අඩුවීම නිසා, ජලගැල්මෙන් ඇති වන හානිය මෙවර ඇති වුණේ නැහැ. හක්මන ප්‍රදේශයේ පමණක් අක්කර තුන් දහසක් පමණ වගා කරන්න බැරි වුණත්, වගුරු බිම් හැටියට පරිවර්තනය වී තිබුණු, වගා කරන්න නොහැකි අක්කර පනස් දහසක් පමණ වගා කරන්න හැකි වුණා. ඒ අනුව වෙනත් අවස්ථාවලදී වගා කරන්න බැරි ගංගා නිම්නවල මෙවර වගා කිරීමට හැකි වූ නිසා සරු අස්වැන්නක් ලැබේයයි විශ්වාස කරන්න පුළුවනි. මේ විධියට සලකන විට, ඉඩෝරය නිසා, නියඟය නිසා වෙනත් ප්‍රදේශවල ගොවිතැන කර ගන්න නොලැබුණත්, වතුර නැති කමින් පාලු වුණත්, මේ ප්‍රදේශවල ජනතාවට සහනයක් සැලසුණා. ලංකාවේ එක් ප්‍රදේශයක් වතුර හිඟය නිසා හානියට පත් වන අතර තවත් ප්‍රදේශයක් ජලගැල්ම නිසා හානියට පත් වෙනවා. නවීන විද්‍යාව අතින් අද ලෝකය විශාල දියුණුවක් ලබා සිටින නිසා තව දුරටත් ස්වභාව ධර්මයේ බලවේගයන්ට ගොදුරු වී කරදරයට, හිරිහැරයට පත් වන්නට වුවමනාවක් නැහැ. යම් ප්‍රදේශයකට වුවමනා ප්‍රමාණයට වඩා ජලය තිබෙනවා නම්, ඒ වගේම තවත් ප්‍රදේශයකට වුවමනා තරම් ජලය නැත්නම්, ජලය වැඩිපුර තිබෙන ප්‍රදේශයෙන් අනෙක් ප්‍රදේශයට වතුර හරවන්නට පුළුවන්කමක් නවීන විද්‍යාව අනුව තිබෙනවා. නවීන විද්‍යාව නිසි අන්දමට යොදා ගත්තොත් තෙත් කලාපයත් වියලි කලාපයත් එක විධියට දියුණු කර ගන්නට පුළුවනි.

අ. භා. 3.15

ලංකාවේ තෙත් කලාපයේ විශාලම ගොවිපළ තිබෙන්නේ මාතර දිස්ත්‍රික්කයේ. තෙත් කලාපයට අයත් අනෙක් කිසිම පළාතක අක්කර තිස්දහසක ගොවිපළක් නැහැ. ඒ කොයි හැටි වෙතත් තවම මාතර දිස්ත්‍රික්කයට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යාලයක් නැහැ. ගාල්ලේ නම් කාර්යාලයකුත් තිබෙනවා; ඒ කාර්යාලයේ ඉංජිනේරු මහත්මයෙකුත්, උප ඉංජිනේරු මහත්මයෙකුත්, තවත් නිලධාරීන් දහ දෙනෙකුත් ඉන්නවා. මාතර දිස්ත්‍රික්කයටම ඉන්නේ ටෙක්නිකල් ඇසිස්ටන්ට් කෙනෙක් පමණයි. ඒ නිසා වුවමනාවක් වුණොත් එක්කෝ අපට ගාල්ලට යන්නට සිදු වෙනවා; එහෙම නැත්නම් හම්බන්තොටට යන්නට සිදු වෙනවා. විශාලම කුඹුරු ප්‍රමාණය තිබෙන්නේත් මාතර දිස්ත්‍රික්කයේ වුණත් මාතරට දක්විය යුතු සැලකිල්ල දක්වන බවක් පෙනෙන්නේ නැහැ.

ලබන මාසයේදී මාතර නගරය තුළ පළමුවැනි වරට ශාඛා කාර්යාලයයක් විවෘත කරන්නට යන බව දිසාපතිතුමාගෙන් මට දැනගන්නට ලැබුණා. මෙපමණ කාලයක් මාතර ජනතාව කෙරෙහි ගරු ඇමතිතුමා නොසැලකිල්ලෙන් කටයුතු කළාය යනුවෙන් කෙරෙන චෝදනාවෙන් සම්පූර්ණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

යෙන්ම නිදහස් වනු පිණිස ගරු ඇමතිතුමා මේ පොරොන්දුව ඒ හැටියටම ඉටු කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

නිල්වලාගඟ ක්‍රමය පිළිබඳව සකස් කරන ලද වාර්තාව නොබෝ දිනකින් මුද්‍රණය කරන්නට දැන් කටයුතු කරගෙන යනවා. මෙය පටන් ගන්නට බලාපොරොත්තු වෙනවා. රිපෝර්තුව අනුමත කරන අදහසයි තිබෙන්නේ.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

පසුගිය දා වාරිමාර්ග මධ්‍යස්ථානයට මා ගිය අවස්ථාවේ එහි පර්යේෂණ කටයුතු කරන නිලධාරීන් දෙදෙනකු සමග සාකච්ඡාවක් කරන්නට මට ඉඩ ලැබුණා. නිල්වලාගඟ සම්බන්ධ පර්යේෂණ කටයුතු ගැන සාකච්ඡා කරද්දී එක් නිලධාරියෙක් කථා කළේ බොහොම බයෙනුයි. ඔහුට දවස් කිහිපයකට පෙර කෙනකු තර්ජනය කර තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ උදවිය යම් යම් ප්‍රචාරයන් කරගෙන යනවාලු. මේ රට විනාශ කරන්නට පැමිණ සිටින පුද්ගලයන් හැටියට හඳුන්වනවාලු, මේ වැඩ කරන්නට පැමිණ සිටින්නන්. කොමියුනිස්ට් පක්ෂයේ මා දැන් අවුරුදු විස්සක් තිස්සේ ගෙන යන ව්‍යාපාරයක් නිසා මට එයින් වාසියක් වනු ඇතැයි කියා තිබෙනවා. මොරවක වතුරින් යට කරන්නට වැඩ පිළිවෙළක්ලු මෙයින් ක්‍රියාත්මක වන්නට යන්නේ යනුවෙන් කියා නිලධාරීන්ට තර්ජනය කර තිබෙනවා. නිලධාරීනුයි මෙහෙම කියන්නේ. නිලධාරීන් සමග යම්කිසි පිරිසක් කියා තිබෙනවා—එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ගිය පිරිසක් කියා තිබෙනවා—මෙය යම් යම් ප්‍රදේශ විනාශ කිරීමට කොමියුනිස්ට් පක්ෂයේ මා කරන වැඩක්ය යනුවෙන්. ඒ නිසා ඒ ගැන ඒ ප්‍රදේශයේ ජනතාවට නියම තත්ත්වය තේරුම් කර දීම ගරු ඇමතිතුමාගේ ඉතාම ලොකු යුතුකමකැයි මා කල්පනා කරනවා. කොමියුනිස්ට් පක්ෂයේ යම් උපක්‍රමයකට ගොදුරු වී නොව රට සංවර්ධනය සඳහා ආණ්ඩුවෙන් මේ වැඩ කරගෙන යන බව පැහැදිලි කර දිය යුතුයි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඔය තර්ජන විශ්වාස කරන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමා දැන් අවුරුදු තිස්පහක් තිස්සේ තමන්ගේ දේශපාලන ව්‍යාපාරය ගෙන ගිය නමුත් රට විනාශ කළේ නැහැ. ඒ නිසා ඉදිරි කාලයේදීත් රට විනාශ කරන්නේ නැහැ.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

විශේෂඥයන්ට තර්ජනය කළ බවයි මා කියන්නේ. මේ අය විදේශීය විශේෂඥයින් නිසා එවැන්නකට ඉඩ තබන්නට හොඳ නැහැ. මා සමග කීවේ වැඩ කිරීමට තිබෙන අපහසුව ගැනයි. ඒ උදවියගේ ගම් යට කරන්නට යනවායයි ගැමියන් අතර ප්‍රචාරයක් කරගෙන යනවා. ගම් මතින්නේ ඒ සඳහා බවත් ප්‍රචාරය කරනවා. මෙය දැන් සම්පූර්ණයෙන්ම මට විරුද්ධ දේශපාලන ආයුධයක් කරගෙන අපට දොස් කියනවා. එය වැරදි දෙයක්. ආණ්ඩුවේ ආහාර නිෂ්පාදන ව්‍යාපාරයේදීත් අප සහයෝගය දෙනවා මිස හිරිහැර කරන්නේ නැහැ. අප කඩාකප්පල් කරන්නේ නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඔය වැඩ ටික කරගෙන යාමට ඔබතුමාගේ සම්පූර්ණ සහයෝගය මා බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු ඇමතිතුමා කළ ඒ ප්‍රකාශය අනුව මින් ඉදිරියට යම් යම් පුද්ගලයන් පටු දේශපාලන අදහස් උඩ ඒ ප්‍රදේශයේ ගෙන යන වැඩවලින් තමන්ගේ කටයුතු කරගෙන යාමට විශේෂඥයන්ට කරදර යක් නොවන තැනට වග බලාගනු ඇතැයි මා විශ්වාස කරනවා. මේ තර්ජනය කිරීම ගරු ඇමතිතුමා විසින් කරන වැඩක් නො වෙයි. එවැනි යෝජනා ක්‍රමවලින් රටට යහ පතක් වන්නේ නැත කියා සිතන අතරම එමගින් දේශපාලන වාසියකුත් ලබාගන් නට පුළුවන් යයි පටු ලෙස කල්පනා කරන අය මහජනයා නොමග යැවෙන අන්දමින් නිලධාරීන්ට තර්ජනය කරන නිසයි මා මෙය මතක් කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාතර දිස්ත්‍රික්කයේ කිරලකැලේ කියන ප්‍රදේ ශයේ ගොවිතැන් කිරීමට යොදගත හැකි ඉඩම් අක්කර 5,000ක් පමණ තිබෙනවා. හල්ලල-කොක්මාදුව අක්කර 4,000 ක් පමණ තිබෙනවා. කඩවැද්දුව අක්කර 4,000ක් පමණ තිබෙනවා. ඔය අන්දමට ගොවිතැන් කිරීම සඳහා යොදගත හැකි අක්කර 16,000ක් පමණ වූ බිම් ප්‍රමාණයක් වතුර බැස්සවීමට නොහැකි කම නිසා අද වතුර වළවල් බවට පත් වී තිබෙනවා. පැරණි ඇළවල් ගොඩ වීම නිසා ඒවායේ තිබෙන වතුර මුහුදට බස්සවන්නට ක්‍රම යක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කිරලකැලේ සඳහා මුදල් වෙන්කර තිබෙනවා. 60 වැනි ශීර්ෂයේ 7 වැනි සම් මතයේ 56 වැනි උප ශීර්ෂය බලන්න.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මෙවර මුදලක් වෙන් කර තිබෙන එක ඇත්ත. මම පසුව ඒ ගැන කථා කරන්නම්. ජලගැලීම් නැවැත්වීම සඳහා පර්යේෂණ පවත්වා ගඟ ඉහත්තාවේ ජලාස ඇති කර විදුලි බල යෝජනා ක්‍රම ඇති කිරීමෙන් පාතකඩ ජලය බැස්සවීමට නොහැකි වීමේ ප්‍රශ්නය විසඳීමටත් උපකාරී වෙනවා. ඒ නිසා ඒවායේ මූලික කටයුතු කරගෙන යෑම ගැන ගරු ඇමතිතුමාට කෘතඥ වෙමිනුයි මා මේ කථා කරන්නේ. කඳුකර ප්‍රදේශයේ ගොවිතැන් කළ හැකි ප්‍රදේශ තිබෙන්නේ ටිකයි. එමෙන්ම පාතකඩ ප්‍රදේශවලත් ගොවිතැන් කිරීම අමාරුයි. ගොවිතැන් කිරී මට සුදුසු මේ දෙකට අතර තිබෙන ප්‍රදේශ යයි. එහෙත් ඒවායේ තිබෙන ප්‍රශ්න විසඳී මට කටයුතු කෙරෙන්නේ නැහැ. ඒ ප්‍රදේ ශයේ තිබෙන ප්‍රශ්නය අවශ්‍ය වේලාවට වතුර නැති වීමත් අනවශ්‍ය අවස්ථාවලදී ජලය ලැබී කුඹුරු පාළුවීමත් බව කියන්නට ඕනෑ. වැව් බැඳ වාරිමාර්ග ක්‍රමවලින් වතුර ලබාගැනීමේ ක්‍රමයක් ඒ ප්‍රදේශවල නැහැ. ඒවායේ තිබෙන්නේ අමුණු බැඳ වතුර ලබා ගැනීමේ ක්‍රමයයි. අමුණු බැඳ වතුර පිර වූ පසු කුඹුරුවලට ගිල්ම ගහනවා. ඊට සතියකට පමණ පසුව අමුණ අරිනවා. ඒ නිසා අර ටික කාලය තුළදී කුඹුරුවල වැඩ කරගැනීමට සිදු වෙනවා. ඒ නිසා කුඹුරු හුඟක් තිබෙන මැද ප්‍රදේශයේ ගොවීන්ට ගොවිතැන් කර ගැනීමට වතුර ලැබෙන කාලය මදි වෙනවා. මාතර, කළුතර, කොළඹ මීගමුව ආදී දිස්ත්‍රික්කවලට සිදු වන්නේ ඒකයි. මැද ප්‍රදේශවල කුඹුරුවලින් හරියට අස්වැන්නක් ලබාගැනීමට නම් පුරන් කොටන දිනයේ සිට වපුරන දිනය දක්වාම —ඒ කියන්නේ මාසයක පමණ කාලයක් —වතුර තිබෙන්ට ඕනෑ. එසේ වතුර තිබු ණොත් පිඩෙලි දිරා ගොස්, කොළ රොඩු දිරාගොස්, ඉපනැල්ල දිරාගොස්, ඒ කුඹුරු වල ස්වාභාවික පෝර ඇති වී වගා කරන්න වගා කරන්න සරු සාරකම වැඩි වෙනවා. එහෙම වුණොත් රටපෝර යොදන්න ඕනැත් නැහැ. ඒ කාර්යය සිදුවීමට නම් අමුණු බැඳීමේ ක්‍රමය නැති කර වැව්වලින් වාරිමාර්ග ක්‍රමයට වතුර ගැනීමේ වැඩ පිළි වෙළක් ඇති වන්නට ඕනෑ. ඒ සඳහා ගංගා ඉහත්තාවේ ජලාස ඇති කර ඒවායින් කුඩා වැව්වලට වතුර ලබාගෙන වාරිමාර්ග ක්‍රම වලින් වතුර බෙදහරින්නට ඕනෑ. එමෙන් ම ඒ මගින් ජල විදුලි බලය ඇති කර ගන් නත් පුළුවන්. මේ අවස්ථාව ගංගා ඉහත් තාවේ ජලාස ඇති කිරීම සඳහා විශේෂඥ උපදෙස් අනුව වැඩ ආරම්භ කර ඇති අවස්ථාවක්. ඒ ජලාස ඇතිවූවාට පසුව වුව මනා වෙලාවට කුඹුරුවලට වතුර ලබාගැනී මේ පහසුකම් සැලසුණොත් දැනට අක්කර


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

යකින් වී බුසල් 40ක් ලබනවා නම් එවැනි ක්‍රමයක් ඇති වුණොට පසුව ඒ අස්වැන්න ප්‍රමාණය බුසල් 80 දක්වා නංවා ගන්නට පුළුවන් කම ඇති ඉඩම් තිබෙන බව මතක් කරන්නට ඕනෑ. විශාල වශයෙන් වර්ෂාවෙන් ලැබෙන වතුර පවා පාලනය කර ගන්නට පුළුවන් වන අන්දමේ වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි. දැන් කෙරෙන පිළිවෙළ අනුව දවස් 10 ක් ඇතුළත කුඹුර පුරන් කොටා මඩ කරලත් අවසාන වන්නට ඕනෑ. දවස් 20 ක් ගත වුණොත් කුඹුර ඇරෙනවා. ඒ විධියට කඩි මුඩියේ ගොවිතැන් කිරීමෙන් හොඳ අස්වැන්නක් ලබා ගන්නට බැහැ. අවුරුදු දහස් ගණනක් තිස්සේ අපේ ගොවීන් ලැබූ පළපුරුද්ද අනුව කුඹුරෙන් හොඳ අස්වැන්නක් ලබන්නට නම් පුරන් කෙටුවා සින් පසු තණකොළ ආදිය හොඳහැටි කුඹුරෙහි දිරන්නට ඕනෑ. කුඹුර මඩ කර වපුරන්නට සකස් කරන්නේ ඊට පසුවයි. නවීන විද්‍යාවත් ප්‍රයෝජනයට ගෙන මේ පිළිවෙල ක්‍රියාත්මක කරන්නට ඕනෑ. විශාල ජලාශ මෙන්ම කුඩා ජලාශත් ඇති කොට ඒවායින් වුවමනා වේලාවට වතුර ලබා ගන්නට පහසු මාර්ග ඇති කරන්නට ඕනෑ. නවීන ක්‍රම අනුව ඒවායින් වතුර ලබා ගන්නට කොන්ක්‍රීට් පයිප්ප පවා යොදන්නට පුළුවනි. ඒ මගින් කඳු පවා හිල්කර ජල මාර්ග සකස් කර ගන්නට පුළුවනි. සෑම තැනටම ජලය නිසියාකාර බෙදී යාම සඳහා වාරිමාර්ග ක්‍රම අද වියළි කලාපයට පමණක් නොව තෙත් කලාපයටත් ඉතාමත් අවශ්‍යයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඔය ගැන කටයුතු කරන්නට ලෝක බැංකුවේ විශෙෂඥයින් කණ්ඩායමක් ලබන සතියේ ලංකාවට එනවා.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

තමුන්නාන්සේට වදින්නම්, ඔය ලෝක බැංකුව අත හරින්න. මේ රටේ හොඳ ජල විදුලි බලයක් නිපදවන්නට පුළුවන් කම තිබෙන බව අද වනතුරු ඔය ලෝක බැංකුව ප්‍රකාශ කර නැහැ. එය ප්‍රකාශ කළ අයගේ ප්‍රකාශ පවා යට කර තිබෙනවා. පයිෆ්පර් නමැති විශෙෂඥයා මේ ගැන ප්‍රකාශ පිට ප්‍රකාශ කළා. ඒවා තමුන්නාන්සේ දැක්කේවත් ඒවා ගැන කිසිවක් දන්නේවත් නැති බව තමුන්නාන්සේ පසුගිය ආණ්ඩුවේ ඉඩම් ඇමති වශයෙන් සිටියදී කිව්වා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

තවමත් මට ඒවා "ඕෆිෂියලි" ලැබුණේ නැහැ.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මහවැලි ගඟ යෝජනා ක්‍රමය සම්බන්ධව පයිෆ්පර් නමැති විශෙෂඥයා කුඩා පොතක් පළ කර තිබෙනවා. ඒ හැර තවත් විශාල වාර්තා තිබෙනවා. දෙපාර්තමේන්තුවටත් ඒවා ලැබී තිබෙනවා. එහෙත්, ඒවායෙහි තිබෙන කරුණුවලට ලෝක බැංකුව විරුද්ධයි. ලෝක බැංකුවට වුවමනා කරන්නේ කලුතෙල්වලින් දුවවන "තර්මල් ප්ලාන්ට්". එම නිසා, ලෝක බැංකුව යනු කුමක්ද යන වග අදවත් ගරු ඇමතිතුමා දැනගන්න. මහවැලි ගඟ ව්‍යාපාරයේ කට යුතු සඳහා පැමිණ සිටින එක්සත් ජාතීන් ගේ මණ්ඩලයේ විශෙෂඥයන්, එම ව්‍යාපාරයෙහි යෙදෙන ගමන්ම, මේ රටේ ජල විදුලි බලය ලබා ගැනීමට ඉතාමත් හොඳ සාධකයන් තිබෙන බව ප්‍රකාශ කර තිබෙනවා. ලංකාවේ ස්වාභාවික ධන නිධානයන් දුප්පත් වුවත් ප්‍රධාන වශයෙන් ජල විදුලි බලය නිපදවිය හැකි විශාල වස්තුවක් මේ රටේ තිබෙන බව ඒ උදවිය කියා තිබෙනවා. එහෙත්, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව තිබුණු කාලයේදී ලෝක බැංකු වාර්තාවල කියා තිබෙන්නේ මොනවාදැයි ගරු ඇමතිතුමා සෝදිසි කර බලන්න. මේ රටේ ජල විදුලි බලය ප්‍රයෝජනයට ගත හැක්කේ ඉතා සුළු වශයෙන් බවත් කළුතෙල් වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගත යුතු බවත් ඔවුන් කියා තිබෙනවා. එහෙත්, මහවැලි ගඟ යෝජනා ක්‍රමයේ කටයුතු කරන එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශෙෂඥයින් කියන්නේ ඒ ව්‍යාපා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රයෙන් පමණක් මැගවොට් 900 ක ජල විදුලි බලයක් නිපදවන්නට පුළුවන් බවයි. එම නිසා ලෝක බැංකුව ගැන විශ්වාසය තබා කටයුතු කරන්නට එපා.

අපේ රටේ ඉඩම් සංවර්ධනය ගැනත් ලෝක බැංකුව යම් යම් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. එයිනුත් ටිකක් මම දැන් කියවන්නම්. 1966 ඔක්තෝබර මාසයේ පළ වුණු වාර්තාවක ලෝක බැංකු නිලධාරීන් මෙසේ කියා තිබෙනවා:

"THE FOREIGN EXCHANGE PROBLEM OF CEYLON

*International Bank for Reconstruction and Development—International Development Association*

*Domestic Agriculture*

The island's dry zone offers the only opportunity for enlarging the cultivated area on a large scale. The traditional approach to the utilization of this potential has been irrigation works and colonization, based on paddy, but achievements have been commensurate neither with the substantial investments nor with Ceylon's needs for expanding output and employment."

අ. භා. 3.30

ලෝක බැංකුව තමුන්නාන්සේට ඉතා මත්ම නරක සහතිකයක් දී තිබෙනවා. සම්පූර්ණයෙන්ම තමුන්නාන්සේගේ ප්‍රතිපත්තිය ප්‍රතික්ෂේප කර තිබෙනවා. ඒක මාත් පිළිගන්නවා. මට මතකයි 1934/35 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ඩී. එස්. සේනානායක මහතා ඔය කටයුතු කරන කාලයේ ඒ ප්‍රකාශයම මාත් කළ බව. එහෙත් අදත් තමුන්නාන්සේ ඒ ප්‍රතිපත්තියමයි ගෙන යන්නේ.

මා තවත් වැදගත් කොටස් කීපයක් කියවන්න කැමතියි. මේවා නම් මා මීට කලිනුත් කීප වතාවක් කියවා තිබෙනවා. එසේ කියවා ඇතත් ඒවා ගැන අසාගෙන සිටියේ නැති නිසා, කවුරුත් සෙව්වේ නැති නිසා, නැවතත් කියන්නට සිදු වීම ගැන සමාවෙන්න.

THE DEVELOPMENT PROGRAMME 1966-67

*Issued by the Ministry of Planning and Economic Affairs, Ceylon.*

"Fortunately the potential exists for such rapid growth in agriculture. In the case of the export crops, although world price prospects are poor, earnings could be strengthened by increases in output made possible by the evolution of new high yielding strains. For domestic agricultural crops, growth possibilities are large for two reasons—first, present levels of productivity reflect traditional techniques of production which are capable of being transformed by the introduction of more scientific methods and, second, new land is still available for extending the area of cultivation under irrigation."

වෙලාව ගත වන නිසා මා තැනින් තැනින් ඒ ඒ අවශ්‍ය කොටස් පමණයි කියවන්නේ.

"Programmes have been in existence in this field and encouraging results have already been obtained. What is needed over the next five years is a more concentrated and purposeful drive for raising output in this sector and an expansion and revision of programmes towards this end."

හොඳින් අහගෙන ඉන්න.

...."though agricultural objectives are often presented in terms of targets of output for the several domestic crops, the underlying process in this sector is virtually one of transforming, relatively rapidly, a low productivity subsistence peasant agriculture into a more modern high productivity system."

තමුන්නාන්සේලා කරන්නේ යම්තම් පණ ගැටගහගන්න පුළුවන් ආර්ථික ක්‍රමයක් හැදීමයි. එවැනි ක්‍රම අනුව මේ ජනපද ඇති කිරීමෙන් සිදු වන්නේ දුප්පතුන් බෝවීමයි.

"......the underlying process in this sector is virtually one of transforming, relatively rapidly, a low productivity subsistence peasant agriculture into a more modern high productivity system."

මේ කියන්නේ තමුන්නාන්සේලාගේ ක්‍රම සම්පාදක මණ්ඩලයෙන්.

"A complex of social, institutional, and technical factors are involved requiring policies and measures on a variety of fronts. The objective of creating a more viable and dynamic domestic agriculture is also of relevance to new lands made cultivable by irrigation."

අලුත් ක්‍රම ඕනෑය කියනවා. තමුන්නාන්සේලාගේ වාර්තාවේයි තිබෙන්නේ.

"It will admittedly be of limited value to transfer a low productivity agriculture from one part of the country to another through a costly process of constructing irrigation works, of land clearing, and so on."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

"But, the return to irrigation and land development which might be poor under this type of programme may be transformed if based on a better system of agriculture. The future development of agriculture in Ceylon need not continue to be based on one or the other of the two polarities which have hitherto been familiar—plantation agriculture and subsistence peasant farming. New prototypes need to be evolved which utilize modern scientific and technical knowledge whilst being suited at the same time to the land/labour ratio which is likely to prevail in agriculture at the present stage of development."

තමුන්නාන්සේලාගේම වාර්තාවෙනුයි මා කියන්නේ. තමුන්නාන්සේ උඩවලවේ ගැන කරන්න යන්නෙත් ඒකයි. චන්ද්‍රිකා වැවේ කරන්න යන්නෙත් ඒකයි. කරන්න එපාය කියන එකමයි තමුන්නාන්සේ කරන්නේ. තමුන්නාන්සේගේ ඉඩම් සංවර්ධන කොමසාරිස් වරයාගේ වාර්තාවෙන් මා ඒ ගැන කරුණු පෙන්වා දෙන විට තමුන්නාන්සේට තේරේවි. තමුන්නාන්සේගේ ක්‍රමය ප්‍රතික්ෂේප කරනවා නම් ඒ වෙනුවට එක්කෝ සමූහ ගොවිපළවල් ඇති වන්න ඕනෑ; එහෙම නැත්නම් රජයේ ගොවිපළවල් ඇති වන්න ඕනෑ. එහෙත් මේ වාර්තාවේ කියන හැටියට, තමුන්නාන්සේලා ක්‍රම ක්‍රමයෙන් හැඩගස්සාගෙන යන්නේ මොකක්ද? තමුන්නාන්සේලා අක්කර 50,000 ක් විශාල කොම්පැනිවලට දී තිබෙනවා. ඒ අනුව තමුන්නාන්සේලා කරන්නේ ඒ වැවිලි ක්‍රමය තහවුරු කිරීමයි. සමාජවාදී රටවල තිබෙන සමූහ ගොවිපළ ක්‍රමයට තමුන්නාන්සේලා දේශපාලන වශයෙන් විරුද්ධ නිසා, ධනපති ක්‍රමයට ඒ ක්‍රමය ගැළපෙන්නෙ නැති නිසා, තේ වතු පොල් වතු රබර් වතු තිබෙන ධනපති ක්‍රමයට පැළපෙන්නේ නැති නිසා තමුන්නාන්සේලා විරුද්ධයි. සමූහ ගොවිපළ ක්‍රමය ගැන නොකියා තමුන්නාන්සේලා කියන්නේ කුමක්ද? තමුන්නාන්සේලා දැන් අක්කර දහස් ගණනක් මුසාජීස්ලාට දී තිබෙනවා. එසේ දී දේශීය හා විදේශීය විශාල ධනවතුන්ට විශාල වශයෙන් ගරා ගන්න දෙමින් ඔවුන් ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙළක් තමුන්නාන්සේලා දැන් ගෙන යන බවයි මගේ නිගමනය. මගේ ඒ බය වුවමනා නැති බයක්ය කියා ඔප්පු වෙනවා නම් මා සතුටු වෙනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

කෘෂිකර්ම ඇමති අංශයෙන් ඔය ජනපද වලට කුඹුරු හාන්නට ට්‍රැක්ටර් සහ පෝර දෙනවා.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

මේක ට්‍රැක්ටර්වල, පෝරවල ප්‍රශ්නයක් නොවෙයි.

"However, much has yet to be done to use these new settlements as a means of transforming the traditional subsistence agriculture into a new form of agricultural activity and land management, modern in outlook and capable of raising the level of agricultural incomes."

පෝර ටික දීම ගැනයි, ට්‍රැක්ටර් දීම ගැනයි නොවෙයි, මේකෙන් කියන්නෙ. සමුපකාර ක්‍රමයට හෝ විශාල ගොවි පොළ වල් හැටියට හෝ පවත්වාගෙන යාමේ අවශ්‍යකමයි, මෙයින් කියන්නේ. ට්‍රැක්ටර් වලින් ගස් පෙරළා හැතැප්ම සිය ගණන් දිග ඇළවල් කපා ගංගා හරවා ඒ ප්‍රදේශ සකස් කළාට පසු දරුවන් 10 දෙනකු ඉන්න ගොවීන් තෝරාගෙන ඒ අයට පැලැස්තර වගේ කුඩා ඉඩම් කැබෙලි දීමෙන් ඇති වැඩක් නැහැ. ඒ ගොවීන්ට යන්තම් පණ ගැට ගහගන්නට පුළුවන් විධියේ ආර්ථික තත්ත්වයක් ඇති කරන්නෙ නැතිව ඒ අයගේ ආර්ථික තත්ත්වය දියුණු වන පිළිවෙළට මේක කළ යුතු බවයි, කියන්නේ. තමුන්නාන්සේ දුන් මේ වාර්තාවෙන් (Mahaweli-ganga Irrigation and Hydro-Power Survey) ඒ කාරණයම ඉදිරිපත් කර තිබෙනවා. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ ඒ පිරිස විසින් ඉතාමත් වැදගත් කාරණයක් ඉදිරිපත් කර තිබෙනවා.

මෙහි පසුබිම ගැන එක වචනයක් මතක් කරන්නට ඕනෑ. යූ.එස්.ඕ.එම්. එකේ මහවැලිගඟ හැරවීමේ ව්‍යාපාරය වෙනුවට මුළු මහවැලි ගංගා නිම්නයේ සංවර්ධනය කරන්නට පුළුවන් ප්‍රමාණය කොයි තරම්ද යන්න සොයා බැලීමට පර්යේෂණ ඇති කර වාර්තාවක් සකස් කර ඊට පසු කොටස් වශයෙන් වැඩ කිරීම සඳහා පිළිවෙළක් ඇතිකිරීමට අප කොයි තරම් සටන් කළාද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන්න තමුන්නාන්සේ දන්නවා. තමුන්නාන්සේගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට ඉඩ නොදී මේ පාර්ලිමේන්තුව පසුගිය වාරයේදී ඒ යෝජනාව ඒකඡන්දයෙන් සම්මත කළා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඇමෙරිකන් කණ්ඩායමට භාර දුන්නෙත් මුළු ගංගා නිම්නයේම වැඩ කරන්නයි. ඒ අය පළමු වැනි කොටස හැටියට වාර්තාවක් සකස් කළා. මුළු වාර්තාවම ලැබෙන තෙක් වැඩ කරන්නට ඉඩ දෙන්නෙ නැත කියා මා ඒ වෙලාවේ කීවා. වාර්තා අපට ලැබෙන හැටියට අප අච්චු ගහනවා, තමුන්නාන්සේලාගේ දැනගැනීම සඳහා. ඇමෙරිකන් කාරයන්ට දුන්නෙත් සම්පූර්ණ වැඩයම කරන්නයි.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මේ ගැන තර්ක කරන්නට වුවමනාවක් නැහැ. ඒකෙ තිබුණෙ "කොම්ටඩ් ප්‍රෝග්‍රෑම්" කියායි. ගඟ හැරවීමේ කොටස් වශයෙන්—

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මේකත් එහෙමයි. ස්ටෙප් 1 ෆේස් 1, ෆේස් 2.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මේ වාර්තාවත්, ඇමරිකන් වාර්තාවත් අහසට පොළොව වගෙයි. මේ වාර්තාවේ කියනවා, මහවැලි ගංගා නිම්නයේ ජල විදුලි බලය මැගොවට් 900 ක් නිපදවන්නට පුළුවන්ය කියා. ඇමෙරිකන් වාර්තාවේ මැගොවට් 240ක් නිපදවීම ගැන පමණයි, සඳහන් කර තිබෙන්නේ. ඇමෙරිකන් වාර්තාවේ කියා තිබෙන්නෙ අක්කර ලක්ෂ 3 ක භූමි ප්‍රමාණයක් වගා කරන්ට පුළුවන් කියායි. දකුණු ඉවුරේ තමන්කඩුව ප්‍රදේශයේ මදුරුඔය දක්වා කොටසෙ පොළොව් හොඳ නැති නිසා කිසිවක් වගා කරන්ට බැරි යයි දක්වා තිබෙනව. ඒ ප්‍රදේශය වගා කිරීම සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම අඳුරු කලාපයක් තමයි, ඇමෙරිකන් වාර්තාවේ පෙන්වා තිබෙන්නෙ. ඒ වාර්තාව මා දැන් ගෙනාවෙ නැහැ. ගරු ඇමතිතුමාට වුවමනා නම් එය නිවී සැනසිල්ලේ කියවන්න පුළුවනි. ඒ ඇමෙරිකන් වාර්තාව වෙනුවට අද ගංගා නිම්නයේ සම්පූර්ණ වාර්තාවක් තිබෙනව. අපට මුදල් අමාරුකම් වැනි ප්‍රශ්න තිබෙන නිසා මේ කටයුත්ත කොටස් වශයෙන් කරන්ට බලාපොරොත්තු වෙනව. සෝවියට් විශේෂඥයින් සකස් කළ වාර්තාවේ මේ විධියට සඳහන් වී තිබෙනව :

> " However, it has a rather large hydro-power potential and the presence of highlands in the centre of the Island permits a certain variety in agricultural production. "

කවදාවත් ලෝක බැංකුව මේ විධියේ ප්‍රකාශයක් කළේ නැහැ. අපේ රටේ තිබෙන ස්වාභාවික වස්තුවලින් ප්‍රයෝජන ගැනීමේ වැඩ පිළිවෙළට ඉඩ නොදී හැමදාම අප වහල් තත්ත්වයේ තබා ගන්ට උත්සාහ කළේ ලෝක බැංකුව බව අප හොඳ හැටි අවබෝධ කර ගන්ට ඕනෑ. ලෝක බැංකුවෙන් ආධාර ගන්න එපා යයි මා කියන්නෙ නැහැ. මේ වගේ වාර්තා දැක්කම ලෝක බැංකුවේත් අදහස් වෙනස් වන බව මම පිළිගන්නව. මේ රටේ පමණක් නොව අනික් රටවල වැඩ කටයුතු සම්බන්ධයෙන් වුණත් ලෝක බැංකුව අනුගමනය කරන වැඩ පිළිවෙළ ඕකයි. ඊජිප්තුවේ අස්වාන් වේල්ල බැඳීම සෝවියට් දේශය දැන් කරගෙන යනව. කලින් ලෝක බැංකුව ඒ කටයුත්තට විරුද්ධ වුණා. එහෙත් දැන් විරුඬ නැහැ. දැන් විරුද්ධ වන්ට බැහැ. මංකොල්ලකෑම් ඔප්පු වන විට, අනික් රටවල ආධාර ඇතිව වැඩ කටයුතු සිදු වන විට, ඒ උදව් යන් ඒ තත්ත්වයට හැඩ ගැසෙනව. එම නිසා එක කාරණයක් අපි හොඳින් හිතේ තියාගන්න ඕනෑ. එනම්, ඒ උදවිය එහෙම හැඩ ගැසෙන්නෙ අපට ඇති අවංක ආදරයකින් නොවන බවයි. අපේ ආර්ථික ක්‍රමය හැමදාම වහල් තත්ත්වයේ තබාගෙන යටත් විජිත ක්‍රමයක් ගෙන යන්නෙ කොහොමද කියන බලාපොරොත්තුවෙන්, කොයි වෙලාවේ හෝ පිටිපස්සෙන් පිහි ඇනීමේ අනින බලාපොරොත්තුවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]
තමයි, ලෝක බැංකුව හැමදාම ක්‍රියා කරන්නෙ. ඒ කෙසේ වෙතත් සතුරාගෙන් වුණත් ආධාර ගන්න ඕනෑ.

ඉන්දියාව ගැන බලන්න. පළමුවෙන් ඇමෙරිකන් සහ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් කියා සිටියෙ ඉන්දියාවේ කර්මාන්තශාලා ආදිය පිහිටුවීන්ට රජයේ අංශයට උදව් දෙන්නෙ නැහැ කියායි. පෞද්ගලික කොම්පැණි දියුණු කරන්ට ආධාර දෙන නමුත් රජයේ අංශයට උදව් නොදෙන බව කිව්ව. ඒ කර්මාන්තවල යෙදෙන්න පෞද්ගලික කොම්පැණිවලට අයිතියක් තිබෙන්න ඕනෑ කියන ප්‍රතිපත්තිය උඩයි පළමුවෙන් කටයුතු කෙරුවෙ. එහෙත් අනිකුත් සමාජවාදී රටවල් රජයේ අංශයට කර්මාන්ත දියුණු කිරීමට ආධාර දෙන්ට පටන් ගැනීමෙන් පසුව් ඇමෙරිකන් ආණ්ඩුවත් ලෝක බැංකුවත් ජනසතු ව්‍යාපාරවලට ආධාර දෙන්ට කටයුතු කළා.

ලංකාවේ වානේ කම්මාන්තශාලාව සෝවියට් ආධාර ඇතිව පිහිටෙව්ව. සමහරවිට මින් පසු තවත් එවැනි කර්මාන්තශාලාවක් ලෝක බැංකුවේ ආධාර ඇතිව පිහිටුවගන්න පුළුවන් වෙයි. සෝවියට් ආධාර ඇතිව ටයර් කර්මාන්තශාලාවක් පිහිටෙව්ව. මෙතෙක් කල් ලෝක බැංකුව් එවැනි දෙයක් පිහිටුවන්න උපදෙස් දුන්නෙ නැහැ ; ආධාර දුන්නෙ නැහැ. ඒක ලෝක බැංකුවේ ප්‍රතිපත්තියක්. තමන්ගෙ බඩු විකුණ ගන්න වුවමනාව තිබෙද්දී ඒ උදවිය තමන්ගෙ මුදල් වියදම් කරල ඒ වර්ගයේ බඩු මේ රටේ නිපදවන්න උදව් දෙයිද ? එහෙම නොකිරීම ඇමෙරිකන් ප්‍රතිපත්තියක්. ඒ උදවියගෙ බඩු පහසුවෙන් විකුණා ගන්න පුළුවන් වන අන්දමට වාසි සහගත විධියට මේ රටවල දියුණුවක් ඇති කරන්ටයි, ඒ උදවිය බලාපොරොත්තු වෙන්නෙ. එහෙත් සමාජවාදී රටවලින් මෙවැනි ආධාර ලැබෙන විට ඒ උදවිය අප යටත් කර ගන්ට ගෙන යන උපක්‍රම වෙනස් කරනවා. මුහුණ අතගාල අපට පහර ගහන්ට පුළුවන් තත්ත්වයට උපක්‍රම වෙනස් කරන බව අප පිළිගන්න ඕනෑ. එම නිසා ඒ උදවිය සමග අපි විරුඬවන්ට වුවමනා නැහැ ; ඒ උදවියට භය වන්ට වුවමනාත් නැහැ ; නමුත් සතුරන් දැනගෙන, ඔවුන් මෙපමණ කල් කටයුතු කළේ කොහොමද කියා දැනගෙන පරිස්සමින් ක්‍රියා කරන්න ඕනෑ.

අ. භා. 3.45

රුසියන් විශේෂඥයින් විසින් සකස් කරන්ට යෙදුනු මේ වාර්තාවේ සඳහන් කර තිබෙනව, මේ වැඩ කටයුතු කරගෙන යන අන්දම.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමා තව කොතෙක් වේලා කතා කරන්නට බලාපොරොත්තු වෙනවාද ? දැන් තමුන්නාන්සේ මිනිත්තු 45 ක් කතා කර තිබෙන බව පෙනෙනවා. මා ළඟ තිබෙන ලැයිස්තුවේ කතා කරන්නට මන්ත්‍රීන් 34 දෙනෙක් සිටින බව පෙනෙනවා.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

අපේ පක්ෂයෙන් මට මේ සඳහා බලය දී තිබෙනවා.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

කොතෙක් වේලා කතා කරනවාද යන්නයි, මා ඇසුවේ.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු ඇමතිතුමා බාධා නොකර සිටිනවා නම් තව පැය බාගයකින් පමණ අවසාන කරනවා.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

මූලාසනය අමතා කතා කළොත් එම හිරිහැරය නැති වේවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

මා ළඟ ඇති වාර්තාවෙන් කොටසක් දැන් කියවන්නට කල්පනා කරනවා.

I am reading from "Mahaweli Ganga Irrigation and Hydro-Power Survey, Ceylon."

"The important goals of providing employment and of meeting the food requirements of the country were also taken into consideration but the attainment of national self-sufficiency in food and full employment were considered less important than the maximization of national income growth and of foreign exchange earnings."

හාමත්ව සිටින මහජනතාව අළුත් අළුත් තැන්වල පදිංචි කරවා හැකිතරම් දුරට ඉඩම් ලබා දීමේ ප්‍රතිපත්තියට වඩා [බාධා කිරීමක්] දැන් අවශ්‍ය වන්නේ අක්කරයකින් පුළුවන්තරම් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමේ ප්‍රතිපත්තියයි. වැඩියෙන් වියදම් කිරීමෙන් පමණක් වැඩිපුර නිෂ්පාදනයක් ඇති කිරීමේ තේරුමක් නැහැ. අද කරන්නේ හැකිතරම් රට පොහොර ගෙනවුත් රජයට සියයට 50ක අලාබයක් ඇති කරගෙන ගොවීන්ට බෙදා දී, වතුරෙන් පාළු වුණේ නැති නම් අස්වැන්න වැඩිපුර ලබා ගැනීමයි. අද දවසේ අස්වැන්න වැඩි කර ගැනීම සඳහා කොතරම් වියදම් දරනවාද ? හැකිතරම් අඩුවෙන් වියදම් කොට හැකිතරම් වැඩියෙන් අස්වනු ලැබීමේ ප්‍රතිපත්තිය අද ලෝකයේ බොහෝ රටවල අනුගමනය කරනවා. අමෙරිකාව ඒ සඳහා අනුගමනය කරන්නේ ධනපති ක්‍රමයයි. ලෝකයේ රටවල් අල්ලා ගැනීමත් තමන් නිෂ්පාදනය කරන කාර්මික භාණ්ඩ නොයෙකුත් රටවලට බෙදා හැරීමත් පමණක් නොව ධනපති ක්‍රමයට අනුව වැඩි වැඩියෙන් ආහාර වගා කිරීමත් අමෙරිකාව කරනවා. අඩු වියදමකින් වැඩි නිෂ්පාදනයක් ඇති කර ගැනීමට හැකි සමාජවාදී ක්‍රමත් තිබෙනවා. අප ඒ දෙකින් අනුගමනය කරන්නේ කුමන ක්‍රමය ද? මුසාජීස්ලාට මේ වැඩ පිළිවෙළ භාර දෙනවාද නැද්දැයි අප තීරණය කර ගන්නට ඕනෑ. නව ජනපද යෝජනා ක්‍රම යනාදිය ප්ලැනිං කොමිටියත් ලෝක බැංකුවත් එක්සත් ජාතීන්ගේ මණ්ඩලයත් කියන සෑම එකකින්ම ප්‍රතික්ෂේප කරනවා. එම නිසා ඒ පිළිබඳව තමුන්නාන්සේලාට තීරණයක් ගන්නට සිදුවී තිබෙනවා. එම තීරණය අර ගන්නා විට රටේ පොදු ජනතාවකුත් සිටින බව කල්පනා කරන්නට වටිනවා. තේවතු සහ රබර් වතු යනාදිය ධනපති ක්‍රමයට අනුව වගා කළා වාගේ ගොවිතැන් කටයුතු කරන්නට ඉඩ ලැබෙන්නේ නැති බව තමුන්නාන්සේලා කල්පනා කළ යුතුව තිබෙනවා.

වාර්තාවේ මෙසේද කියනවා.

"...the possibility of making available to small farms, through co-operatives, some at least of the advantages of large-scale capital intensive farming (mechanization, managerial ability, technical guidance, etc.)"

එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශෙෂඥයන්ට දේශපාලන තර්කයකට ඇතුළත් වෙන්නට බැහැ. එහෙත් ඒ ගැන නොකියා කියනවා. විද්‍යාත්මක ක්‍රම යොදවා මේ රටේ ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා සමුපකාර ක්‍රමය මාර්ගයෙන් වැඩි නිෂ්පාදනයක් ඇති කිරීම ගැන කියනවා. [බාධා කිරීමක්] ඒ කියන්නේ, සමූහ ගොවිපොළවල් ගැනයි. ඒ ගැන කියන විට තමුන්නාන්සේලාගෙන් ඇතැමුන්ට රෙද්ද තෙමෙනවා. සමූහ ගොවිපොළවල ප්‍රජාතන්ත්‍රවාදය නැතිලු. උතුම්ම ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්නේ සමූහ ගොවිපොළවලයි. එහෙත් ලෝක බැංකුවේ ප්‍රචාරයට රැවටී එයට සම්පූර්ණයෙන්ම තිරයක් නැති නම් කඩතුරාවක් අදිනවා. එතන ප්‍රජාතන්ත්‍රවාදය නැතිලු. එතන තියෙන්නේ ඒකාධිපති ක්‍රමයලු. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ කටයුතු කරන ප්‍රධාන විශෙෂඥයන් අතර සෝවියට් දේශයෙන් පැමිණි කීප දෙනෙක්ද සිටිනවා. මීට අත්සන් කර තිබෙන්නේත් සෝවියට් විශෙෂඥයෙක්. ඔහුගේ නම Fialkovsky. දේශපාලන තර්කයකට එකතු නොවී මෙහි සාමාන්‍යයෙන් පෙන්වා දී තිබෙනවා අළුත් ගොවි ජනපද වර්ධනය කිරීමේ වැඩ පිළිවෙළට සමුපකාර ක්‍රමයෙක් ප්‍රයෝජන ලබා ගන්නට හැකිය යන අදහස.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

නමුත් සැලැස්මේ සඳහන් කර තිබෙන්නෙ මෙන්න මෙබඳු වැඩ පිළිවෙළක් අනුගමනය කරන්නටයි :

"The project master plan has been provisionally prepared and appraised on the assumption that the settlers would be small peasant farmers and, for this kind of settlement, farms of 5 acres in size have been recommended."

සැලැස්ම සකස් කර තිබෙන්නේ තමුන්නාන්සේලාගේ පරණ ප්‍රතිපත්තිය උඩයි. නමුත් ඒ සමගම යම් යම් අමාරුකම් තිබෙනවාය, ඒ අමාරුකම් මගහැර ගන්න, සමුපකාර ක්‍රම යොදා නියම අන්දමට සකස් කර ගන්න. ඒ අනුව සැලැස්ම වෙනස් කර ගන්න පුළුවන් ක්‍රම මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර තිබෙනවා. මෙම සැලැස්ම සම්පූර්ණ වන විට මහවැලි ගඟේ හැම වතුර බින්දුවක්ම ප්‍රයෝජනයට ගන්න පුළුවන් විධියට, අක්කර 14 ලක්ෂයක් වගා කිරීමට හැකි අන්දමට සකස් කර ගත හැකි බව, මෙම වාර්තාවේ සඳහන් වෙනවා. මහවැලි ගඟ නිම්නය, මදුරුඔය නිම්නය, කලාඔය නිම්නය ආදී නිම්නවල අක්කර නව ලක්ෂයක වී ගොවිතැන කරන්න පුළුවන්කම ලැබෙනවා පමණක් නොවෙයි, මිශ්‍ර වැවිලි සහිතව අක්කර 14 ලක්ෂයක් වගා කරන්න පුළුවනි. ඒ හැර මැගවොට් නව ලක්ෂයක විදුලි බලය ලබා ගන්න පුළුවන් වෙනවා පමණක් නොවෙයි, තමන්කඩුව ආදී ප්‍රදේශවල, මහවැලි ගඟ දෙගොඩ පිහිටා ඇති ප්‍රදේශවල, ජලගැල්ම සම්පූර්ණයෙන්ම නතර වෙනවා. රන්දෙනිගල ජලාශය ඇති වීමෙන්, ඒ වාගේම කොත්මලේ ජලාශය ඇති වීමෙන් විශේෂයෙන්ම ගම්පොල ආදී ප්‍රදේශවලට ජල ගැල්මෙන් වන හානිය වළකිනවා. ජල ගැල්ම නැවතීමත් සමගම ක්‍රමවත් වැඩ පිළිවෙළක් අනුගමනය කිරීමෙන් ඉදිරි අවුරුදු 20 කට වුවමනා තරම් විදුලි බලය මහවැලි ගඟ ව්‍යාපාරයෙන් ලබාගන්න පුළුවන් වේයයි මෙම වාර්තාවෙ පැහැදිලි වශයෙන් සඳහන් කර තිබෙනවා. මෙය පළමුවන වාර්තාවයි. යෝජනා ක්‍රම සම්බන්ධ විස්තර වාර්තාව ලබන අවුරුද්දේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරනවා.

තවදුරටත් එහි සඳහන් කර තිබෙනවා, මෙම යෝජනා ක්‍රියාත්මක කිරීමට නම්, සම්පූර්ණ ප්‍රතිඵල ලැබීමට නම්, ක්‍රම සම්පාදක වැඩ පිළිවෙළක් යෙදිය යුතු බව. ඒ කාරණය ගැන අප හොඳාකාර කල්පනා කර බලන්න ඕනෑ. වාර්තාවෙ ඒ ගැන කොයි ආකාරයෙන්ද සඳහන් කර තිබෙන්නෙ කියා මම කියවන්නම් :

"However, it will not be easily feasible and certain essential conditions will have to be fulfilled if it is going to be successfully implemented."

ශාස්ත්‍රානුකූල විද්‍යාත්මක වැඩ පිළිවෙළක් අනුගමනය කරන්නෙ නැතුව, ඉබේටම මෙම යෝජනා සාර්ථක වන්නෙ නැති බව සඳහන් කර තිබෙනවා. එමෙන්ම ඒ කාර්යයන් ඉටුකරගැනීම පිණිස අවශ්‍ය මණ්ඩල සකස් කරන්නත් ඕනෑලු.

"A progressive increase in the rate of land development during the first few years of the project (Phase I). Immediate action to build up by 1970 the capacity required to develop annually 20,000 acres of land (new). (Failure to do so will jeopardise the implementation of Phase I as planned)."

දැන්ම සිට, වර්ෂයකට අක්කර 20,000 බැගින් විද්‍යාත්මකව වගා කරන්න පුළුවන් විධියෙ සැලැස්මක් සකස් කරන්න ඕනෑලු; වැඩ පිළිවෙළක් අනුගමනය කරන්න ඕනෑලු. එසේ කළේ නැති නම් සාර්ථක කර ගන්න ලැබෙන්නෙ නැතිලු. නමුත් තමුන්නාන්සෙ උඩවලවෙ කර ගෙන යන වැඩපිළිවෙළ මොකක්ද? රටේම තිබෙන බුල්ඩෝසර් ගෙනැවිත් ගස් ටික උදුරා ගිනි තබනවා. වගා කිරීම පිණිස බිම සකස් කරන්නටයයි කීවත්, කොන්ත්‍රාත්කරුවන් ලවා කඩිමුඩියෙ ගස් සියල්ලම ගළවා දැමීමෙන් වර්ෂාවක් පැමිණි විට පොළොව සේදී යාමයි සිදු වන්නෙ. හදිසියේම කරන්න යනවා; වාර්තාවටත් පටහැණි අන්දමට තමුන්නාන්සේ වැඩ පිළිවෙළක් ගෙන යන්නෙ. තමුන්නාන්සේ ඒ පිළිබඳව මේ ගරු සභාවෙදි කළ ප්‍රකාශයන් හැන්සාඩ් වාර්තාවෙ පළ වී තිබෙනවා. මෙය ඉතාමත්ම විනාශදායක වැඩ පිළිවෙළක්. වැවී තිබෙන හැම ගසක්ම කපා දමනවා. කැලෑ විනාශ කරන වැඩ පිළිවෙළක් ගෙන යන්නෙ. ගසක් කැපුවාම ගසක් වවන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුළුවන් වුණත්, මතුපිට තිබෙන අඟල් දෙක තුනක පස් තට්ටුවක් විනාශ කර දැමීම බලවත් අපරාධයක්. දැන් ගෙන යන්නෙ එබඳු වැඩ පිළිවෙළක්. එම නිසා සම්පූර්ණයෙන්ම සැලැස්මක් යටතේ, ක්‍රමවත් වැඩ පිළිවෙළක් ඉඩම් සංවර්ධනය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නමුත් වාර්තාවෙ අඩංගු නැති මෙබඳු වැඩ පිළිවෙළක් ඇමතිතුමා ගෙන යන්නෙ මන්ද කියා දැනගන්න කැමතියි.

"Setting up of an implementation agency in charge at least of co-ordination at ministerial level to ensure timely execution of the project according to plan. Provision of adequate extension services and setting up of pilot farms and experimental centres at an early stage."

දැන් ව්‍යාපාර දෙකක් ගෙන යනවා. මේ රටට විතරක් නොවෙයි, මුළු ලෝකයටම ඇහෙන්න ප්‍රචාර කරමින් ගල්ඔය ව්‍යාපාරය ගෙන ගියා. එහෙත් දැන් ඒ උදවියට ගල්ඔයෙන් ගන්නට කිසිම දෙයක් නැහැ. ගල්ඔය විධියට අනෙක් ඒවාත් කරන්න කියනවා නේද? චන්ද්‍රිකා ව්‍යාපාරය, උඩවලවේ ව්‍යාපාරය ආදියෙන් උන්නැහෙලාගේ ව්‍යාපාරවල තත්වය මොකක්දැයි හොඳ හැටි පෙනෙනවා නේද? ගල්ඔය පරීක්ෂණ වාර්තාව කෝ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
තවම ලැබුණේ නැහැ.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
ඒ වාර්තාව ලැබුණාම තමුන්නාන්සේට පෙනේවි. මා මේ තරම් කෑ ගහන්නට ඕනෑ නැහැ. ගල්ඔය ව්‍යාපාරය මඟින් තමුන්නාන්සේ මොන තරම් ජාතික විපත්තියක් කර තිබෙනවාදැයි ඒ වාර්තාව ලැබුණාම තමුන්නාන්සේට තේරේවි. ඒ වාර්තාව පිළියෙළ කරන එක් කෙනකුවත් මට මුණගැහුණේ නැහැ. මා ඒ අය අඳුනන්නේත් නැහැ. මා අනාගතය ගැන කියන්න දන්නා පේන කියන මිනිහකුත් නොවෙයි. ඒ කොහොම වුණත් ඒ උදවියගේ වාර්තාව ලැබුණාම තමුන්නාන්සේට පෙනේවි, මොන තරම් ජාතික වස්තුවක් විනාශ කර තිබෙනවාද කියා. ඒ ඉඩම්වලින් 1/3 ක් පමණ වූ සරුසාර ඉඩම්, වගා කරන්නට බැරි නිසරු ඉඩම් බවට පත් කර තිබෙනවා. ඒ වාගේම වටිනා දැව විනාශ කර තිබෙනවා. කිසිම සැලැස්මක් නැතිව කර්මාන්තශාලා ඇති කර තිබෙනවා. එම නිසා අද ඒ කර්මාන්තවලින් පාඩු සිදු වෙනවා. කම්කරුවන් දහස් ගණනකට කරන්නට කිසිම වැඩක් නැති වුණත්, නිකම් පඩි දෙනවා. නිකම් පඩි ලබන මිනිසුනුත් පිරී හෙනවා.

සුදුසු නැති තැනක අක්කර දහස් ගණනක උක් වැව්වා. දැන් ඒ උක් කපා අඹරන්නට ගෙන යන්නේ, රම් හදන්නටයි. රුපියල් කෝටි ගණන් වියදම් කර උක් වවා මූලික නිෂ්පාදනය වශයෙන් රම්——මත්පැන්—හදනවා. මෙවැනි දෙයක් ගැන ලෝකයේ වෙන කොයිම රටකින් වත් අහන්නට පුළුවන්ද? සීනි හදන ගමන් ඉතුරු වන දෙයින්, අහක යන ටිකෙන් මත්පැන් හැදීම වෙනම දෙයක්. දැන් මූලික නිෂ්පාදනය මත්පැන් හැදීමයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)
ඉන්නේ මත්පැන් කාරයන්.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
මත්පැන් විකුණන්නට පුළුවන්. මත්පැන්වලින් මේ රටේ සංවර්ධනයක් ඇති කරන්නට පුළුවන්ද? මහජනයාට විෂ පොවා මුදල් ලබාගෙන රට සංවර්ධනය කරන්නට හදනවා. [බාධා කිරීමක්] වෙන රටක් නොවෙයි, අපේ රට ගැන කල්පනා කර බලමු. ජාතික පිරිහීම නවත්වන්නට, ජාතික දියුණුවක් ඇති කරන්නට ඕනෑ නම් ක්‍රම ක්‍රමයෙන් මත්පැන් බීම අඩු කරන්නට ඕනෑ. ඉඩම් ඇමතිතුමාගේ ව්‍යාපාරය නිසා අද කපන උක් පවා ඇද ගන්නට බැරි වී තිබෙනවා. ඒ උක් පල් වෙනවා. ඒවායෙන් සීනි හදන්නට බැහැ. ඒ උක් මිරිකන්නේ, සීනි හදන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]
නොව, රම් හදන්නටයි. කරුණාකර ගල් ඔය වාර්තාව කියවා බලන්න, ආදායම තිබෙන්නේ සීනිවලින් ද, රම්වලින් ද කියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ලෝකයේ හැම තැනම ලාභ ලැබෙන්නේ, මත්පැන්වලින්.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

කොහේවත් නැහැ. හැම තැනම මූලික ආදායම ලැබෙන්නේ සීනිවලින්. සීනි ෆැක්ටරියෙන් අහක යන ටික රම් හැදීමට යොදනවා. මූලික නිෂ්පාදනය, සීනියි. ලංකාවේ වෙන්නේ ඒකෙ අනෙක් පැත්තයි. මූලික නිෂ්පාදනය හැටියට ලංකාවේ හදන්නේ රම්. සීනි හදන්නේ අතුරු නිෂ්පාදනයක් හැටියටයි. [බාධා කිරීම්.]

කන්තලේ උක් වැවීම සඳහා උපදෙස් දෙන්නට ඕස්ට්‍රේලියාවෙන් විශේෂඥයෙක් ඇවිත් ඉන්නවා. ඔහුට කොයි තරම් උපාධි තිබෙනවාදැයි මා දන්නේ නැහැ. ඒ වුණත් ඔහු ඉතාමත් දක්ෂ, අවංක, මහන්සි වී වැඩ කරන කෙනෙක්. ඔහුගේ පෞද්ගලික උනන්දුව නිසා අඩි 10-15 උසට ඉතා හොඳින් උක් වැවුණා. වර්ෂාව නැති පායන කාලයට ඒ උක් වගාවට වතුර වුවමනා කරන බව ඔහු කීප වතාවක්ම මතක් කර තිබුණා. ඒ වුණත් ඇලවල් ඔක්කෝම ගොඩවෙලා, කැඩී ගිහින්. වැවේ නම් වතුර තිබෙනවා. උක් හොඳට හැදී තිබුණා. එහෙත් ඒ වතුර ටික උක් වගාවට යොදවන්නට ඇමතිතුමාත්, කන්තලේ ව්‍යාපාරයේ නිලධාරීනුත් අපොහොසත් වුණා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඇමතිවරයා ඉන්නේ, ඇලවල් සුද්ධ කරන්නට නොවෙයි.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ඇමතිතුමා ඇලවල් සුද්ධ කරවා ගන්නට එපායැ? තමුන්නාන්සේ ඒ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර තිබෙන්නේ, ඉතා මත් අදක්ෂ දූෂිත බේබදු පුද්ගලයන්. සම්පූර්ණයෙන්ම සමාජයෙන් ඉවත් කළ යුතු උදවිය ඒ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර තිබෙනවා. එයින් දෙදෙනකු ගැන මම දන්නවා. එහෙත් ඔවුන්ගේ නම් කියන්නේ නැහැ. ඒ විධියේ දූෂණ කරන පාරාජිකා වෙච්ච පුද්ගලයින් පිරිසක් තමයි, එහි ඉන්නේ. කනමදයන් වගේ වෙරි වුණු පුද්ගලයන් මා කන්තලේදී දැක තිබෙනවා. ඔවුන් වන මෘගයන් වාගෙයි. ඔවුන් වැද්දන් වාගේ යයි මා නොකියන්නේ එසේ කීවොත් වැද්දන්ට අපහාසයක් වන නිසයි.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

Order, please! The sitting is suspended for 30 minutes.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 4.30 மணிக்கு ஆரம்பமாயிற்று.

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැරණි ඉඩම් සංවර්ධන ප්‍රතිපත්ති ඒ විධියටම ගෙන ගියහොත් බලාපොරොත්තු ඉෂ්ට නොවන තත්ත්වයක් ඇති විය හැකි වන බවට විශේෂඥයන් තුළ ඇති සැකය ගැන මා කීවා. ගොවි ජනපද ව්‍යාපාර ගැන කල්පනා කරන විට ඒ විධියේ සැකයක් අප තුළත් ඇති වෙනවා. මම දන් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේම වාර්තාවකින් කියවන්නම්. මා මේ කියවන්නේ 1965-66 වර්ෂය සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද පාලන වාර්තාවෙනුයි. මෙය පිට වී තිබෙන්නේ 1967 අගෝස්තු මාසයේදීයි. මා කාටවත් පෞද්ගලික වශයෙන් දෝස් පවරන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා කියන්නේ 1965 සිට අර විධියේ තත්ත්වයක් පැන නැඟී තිබෙන බවක්වත් මේ වාර්තාවේ සඳහන් වී නැති බවයි. මහවැලි ගඟ යෝජනා ක්‍රමය ඒ විධියට කරගෙන යන්නට බැරි බවට ඇති සැකය ගැන මෙහි මොකක්වත් සඳහන් වන්නේ නැහැ.

"Paddy allotments were given in blocks of 30 acres for 15 colonists to be cleared in time for chena cultivation in Maha of the same year. They were paid a subsidy of Rs. 100 per acre for jungle clearing."

දැන් මේක වෙනස් කර තිබෙනවා. විශාල සංශෝධනයක් කර ඇති බව අන්තිම කොටසේ සඳහන් වෙනවා :

"It was felt that this scheme of settling colonists had certain drawbacks. The colonist is separated from his family in the early stages of settlement which is a disadvantage. His highland allotment is not blocked out and given to him until at a later stage so that he cannot bring his family to live with him during this period. It was therefore proposed to remedy this by having the highland cleared by labour provided by the Department of Land Development so that when the colonist arrived, he would receive already cleared land on which he could immediately construct his temporary hut....."

එතකොට ජනපදයේ පදිංචියට එන ගොවියන් තම මුඩු බිම් එළි කර ගන්නවා වෙනුවට ආණ්ඩුව ඒවා එළි කර දෙනවා. ඒකයි, මේ ලොකුම ප්‍රතිසංස්කරණය. වෙන මොකුත් නැහැ. ගොවියන්ට බෙදන්නේ වියදම පිළිබඳව සඳහන් වන වාර්තා පමණයි.

"Under the policy that prevailed up to the close of the last financial year, the provision of the necessary amenities to each colonist cost the Department Rs. 4,185."

ජනපදයක පදිංචි වන එක පවුලකට රුපියල් 4,185 ක් ආණ්ඩුවෙන් වියදම් කරනවා.

"This is on the basis of two acres of paddy land and one acre of highland per colonist. Under the amended scheme whereby highland allotments are to be cleared by Department labour and civic amenities to be provided in concentrated areas serving 600 units, the cost per unit is the same as indicated below....."

ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් නම් කිසිම වෙනසක් නැහැ. විදේශීය හා ස්වදේශීය යන විශේෂඥයන් දෙගොල්ලන්ම මෙම ව්‍යාපාරය ගැන පළ කරන සැකය ගැන මොකුත් සඳහන් වන්නේ නැහැ. මඩ ඉඩම් අක්කර තුන බැගින් සහ ගොඩ ඉඩම් අක්කරය බැගින් දීම විනාශකාරී ප්‍රතිපත්තියක් බවට පත් වී තිබෙනවා. මහවැලි ගඟ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඇති ප්‍රථම වාර්තාවේ මෙය අක්කර පහක් හැටියට සටහන් කර තිබෙනවා. එහෙත් ඒවා ගැන කිසිවක් මෙම ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂගේ වාර්තාවේ සඳහන් කර නැහැ. මහවැලි ගඟ ව්‍යාපාරය සම්බන්ධ වාර්තාවේ සඳහන් වී ඇති කොටසක් සටහන් වීම සඳහා කියවන්නට කැමතියි.

"Indeed, until now, settlement schemes, aimed at providing even smaller plots of land to larger numbers of peasant farmers, have been disappointing from the point of view of farm productivity ; it is therefore felt, in many quarters, that in order to reap the full benefits of the heavy investments to be made in future irrigation schemes, one should adopt highly productive capital intensive methods of cultivation implying large plantation-type farms. The project master plan has been provisionally prepared and appraised on the assumption that the settlers would be small peasant farmers and, for this kind of settlement, farms of 5 acres in size have been recommended."

විශාල ගොවි පොළවල් පිහිටුවීමේ අවශ්‍යතාවය ගැන ප්‍රකාශ කරන අතරම ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදවන්නට වුව මනා නිසා, ආණ්ඩුවට කීකරුව, ආණ්ඩුවේ ප්‍රතිපත්තියට අනුව එක ගොවියාට අක්කර පහ ගණනේ දී ඒ කටයුතු කළ යුතුය කියනවා. ඒ සමගම මේ විශේෂඥයින්ට තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව තමන්ගේ අවංක අදහස් ප්‍රකාශ කිරීමට යුතුකමක් තිබෙන නිසා ඒ අදහසත් සමග අර අනික් අදහසත් ප්‍රකාශ කර තිබෙනවා.

"No recommendations have as yet been made concerning the type of settlement to be finally adopted."

කුමන ක්‍රමය යෙදිය යුතුද කියා අවසාන තීරණයක් අරගෙන නැහැ. අක්කර පහ බැගින් දෙනවාද, විශාල ගොවි පොළවල් හැටියට කරනවාද කියා අවසාන තීරණයක් ගෙන නැහැ. නමුත් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

අනුව අක්කර තුනක් බැගින් එහෙම නොවෙයි අක්කර පහ ගණනේ දිය යුතුය කියා පමණක් වාර්තා කර තිබෙනවා.

" . . . . (small proprietary farming, large farms or plantations). Studies, already begun, to make this essential decision should be actively pursued during Stage II of the UNDP study to determine the optimum types of settlement and of farming organization to be recommended, . . . . "

බොහෝ දුරට පරීක්ෂා කර බලා මේ සංවර්ධන කටයුතුවලට කුමන විධියේ අලුත් ක්‍රමයක් යොදවන්නට ඕනෑද යන ප්‍රශ්නය ගැන ඒ විධියට අදහස් ප්‍රකාශ කර තිබෙනවා. මා කලිනුත් මේ කාරණය ඉදිරිපත් කර තිබෙනවා. විශාල ධන වතුන්ට අක්කර 50,000 ක් දී තිබෙන මේ ආණ්ඩුවෙනුත් ඇමතිතුමාගෙනුත් මා ඉල්ලීමක් කරනවා. එවැනිම විශාල වැඩ පිළිවෙළවල් අනුව, නවීන සංවිධාන ඇතිව, නවීන යන්ත්‍රෝපකරණ ඇතිව සමුපකාර ක්‍රමයට පොදුවේ, සාමූහිකව අපේ ගම්බද ගැමි ගොවිජනතාවටත් වැඩ කරන්නට පුළුවනි. එමගින් ඔවුන්ට විශාල ආදායමක් ලබා ගැනීමට පුළුවන් වෙනවා. එවැනි වැඩ පිළිවෙළක් ආරම්භ කරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. පරණ ප්‍රතිපත්තිවලටම අනුව මඩ ඉඩම් අක්කර දෙකක් ගොඩ ඉඩම් අක්කරයක් නැත්නම් භාගයක් දෙන ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම ඉවත් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, ජල විදුලි බලය සම්බන්ධව එකම කාරණයක් ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා. මස්කෙළිඔය ව්‍යාපාරයේ I වැනි කොටසේ වැඩ දැන් අවසාන කරන්නටයි යන්නෙ. ඊළඟට II කොටසේ වැඩ කරන්නට බලාපොරොත්තු වෙනවා. මේ සම්බන්ධව ලෝක බැංකු වාර්තාවකින් කොටසක් මා කියවන්නට අදහස් කරනවා. ලෝක බැංකුවෙ හැම එකක්ම වැරදි නැහැ ; හරි ඒවත් තිබෙනවා.

"This is a combined irrigation and power project. A feasibility report was received in May this year and the Government proposes coming to a final decision on whether to proceed, in January next year. As discussed in this report, the project cannot be justified on economic grounds for power purposes only until after completion of the Maskeliya II and III projects at Thiberton and Laxapana. It has, however, one advantage over the Maskeliya projects in that its watershed is on the South Eastern side of the mountains and receives the benefit of both monsoons. The Walawe Ganga river which feeds the reservoir is therefore at relatively high flows when the Maskeliya and Kehelgamu rivers are at their lowest levels."

ජල විදුලි බලය නිපදවීමේදී ලංකාවේ මෝසම් දෙකෙන්ම ලැබෙන වර්ෂා ජලයෙන් ප්‍රයෝජන ගැනීම වැදගත් කාරණයක්. මස්කෙළි ඔය, කෙහෙල්ගමු ඔය යන දෙකටම ලැබෙන්නේ එක මෝසමක වර්ෂා ජලයයි. නමුත් සමනලවැවට ජලය ලැබෙන වලවේ ගඟට මෝසම් දෙකෙන්ම ජලය ලැබෙනවා. දෙසැම්බර් මාසයේදී වාගේම වෙසක් මාසයේදීත් වලවේ ගඟට විශාල ජල ප්‍රමාණයක් ලැබෙනවා. දැන් මේ කොළඹ තිබෙන ග්‍රෑන්ඩ්පාස් ආදී විදුලි බල මධ්‍යස්ථාන නිතරම කළු තෙල්වලින් ක්‍රියා කරවන්නට සිදු වෙනවා. චෙකෝස්ලොවේකියාවේ විශේෂඥයින් පැමිණ විශාල යන්ත්‍ර යොදා උඩවලවේ ජලවිදුලි බලය උපදවා වැඩ කරගෙන යනවා. එතැන සිට සමනල වැවට හැතැප්ම දහයයි නැත්නම් පහළොවයි තිබෙන්නේ. මස්කෙළිඔයේ දෙවැනි කොටසේ වැඩ කටයුතු කරගෙන යාම ඒ තරම් අමාරු නැහැ. කොයි තරම් මුදල් වැය වෙතත් සමනල වැව ව්‍යාපාරයේ වටිනාකමක් තිබෙනවා. වර්ෂාව නැති කාලයේදී වුවත් කළුතෙල් ආදිය ගෙන යන්නට හෝ මුදල් වියදම් කරන්නට වුවමනා නැහැ. කොළඹ තිබෙන බල මධ්‍යස්ථානය හදිසියකට පාවිච්චි කරන්නට ඉඩ තිබෙනවා. ඒ නිසා පිටරටවලින් තෙල් ආදිය හෝ වෙනත් දේ හෝ ඒ සඳහා ගෙන්වන්නට වුවමනාවක් නැති බව මතක් කරන්නට ඕනෑ.

තවත් කාරණා දෙකක් පමණයි මතක් කරන්නේ. ගරු මුදල් ඇමතිතුමාගේ කථාවේදී වන්නිය ගැන පමණක් නොව වන්නියේ විල්ලු ගැනත් කියා තිබෙනවා :

" . . . . . පුත්තලම දිස්ත්‍රික්කයෙහි වනාන්ත විල්ලු ප්‍රදේශයෙහි හූ ජල සම්පත් පිළිබඳ පරීක්ෂණයෙහි සැහෙන දියුණුවක් අත් කරගනු ලැබුණා. මේ ප්‍රදේශයෙහි අක්කර 8,000 ක් සිට 10,000 දක්වා ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට ප්‍රමාණවත්, යහපත් තත්ත්වයෙහි හූ ජල සම්පත් මේ ප්‍රදේශයෙහි ඇති බව දැන් සනාථ වී තිබෙනවා."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ ගැන මට එක් සැකයක් ඇති වුනා. මහවැලිගඟ ව්‍යාපාරය ගැන වැඩ කරන්නට එක්සත් ජාතීන්ගේ මණ්ඩලය සමග ගිවිසුමක් අත්සන් කළ අවස්ථාවේ මෙන්න මෙහෙම වාර්තාවක් තිබුණා :

"Comprehensive survey of the available surface and groundwater resources within the catchment areas of the Mahaweli Ganga and Dry Zone areas of the North and Central Provinces and Service area of the diversion scheme including analysis and interpretation of existing hydro-meteorological data, modification of existing hydrological network and the establishment of new stations and groundwater investigation by drilling."

පොළොව යට තිබෙන ජල සම්පත් සම්බන්ධයෙන් සම්පූර්ණ පරීක්ෂණයක් කරන්නට එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශේෂඥයින් එකඟ වුණා. ඒ පරීක්ෂණය කළාද නැද්දැයි දැන ගන්නට කැමතියි. එසේම අරාබි රටවලට අපේ රටේ විරුද්ධකමක් ඇති කිරීමේ වැඩ පිළිවෙළකට ඊශ්‍රායලයේ විශේෂඥයකු මාර්ගයෙන් ඊශ්‍රායලය සමඟ මේ වැඩ කරනවාය කියන ඒ ප්‍රතිපත්තිය වෙනස් කළා දැයි දැනගන්නට කැමතියි.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මේකත් මීට පෙර, මෙයට අත්සන් කරන්නට ඉස්සරවෙලා, ගිය ආණ්ඩුව තිබුණු කාලයේ ඇති කර ගත් දෙයක්.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ඒකත් මේකට අයිතියි.

"Comprehensive survey of the available surface and groundwater resources within the catchment areas of the Mahaweli Ganga and Dry Zone areas of the North and Central Provinces...."

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒක ඊට කලින්. ඒ අය ආවේ 1963 දීයි.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

භූ ජල සම්පත් සම්බන්ධව සෑහීමකට පත් වෙලා තිබෙනවද? පොළොව යට තිබෙන ජල සම්පත් ප්‍රමාණය කොතෙක් දැයි සොයා බලා සෑහීමකට පත් වුණාද? තිබෙන ජල ප්‍රමාණය කොතෙක්දැයි නොදැන වැඩ කරන්නට ගියොත් මුළු ප්‍රදේශයම කාන්තාරයක් වන්නට පුළුවනි. ඒ නිසා කිට්ටු කිට්ටු තැන්වල හාරා බලා පොළොව යට තිබෙන වතුර ප්‍රමාණය සෑහේදැයි තීරණය කර ගන්නට ඕනෑ. එසේ නොකළොත් කලක් ගත වන විට තිබෙන වතුර ප්‍රමාණය සම්පූර්ණයෙන්ම නැති වෙන්නට පුළුවනි. ඒ නිසා භූ-ජල සම්පත් ලබාගැනීමේ වැඩ පිළිවෙළක් සමගම පොළොව යට ජලය නැත්පත් කිරීමේ වැඩ පිළිවෙළකුත් ඇති කරන්නට ඕනෑ. පුත්තලමත් මන්නාරමත් අතර ප්‍රදේශයෙ භූ-ජල සම්පත් ලබාගන්නට නම් මල්වතු ඔය ව්‍යාපාරය වැනි වාරිමාර්ග ව්‍යාපාරත් ඇති කරන්නට ඕනෑ. අපට වුවමනා නොකරන පොළොව මතුපිට තිබෙන ජලය මුහුදට ගලායන්නට ඉඩ නොතබා ඒවා පොළොවට බීගන්නා අන්දමට වැඩ පිළිවෙළක් ඇති නොකර හිතුවක්කාර අන්දමට කටයුතු කරනවා නම් එය ප්‍රචාරයක් ඇති කර ගැනීමට පමණක් කරන වැඩක් බව මා කියන්නට ඕනෑ. පුත්තලම කිට්ටුව පොළොව යටින් වතුර ගැනීමේ කටයුත්ත කරගෙන යන ආකාරය මාත් දැක්කා. එහි වතුර ලබාගන්නේ එක තැනකින් ගලවා තවත් තැනකට ගෙනයා නොහැකි අන්දමේ විශාල මැෂින් යොදවලයි. එහෙත් ඒ කටයුත්ත කළ යුත්තේ එහෙම නොවෙයි. එක එක තැන හාරා භූ-ජල සම්පත් සෙවිය හැකි අන්දමට තැනින් තැනට ගෙනයෑමට පුළුවන් මැෂින් පාවිච්චි කරන්නට ඕනෑ.

අ. භා. 4.45

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி.பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

එහෙම තමයි කරන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

එහෙම කරන බවට මා නම් සළකුණක්වත් දැක්කේ නැහැ. ඒවායේ සවිකර තිබුණේ තැනින් තැනට ගෙනයන්නට නොහැකි විශාල මැෂින්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

නැහැ. පොම්ප සවිකර තිබෙන්නේ එතැන.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මා මීට වඩා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. තෙත් කලාප යට වුවමනා තරම් වාරිමාර්ග ක්‍රම මෙතෙක් කල් සකස් කර නැහැ. ආහාර ප්‍රශ්නය ඉතා භයානක තත්ත්වයක පවතින මේ අවධියේදීවත් ආහාර නිෂ්පාදනය වැඩි කර ගැනීම පිණිස තෙත් කලාපයේත් අවශ්‍ය වාරිමාර්ග පහසුකම් ඇති කරන ලෙස මා ඉල්ලා සිටිනවා. අද තෙත් කලාපයේ ගොවි තැන් වතුර වැඩිකමින් පාළු වෙනවා; වතුර නැතිකමින් පාළු වෙනවා; වතුර බස්සවන්නට බැරිකමින් පාළු වෙනවා. ඒ නිසා ඒ කරුණු තුන ගැන විශේෂ සැලකිල්ලක් දක්වා ඉතාමත්ම කෙටි කාලයකින් ඒ ප්‍රශ්න තුන විසඳීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර අද වියළි කලාපයේ වාරිමාර්ග කටයුතු සඳහා ගන්නා උනන්දුවට වැඩි උනන්දුවක් තෙත් කලාපයේ වාරිමාර්ග කටයුතු සඳහා ගන්නා ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**කේ ඩබ්ලිව්. දේවනායගම් මයා. (කල්කුඩා)**
*(திரு. கே. டபிள்யூ. தேவநாயகம்—கற்குடா)*
(Mr. K. W. Devanayagam—Kalkudah)

Mr. Chairman, I wish to make a few remarks with regard to the irrigation facilities in my electorate.

In the context of the present agricultural policy of the Government, irrigation plays a very important part in making this country self-sufficient in food.

It should have been our aim from the time we gained independence to make the country self-sufficient before we embarked on industrialization. In that respect we have not fulfilled our duty, but it is not too late to start even now. It becomes more important in the present context when our dependence for food on foreign countries is being underlined, particularly after the Chinese incident which was an affront to the self-respect of this country. We can even be held to ranson as a result of our dependence on other countries for our food.

Therefore, particularly in the present context of things, irrigation plays a very important part in the success of our scheme for self-sufficiency.

Although the crash programme that has been organized is working fairly successfully, yet there are certain delays and set-backs mainly due to the contractors who are engaged on these works. They have sprung up like mushrooms round every branch of the Irrigation Department. For the most part they are people without the capital to carry out the jobs. It is the contractors who are holding up the irrigation projects.

The Minister should find ways and means of overcoming the difficulties. There are a number of persons under the G. O. D. B. who are now on the unemployment lists. Their services could be used for the irrigation works.

There is no point in any government initiating a scheme unless it sees to it that it is completed. Then the impact of the scheme will be felt by the people. It is useless our starting a scheme if it is to be completed by somebody else.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

It is therefore necessary that the contractors for these jobs are selected with care and that we organize a scheme to see that these irrigation works are carried out promptly and correctly.

The other matter I want to refer to is this. I should like to recommend to the Minister a revision of the present scheme in regard to colonization. In these colonization schemes little houses are dotted all over in a vast area and the people live in isolation.

It is a matter of history that human beings like to live in community. They like to group themselves together for safety and security. But in these colonization schemes they live in isolation and the conditions in which they live are not hygienic.

For instance, even if you really want to provide these colonists with modern conveniences it is not possible to give them a water scheme or even to give them electricity. They get their drinking water from the channels, and it is probably contaminated with potash and phosphates, the residue from the fertilizer they use in their fields or from insecticides like endrex.

In order to avoid such conditions, it is better if colonists are settled somewhere near their working fields. A village or town can be planned out, and once they are settled there is every possibility that the village or town will develop. Throughout the history of Ceylon, even during the time of our ancient kings, people have been living in villages near their fields. From their villages they went to their fields, worked there, and returned to the villages. After all, even colonists must progress, and no progress is possible under the conditions prevailing today.

In this respect I would like to draw the attention of the Hon. Minister to the fact that people have been settled on the borders of my electorate without being provided with any irrigation facilities. They do not have even a source of pure drinking water. If wells are sunk the water tends to be brackish. I am at a loss to understand how this situation could have arisen if any sort of investigation had been done. Was it political expediency ? I have a suspicion that it was nothing but Federal politics that permitted people to be settled in extreme corners of my electorate.

On the last occasion on which I visited one of those settlements, a colonist produced a pot of water, which was slimy green and not at all fit for human consumption. The village I am referring to is Vadamunai, 20 or 30 miles away from the boundary of the Hon. Minister's own electorate. Even if these people continue to live there for 40 or 50 years, it is doubtful whether water will be available to them because the terrain is very bad and no more tanks are going to be restored. The one available tank has been restored in Vadamunai, and people have already been settled there. The area I am referring to now is 15 or 20 miles away from that spot.

Therefore I suggest to the Hon. Minister that these people be re-settled in some other place where water is available. They were brought from their villages, which were civilized places, and now they are reduced to living the life of animals.

I have seen the conditions under which they live. They work during the day in their fields. They come home and sleep with the sweat, the dirt and the ash on their bodies and feet. They have no water to wash themselves with. It is only in the morning, when they get up, that they wash themselves. It is under such conditions that these people live. So, I urge the Hon. Minister to see that they are re-settled in some other place.

The next matter I wish to raise is the plight of bachelors under the present system of land alienation. Under the present system, bachelors are not settled in schemes, and no bachelor

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දේවනායගම් මයා.]

will ever be able to settle down on the land. Being a bachelor seems to be a disqualification so far as land alienation is concerned. I really do not see why that should be so. There seems to be a contradiction in policy here. On the one hand we are establishing youth farms—

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

We have changed that now.

**දේවනායගම් මයා.**
*(திரு. தேவநாயகம்)*
(Mr. Devanayagam)

Then it is all right. Young people really are the people who cultivate the land. Settling bachelors on colonization schemes will also go a long way towards solving the unemployment problem of the country.

The other matter I wish to raise is one that is peculiar to my electorate. As you are aware, Sir, the L. D. O. and his officers are the people who come in contact with the colonists in these areas. It is a matter for regret that these officers make use of their office for political purposes, and this is a source of nuisance to me. I would ask the Hon. Minister to take stern action whenever matters of this sort are reported to him.

There is another matter I would like to raise. In areas like Jaffna, Vavuniya and other places, I think the Land Commissioner has given special facilities for the sinking of wells. In fact, in my electorate, there are areas where water is much more difficult to get than in these places and I would ask the Hon. Minister to extend the same facilities to the people in those areas where the terrain is much more difficult and harder than in areas like Jaffna, Vavuniya, Mannar, and other places.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉඩම් අමාත්‍යාංශය ගැන වර්ෂයක් පාසා අප මෙහිදී නොයෙක් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මේ වර්ෂයේදී, එක් කරුණක් පමණක් අප කී පරිදි මේ අමාත්‍යාංශය විසින් වෙනස් කර තිබෙන බව ප්‍රථමයෙන් මා කියන්නට කැමතියි. තරුණයන්ට ඉඩම් නොලැබෙන බව අප ගිය වර්ෂයේදීත් කිව්වා. දැන් නම් ගරු ඇමතිතුමා වැඩි වැඩියෙන් තරුණයන්ට ඉඩම් දීමේ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. මේ අවස්ථාවේදී අප විසින් ඉදිරිපත් කළ යුත්තේ අපේ ප්‍රදේශ සම්බන්ධ කරුණුයි. එම නිසා, පසුගිය දවස්වල අපේ ප්‍රදේශයේ ඉඩම් කච්චේරි පැවැත්වූ අන්දම ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට මා බලාපොරොත්තු වෙනවා.

අ. භා. 5

උඩ වලවේ යෝජනා ක්‍රමය යටතේ ගොවීන් තෝරා ගැනීමට හම්බන්තොට හා මාතර දිස්ත්‍රික්කවල පසුගිය දවස්වල ඉඩම් කච්චේරි පැවැත්වූවා. මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් කච්චේරිය පවත්වන්නට පෙර සිරිත් පරිදි දැන්වීමක් ප්‍රසිද්ධ කළා. එම දැන්වීමෙහි, ඉඩම් ඉල්ලන අයගේ වයස සම්බන්ධයෙන්වත් අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන්වත් පවුලේ සිටින තරුණයන් සම්බන්ධයෙන්වත් කිසිම දෙයක් සඳහන් වී තිබුණේ නැහැ. උඩ වලවෙන් ඉඩම් ඉල්ලන ලෙස ගොවීන්ට දන්වා තිබුණා. ඒ අනුව ගොවීන් ඉඩම් ඉල්ලුවා. එසේ ඉල්ලූ ගොවීන් අතර, ළමයින් දහ දොළොස් දෙනා සිටි අයත් හත් අට දෙනා සිටි අයත් සිටියා. වයස අවුරුදු 20, 21 ක පමණ වූ තරුණ පිරිමි ළමයින් ඇති ගොවීනුත් ඒ අතර සිටියා. එවැනි ගොවීන්, ඔවුන්ගේ පළපුරුදුකම් ගැන වැඩි සැලකිල්ලක් දැක්වේය යන විශ්වාසයෙන් තරුණ ළමයින් ඉදිරිපත් නොකර ඔවුන්ම ඉදිරිපත් වුණා. එහෙත්, අන්තිමට සිදු වුණේ මොකක්ද ? ඉඩම් ඉල්ලන අයගේ වයස අවුරුදු 45 ක් විය යුතු බවත් ඊට වැඩි අයගේ ඉල්ලුම් පත්‍ර බාර නොගන්නා [illegible]ගේම ඔවුන් 3 වැනි ප්‍රමාණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමත්ව සිටිය යුතු බවත් ඔවුන්ට ළමයින් 5 දෙනකුට වැඩිය නොසිටිය යුතු බවත් දන්වා ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය නියෝගයක් නිකුත් කළා. එහෙත්, කලින් ප්‍රසිද්ධ කළ දැන්වීමෙහි මේ කිසිවක් සඳහන් කළේ නැහැ. එක් ආකාරයකට දැන්වීම් ප්‍රසිද්ධ කොට ඊට වෙනස් අන්දමකට කොන්දේසි අනුව පරීක්ෂණය පැවැත්වීම යුක්ති සහගත දැයි මා ගරු ඉඩම් ඇමතිතුමාගෙන් අහනවා. මෙහි ප්‍රතිඵලය වුණේ කුමක්ද? හොඳ ශරීර ශක්තියෙන් යුත් වයස අවුරුදු 50 පමණ වූ දක්ෂ ගොවීන්ට ඉඩම් ලැබුණේ නැහැ. ජ්‍යෙෂ්ඨය පවා සමත් ඔවුන්ගේ තරුණ පිරිමි දරුවන්ට ලැබුණෙත් නැහැ, ඔවුන් ඉඩම් ඉල්ලුවේ නැති නිසා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ විධියේ නියෝගයක් කරන්නට ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට කිසිම බලයක් නැහැ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඒ ගැන මම කරුණු කියන්නම්. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ අධිපතියා කවුරුදැයි මා දන්නේ නැහැ. කවුරු වුණත් ඔහු ගල්ඔය "හිට්ලර්" කෙනකු වී කටයුතු කරනවා. ඔහු ඇමතිතුමා කියන දෙයක් අහන්නෙත් නැ; දෙපාතීමේන්තුවේ උපදෙස් ලබා ගන්නෙත් නැ. "හිට්ලර්" කෙනකු මෙන් හිතුවක්කාර අන්දමට ඔහු ක්‍රියා කරන බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

අද ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට වුවමනාවට වඩා රැකී රක්ෂා සඳහා මිනිසුන් බඳවාගෙන තිබෙනවා. එසේ බඳවාගෙන තිබෙන්නේ ඇමතිතුමාගේ අවසරය ඇතිව ඉල්ලුම් පත්‍ර කැඳවා නියම අන්දමටද? එසේ නැත්නම් පස්ස දොරෙන්ද? ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය අද වුවමනාවට වැඩි සේවකයින්ගෙන් පිරී ඉතිරී ගොස් තිබෙන බව ගරු ඇමතිතුමාත් දන්නවා ඇති. ඒ සේවකයින් බඳවා ගත්තේ කවුරුන් විසින්ද යන බව මා දන්නේ නැහැ. මට අද එක් තරුණයෙක් හමු වුණා; දැන් රක්ෂාව කරන්නේ කොහේ දැයි මා ඔහුගෙන් ඇසුවා. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ බව ඒ තරුණයා කිව්වා. එතැනට ගියේ කෙසේ දැයි මා නැවතත් ඔහුගෙන් ඇසුවා. "තමුන්නාන්සේට කිව්වොත් තමුන්නාන්සේ ඒක පාර්ලිමේන්තුවෙදි කියාවි" යි තරුණයා කිව්වා. ඔහු එතැනට ගිහින් තිබෙන්නේ පස්ස දොරෙන්. අර අධ්‍යක්ෂකගේ මේ අධ්‍යක්ෂකගේ මාර්ගයෙන් ඔය විධියට ඇතුළු වුණ අයයි අද එහි වැඩි හරියක් සිටින්නේ. [බාධා කිරීමක්] මා කියන දේ ගරු ඇමතිතුමාත් පිළිගන්නවා. ඕනෑවට වැඩි සේවක පිරිසක් අද ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට ඇතුළු කරගෙන මුදල් කාබාසිනියා කරන වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ බව ඇමතිතුමාත් පිළිගන්නවා. මා නිකම්ම නොවෙයි කියන්නේ, කරුණු දැනගෙනයි.

උඩවලවේ යෝජනා ක්‍රමයට ගොවියන් තේරූ ආකාරය ගැනයි මා කිව්වේ. තාත්තාට අවුරුදු 50 යි. පුතාට අවුරුදු 20 යි. තාත්තාට අවුරුදු 50 ක් නිසා හොඳට ගොවිතැන් කර පළ පුරුද්ද තිබෙනවා. ඒ නිසා ඔහු ඉල්ලුවා. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය කියනවා, 45 ට වැඩි නිසා ගන්නේ නැත කියා. 45 ට වැඩි අයගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කර තිබෙනවා. තාත්තා ඉල්ලූ නිසා පුතා ඉල්ලුවේ නැහැ. අන්තිමේදී පුතාටත් තාත්තාටත් දෙන්නාටම ඉඩම් නැහැ. ඔන්න ඔය විධියේ තත්ත්වකටයි ඒ ඉඩම් කච්චේරිය හේතු කොටගෙන මුළු මාතර දිස්ත්‍රික්කයම පත් වී තිබෙන්නේ. ඒ නිසා ඒ ඉඩම් කච්චේරිය සම්පූර්ණයෙන්ම අවලංගු කර ඇමතිතුමාට වුවමනා හැටියට කොන්දේසි සකස් කර දැන්වීම් පළ කර නැවතත් සාධාරණ ලෙස ඉඩම් කච්චේරියක් පවත්වන්නය කියා අප ඉල්ලා සිටිනවා. මුළු මාතර දිස්ත්‍රික්කයේම සිටින සියලුම මන්ත්‍රීවරුන් මා හා එකඟ වෙනවා මේ ඉල්ලීමට. මේ ගැන අප සාකච්ඡා කළා. හක්මන මන්ත්‍රීතුමා ඇතුළු සියලු දෙනාම එකඟ බව ප්‍රකාශ කර තිබෙනවා. ඒ මොකද? මෙහි කෙරී තිබෙන්නේ වැරදි වැඩක්. එවැනි වැරදි වැඩවලට ඉඩ දෙන්න එපා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

ඊළඟට ගම්බද ප්‍රාදේශීය ඉඩම් කච්චේරි පැවැත්වීම ගැන කරුණු කීපයක් සඳහන් කරන්න කැමතියි. දැනට ගම්බදව තිබෙන ඉඩම් ප්‍රමාණයේ හැටියට ඉඩම් කච්චේරියකින් දෙනු ලබන ඉඩම් ප්‍රමාණය අක්කර 1/8 කට බැස තිබෙනවා. ඉල්ලුම්කරුවන්ගේ සංඛ්‍යාව වැඩි නිසයි මේ තරම් ප්‍රමාණයකට බැස තිබෙන්නේ. එහෙත් අඩුම ගණනේ අක්කර කාලක්වත් දීමට යම් වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් හොඳයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගෙවල් හදන්නද ?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඔව්, ගෙයක් සාදාගෙන පදිංචි වීමට අඩුම ගණනේ ගොවියෙකුට අක්කර කාලක්වත් දෙන්න ඕනෑ.

අනික් ප්‍රශ්නය, ගම් පුළුල් කිරීමේ ක්‍රමය යටතේ දකුණේ ඉඩම්වල අනවසරයෙන් ගොවීන් පදිංචි වී සිටිනවා. අවසරයක්ද නැතිව, බදු මුදල්ද නොගෙවා අවුරුදු පහක හයක සිට පදිංචි වී ඉන්නවා. තමුන්නාන්සේ පසු ගිය දිනවල නියෝගයක් නිකුත් කළා, ඒ විධියට පදිංචි වී සිටින අයට ඒ සඳහා බලපත්‍රයක් දෙන්නය කියා. තමුන්නාන්සේ ඉංග්‍රීසියෙන් කිව්වා, " රෙගුයුලරයිස් " කරනවාය කියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒක දැන් සිදු වී තිබෙනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

එහෙත් බොහෝම ප්‍රමාදයි. විශේෂයෙන්ම ඒ විධියේ ප්‍රදේශයක් නියෝජනය කරන කෙනකු හැටියට සෑම පෝය දිනකට පසු දිනක විශාල පිරිසක් සමග මට කච්චේරියට යන්න සිදු වී තිබෙන බව මට කියන්න පුළුවන්. අවුරුදු 5ක් 6ක් පදිංචි වී සිටි අයගේ ඉඩම් සඳහා බල පත්‍රයක් නිකුත් නොකිරීම නිසා සෑමදාම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට මුහුණ පාන්නට සිදු වන්නේ විශාල කරදරයකටයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

තුනෙන් පංගුවක් පමණ සම්පූර්ණ කර තිබෙනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

තුනෙන් පංගුව බොහෝම මදි. මීට වඩා වේගයෙන් වැඩ කරන්න ඕනෑ. ඒ ගැන මීට වඩා කඩිනමින් වැඩ කරන්නය කියා මා ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

ගම් පළල් කිරීමේ ක්‍රමය යටතේ ගොවියන්ට ගෙවල් සාදාගැනීම පිණිස රුපියල් 1,000ක් දීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා. කලින් 700යි දුන්නේ. දැන් රු. 1,000 දක්වා වැඩි කර තිබෙනවා. දැන් කාලේ හැටියට මේ ආධාර මුදල වැඩි කරන්න ඕනෑ. ඊට හේතුව මේකයි. තමුන්නාන්සේලා දන්නවා ඇති අද රටේ තිබෙන තත්ත්වය මොකක්ද කියා. බඩු මිල සෑහෙන ප්‍රමාණයකින් ඉහළ ගොස් තිබෙනවා. ගොඩනැගිලි උපකරණවල මිල ඒ වාගේම වැඩි වී තිබෙනවා. ඒ නිසා ඒ වැඩිවීම්වලට සරිලන පරිදි මේ ආධාර මුදල තවත් ටිකක් වැඩි කළ යුතුව තිබෙනවා. අඩුම ගණනේ තවත් 250ක් වත් වැඩි කර රුපියල් 1,250ක් වත් දෙනවා නම් යම්තමින් පිරිමහගන්න පුළුවන් වේවි. අද රජයේ සමහර සේවකයන්ට රුපියල් 20කුත්, තවත් කොටසකට රුපියල් 10කුත් වශයෙන් වැටුපක් වැඩි කර තිබෙනවා නම්, තමුන්නාන්සේලා විසින් ආරම්භ කර ඇති ආහාර වගා කිරීමේ ව්‍යාපාරයට සම්බන්ධ වී රට ස්වයංපෝෂිත කිරීමට අදාළ වන කාර්යයක යෙදී සිටින කොටසකට නොසලකා හැර සිටීමට කිසිසේත්ම ඉඩක් නැහැ. ඒ නිසා දැනටමත් ගෙවල් සාදාගෙන පදිංචි වී සිටින ගොවීන්ට රුපියල් 1,000ක් දෙනවා නම්, ඉදිරියට ඒ මුදල වැඩි කිරීමට යම් වැඩ පිළිවෙළක් යොදන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගම් පුළුල් කිරීමේ ක්‍රමය යටතේ ඇති ඉඩම්වල පස් සෝදා යෑම වැළැක්වීම පිණිස පසු ගිය කාලයේ ක්‍රම යොදා තිබුණා. ඒ ක්‍රම යොදන අවස්ථාවේදී ඉඩම් නිලධාරීන් ගිහින් ඒ සඳහා ආධාර මුදල් දුන්නා. දැන් ඒ ක්‍රමය නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

දැනුත් ඒ ක්‍රමය තියෙනවා. ආධාර මුදල් නොලැබෙන්නෙ ඒ නිලධාරි මහත්වරුන්ගේ නොසැලකිල්ලක් නිසා. ඒජන්තතුමාට කිව්වම ඒක හරිගස්සයි.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

තමුන්නාන්සේලා ඒ නිලධාරීන් උනන්දු කරන්නට ඕනෑ. විශේෂයෙන් පස ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට ඕනෑ. රජයෙන් ආධාරයක් දෙනවා නම්, ඒ ගොවීන් වෙනුවෙන් එය වැය කර ඔවුන්ට උපදෙස් දී එහි ප්‍රයෝජනය ගැනීමට ඔවුන්ට අවස්ථාව සලසා දෙන්නට ඕනෑ. නැත්නම් ඒ කැලෑ ඉඩම් එළි කර අවුරුදු කීපයක් යන විට පස සේදී ගොස් ඒ ඉඩම් නිසරු ඒවා වෙනවාට කිසිම සැකයක් නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඒකත් මම ඒජන්තතුමාට කියන්නම්.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

ඒ ගොවීන්ට ගම් පළල් කිරීම යටතේ ඉඩම් දී තිබෙනවා. එහෙත් මායිම් හරියාකාර නැති නිසා ඒ සම්බන්ධයෙන් ඔවුන්ට නොයෙකුත් කරදර ඇති වී තිබෙනවා. ඉඩම් කච්චේරියක් පවත්වන්නට පෙර ඉඩම් මණින්නට ඕනෑ; කැබෙලි කරන්නට ඕනෑ; සෑම ඉඩම් කැබෙල්ලකටම යාමට පාරක් ඇති කරන්නට ඕනෑ. දැනට ඉඩම් කට්ටි දී තිබෙන නමුත් ඒවාට යන්නට පාරක් නැහැ. ඒ නිසා ආරාවුල් ඇති වී මිනීමැරුම් පවා සිදු වී තිබෙනවා. හරියට මායිම් නැති නිසා, පාරවල් නැති නිසා ඉඩම් ලබා ගත් අය පොලිසිවල, ඩී. ආර්. ඕ. කාර්යාලවල, කච්චේරිවල කරදර වෙනවා. මේවා තමයි, අපට නිතර ලැබෙන පැමිණිලි. දින දෙක තුනකට උඩදී ඉඩම් කට්ටියක ගොවීන් දහ පහළොස් දෙනකු අතරේ විශාල සට්ටනයක් ඇති වුණා, ඉඩම් කැබෙලි වෙන් කර ගන්නට පාරවල් නැතිව. වතුර බොන ළිඳ කාගෙ ඉඩම් කැබෙල්ලට අයිතිද කියා තෝරා ගන්නට බැහැ. අවුරුදු 10ක් තිස්සේ මේ තත්ත්වය උද්ගත වී තිබෙන්නේ මිණින්දෝරු මහත්වරුන් නැති නිසයි. මා මේ දොස් කියනවා නොවෙයි. මුළු මාතර කච්චේරියටම ගම් පළල් කිරීමේ වැඩ පිළිවෙළ යටතේ ඉඩම් කැබෙලි කිරීමට, ඉඩම් කච්චේරි පැවැත්වීමට ඉන්නෙ එකම මිණින්දෝරු මහත්මයයි. මේ විධියට වැඩ කරන්නට පුළුවන්ද ? මේ තත්ත්වය පවතින විට තමුන්නාන්සේලා කොයි තරම් වෙහෙස මහන්සි වී වැඩ පිළිවෙළ සකස් කළත් එයින් ගොවි ජනතාවට ප්‍රයෝජනය ලබා ගන්නට බැහැ.

ආහාර අතින් රට ස්වයංපෝෂිත කිරීමේ වැඩ පිළිවෙල සම්බන්ධයෙන් ඉතාමත් වැදගත් වැඩ කොටසක් තමයි, තමුන්නාන්සේගේ ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයෙන් සිදු වන්නට තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය කොයි තරම් උත්සාහ දැරුවත්, නවීන ක්‍රමයට පෝර යොදන්නට නියම කළත්, ගොවීන්ට කොයි තරම් උපදෙස් දුන්නත්, ව්‍යාප්ති අංශයෙන් කොයි තරම් වැඩ කළත් තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ තිබෙන වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරියාකාර ක්‍රියා කළේ නැත්නම් එයින් වැඩක් නැහැ. තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන් හරියට වැඩ කෙරෙන්නේ නැත්නම් කෘෂිකර්ම ඇමති එම්. ඩී. බණ්ඩා මහත්මයාගේත් එතුමාගේ පාර්ලිමේන්තු ලේකම් පී. සී. ඉඹුලාන මහත්මයාගේත් උත්සාහයෙන් නියම ප්‍රයෝජන ලබා ගන්නට බැහැ. මේ රට ආහාර අතින් ස්වයම්පෝෂිත කිරීමේ මූලික වගකීම තිබෙන්නේ ඉඩම් ඇමතිතුමා අත බව මා ප්‍රකාශ කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

ගරු සභාපතිතුමනි, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගැන සඳහන් කරන විට මා විසින් ඉතාමත් කණගාටුවෙන් සඳහන් කළයුතු කාරණයක් තියෙනවා. අක්කර 50,000 ක පමණ කුඹුරු වගා කෙරෙන මුළු මාතර දිස්ත්‍රික්කයටම වාරිමාර්ග කාර්යාලයක් නැහැ. වාරිමාර්ග පිළිබඳව උපදෙස් දීමට කාර්මික නිලධාරියෙක් ඉන්නවා. ඒ නිලධාරියා පදිංචි කොහේද කියා සොයා බැලුවාම මට දැන ගන්නට ලැබුණා, ඔහු ගරාජ් එකක නැවතී සිටිනවාය කියා. ඒ නිලධාරියාට දොස් කියන්නට අපට පුළුවන්කමක් නැහැ. ඔහුට පදිංචි වීමට කාර්යාලයක් නැහැ. දිස්ත්‍රික් සම්බන්ධතා කමිටු රැස්වීමේදී මා මේ ගැන දෙවරක් කරුණු ඉදිරිපත් කළා. දෙවැනි අවස්ථාවේ දී මාතර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග කාර්යාලයක් පිහිටුවිය යුතු බව පිළිගෙන තිබීම ගැන මා ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ලබන 28 වැනිදා අගමැතිතුමා විසින් ඒ කාර්යාලය විවෘත කිරීමට තිබෙන බව දැන ගන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. එය විවෘත කළාට මදි. ඒ දිස්ත්‍රික්කයට වුවමනා වාරිමාර්ග කටයුතු කිරීමට අවශ්‍ය නිලධාරීන් සිටින්නට ඕනෑ. ඒ නිලධාරීන් ඒ වැඩ කටයුතු කරන්නට ඕනෑ. අද ඒ ගොවීන්ට නියම වෙලාවට වතුර ටික නැහැ. ඇනිකට් භාරව සිටින මුරකරුවන්ගේ උදාසීනකම හා නොසැලකිල්ල නිසා වතුර බෙදා හැරීම හරි හැටි සිදු නොවන නිසා විශාල යායවල වැඩ කරන ගොවීන්ට පාඩු සිදු වෙනවා. ඊයෙ-පෙරේදා ගොවීන් සමූහයක් මේ පිළිබඳව මාතර කච්චේරිය වට කරගෙන හිටියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒවයෙ මුරකරුවන් අයින් කරල ඒ අමුණු ගොවි මණ්ඩලවලට භාර දෙන්ට මම ලැහැස්තියි.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

බොහොම හොඳයි. එහෙම නම් ගොවීන් සන්තෝෂයෙන් භාර අරගෙන නියම වෙලාවට වතුර බෙදාගනියි. හැබැයි නඩත්තුව——

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මුරකරුවන්ට ගෙව්ව පඩිය ගොවි මණ්ඩලයට දෙනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

බොහොම හොඳයි. ගොවි කාරක සභා ඒවා පාලනය කරන විට, ගොවි ජනතාව විසින්ම ඒ ප්‍රදේශවල ඇනිකට් භාරව කටයුතු කරනවා කියා, අඩු ගණනේ මේ ලැබෙන දෝෂාරෝපනවලින්වත් ගැලවෙන්ට පුළුවන්කම ලැබෙනව. එවිට වතුර නැති වුණත් වග කියන්නට ඕනෑ ඒ උදවියයි. අද තනි පුද්ගලයකු භාරයේ තිබෙන නිසා ඒ පුද්ගලයන් හිතුවක්කාරව කටයුතු කරන විට මුළු මහත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවටම දොස් අහන්ට සිදු වී තිබෙනවා.

අ. භා. 5.15

වාරි මාර්ග කටයුතු සම්බන්ධයෙන් කථා කරන විට අප ප්‍රදේශවල තිබෙන පැරණි වැව් ගැනත් මතක් වෙනවා. පැරණි වැව් ප්‍රතිසංස්කරණය කිරීමට වැඩ පිළිවෙළක් යොදන්ට ඇමතිතුමා බලාපොරොත්තු වන බව ප්‍රකාශ කර තිබුණා. අපේ ප්‍රදේශයේ වැව් ගණනාවක් ගැන අමාත්‍යාංශයට කරුණු ඉදිරිපත් කළා. අපේ බස්නායක මහත්මයා රට පුරාම වැව් පරීක්ෂා කරගෙන ගිහින් වාර්තාවක් ඉදිරිපත් කළ බව අපට පත්‍ර මාර්ගයෙන් දැනගන්නට ලැබුණා. [බාධාකිරීමක්]

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ඇමතිතුමා ඉන්නෙ බස්නායක මහත්මයා යටතේද, නැත්නම් බස්නායක මහත්මය ඉන්නෙ ඇමතිතුමා යටතේද ?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඇමතිවරයකු හෝ වෙන කෙනකු හෝ වේවා ඕනෑම රටවැසියකුට අයිතිවාසිකමක් තිබෙනවා රට ස්වයංපෝෂිත කිරීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආධාර කරන්න. ඒ අනුව බස්නායක මහත්මයා රට හැමතැනම ඇවිදල වාර්තා වක් ඉදිරිපත් කර තිබෙනවා. එහි යම් යම් කරුණු අඩංගු වෙලා තිබෙනවා. රජයට ක්‍රියාවට පරිවර්තනය කරන්ට පුළුවන් යම් දෙයක් එහි තිබෙනව නම් රජයට එය ප්‍රමාද කරන්ට කරුණක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ප්‍රමාද කරන්නෙ නැහැ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
අන්න හරි. ඊළඟට මා මතක් කරන්ට කැමතියි, මාතර දිස්ත්‍රික්කයේ කිරල කැලේ යෝජනා ක්‍රමය ගැන. ඒ යෝජනාව ප්‍රථමවරට මමයි, මේ ගරු සභාවට ඉදිරිපත් කළේ. ඒ පසුගිය පාර්ලිමේන්තු වාරයේදීයි. ඒ යෝජනාව ඉදිරිපත් කිරීමෙන් පසුව දිසාපතිතුමාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීනුත් එහි ගොස් පරීක්ෂා කර බලා ඒ පිළිබඳව සැලැස්මක් හා ඇස්තමේන්තු සකස් කර අමාත්‍යාංශයට භාර දුන්න. අමාත්‍යාංශයට මේ කටයුත්ත සඳහා මුදල් නැති නිසා මුදල් සොයා ගන්න මාර්ගයකුත් මා පෙන්වා දුන්න, ගරු ඇමතිතුමාට.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒ ක්‍රමයට මුදල් ගන්න බැරි වුණා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
භාණ්ඩාගාරයේ පුස්කාපු නීතියක් නිසා ඒ විධියට මුදල් ලබා ගන්න බැරි වුණා. කෙසේ වෙතත් අද නිසරු බිම් හැටියට තිබෙන අක්කර තුන් හාර දහසක තරම විශාල ප්‍රදේශයක් මේ කිරල කැලේ යෝජනා ක්‍රමය අනුව සංවර්ධනය කරන්ට පුළුවනි. ඒ ප්‍රදේශයේ වතුර ටික බැස්සීමේ වැඩ පිළිවෙළක් අත්තිඩිය ක්‍රමය ආදර්ශයට ගෙන සකස් කළ යුතු යයි අපි අදහස් කළා. මම හිතන්නෙ අමාත්‍යාංශයේ නිලධාරීන් අත්තිඩියට ගිහින් මේ පිළිබඳව පරීක්ෂා කරලත් බැලුව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
අත්තිඩිය කටයුත්ත කළෙත් අපියි. ඕකත් ඒ විධියට කරනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
ටිකක් මම කථා කරන තුරු ඉන්නකො. අත්තිඩිය ක්‍රමය අනුගමනය කරල ඒ අන්දමට එන්ජින් දෙක-තුනක් සවි කරල වතුර ටික බස්වන්න වැඩ පිළිවෙලක්, රුපියල් ලක්ෂ 6ක තරම වියදමකින් අක්කර 4,000 ක් පමණ වගා කිරීමේ වැඩ පිළිවෙළක් අපි ඉදිරිපත් කළා. දැන් ඒ වැඩ පිළිවෙල තමුන්නාන්සේ භාර ගෙන තිබෙනවා. මේ අවුරුද්ද අවසානවන්ට පෙර එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට තමුන්නාන්සේ මහන්සි ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා. ඒක අප්‍රමාදව කළ යුතු දෙයක්. මේ කිරල කැලය පිහිටා තිබෙන්නෙ මාතර නගරයට යාබදවයි. මේ කිරල කැලේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළොත් මාතර, කඹුරුපිටිය, අකුරැස්ස, වැලිගම ආදි ආසනවල ඉඩම් නැති ගොවි ජනතාවට විශාල ප්‍රයෝජනයක් සැලසෙනවා. අද සම්පූර්ණයෙන් පාර දෙපැත්තේ කිරල වලින් ගහණ වී කැලයක් බවට පරිවර්තනය වී තිබෙන මේ ප්‍රදේශයෙන් ගත හැකි ප්‍රයෝජනය කොතරම්ද කියන එක මා තමුන්නාන්සේට පෙන්වා දෙන්න වුවමනා නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මාත් ඒක ඇතුළට ගියා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
ඇතුළට ගියා නම් කමක් නැහැ. අනික් කාරණය. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඡනිත්‍ය අඩුපාඩු නිසා අද ගොවීන්ට විශාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

කරදරවලට මුහුණපාන්ට සිදු වී තිබෙනවා, ජල ගැලීම්වලින්. මට පෙර කථා කළ අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) විසින් ජල ගැලීම්වලින් සිදු වන හානි සම්බන්ධයෙන් අදත්, ඊදත් කවදත් කරුණු ඉදිරිපත් කර තිබෙන නිසා ජල ගැලීම්වලින් මාතර දිස්ත්‍රික්කයේ ගොවීන්ට සිදුවන හිරිහැර කරදර ගැන මා නැවත නැවත මතක් කරන්ට යන්නෙ නැහැ. එහෙත් නිල්වලා ගඟ යෝජනා ක්‍රමය නිසියාකාර ක්‍රියාත්මක වන තුරු නිසි පිළිවෙළකට ජලගැල්ම නවත්වන්නට හැකි වේයැයි සිතීම සැක සහිතයි. එම යෝජනා ක්‍රමය ප්‍රමාද කරන්නේ කුමන කරුණක් හෙයින්දැයි මා ප්‍රශ්න කරනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ප්‍රමාද කරන්නෙ නැහැ; ඉක්මන් කරනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

සෑම වර්ෂයකම කියනවා, ඉක්මන් කරන බව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

රපෝර්තු ලබා ගන්නට ඕනෑ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

සෑම වර්ෂයකම රපෝර්තු ගැනත් කියනවා. රට ස්වයංපෝෂිත කිරීම සඳහා තමුන්නාන්සේලාගේ අගමැතිතුමා මෙතරම් උත්සාහයක් දරද්දී මෙවැනි වැඩ කටයුතු ප්‍රමාද කිරීම නිසා පහර වදින්නේ එතුමාගේ එම වැඩ පිළිවෙළටයි.

බණ්ඩත්තර වේල්ල දෙපැත්තෙන්ම බැඳ සුළු කොටසක් පමණක් ඉතිරි කර තිබෙනවා. ලක්ෂ ගණනක් වියදම් කොට එතරම් දුරට වැඩ නිමවා තිබෙතත් දෙතුන් දහසකින් කරන්නට හැකි ඉතිරි කොටස කරන්නේ නැහැ. [බාධා කිරීමක්] මා තමුන්නාන්සේ කැඳවාගෙන ගොස් එය පෙන්වා තිබෙනවා. ගොවීන් සමග තමුන්නාන්සේ සාකච්ඡා කරන අන්දම පෙන්වන පිංතූර පවා පත්‍රවල පළ වුණා. එහෙත් තවම වැඩ කටයුතු කෙරී නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

අප දෙදෙනාගේම පිංතූර පත්‍රවල පළ වුණා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගොවි ජනතාවට තමුන්නාන්සේ එදා පොරොන්දුවක් දුන්නා.

**කේ. බී. රත්නායක මයා.** (අනුරාධපුර)
*(திரு. கே. பி. ரத்னாயக்க—அனுராதபுரம்)*
(Mr. K. B. Ratnayake—Anuradhapura)

කොයි පත්‍රයේද ඒවා පළවුණේ ?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

"දිනමිණ" පත්‍රයේ.

තමුන්නාන්සේ අද කියනවා, ඉක්මන් කරන බව. නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක නොවෙන එකක් බවයි පෙනෙන්නේ. ජල ගැලීම් වැළැක්වීමේ වැඩ පිළිවෙළේ තිබෙන අඩුපාඩුව නිසා ගොවිතැන්වලට වදින්නේ බලවත් පහරක්. අද මාතර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව අක්කර 50,000 කින් පමණ අස්වැන්නක් ලබා ගෙන තිබෙනවා නම් ඇත්ත වශයෙන්ම ඊට උපයෝගි වී තිබෙන්නේ සුළු වාරිමාර්ග කටයුතුයි. ගොවිජන සේවා කොමසාරිස්වරයා යටතේ පවතින සුළු වාරිමාර්ග කටයුතු සංවර්ධනය වී තිබීම නිසායි, එම තත්ත්වයෙන්වත් අස්වැන්න ලබා ගෙන තිබෙන්නේ.

මීලඟට තමුන්නාන්සේ යටතේ තිබෙන රාජ්‍ය වැවිලි සංයුක්ත මණ්ඩලය පිළිබඳ වචනයක් ප්‍රකාශ කළ යුතුයි. එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මණ්ඩලයට කලුබෝව්ටියන සහ දැරංගල නමැති ජනපද භාර ගෙන තිබෙනවා. මීට ප්‍රථම එම ජනපද භාර වී තිබුණේ දිසාපතිතුමාටයි. එතුමා විශෙෂ නිලධාරීන් මාර්ගයෙන් මෙම ගොවිජනපදවල වැඩ කටයුතු ඉතාමත්ම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගියා. ඒවායේ සිටින ගොවීන් අද දවසේ වැඩි සතුටකින් සිටින බවක් පෙනෙන්නට නැහැ. දැරංගල තේ ෆැක්ටරිය ලංකාවේ පමණක් නොව මුළු ලෝකයේම තිබෙන හොඳ ෆැක්ටරිවලින් එකකැයි සඳහන් කරන්නට පුළුවනි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
තේ මිල ගැන අද පත්‍රයේ පළ වී තිබෙනවා. එම ෆැක්ටරි දෙකේ තේ මිල හොඳට නැග තිබෙනවා.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
එම ෆැක්ටරි හොඳ නිසායි, එසේ වන්නේ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
දැන් කලින් තිබුණාට වඩා තේ මිල වැඩියි.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
ගොවීන්ට රාත්තලක් සඳහා ගෙවන මුදල කොපමණද? මේ යෝජනා ක්‍රමවල පදිංචිව සිටින ගොවි ජනතාවට රාජ්‍ය වැවිලි සංයුක්ත මණ්ඩලයේ කර්මාන්තශාලාවටම තේ දළු දෙන්නය; ඉන් පිට දෙන්න එපාය කියා නියෝගයක් නිකුත් කර තිබෙන්නේ ඇයි? [බාධා කිරීමක්] කර්මාන්තශාලාව හොඳින් වැඩ කරනවා නම් එවැනි නියෝගයක් දෙන්නට වුව මනා කරන්නේ නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
එහෙම නියමයක් නැහැ.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
නැත්නම් හොඳයි. දිසාපතිතුමා යටතේ පැවති කාලයේදී තිබුණු සමූපකාර සමිති ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම අහෝසි කර තිබෙනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
දැන් ෆැක්ටරිය කෙළින්ම තේ දළු ගන්නවා. පැය 3 කින් අඹරනවා. කලින් සමූපකාර සමාගමක් ඒජන්ත හැටියට වැඩ කළා. එසේ කටයුතු කරද්දී වැඩ ප්‍රමාදයි. දැන් තේ දළු කෙළින්ම ෆැක්ටරියට ගන්නවා.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
සමූපකාර ක්‍රමයක් එතන ආරම්භ කර තිබුණා. ඒ ක්‍රමයටම වැඩ පිළිවෙළ යොදනවා නම් මීට වඩා ප්‍රයෝජනවත්ය යන්නයි, ගොවි ජනතාවගේ අදහස. ගරු ඇමතිතුමාට මේ පිළිබඳව නිසි විස්තරයක් පසුව ඉදිරිපත් කරන්නට අපි කල්පනා කරනවා. හාල් සේරුව කැපීමත් සමගම රටපුරා ආහාර වගා කිරීම සඳහා වැඩ පිළිවෙළක් ගෙන යාමෙන් ඉඩම් අමාත්‍යාංශයට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වුණා. ඒ අතර කැලෑ වගා කිරීමේ මුවාවෙන් කැලෑ විනාශ කිරීම පිණිස පිරිසක් ඉදිරිපත් වුණා. මා දුටුවා ඇමතිතුමා විශෙෂ නියෝගයක් නිකුත් කර තිබෙනව, වහාම එය නවත්වන්නටය කියා. එසේ වුණත් අද ඇති වී තිබෙන තත්ත්වය මොකක්ද? ඇත්ත වශයෙන්ම එය ඉතාමත් භයානක තත්ත්වයක්. කැලෑ නැවත වගා කිරීමේ ක්‍රමය යටතේ මැහොගනි ආදී ගස් වර්ග වවා ගෙන යනවා. නමුත් මේ වගාවන් විනාශ කර දැමීමේ වැඩ පිළිවෙළක් ඒ සමගම ගෙන යනවා. මා දන්නවා, මේ ගස් ඉදල් කෝටු සඳහා කපා ලොරිවල පටවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

කොළඹට ගෙනෙන බව. මෙය ජාතික අප රාධයක්.

මේය කරන්නෙ කොහොමදැයි තමුන් නාන්සෙ දන්නවාද? පෞද්ගලික ඉඩම කින් කෝටු කපා ගෙනෙන්නටය කියා ආදායම් පාලක නිලධාරිගෙන් බලපත්‍රයක් ලබා ගන්නවා. එසේ ලබාගන්නා බලපත්‍ර යෙන් තමයි දවස් ගණනාවක්ම කොළඹට කෝටු ගෙනෙන්නෙ. මෙම අලුත් වගාව ලින් කපා සකස් කර ගන්නා ලද කෝටු ලොරි වලින් කොළඹට සුමානයකට සැර යක් දෙකක් ගෙනෙනවා. මේ අවස්ථාවේදී වත්, අප මේවා ගැන හෙළි නොකළොත් ඒ සඳහා ඉක්මන් පියවරක් නොගත්තොත් කවදාවත් මේවා නවත්වන්න බැහැ, වගා වන්ගෙන් වැඩක් වෙන්නෙත් නැහැ. තත්ත්වය කොයි තරම් භයානකද කීවොත්, කැලෑ දෙපාර්තමේන්තුව මගින් බෙදා නොදුන් ඉඩම්වල පට්ටල් දමාගෙන ලී ඉරීම කරගෙන යන බව රහසක් නො වෙයි. ඒ විධියෙ තත්ත්වයක් අද පවතින් නෙ. එමනිසා මේ විධියට දිගින් දිගට කර ගෙන යන්න ඉඩ දුන්නොත් වටිනා දැව වර්ග සම්පූර්ණයෙන්ම නැති වී යනවාට කිසි ම අනුමානයක් නැහැ. එම නිසා මේවා නැවැත්වීමට නම් අවංක නිලධාරීන් ඒ ඒ තනතුරුවලට පත් කිරීමට ඇමතිතුමා ක්‍රියා කරන්න ඕනෑ. රුපියල් සියයක පමණ වැටුපක් ගෙවන සාමාන්‍ය නිලධාරීන් ලවා —බීට් ෆොරස්ට් ඕෆිසර් වැනි අය ලවා —මේ කටයුත්ත කරන්න බැහැ. මා දන් නවා, අපේ ප්‍රදේශයෙ සිටින එක් මහත් මයෙක් ගැන. මොහු කලින් කැලෑ දෙපාර්ත මේන්තුවෙ ප්‍රධාන කාර්යාලයෙ, කාර්යාල කාර්ය සහයක වශයෙන් සිටියෙ. එම තනතුරෙන් උසස් කොට මේ පදවියට පත් කළා.

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලි මේන්තු ලේකම්)**

*(திரு. சி. பி. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளு மன்றக் காரியதரிசி)*

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

ඒ තත්ත්වයට එන්න අයිතියක් නැද්ද?

**පර්සි වික්‍රමසිංහ මයා.**

*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*

(Mr. Percy Wickremasinghe)

තත්ත්වයෙන් උසස් කරන විට පඩි යෙනුත් උසස් කරන්න ඕනෑ බවයි මා කියන්නෙ. කවුරුන් හෝ තනතුරෙන් උසස් කළාට වරදක් නැහැ; කැලේ රජා කළත් කමක් නැහැ. නමුත් ඒ විධියෙ තනතුරුවලට පත් කරන විට තනතුරට සැහෙන, වගකීමට සැහෙන වැටුපක් ගෙවන්න ඕනෑ. දැනට ඒ උදවියට ලැබෙන පඩි මදි. ඒ නිසා සතියකට ලී ලොරි එකක්—දෙකක්වත් පිට කරන්නෙ නැතුව ජීවත් වෙන්න අමාරුයි. එපමණක් නො වෙයි, ඒ උදවියට අප්‍රමාණ වැඩ කටයුතු තිබෙනවා. උදේ සිට සවස් වන තුරු නො කඩවා වැඩ කරන්න ඕනෑ. ගස්වලට නොම් මර ගහන්න ඕනෑ, දෙපාර්තමේන්තුවට රපෝර්තු යවන්න ඕනෑ. ඔය විධියෙ දහ සක් වැඩ. එසේ වුණත් එදා තිබුණු පඩි ක්‍රමයමයි අදත් තිබෙන්නෙ. තත්ත්ව යෙන් ඕනෑ තරම් උසස් කරන්න, ඒකෙ වරදක් නැහැ. නමුත් වගකීම වැඩි වන විට ඒ අනුව වැටුප් ගෙව්වෙ නැතිනම් හොරකම් සිඩ වීම පුදුමයක් නොවෙයි. අද සිදු වී තිබෙන්නෙ ඒ දෙයයි. එම නිසා ඉක් මන් ප්‍රතිකර්මයක් යෙදිය යුතු බවයි මා කියන්නෙ.

විදුලි බලය සැපයීම ගැනත් වචනයක් කියන්න ඕනෑ. මගේ ප්‍රදේශයට උඩින්, හක්මන තංගල්ල ආදී ප්‍රදේශවලට විදුලි කම්බි ඇද තිබෙනවා. කම්බි උඩින් ඇද ඇතත් අප කරුවලේ.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பி. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

බොහොම විගහට පොඩි කම්බි සවි කරනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**

*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*

(Mr. Percy Wickremasinghe)

කඹුරුපිටියෙ ගම් සභා ප්‍රදේශය, කිරින්ද-පුහුල්වැල්ල ගම් සභා ප්‍රදේශය, තිහගොඩ ගම් සභා ප්‍රදේශය—කඹුරුපිටිය කීවාම, විශාල කඩපොළක් තිබෙන, විශාල ජනකායක් සිටින, ගහබොඩ පත්තුවේ මධ්‍යස්ථානයක්——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சி. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

ඒවාට දෙනවා.

පර්සි වික්‍රමසිංහ මයා.

(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)

(Mr. Percy Wickremasinghe)

පොඩ්ඩක් ඉන්න. ඇමතිතුමා කලබල වෙනව, එතුමා හොඳින් කිව්වත් කලබල වෙනවා; නරකින් කිව්වත් කලබල වෙනවා. මට නිකම් "දෙනවා" කියන වචන වුවමනා නැහැ. මගේ ආසනයේ රට උළු කර්මාන්තශාලාවක් තිබෙනවා. විදුලි බලයෙන් ක්‍රියා කරන පේශකම් මධ්‍යස්ථානයක් තිබෙනවා. හක්මන ගරු මන්ත්‍රීතුමාගේ (සිරිසේන හෙට්ටිගේ මයා.) ආසනයේත් ඉතා විශාල බලවේග මධ්‍යස්ථානයක් තිබෙනවා. මගේ ආසනයේ ආරෝග්‍ය ශාලාවක් තිබෙනවා; මාතෘ නිවාසයක් තිබෙනවා. හක්මන ආසනයේත් විශාල මාතෘ නිවාසයක් තිබෙනවා. මේ ආසන දෙකටම සරිලන විධියට තවත් මාතෘ නිවාසයක් තිබෙනවා. "ජේනරේටර්" සවි කර, විශාල මුදලක් යොදවා තමයි, මේ සියල්ලක්ම ක්‍රියා කරවන්නේ. රජයේ උළු කර්මාන්ත ශාලා රජයේ බලවේග මධ්‍යස්ථාන ආදි සියල්ලක්ම ක්‍රියා කරවන්නේ ඒ විධියටයි. එහෙත් ඒවා උඩින් මහා විදුලි කම්බි ඇද තිබෙනවා.

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சி. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

උඩින් විදුලි කම්බි ඇද තිබෙන්නේ, විදුලි බලය සපයන්නට තමයි.

පර්සි වික්‍රමසිංහ මයා.

(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)

(Mr. Percy Wickremasinghe)

උඩින් කම්බි දමා දැන් කොපමණ කාලයක් ගත වී තිබෙනවාද? තවමත් හීන් කම්බි දමන්නට බැරි වුණා. ලොකු කම්බිය ඇද ගත්තා. හීන් කම්බිය දැමීමටයි, ප්‍රමාදය තිබෙන්නේ. එදා කීවා, "ට්‍රාන්ස්ෆෝමර්" නැතැයි කියා.

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சி. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

දැන් තිබෙනවා.

අ. භා. 5.30

පර්සි වික්‍රමසිංහ මයා.

(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)

(Mr. Percy Wickremasinghe)

දැන් "ට්‍රාන්ස්ෆෝමර්" තිබෙනවාලු. "ට්‍රාන්ස්ෆෝමර්" තිබෙනවා නම් ඒවා යින් එකක් දෙකක් සවි කර ඒ කර්මාන්ත ශාලාවලට, ආරෝග්‍ය ශාලාවලට විදුලි බලය ලබා දෙන්න. කම්බි ඇද තිබෙන නිසා විදුලි බලය ලබා දීමට වැඩි අමාරුවක් නැහැ නොවැ?

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சி. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

කථා කරන තරම් ඉක්මනට කම්බි අදින්නට බැහැ. [බාධා කිරීම්]

පර්සි වික්‍රමසිංහ මයා.

(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)

(Mr. Percy Wickremasinghe)

ගරු ඇමතිතුමාගෙන් එක ප්‍රශ්නයක් අහන්නට කැමතියි. ඒ ගැන නියෝජ්‍ය සභාපතිතුමාත් බොහොම සන්තෝෂ වෙනවා ඇති. එතුමාත් රට දියුණු වනවාට කැමති කෙනෙක්. මගේ ආසනයේ තිබෙන කර්මාන්ත ශාලාවල සේවය කරන එතුමාගේ ඥාති පිරිසකුත් ඉන්නවා. ඒ නිසා ඇමතිතුමා කරුණාකර මේ පොරොන්දුව දෙනවාද? මේ පාර්ලිමේන්තු වාරය අවසාන වන්නට කලින් දක්ෂිණ ලංකාවේ ඒ කොටසට ඇමතිතුමා විදුලි බලය දෙනවාද නැද්ද?

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சி. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

නියෝජ්‍ය සභාපතිතුමනි, මා ඒ පොරොන්දුව දෙනවා. [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඇති, ඇති. වැඩිය කථා කරන්නට එපා. දෙන බවට ඇමතිතුමා පොරොන්දු වුණා. ඒ ඇති.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

එහාට පමණක් නොව හැම තැනටම—[බාධා කිරීම්]

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඇමතිතුමා දෙන්නට පොරොන්දු වුණා. ඒ ගැන අප ඉතාමත් සන්තෝෂ වෙනවා. හොඳ දේට ස්තුති කරන්නට ඕනෑ. ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමා මේ ගරු මන්ත්‍රීවරුන් ඉදිරියේ—තමුන්නාන්සේ වැනි කෙනකු මූලාසනයේ සිටිද්දී—පොරොන්දු වුණා, කඹුරුපිටිය, තිහගොඩ ආදි පළාත්වලට—මාතරින් එහා පැත්තට සම්පූර්ණයෙන්ම—විදුලි බලය සපයන්නට, මේ රජයේ කාලය තුළ මේ පාර්ලිමේන්තු වාරය අවසන් වන්නට කලින්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කතරගමට යන තෙක් දෙනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

කතරගමට යන තෙක්ම දෙනවාලු. මාතරින් එහාටත් දෙනවාලු. අප ඒ ගැන බොහොම සන්තෝෂ වෙනවා. දැන් කථා නොකළත් කමක් නැහැ. ඒ ඇසිද කීවොත්, පොරොන්දුවක් ලැබුණා නොවැ? නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාගේ (ඩොනල්ඩ් ජේ. රණවීර මයා.) ගෙදරටත්, යටියන කඩපොළටත් විදුලි බලය—[බාධා කිරීම්] යටියන රෙදි වියන මධ්‍යස්ථානය තිබෙන්නේ, නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාගේ ගමේ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

එහේ උළු කර්මාන්ත ශාලා දෙකක් තිබෙනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඔව්, පෞද්ගලික උළු කර්මාන්ත ශාලා දෙකක් තිබෙනවා. මගේ ගමේ එකක් තිබෙනවා; නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාගේ ගමේ අනෙක තිබෙනවා. ගරු ඇමතිතුමාගේ නෑයන් ඉන්නවා, මගේ ආසනයේ කරපුටුගල කියන ගමේ. [බාධා කිරීම්] මා වැඩිය කියන්නට යන්නේ නැහැ. මේ පාර්ලිමේන්තු වාරය අවසන් වන්නට කලින් අපට විදුලි බලය ලබා දෙන බවට ගරු ඇමතිතුමා පොරොන්දු වුණා. කලින් කථා කරන්නට හිතේ තබාගෙන හිටියත්, දැන් තවදුරටත් කථා කරන්නට යන්නේ නැහැ. දැන් අපේ වැඩේ කරන බවට පොරොන්දුවක් ලැබුණා නොවැ?

මාතර දැන් වාරිමාර්ග කාර්යාලයක් පිහිටුවා තිබෙනවා. ඒ මාර්ගයෙන් ගොවි ජනතාවට නියම ප්‍රයෝජනයක් ලබා ගැනීමට සෑම පියවරක්ම ගන්නා හැටියට මා ඉල්ලා සිටිනවා. ඉඩම් සංවර්ධනය සඳහා මාතර කච්චේරියේ තිබෙන අඩුපාඩුකම් සම්පූර්ණ කර දෙන හැටියට ඒ සමගම මා ඉල්ලා සිටිනවා. මාතර කච්චේරියේ ඉඩම් අංශයේ නිලධාරීන් බොහොම උනන්දු වෙන් වැඩ කර ගෙන යන බව ප්‍රකාශ කරන්නට කැමතියි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

අහන්නටත් සන්තෝෂයි.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගමනාගමනය සඳහා වාහන නම් නැහැ. එසේ හෙයින් ඒ වාහන ආදී අඩුපාඩු සියල්ලක්ම සම්පූර්ණ කරනවා ඇතැයි විශ්වාස කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. ඊ. තිලකරත්න මයා. (රත්ගම)**
*(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம)*
(Mr. D. E. Tillekeratne—Ratgama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට පෙර කථා කළ මගේ මිත්‍ර කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමාත් (පර්සි වික්‍රමසිංහ මයා.) අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමාත් (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) හැම අවුරුද්දේම ගරු ඉඩම් ඇමතිතුමාට නොයෙක් චෝදනා එල්ල කරනවා. විශේෂයෙන්ම අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා පසුගිය අවුරුදු පහක හයක කාලය තුළ ඉඩම් අමාත්‍යාංශය ගැන කියා ඇත්තේ එකම දේවල් බව මගේ කල්පනාවයි. එතුමාගේ කථා තැටිගත කර ඇත්නම් ඒවා සියල්ලක්ම එකම විධියේ කථා බව පෙනී යනවා ඇති. ඒ මන්ත්‍රීතුමාගේ කථා හරියට දවාලට පරිප්පුයි බතුයි, රෑට බතුයි පරිප්පුයි වගෙයි. [බාධා කිරීමක්] ගරු ඉඩම් ඇමතිතුමා පසුගිය ආණ්ඩුවට සම්බන්ධ වී සිටින විට එතුමාට විරුද්ධව එල්ල කරන ලද චෝදනාවලත් දැන් මේ ආණ්ඩුවට සම්බන්ධ වී සිටින විට එල්ල කරනු ලබන චෝදනාවලත් වැඩි වෙනසක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා උඩ වලවේ ව්‍යාපාරය ගැන යම් යම් කාරණා ඉදිරිපත් කළා. ඒ කාරණාවල සැලකිය යුතු ඇත්තක් තිබෙනවා. ඒ මන්ත්‍රීතුමා කීවාක් මෙන් පස්සා දොරෙන් රක්ෂාවලට යම් යම් පුද්ගලයන් රිංගවාගෙන තිබෙන බව මටත් කියන්නට සිදු වී තිබෙනවා. සමහර විට එසේ කර ඇත්තේ ඇමතිතුමාට හොරෙන් වන්නට ඇති. ඒ වාගේම ගංගා නිම්නභූමි සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමාට හොරෙන් වන්නට ඇති. උසස් නිලධාරීන්ට හොරෙන් වන්නට ඇති. ඒ ව්‍යාපාරය තුළ නොයෙකුත් විධියේ කූට වැඩ තිබෙන බවට අපට ආරංචි තිබෙනවා. නොයෙක් විධියේ කූට වැඩවලින් හැම දේශපාලන පක්ෂයටම සම්බන්ධ අය රක්ෂාවලට බඳවාගෙන තිබෙනවා. කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමාගේ ගෝලයකුත් බඳවාගෙන ඇති බව එතුමා කීවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்சி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගෝලයෙක් නොවෙයි; මගේ කොට්ඨාශයේ කෙනෙක්.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)

තමුන්නාන්සේගේ කොට්ඨාශයේ කෙනකු නම් ඔහු තමුන්නාන්සේගේ ගෝලයෙක්.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்சி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

එහෙම වන්නේ කොහොමද? ඔහු මට විරුද්ධව වැඩ කළ කෙනෙක්.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)

මට විරුඩවද වැඩ කරන ලද සිය ගණනක් බඳවා ගෙන තිබෙන බව මං දන්නවා. නොයෙකුත් ලියකියවිලි ගෙන්වාගෙන, නොයෙකුත් රහස් වැඩවලින් යම් යම් අය සේවයට ගෙන ඇති බව රහසක් නොවෙයි. දැන් ගරු ඇමතිතුමා මේ කරුණු ගැන සොයා බලාගෙන යනවා. ඒ පරීක්ෂා කිරීම් දිගටම ගෙන ගොස් තනතුරුවලට නුසුදුසු අය සිටිනවා නම් ඔවුන් ඉවත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. නුසුදුසු අය අස් කළාට කමක් නැහැ. [බාධා කිරීමක්] කොමියුනිස්ට්කාරයන් දහස් ගණනින් සිටිනවා.

ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කළ යුතු කාරණයක් ඉදිරිපත් කරන්නට කැමතියි. උඩ වලවේ ව්‍යාපාරයෙහි කිසිම රක්ෂාවකට කාන්තාවන් ඇතුළු කර ගැනීම සුදුසු නැහැ. උඩවලවේ ව්‍යාපාරය ස්ත්‍රීන්ට ඔබින්නේ නැති බවට අපට නොයෙකුත් ආරංචි තිබෙනවා. ඒ නිසා එහි මොනම රක්ෂාවක් සඳහාවත් ස්ත්‍රීන් බඳවා නොගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

ඊළඟට අප කවුරුත් පිළිගන්න කාරණයක් ගැන මා මතක් කරනවා. ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරුන් කීප වරක්ම මේ උඩ වලවේ ව්‍යාපාරය නරඹන්නට ගියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
අර ගමන.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
ඔව්, ගමන.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
නෑගිත් ලැබුණා.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
අපට වැඩිය නෑගි ලැබුණේ ඔය පැත්තට.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
නෑගි හොරකම් කරගෙනත් ගියාලු.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
නෑගි හොරකම් කරගෙන ගියෙ ඔය පැත්තෙන්.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
කවුද ? නම කියන්න.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
වුවමනා නම් එළියට එන්න කියන්න. මෙතැන නම කියන්න ලජ්ජයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
නෑහැ, නෑහැ. කියන්න.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
නෑහැ, මම නම කියන්නේ නෑහැ. මාව අවුස්සන්නට එපා. ඇවිස්සුවොත් ඔය මන්ත්‍රීතුමාමයි ලජ්ජා වන්නෙ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
නෑහැ, මට ලජ්ජාවක් වෙන්න දෙයක් නෑහැ.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
සහෝදර මන්ත්‍රීවරයකු හැටියට මා නම කියන්නේ නෑහැ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ගල්ඔය අරක්කු, බ්‍රැන්ඩි.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
ගල්ඔය ජින්, රම් ආදියත් තිබෙනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
නෑගිවලට ඒවත් තිබුණා.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උඩ වල වේ ව්‍යාපාරය ඉතාමත් වැදගත් ව්‍යාපාරයක්ය, එම ව්‍යාපාරයෙන් ලංකාවට විශාල සෙතක් ශාන්තියක් ඇති වෙනවාය, එම ව්‍යාපාරය අවසන් කළාම තවත් අක්කර දස දහස් ගණනක් ගොවිතැනට යට කරන්නට පුළුවන් වෙනවාය, කියා එදා විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුත් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුත් එකඟත්වයකට පැමිණියා. උඩ වලවේ ව්‍යාපාරය ගැන මා නොකීවාට කවුරුත් දන්නවා. එම නිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්නට අදහස් කරන්නේ නෑහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කඹුරු පිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) විදුලි බලය ඉල්ලුවා. ඊට කලින් මගේ ඡන්දදායක කොට්ඨාශයට සපයන මෙන් මා ඉල්ලා සිටිනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒකටත් දෙනවා.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)

ඒ ගැන මා සන්තෝෂ වෙනවා. කඹුරු පිටියට යන්නට මගේ කොට්ඨාශය පසුකර යන්නට ඕනෑ. අපට අවශ්‍ය විදුලි බලය සපයන්නට තමුන්නාන්සේ පුළුවන් තරම් මහන්සි ගන්න බව මා දන්නවා. තමුන්නාන්සේ කරන්නට බලාපොරොත්තු වන වැඩ කරන්නට අනෙක් අයගේ සහයෝගය ලැබේවායි මා ප්‍රාර්ථනා කර නවා. අපේ ගම් ප්‍රදේශවලට පමණක් නො වෙයි මුළු ලංකාවටම අවශ්‍ය විදුලි බලය සැපයීමට තමුන්නාන්සේට අවස්ථාව ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

ඊළඟට, මාදම්පේ ව්‍යාපාරය ගැන මා වචනයක් සඳහන් කරන්නට සතුටුයි. රුපියල් ලක්ෂ ගණනක් වියදම් කර ඒ ව්‍යාපාරය අවසාන කළා. ඒ ගැන මා ගරු ඇමතිතුමාට ස්තුති කරනවා. මාදම්පේ ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් වශයෙන් මේ කන්නයේදී අක්කර පන්සියයකට වැඩි ඉඩම් ප්‍රමාණයක ගොවිතැන් කරන්නට පුළුවන් වුණා. මේ නොබෝදා ඒ කුඹුරු වලින් ලැබුනු හාල්වලින් අපි කිරිබත් කෑ බව මා තමුන්නාන්සේට සන්තෝෂයෙන් මතක් කරනවා. හික්කඩුව යෝජනා ක්‍රම යෙන් වැඩ දැන් පටන් අරගෙන තිබෙනවා. ඒ ව්‍යාපාරයට ලක්ෂ 25 ක් පමණ වියදම් වෙනවා. ඒ ව්‍යාපාරයෙන් ප්‍රයෝජන අරන් ලබන අවුරුද්දේදීත් කිරිබත් කන්නට අප බලාපොරොත්තු වෙනවා.

තවත් කාරණයක් මතක් කරන්නට තිබෙනවා. ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතෙ මගේ කොට්ඨාශයේ මොන්රෝවියා වත්තේ පවුල් හාරසිය ගණනක් පදිංචි කරවා තිබෙනවා. නමුත් ඒ වත්තේ ගමේ පාරවල්වල කරත්තයක්වත් ගමන් කර වන්නට බැරි බව මා කණගාටුවෙන් ප්‍රකාශ කරනවා. ඒ ගැන මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා. කුමන මාර්ගයකින් හෝ මුදලක් වියදම් කර ඒ පාරවල් ටික අළුත්වැඩියා කිරීමට නිලධාරි මහතුන්ට නියෝග කරන මෙන් මා ඉල්ලා සිටිනවා. මොන්රෝවියා වත්තේ කැකිල්ලමංඩිය, ගල්කෙම්නාව, පන්විල, යනාදී ගම්වලට අයිති ඒ පාරවල් ටික කුමන මාර්ගයකින් හෝ අළුත්වැඩියා කර දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

තුනී ලෑලි කාර්මාන්ත ශාලාව ගැනත් මා වචනයක් කියන්නට ඕනෑ. කැලෑ දෙපාර්තමේන්තුවෙන් තුනී ලෑලි කර්මාන්ත ශාලාවට වුවමනා දැව ලබාගැනීමට දුෂ්කර වී තිබෙනවා. ඒ කාරණය සම්බන්ධව මා වාර්තාවකින් කොටසක් කියවන්නට සතුටුයි :

"The Island's requirements of tea chests at present are about 4 million. The projected demand by 1970 will be about 4.5 million chests. Until recently the Plywood Factory at Gintota produced about 17.5 per cent. of the Island's requirements, i.e., about .7 million tea chests. With the Expansion Programme put into effect recently it is proposed to double the production at Gintota, i.e., to meet 35 per cent.—40 per cent. of the Island's requirements of tea chests."

It goes on :

"For the manufacture of 40 per cent. of the Island's requirements of tea chests about 1.2 million cu. ft. of timber are required at Gintota. At present the supplies made by the Forest Department have been only about 50 per cent. of this requirement, although supplies are being effected even from the Sabaragamuwa and Western Provinces . . .

Hence the requirement of 3.5 million cu. ft. of timber for the two factories is a very modest estimate.

The total production of timber by the Forest Department annually for the past few years has been about 6 million cu. ft. Hence the Plywood Corporation alone needs about 50 per cent. of the total production of timber supplied by the Forest Department.

Certain difficulties in the extraction of timber particularly from inaccessible jungles have been pointed out to the Ministry of Lands by the Forest Department recently . . . . . .

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තිලකරත්න මයා.]

In view of the very short time available before the second Plywood Factory would go into production, it is imperative that suitable extents of forests be immediately demarcated to yield sufficient timber to meet the requirements of the 2 factories at Gintota and Sabaragamuwa . . . . . .

Further, if good motorable roads are constructed within forests the cost of supply would be reduced. Any capital invested on road construction into inaccessible jungles is amply repaid by reduced cost of extraction.

In the manufacture of tea chests at the Plywood Factory at Gintota, 50 per cent. of the total cost is cost of timber. Hence if prices of tea chests are to be brought down to give relief to the Tea Industry, it is necessary to reduce the cost of timber which is the main element of cost."

අ. භා. 5.45

මා මේ කාරණය පැහැදිලි කළේ අද ලංකාවේ හැම කැලයක්ම වාගේ විනාශ කරගෙන යන බව අප කවුරුනුත් දන්නා නිසයි. ආණ්ඩුවේ බලපත්‍ර අනුවත්, බලපත්‍ර නැතිව හොර රහසේත් කැලෑ විනාශ කිරීම දැන් බෙහෙවින් කෙරෙනවා. ඒ නිසා එසේ විනාශ කරනු ලබන කැලෑ වෙනුවට කැලෑවල් නව නවත් වගා කරන්නට සෑහෙන පියවරක් ගන්නට සිදු වෙනවා. එසේ නොකළොත් තවත් අවුරුදු දහයක් තරම ගත වුණාම අපට වුවමනා දැව ආදිය පිටරටවලින් ගෙන්වා ගැනීමටයි සිදු වන්නේ. එය ඉතා භයානක තත්ත්වයක් හැටියට කල්පනා කරන්නට ඕනෑ. ඒ නිසා ආණ්ඩුවෙන් දෙන බලපත්‍ර ඇති අය හෝ හොරෙන් පැමිණ ගස් කපන අය හෝ විනාශ කරන කැලෑ වෙනුවට අලුතින් කැලෑ වගා කරන්නට වැඩ පිළිවෙළක් යොදන ලෙස මා ඉතා ඕනෑකමින් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමා යටතේ තිබෙන සීනි සංස්ථාව මණ්ඩලය පසුගිය කාලයට වඩා විශාල ලාභයක් ගත වූ වර්ෂය තුළ ලබා තිබීම අපේ සතුටට කාරණයක්. රුපියල් ලක්ෂ හය සියයක පමණ ලාභයක් පසුගිය අවුරුද්දේ දී පෙන්වා තිබෙනවා. ඒ වගේම සිය ගණන් සේවකයන්ට රක්ෂා ලබා දී තිබෙනවා. රාජ්‍ය වැවිලි සංයුක්ත මණ්ඩලයත් පසුගිය වර්ෂයේ දී පෙරට වඩා ලාභයක් උපදවා තිබෙනවා. එය ලංකාවට විශාල ප්‍රයෝජනයක් අත් කර දෙන්නට මහන්සි ගන්නවා. මේ කරුණු ගැන අපේ සන්තෝෂය ප්‍රකාශ කරන අතරම මා නියෝජනය කරන කොට්ඨාශයේ අඩුපාඩුකම් ඉතා ඉක්මනින් ඉවත් කර දෙන ලෙස මතක් කරන්නට කැමතියි. විදුලි බලය ගැනත්, හික්කඩුවේ ජල යෝජනා ක්‍රමය ගැනත් මීට කලින් මා සඳහන් කළා. අවශ්‍ය තරම් ජලය ලබා දුන්නොත් තවත් කුඹුරු අක්කර දෙදාහකට වැඩි ප්‍රමාණයක් රත්ගම මෙන්ම අම්බලංගොඩත් වපුරන්නට පුළුවන් බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ආර්. බී. රත්නමලල මයා.** (කලාවැව)

*(திரு. ஆர். பி. ரத்னமலல—கலாவெவ)*

(Mr. R. B. Ratnamalala—Kalawewa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වර අය වැය ලේඛනය පිළිබඳ කාරකසභා අවස්ථාවේදී ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට තමුන්නාන්සේගේ අවසරය මා බලාපොරොත්තු වෙනවා. රජරට ප්‍රදේශයේ කලාවැව කොට්ඨාශයේ විශාල වශයෙන් ගොවිතැන් කෙරෙන බවත්, කාලාන්තරයක් තිස්සේ එහි ඉඩම් සෑහෙන ප්‍රමාණයක් අනවසරයෙන් අල්ලා ගෙන ගොවීන් ගොවිතැන් කරගෙන එන බවත් ගරු ඇමතිතුමා දන්නවා. ඒ කාරණය ගැන මේ ගරු සභාවේදීත්, ඒ වාගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරකසභා රැස්වීම්වලදීත් මතක් කර තිබෙනවා. අනවසරයෙන් ඉඩම් අල්ලාගෙන සිටින අයට ඉක්මනින් බලපත්‍ර නිකුත් කරන ලෙස මාත් වරින්වර මතක් කර තිබෙනවා. එහෙත් මොන කාරණයක් නිසා ඒවා නිකුත් කිරීම ප්‍රමාද වුණාදැයි දන්නේ නැහැ. එය හෙමින් හෙමින් කරගෙන යන බවයි පෙනෙන්නේ. ගොවිතැන් කිරීමේ නව සැලැස්ම අනුව අලුතින් ඉඩම් දීමේ ප්‍රතිපත්තිය උඩ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට කරදර වැඩියි කියා බලපත්‍ර දෙන ලෙස ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ට නියම කර තිබෙනවා. ඒ අය දැන් ගොවිතැන් වැඩ පටන් ගන්නට යන ඉඩම්වලට පමණක් සාමාන්‍යයෙන් හෙමින් හෙමින් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් දීම කරගෙන යනවා. එහෙත් අවුරුදු දහය, පහළොව, විස්ස තරම් දීර්ඝ කාලයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිස්සේ ඉඩම් අල්ලාගෙන සිටින උදවියට මේ දක්වා ඉඩම් කච්චේරි පවත්වා නැහැ. ඒ, මොන කාරණයක් නිසාදැයි දන්නේ නැහැ. ගරු ඇමතිතුමා අනුරාධපුර කච්චේරියේදී පවත්වන ලද සාකච්ඡා සභාවකදී ඉඩම්වලට බලපත්‍ර දීම ගැනත්, රජරට ප්‍රදේශයේ වාරිමාර්ග පහසුකම් ගැනත් රජරට ප්‍රදේශ නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම වාගේ කරුණු මතක් කර තිබෙනවා. එහෙත් ඒ රැස්වීමෙන් පසුව මෙතෙක් කල් පරණ ඉඩම් සඳහා ඉඩම් කච්චේරියක් පැවැත් වූ බවක් මට නම් දැනගන්නට නැහැ.

තවත් කරුණක් ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. අවුරුදු 4 ක් තිස්සේ මේ ගරු ඇමතිතුමාට මා මේ කාරණය කියා තිබෙනවා. රාජාංගන ජලාසයට යට වන නවගත්තේගම හා දෙමටවැව කියන ගම්වල වාසය කරන අය සඳහා මෙතෙක් කල් කිසියම් වැඩ පිළිවෙළක් අරගෙන නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඒ අයට ඉඩම්දීම සඳහා වැවක් බඳිනවා.

රත්නමලල මයා.
(திரு. ரத்னமலல)
(Mr. Ratnamalala)
ඒ ගැනත් වචන දෙක තුනක් කියන්නට ඕනෑ. ඒ ගම්වල අයට දීම සඳහා ලුණුවැව බැඳීමට මං යෝජනා කළා. ඒ සඳහා වැඩ කටයුතු දැන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් යන්තමින් ආරම්භ කර තිබෙනවා. ගොවි හමුදාවේ 300 ක් එහි පදිංචි කර තිබෙනවාය කියා දැනගන්නට ලැබුණා. එහි ගොවි හමුදාව පදිංචි කරවනවාය කියන ලියමන මට ලැබුණේ අදයි. ඒ නිසා ඒ සඳහා එහි යෑමට පුළුවන් වුණේ නැහැ. ලුණුවැව බැඳීම නම් තව අවුරුදු 4 කින් හෝ 5 කින් කළත් වරදක් නැහැ. රාජාංගන ජලාසයේ දොරවල් මෙවර සම්පූර්ණයෙන්ම නිම කර තිබෙන නිසා ඒවා සවි කළාම අර ගම් දෙකත් සම්පූර්ණයෙන්ම යට වෙනවා. ඒ ගම්වල අයට සිදු වන්නේ [illegible] වගේ පොට්ටනි බැඳගෙන මඟට බැසීමටයි. ලුණු වැව යටතේ බලහත්කාරයෙන් පදිංචි වී සිටින අයට නඩු දමන්නය කියා ගරු ඇමතිතුමා දිසාපතිතුමාට නියෝග කර තිබෙනවාලු. එහෙත් ඒ අය ඒ පළාතේ සිටින එක්සත් ජාතික පක්ෂයේ බලවතුන් දෙතුන් දෙනෙක් අල්ලා ගෙන ජලයෙන් යටවන ගම් දෙකේ අයට ඒ ඉඩම් නොදී බලහත්කාරයෙන් පදිංචි වී සිටින අයට ලබාගැනීමට කටයුතු කරනවාය කියා මට ආරංචියි. එහෙම කරනවා නම් එය වැරදි වැඩක්. මේ ප්‍රශ්නය උඩ ඒ අය දහ වරක් පමණ තමුන්නාන්සේ ඉදිරියට ආවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
බලහත්කාරයෙන් පදිංචි වී සිටින අය අයින් කර අනික් අයට ඒ ඉඩම් දෙන්නය කියා දිසාපතිවරයාට නියෝග කර තිබෙනවා. දිසාපතිවරයා මගේ නියෝගය පිළිපදින්නේ නැත්නම් ඒ ගැනත් මම බලාගන්නම්.

රත්නමලල මයා.
(திரு. ரத்னமலல)
(Mr. Ratnamalala)
තමුන්නාන්සේගේ ප්‍රකාශය පිළිගන්න මම නම් ලැහැස්තියි. එහෙත් අවුරුදු 4 ක් තිස්සේ කියන ඔය කියමන ගැන කියන්නට තිබෙන්නේ අර ගම් දෙකේ අය වතුරට යට වුණාට පසුව මටවත් තමුන්නාන්සේටවත් නැවත මතක් කරන්න එන්නේ නැහැ කියන එකයි.

ඊළඟට යෝද ඇලෙ සිට නාච්චදූව දක්වා කපන ඇල ගැන සඳහන් කරන්න කැමතියි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරි හැටියට කළා නම් මාස 2 කින් ඔය ඇල කපන්නට තිබුණා. ඒ තරමටම මැෂින් ආදිය එහි තිබුණා; එමෙන්ම ඒ දිනවල ලොකු උනන්දුවකුත් තිබුණා. එහෙත් අවසානයේදී ඇල බාගයට කපා වැඩ නතර කර තිබෙනවා. ඒ ඇල යන්නේ ගම් තුනක් මැදින්. ඒ අයටවත් ඒ ඇලෙන් ප්‍රයෝජනයක් නැහැ. ඒ අයටත් ඉඩම් නැතිවීම් පමණයි වුණේ. ඒ ඇල බලන්නට එන්නය කියා ගරු ඇමතිතුමාට මම කිව්වා. ජූලි 15 වැනි දා එනවා යයි පොරොන්දු වුණා. ඊට පසුව 15 වැනිදාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නමලල මයා.]

නියමිතව තිබුණු ඒ ගමන කල් දැම්මාය කියා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මහත් මයකුගෙන් මට ටැලිග්‍රෑම් එකක් ලැබුණා. ඒකත් හරියට කියවා ගන්නවත් බැහැ. ගරු ඇමතිතුමා රජ රට ඇති හැම ජන පදයකටම යනවා. එහෙත් ලක්ෂ ගණන් වියදම් කළ නාච්චදූවට ජලය සපයන ඇල බැලීමට නොපැමිණීම හොඳ නැහැ. ගරු ඇමතිතුමා රාජාංගනයට යනවා; අනුරාධ පුරයට යනවා; කැකිරාව මැදින් පොළොන්නරුවට හා මින්නේරියට යනවා. එහෙත් නාච්චදූව වැව බැලීමට එන්නේ නැහැ.

ඊළඟට බලලුවැවේ සිට නෑගම්පහ කෝරළේ මැදින් යන ඇල ගැන සඳහන් කරන්නට ඕනෑ. හැතැප්ම කාලක් පමණ වන ඒ ඇලේ වැඩ 1956 සිටම පටන් ගෙන තිබෙනවා. ඒ අවධියේදීත් ඉඩම් ඇමතිතුමා තමුන්නාන්සේමයි. මිනින්දෝරු මහත්වරුන් දහ පහළොස් දෙනකු ගිය අවුරුද්ද වනතුරුම ඒ ඇළ මැන්නා. රුපියල් 15 දාහක් 20 දාහක් පමණ ඒ සඳහාත් වියදම් වන්නට ඇති. එහෙත් ඇළ කැපීමේ වැඩ පටන් ගැනීමට අද වනතුරු කිසිවක් කර නැහැ. මෙහිදී කෑකෝගහන, තර්ජනය කරන මන්ත්‍රීවරුන්ගේ වැඩ කොයි ඇමතිවරුනුත් කරන බවයි මට පෙනෙන්නේ. මා සාමාන්‍ය මන්ත්‍රීවර යෙක්. ඒවාගේම මා අහිංසක මන්ත්‍රී වරයකු ලෙසත් කාටත් පෙනෙනවා. එම නිසා, සෑම ඇමතිවරයකුම මට සලකනවා මදි බව මට හොඳ හැටි පෙනී ගොස් තිබෙනවා. කලාවැව කොට්ඨාශයේ ඉඩම් පිළිබඳවත් ජල පහසුකම් පිළිබඳවත් නිසි පියවරක් ගන්නා හැටියට මා ගරු ඉඩම් ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ඊළඟට, කොයි කවුරුනුත් පාහේ මෙහිදී නිතර කියන කරුණක් මටත් දැන් කියන්නට සිදු වී තිබෙනවා. පොළොන්නරුව, මින්නේරිය ආදී ප්‍රදේශවලට ඉඩම් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු හැම වරප්‍ර සාදයක්ම තමුන්නාන්සේ ලබා දී තිබෙනවා. දැනුත් ලබා දෙනවා. එහෙත්, මා නියෝජනය කරන කලාවැව කොට්ඨා ශයේ කාගම, කටියාව යන ස්ථානවලටත් මහකටියාව ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය වත් හොඳ ඩිස්පෙන්සරි ගොඩනැගිල්ලක් වත් හොඳ ඉස්කෝල ගොඩනැගිල්ලක් වත් ඇත්තේ නැහැ. 1950 න් පසු හැදූ ජලාස හා ඇළවල් ප්‍රතිසංස්කරණය කර ලාත් නැහැ. මෙම අඩුපාඩු කම් බැලීමට කලාවැව ආසනයේ සංචාරය කිරීම සඳහා අඩු ගණනේ එක් දවසක්වත් නියම කර ගෙන තමුන්නාන්සේගේ දෙපාර්ත මේන්තු නිළධාරීන්ද සමග පැමිණෙන ලෙස මා ගරු ඉඩම් ඇමතිතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. කලාවැව යෝධ ඇළ ප්‍රතිසංස්කරණය කරන්නට පෙර, අවුරුදු සිය ගණනක් අහස් ජල යෙන් ගොවිතැන් කරගෙන සිටි, කලාවැව යෝජනා ක්‍රමයට අයත් වුණු ඉඩම් හිමියන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතට පත් වුණේ, ඔවුන් කලින් ගොවිතැන් කරගෙන සිටි ඉඩම්වලට අමතරව වැව් බැන්දායින් පසු දියුණු කෙරෙන ඉඩම් ගැනත් බලා පොරොත්තුවක් ඇතිවයි. මේ අය දැන් අවුරුදු ගණනක් තිස්සේ කියා පාන කරුණක් තිබෙනවා. ඔවුන්ගේ පුරාණ කුඹුරුවලින් අක්කරයකට රුපියල් 2 ක බද්දක් ගන්නවා. ඊළඟට අස්වද්දන ඉඩම් සඳහා අක්කරයකට රුපියල් 5 ක බද්දක් ගන්නවා. ඊළඟ ඉඩම් අක්කරය කට රුපියල් 10 බැගින් ගන්නවා, දිය බද්ද වශයෙන්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දිය බද්ද වශයෙන් රුපියල් 10 ක් ගැනීම වරදක්.

**රත්නමලල මයා.**
*(திரு. ரத்னமலல)*
(Mr. Ratnamalala)

දැන් මේ අය මගේ දුර්වල කමක් හැටියට මේ කාරණය නිතරම කියා පානවා. "රුපියල් 5 බද්දත්, රුපියල් 10 බද්දත් දෙකම ගන්නේ අපෙන්. එම නිසා පුරාණ කුඹුරු ඉඩම්වලින් අය කරනු ලබන දිය බද්ද ඉවත් කර එම ඉඩම් දිය බද්දෙන් නිදහස් කර දෙන්න" යි කිය මින් මේ මිනිසුන් ඉල්ලීමක් කරනවා. වැවකට අයත්ව පුරාණ කුඹුරු තිබෙන්නේ අක්කර 10, 15, 25 ආදී වශයෙනුයි. ඒවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජල බද්දෙන් නිදහස් කර දෙන ලෙසයි මේ ගොවීන් ඉල්ලන්නේ. එයින් රජයට පාඩුවක් වන්නේත් නැහැ. අවුරුදු ගණනක් තිස්සේ මේ ගොවීන් රජයට කඹුරලා තිබෙන තරම ඇති. එම නිසා ඒ පුරාණ කුඹුරු ජල බද්දෙන් නිදහස් කරන ලෙස මා ගරු ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ජල බද්ද වශයෙන් රුපියල් 10 ක් ගැනීම වරදක්. එය අඩු කරන්නට ඕනැ. ඒ ගොවීන් එම වාරිමාර්ග ක්‍රමවලට ඇතුළත් වන අවස්ථාවේදී ඔවුන් යම් කිසි ගිවිසුමකට බැඳුණා නම් එය වෙනස් කරන්නට මට බලයක් නැහැ. පරණ කුඹුරු වෙනුවෙන් අක්කරයකට රුපියල් 2 බැගින් ගෙවන්නට ඔවුන් පොරොන්දු වුණා නම් ඒ අනුව ඒ මුදල අය කරනවා ඇති. කෙසේ වෙතත් මා ඒ ගැන සොයා බලන්නම්.

අ. භා. 6

**රත්නමලල මයා.**
*(திரு. ரத்னமலால)*
(Mr. Ratnamalala)

නෑ ගරු ඇමතිතුමනි, කවුරු හෝ තමුන්නාන්සේට වැරදි මතයක් දී තිබෙන බවයි මට පෙනෙන්නේ. අදත් එදත් අහස් ජලය ප්‍රයෝජනයට ගෙන ගොවිතැන් කරන කුඹුරුයි වැඩි කොටසක් තිබෙන්නේ. කලාවැවේ ගොවිතැන් කෙරෙන කුඹුරු අක්කර 18,000 ක් පමණ තිබෙනවා. එයින් අක්කර 15,000ක් පමණ තිබෙන්නේ කලාවැව යෝධඇළ යටතෙයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කලාවැවේ සුළු වැව් යටතේ කුඹුරුවලින් අක්කරයකට රුපියල බැගිනුත් අනෙක් ඒවායින් රුපියල් 5 බැගිනුත් අය කරන බවයි මට දැනුම් දී තිබෙන්නේ.

**රත්නමලල මයා.**
*(திரு. ரத்னமலல)*
(Mr. Ratnamalala)

කලාවැව යටතේ ගොවිතැන් කරන කුඹුරුවලින් අක්කරයකට රුපියලයි. තිසා වැව යටතේ අක්කරයකට රුපියලයි. කලා වැවේ සිට තිසා වැව දක්වා ඇති හැතැප්ම 54 ක් වූ යෝධ ඇලෙන් වතුර ලබා ගන්නා ගොවියන් අක්කරයකට රුපියල් දෙකක් ගෙවනවා. අලුත් ඉඩම්වල අක්කරයකට රුපියල් 5 යි. දැන් සමහර අය 10 ක් ගෙවනවා. එසේ ගෙවූ බවට ඇති රිසිට් පත් පවා මා තමුන්නාන්සේට ගෙනැවිත් පෙන්වන්නම්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මම පරීක්ෂා කර බලන්නම්.

**රත්නමලල මයා.**
*(திரு. ரத்னமலல)*
(Mr. Ratnamalala)

මා දිගින් දිගට කථා කරන්නේ නැහැ. කොයි පැත්තෙන් සිටියත් 1956 සිටම අද දක්වා සිටින මේ ඉඩම් ඇමතිතුමා රජ රට සෑම තැනම තිබෙන ගහක්, ගලක්, පොකුණක්, අඩිපාරක් ගානේ දන්න නිසා මේවා පිළිබඳ අප දිගින් දිගට විස්තර නොකළාට එතුමා හොඳාකාරව දන්නවා. අසුවල් වැව දියුණු කරන්නය, අසුවල් ඇළ දියුණු කරන්නය කියා අප අමුතුවෙන් පැහැදිලි නොකළාට, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන අඩුපාඩුකම් එතුමා හොඳින් දන්නවා. ඒ නිසා මා ඒ ගැන ඇමතිතුමාට වැඩි කරදරයක් කරන්නේ නැහැ.

එදා ඇමතිතුමා කච්චේරියේ පැවැත්වූ සාකච්ඡා සභාවේදී පිළිගත්තා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවත්, අතර ඝට්ටනයක් තිබෙනවාය කියා. ඒ අනුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ තිබුණ වැව් 66 ක් කෙළින්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතට අරගැනීමට කරන ලද ඉල්ලීම ඇමතිතුමා පිළිගත්තා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒක ආණ්ඩුවෙනුත් අනුමත කර තිබෙනවා.

**රත්නමලල මයා.**
*(திரு. ரத்னமலல)*
(Mr. Ratnamalala)

ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී, ගැලවී කැඩී තිබෙන කොන්ක්‍රීට් වාන් බැමි 4 ක් බඳින්න තිබෙන බව මා එතුමාට කිව්වා. ඒ බැමි 4 බඳින්නේ නැතිව ඒ වැව් යටතේ ගොවිතැන් කරන්න බැහැ. ඒ නිසා නව ගොවිතැන් සැලස්ම අනුව කෙසේ වෙතත් පැරණි ක්‍රමයට අනුව ගොවිතැන් කරගෙන ආ ඒ කොන්ක්‍රීට් බැමි 4 හැකි පමණ ඉක්මනින් බැඳ දෙන්නය කියා මා ඉල්ලනවා.

එදා සාකච්ඡාවේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ පටන් අන්තිම නිලධාරියා දක්වා පැමිණ සිටියා. මා ඉදිරිපත් කළ තර්කවලට මා සමග ඒ නිලධාරි මහත්වරුන් අමනාප ගතියක් දැක්වූ බව මට ඒ මහත්වරුන්ගේ මුහුණු වලින් පෙනී ගියා. ඇමතිතුමා පමණයි අමනාප වුණේ නැත්තේ. අද වන තුරුම ඒ කොන්ක්‍රීට් බැමි 4 බැඳීමට කටයුතු යොදා නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා කිව්වා, මාස් කන්නෙට කලින් එය සාදන්නය කියා.

**රත්නමලල මයා.**
*(திரு. ரத்னமலல)*
(Mr. Ratnamalala)

මොන අමාත්‍යාංශයෙන්ද මා දන්නේ නැහැ උදේ සිට රෑ 12 වන තුරු ජීප් රථ නම් නිරන්තරයෙන්ම එහා මෙහා දුවනවා. දර වට්ටක්කා ආදිය පටවාගෙන යනවා. අප ඒ ගැන අමනාප නැති නමුත්, ඒ ජීප්වල කටයුතු කරන අය වැඩෙහි යොද වන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා අවසාන වශයෙන් ඉල්ලනවා.

**එස්. බී. ලේනව මයා.** (කැකිරාව)
*(திரு. எஸ். பி. லேனவ—கக்கிராவ)*
(Mr. S. B. Lenawa—Kekirawa)

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා ඇති, 1957 දී විශාල ජලගැල්මක් ඇති වී රජ රට විශාල විපතකට මුහුණ පෑ බව. අපේ විශාල වැව්—කලා වැව ආදී විශාල වැව්—27 කුත්, ඒ වැව් යටතේ ගොවිතැන් කෙරෙන අක්කර 86,560 කුත්, සුළු වැව් 1,100 කුත්, ඒ සුළු වැව් යටතේ ගොවිතැන් වන කුඹුරු අක්කර 45,000 කුත් විනාශ වී ඒ අනුව කුඹුරු අක්කර 1,31,560 ක් වපුරාගැනීමට බැරිව පුරන් වුනා. මේ සිද්ධිය ඇති වුණේ 1957-58 මුදල් වර්ෂයේයි. ඒ වැව් සියල්ලම 1961 වන විට සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කර අක්කර 1,31,560 ක් වපුරා ගැනීමට ගොවීන්ට සලස්වා දීම ගැන රජරට වාසීන් වෙනුවෙන් මා ගරු ඇමතිතුමාට අපේ කෘතඥතාවය පිරිනම නවා. මේ සඳහා කෝටි 4 ක් වියදම් වුණා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රෑ දවල් නොතකා මේ වැඩය කර දුන් නිසා අපට සෑහෙන තරම් වී ප්‍රමාණයක් රජයට දෙන්නට පුළුවන් වුණා. අප නිකම් රජයට වී දෙන්නෙ නැහැ. වී බුසලකට අපට රුපියල් 12 ක් ලැබෙනවා. එසේද වුවත් අක්කර 1,31,506ක් අස්වද්දන්නට නොලැබී පුරන් වුණා නම් අපට කවදාවත් ඔළුව උස්සා ගන්නට බැරි වන නිසා රජරට වාසීන් වෙනුවෙන් ගරු ඇමතිතුමා ටත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන්ටත් අප කෘතඥතා වය දක්වන්නට ඕනෑ. මේ තරම් විශාල ජල ගැල්මකින් කැඩී බිඳී ගිය වැව් මේ තරම් සුළු කාල සීමාවකදී සාදා දීම මා හිතන විධියට සිංහල රජ කාලයේදීවත් නොකෙරුණු තරම් විශාල වැඩක්.

1966 දීත් විශාල ජලගැල්මක් සහ විශාල සුළි සුළඟක් ඇති වුණු බව තමුන් නාන්සේලා දන්නවා. ඒ නිසා හොරොව් පතාන, මැදවච්චිය යන ආසනවල වැව් 111ක් කැඩී බිඳී ගියා. මේ වැව් යටතේ ගොවි ජනතාවගේ කුඹුරු අක්කර 6,000ක් පුරන් වන්නට ගියා. මේ සුළු කාලය ඇතු ළතදී රු. ලක්ෂ 16 ක වියදමින් මේ වැව් 111 ම සම්පූර්ණයෙන් බැඳ දුන් නිසාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඇමතිතුමාට රජරට වාසීන් වෙනුවෙන් මා ස්තුති කරන්නට ඕනෑ. ඒ සුළු වැව් යටතේ අක්කර 6,000ක් වැඩ නොවුණා නම් ගම් 111 ක පවුල් විශාල ගණනක ගම්බද ජනතාවට අවුරුදු දෙකක්වත් රජයෙන් ආධාර දීමට සිදු වෙනවා. එහෙත් වැව් 111 ම ගරු ඇමතිතුමා විසින් සාදවා දීම නිසා රජයෙන් කිසිම ආධාරයක් දෙන්නට වුවමනා වුණේ නැහැ. ඒ වැව් එසේ සාදවා දීම ගැන මා නැවතත් ගරු ඇමතිතුමාටත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන්ටත්, ජාතික රජයටත් ඒ පළාත්වාසීන් වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, ගම්බද වැව් අමුණු දියුණු කර ගැනීමේ ප්‍රතිපත්තියක් අප යෝජනා කළා. ඒ අනුව ගරු ඇමතිතුමා සබ් ඩිවිෂනල් ඔෆිසස්—ප්‍රාදේශීය කාර්යාල—3 ක් දැනටම විවෘත කර තිබෙනවා, ගලෙන් බිඳුණු වැව, කැකිරාව සහ මහකන දරාව යන ප්‍රදේශවල. මේ කාර්යාල තුන පිහිටුවා, ආදායම් පාලක නිලධාරි කාර්යාල මාර්ගයෙනුත්, ගොවි සමිති මාර්ගයෙනුත් කරුණු ඉදිරිපත් කර ඒ පළාත් වාසීන්ට අවශ්‍ය ඕනෑම වැවක් ප්‍රතිසංස්කරණය කර ගැනීමට පුළුවන් අන්දමට කටයුතු සලස්වා තිබෙනවා. මෙවැනි තවත් කාර්යාල බිබිලේ, අනුරාධපුර, මොණරාගල, මහඔය යන තැන්වලත් විවෘත කිරීමට ගරු ඇමතිතුමා අදහස් කර තිබෙන බව පත්‍ර මාර්ගයෙන් අපට දැන ගන්නට ලැබුණා. ඇත්ත වශයෙන්ම දුප්පත් ගම්බද ජනතාවට විශාල වැව් දියුණු කරනවාටත් වඩා ප්‍රයෝජනවත් වන්නේ ඒ ඒ ගම්වල තිබෙන සුළු වැව් දියුණු කිරීමයි. ඒ ගම්වල සිටින, තමන්ගේ පවුල නඩත්තු කර ගැනීමට තරම් වත් පොහොසත්කමක් හෝ රක්ෂාවක් හෝ ඉඩමක් හෝ නැති කෙනකුට ගම්වල තිබෙන සුළු වැව් දියුණු කිරීමෙන්, වැඩි කලක් යන්නට පෙර එහි ප්‍රයෝජනය ලබා ගැනීමට පුළුවන් වන නිසා ඒ සුළු වැව් ප්‍රතිසංස්කරණය කරවීම ගැන ගරු ඇමතිතුමාටත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන්ටත්, මහජන රජයටත් මා ස්තුතිවන්ත වෙනවා. දැනට මත් රුපියල් 19 ලක්ෂයක වියදමින් සුළු වැව් රාශියක් ප්‍රතිසංස්කරණය කර දී තිබෙනවා.

දැන් අප කාගේත් අදහස් උදහස් නැමී තිබෙන්නෙ සංවර්ධන කටයුතු සඳහා බව මා ඊළඟට මතක් කරන්ට කැමතියි. ලංකාවේ සංවර්ධන කටයුතු අතර පළමුවෙනි තැන දිය යුත්තේ ගොවි කර්මාන්තයටයි. ඇත්තෙන්ම ඊළඟට කර්මාන්ත සංවර්ධනයත් අවශ්‍යමයි. ඒ ඒ ප්‍රදේශවල ජනතාවට සුදුසු කර්මාන්තයන් ඒ ඒ ප්‍රදේශවල පිහිටුවා දීම රටට මහෝපකාරී වන බව මතක් කරන්ට කැමතියි. ජාතික රජය පටන් ගෙන තිබෙන උඩවලවේ ආදි විශාල වාරිමාර්ග කටයුතු ගැන කල්පනා කර බලන විට පෙනී යනව, සුළු කාලයකදී අපට එයින් ප්‍රතිඵල ලබා ගන්ට පුළුවන් බව. පසුගිය දා මම එහි ගොස් ඒ කටයුතු නැරඹුවා. මා අපේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, මේ ඇමතිතුමාගේ වැඩ කටයුතු ගැන පිකක් එහි ගොස් පරීක්ෂා කර බලන්න කියා. බොහෝවිට අපට බලන්ට ලැබෙන්නෙ වාර්තා පමණයි. ඇත්තවශයෙන්ම වාර්තාවලින් අපට නිගමනයකට බහින්ට අමාරුයි. ඒ නිසා ඇස්වලින්ම බලා ගන්නව නම් හොඳයි. විරුද්ධ පාර්ශ්වයත් අපිත් එකතුවෙලා මේ රටේ ගොවි කර්මාන්තය දියුණු කර රට සංවර්ධනය කරන්ට මහන්සි ගන්නව නම්, ඇමෙරිකාව, ඉන්දියාව, රුසියාව, චීනය ආදි රටවලින් අපට අවවාද වුවමනා යයි මා හිතන්නෙ නැහැ. සිංහල මනුෂ්‍යයා විශේෂයෙන්ම වැව් කර්මාන්තය ගැන ඉතා ශුර පුදුම ඥානයක් ඇති මිනිහෙක්. ඔය පිටරටින් එවන වාර්තා කියවා බලා ඒවා තේරුම් ගෙන අපේ රට සංවර්ධනය කරන්ට ගියොත් තව අවුරුදු විස්සක්-තිහක් ගත වෙයි. ඒ වගේම එයින් ලැබෙන ප්‍රතිඵලත් බොහොම අඩු වෙයි කියායි මා විශ්වාස කරන්නෙ. පිටරටින් එන බොහෝ විශේෂඥයින් අපේ වැකම්, මැටියෙන් සහ පසෙන් කර තිබෙන අපේ වැකම්, දැක මවිත වන බව තමුන්නාන්සේ දන්නවා ඇති. උන්නැහේලාගේත් අපේ පැරණි මුතුන් මිත්තන්ගේත් අදහස් කොහොමද කියන එක මෙයින්ම පෙනී යනවා.

ගොවි කර්මාන්තයෙන් පමණක් රටක් දියුණු කරන්ට අමාරුයි කියන ප්‍රකාශය මා කලින් කළා. තව අවුරුද්දක් ගත වන්ට පෙර රජ රටට විදුලි බලය ලබා දෙන්ට ගරු ඇමතිතුමා කටයුතු කරගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලේනව මයා.]

යන බව අපට ආරංචියි. එහෙම විදුලි බලය ලැබෙනව නම් අපට තිබෙන සුළු කුඹුරු වල වැඩ කර ගන්න ගමන්ම මාසයකට රුපියල් පනහක—හැටක තරම අමතර මුදලකුත් සෑම පවුලකටම හම්බ කර ගැනීමට අවස්ථාවක් ලැබෙන බව මතක් කරන්ට කැමතියි. නොයෙක් කර්මාන්ත කරන්ට දක්ෂ උදවිය අපේ පළාත්වල සිටින නමුත් විදුලි බලය ආදි පහසුකම් නැති නිසා ඒ උදවිය කුඹුරටත් හේනටත් පමණක් සීමා වී සිටිනවා. ඒ ප්‍රදේශයට විදුලි බලය සැපයීමට දැනට කොන්ත්‍රාත් පවා අත්සන් කර අවසාන බව ආරංචි වී තිබෙන නිසා ඒ සම්බන්ධයෙන් ජාතික රජයටත් ගරු ඇමතිතුමාටත් අපි කෘතඥ වෙනවා.

අ. භා. 6.15

ගරු සභාපතිතුමනි, ඈත කාලයේ පටන්ම අවුරුදු 4 කට 5 කට වරක් විශාල දුර්භික්ෂයක් අපේ රටේ ඇති වන සවභාවයක් තිබෙනවා. මේ දුර්භික්ෂය කිසිම කෙනෙකුට වළක්වන්න බැහැ. ඒ දුර්භික්ෂය ඇති වන්නෙ වර්ෂාව නැතිකම නිසයි. අපි කොයිතරම් වැව් අමුණු බැන්දත් වර්ෂාව නැත්නම් අපට ඒ දුර්භික්ෂය නැති කරන්ට පුළුවන්කමක් නැහැ. එම නිසා මේ තත්ත්වය නැති කිරීම සඳහා ගරු ඇමතිතුමා විසින් මහවැලි ගඟ රජරටට හැරවීමට තීරණය කර අවසානයි. එයින් රජරටට විශාල සෙතක් සැලසෙනවා නො අනුමානයි. රජරටට සෙත සැලසෙන විට ඇත්තවශයෙන්ම මුළු ලංකාවටම සෙත සැලසෙන බව ඒකාන්තයි.

කනගාටුවෙන් නමුත් එකක් මතක් කරන්නට සිදු වී තිබෙනවා. එනම්, උඩරට ගැමි කොමිෂන් සභාව පිළිබඳවයි. උඩරටය කියා කොටසක් වෙන් කරගෙන එම කොටසට සම්පූර්ණ සහාය දෙන බවකුයි, දැන් අපට පෙනී යන්නේ. එහෙත් රජ රට ප්‍රදේශය උඩ රටටත් නැහැ, පහත රටටත් නැහැ. අවුරුදු දෙදහස් ගණනකටත් පෙර සිට දකුණු ඉන්දියානුන් සමග නොයෙකුත් අරගලවලට අප මුහුණ දුන්නා. රජරට ඕනෑම කැලයකට ගොස් බැලුවොත් එක්කෝ පැරණි මාලිගාවක් නැතිනම් පැරණි වෙහෙරක් විහාරයක් වශයෙන් කිව හැකි ස්ථානයක නටබුන් දකින්නට ලැබෙනවා. රජරට ජනතාවගේ අතීතය එයින් පෙනෙනවා. එහෙත් රජ රට වෙසෙන අප මේ දක්වාම උඩරට ගැමි කොමිෂන් සභාවට ඇතුළත් කරගෙන නැහැ. පෘතුගීසීන්, ඕලන්දකාරයන් සහ ඉංග්‍රීසීන් නිසා විනාශ වුණු ප්‍රදේශ යනුවෙන් වෙන් කරගෙන යම් යම් කොටස් වලට පහසුකම් දෙතත්, අවුරුදු දෙදහසකටත් අධික කාලයක සිට දකුණු ඉන්දියානුන්ගෙන් බැට කෑ අපට කවදාවත් සහනයක් නැහැ. යාපනය සහ ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවල ද්‍රවිඩ සහෝදරයන්ගෙන් කිසිදු හානියක් අපට සිදු වුණේ නැහැ. අපට හානි සිදු වුණා නම් සිදු වුණේ දකුණු ඉන්දියානුන් ගෙනුයි. අපේ රජරටත් ඔය උඩරට ගැමි කොමිෂන් සභාවට පවරා ගෙන උඩරට ප්‍රදේශවලට දෙන සහායයෙන් දහයෙන් එකක්වත් දෙනොත් ලංකාව දියුණු කිරීම උදෙසා අපගේ සහාය යත් නොපිරිහෙලා ලැබෙනවා ඇතැයි ප්‍රකාශ කරමින් මගේ කතාව අවසාන කරනවා.

**ලීලාරත්න විජේසිංහ මයා.** (පොළොන්නරුව)

*(திரு. லீலாரத்ன விஜேசிங்க—பொலன்னறுவை)*

(Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ වචන සවල්පයක් කතා කිරීමට මා කල්පනා කරනවා. මේ රටේ ඉතිහාසය සිහිපත් කරවන පැරණි නටබුන් සහ වැව් අමුණු ආදිය සිහිපත් කරවමින් අපේ මතකය අතීතය කරා යොමු කරවමින් කැකිරාවේ ගරු මන්ත්‍රීතුමා (ලේනව මයා.) විසින් පවත්වන්නට යෙදුණු කතාව අසා මා විශෙෂ සතුටට පත් වුණා. එහෙත් මෙහිලා එක් කරුණක් සඳහන් කරන්නට සිදු වී තිබෙනවා. අපේ පැරණි ඉතිහාසය ගැන කියා අපි ආඩම්බර වෙන නමුත් එවැනි අළුත් ඉතිහාසයක් නම් අපට ගොඩ නගන්නට පුළුවන්කමක් නැහැ. අපි අපේ පැරන්නන්ගේ ඉතිහාසය ගැන කිය කියා සිටිනවා මිස අළුත් ඉතිහාසයක් ගොඩ නගන්නට අපට ඕනෑකමක් තිබෙන බවක් නම් මට පෙනෙන්නට නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධිරාජ්‍යවාදී යුගයෙන් පසු මෙරටට නිදහස ලැබුණාට පසුව මේ රටේ කෘෂිකර්ම කටයුතු සඳහා විශාල මුදලක් වැය කළා පමණක් නොව සෑහෙන වේගයකින්ද මේ රටේ ඉඩම් සංවර්ධනය කිරීමේ කටයුතු කර ගෙන ගියා. එසේ වුවත් තවම අප රටට අවශ්‍ය කරන ආහාර ද්‍රව්‍ය වත් නිසියාකාර නිපදවා ගන්නට අපට පුළුවන්කම ලැබී නැහැ. අපේ ගරු ඇමතිතුමාත් පසුගිය වකවානුව මුල්ලේ කඩින්කඩ හෝ ඉඩම් සංවර්ධන අංශයේ කටයුතුවල නිරතව සිටින බව පෙනෙනවා. ඉඩම් කොමසාරිස් වරයකු වශයෙන්, දිසාපතිවරයකු වශයෙන් සහ ඉඩම් ඇමතිවරයා වශයෙන් එතුමා දීර්ඝ කාලයක් බොහොම දක්ෂ ලෙස කටයුතු කර තිබෙනවා. එහෙත් මේ රටේ සංවර්ධනයට හේතු වන ජීවනාලිය යයි කිව් හැකි ඉඩම් අමාත්‍යාංශය තරම් දූෂණ සිදු වන අමාත්‍යාංශයක් ඇත්තේම නැත යන්නයි මා කියන්නේ. ඉඩම් කච්චේරි පැවැත්වීම, ඉඩම් මැනීම සහ ඉඩම්වලට ඔප්පු තිරප්පු ලබා දීම, යනාදී සියලුම කටයුතු දූෂිතයි; නිදා වැටෙන සුළුයි. ඒවා යන්නේ, ගොළුබෙලි ගම නින්. වාරිමාර්ග අංශයත් සෑම අතින්ම වාගේ අන්ත දූෂණකම්වලින් පිරී තිබෙනවා. සමහරවිට ඇමතිතුමා මේවා නොදන්නවා දැයි සිතෙනවා. මේවායේ නිරතර සිටින නිලධාරීන්ගේ වැරදි ක්‍රියා පිළිබඳව කොතෙක් චෝදනා කළත් ගරු ඇමතිතුමා කිසිම විදියකින් හෝ ඒ අයට දඬුවම් කළාය කියා දැනගන්නට ලැබී නැහැ.

පසුගිය දිනවල පොළොන්නරුවේ ගිනිපෙව්ටි පාලම කැඩී ගියා. හදිසියේම ගරු ඇමතිතුමා එහි ගොස් එය බලා ආවායැයි අසන්නට ලැබුණා. ඒ පාලම කැඩෙන්නට හේතුව කුමක්දැයි එතුමා විමසා බැලුවාද? එම පාලමේ වතුර කානු 5කින් යනවා. එයින් එක ස්ථානයක් සම්පූර්ණයෙන්ම කැඩී ගියා. ඉතා නොසැලකිලිමත් විදියටයි, මෙය සකස් කර තිබෙන්නේ. මේ පාලම යට අත්තිවාරම තියෙන්නේ මඩ ගොඩක් උඩයි. මේ පාලමේ කණු සාදා තිබෙන්නේ ඒ මතයි. සිල්පර කොට දමා මුක්කු ගහලයි තියෙන්නේ. අවුරුදු එකහමාරක් පමණ කාලයක් තිස්සේ මෙය අබලන් බවට පත්ව තිබුණා. රුපියල් 3,600 කට ඇස්තමේන්තුවක් සකස් කරන අවුත් සේරම කොන්ත්‍රාත්කාරයන්ගෙන් ඇසුවා, ඒ මුදලට එය කරන්නට පුළුවන්ද කියා. එහෙත් එම මුදල ප්‍රමාණවත් මදි බව කියා ඒ කිසිවකු එය භාර ගත්තේ නැහැ. දැන් රුපියල් ලක්ෂ ගණන් වැය කරමින්, බැම්ම සකස් කරගෙන යනවා. ඔක්තෝබර මාසයට පෙර වෙන් කර ඇති මුදල් වියදම් කරන්න ඕනෑ නිසා මහ කලබලයෙන් මේ වැඩ කරගෙන යන බව පෙනී යනවා. නමුත් කල්වේලා ඇතුව ඇස්තමේන්තු සකස් කර මේ කටයුත්ත කළා නම්, කවදාවත් මෙය කඩා වැටෙන්නෙ නැහැ. පාලම සම්පූර්ණයෙන්ම කඩා වැටුණෙ නමුත්නාන්සෙගෙ නිලධාරීන්ගෙ ඇති අකටයුතුකම් නිසා බව සඳහන් කරන්න ඕනෑ. එම නිසා ඒ කාරණා ගැන පරීක්ෂා කර බලන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ වාගේම එම ස්ථානයේ වැවක් බැඳීමට නමුත්නාන්සේ යෝජනා කර ඇති බව ආරංචියි. ගිනිපෙව්ටි පාලම සකස් කරන ගමන්ම එතැනින් වතුර ලබාගෙන වැවක් තනා, එම වැවෙන් බීඕපී 400, 398 ඉඩම් කෑබලිවලට වතුර දීමේ වැඩ පිළිවෙළක් නමුත්නාන්සේ යෝජනා කර තිබෙනවා.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මම යෝජනා කළා; නමුත් දෙපාර්තමේන්තුව කියනවා එය කරන්න බැරිය කියා.

ලීලාරත්න විජේසිංහ මයා.
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)

දැන් එය කරන්න බැරි බවද ඇමතිතුමා කියන්නෙ?

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒක කරන්න ගියොත් තව අවුරුදු කීපයක් ගත වේවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)

එහෙම නම් බීඕපී 400 ට වතුර දෙන්න තවත් බටයක් දමන්න වෙනවා. එහෙම බටයක් දැම්මොත් තමයි දිගටම 400 ටත් 398 ටත් වතුර දෙන්න පුළුවන් වෙන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

බී.ඕ.පී 292 කොටසට ගිහයක් නැතුව දිගටම වතුර දෙන්න පුළුවනි.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)

මේ මෝසම අවසන් වෙන්න ඉස්සර දෙන්න පුළුවන්ද? අඩු වශයෙන් අනික් මෝසම පටන් ගන්න පෙර දෙන්න බලන්න.

මාදුරුඔය පොල් වැවිල්ල ගැනත් මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. තමුන්නාන්සෙ පොල් වැවීම සඳහා දුප් පත් උදවියට, හාරසිය ගණනකට, අක්කර 5 ගණනෙ ඉඩම් බෙදා දුන්නා. මේ සඳහා රුපියල් ලක්ෂ 12 කට වැඩිය වියදම් කළා. අද මාදුරුඔය පොල් වැවිල්ලට කියන්නෙ දුප්පතාගෙ බෙලි කැපිල්ල කියලයි. එපමණ විශාල මුදලක් වියදම් කළත් එයින් සතයකවත් ප්‍රයෝජනයක් සැලසී නැහැ. අනික් අතින් ඉඩම් කැබලි ලබා ගෙන පදිංචියට ගිය උදවිය දැන් උන්හිටි තැන් නැති තත්ත්වයකට පත් වී තිබෙ නවා; ඒ මිනිසුන් අනාථ වීමේ ත්ත්වයට පත් වී තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපති තුමනි, මා හාපුරා කියා මෙම පාර්ලිමේන් තුවට ඇවිත් රාජාසන කථා විවාදයට පළමු වෙන්ම සම්බන්ධ වූ අවස්ථාවේදීත් සඳ හන් කළා, මෙම ව්‍යාපාරය සාර්ථක කර ගන්න පුළුවන් වෙන්නෙ හිඟුරක් ආර වැව බැන්දවීමෙන් පමණය කියා. එපම ණක් නොවෙයි, මාදුරුඔය වැවක් බැඳ ගං වතුර ගැලීම නතර කළොත් අක්කර හාර පන් දහසක වැඩ කරගෙන යන්න පුළු වන් වෙනවා. ඒ හැර ජලය වැලිකන්ද දක්වා ගෙන යන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවනි. මා දැක්කා, දනට

ඒ සඳහා අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කර ඇති බව. කෙසේ වුණත් මේ වැඩ පිළිවෙළ 1970 වන තුරු අවසන් කරන්න බැරි බවක් කියනවා. එහෙම නම් 1970 වන තුරු, තමුන්නාන්සෙ ගිහින් දමූ මිනිසුන් ජීවත් වෙන්නෙ කොහොමද? ඒ අයට කන්න බොන්න නැති නම්, ආධාර මුදලක් දෙන්නෙත් නැතිනම්, මුළු යායම ඉලුක් වැවී ඇති නම්, හේන් හොවි තැන් කර බලාපොරොත්තුවක් ඇති කර ගන්න බැරි නම්, ඒ උදවිය ජීවත් වෙන්නෙ කොහොමද? එහි පදිංචි 79 දෙනකු අත්සන් තැබූ පෙත්සමක් මං සභාමේසය මත තබන්න බලාපොරොත්තු වෙනවා; එවිට තමුන්නාන්සේට ඒ උදවිය දැන් මුහුණ පා ඇති තත්ත්වය හොඳින් දැනගන්න පුළුවන් වෙයි. මෙහි කියා තිබෙනව ඔවුන් දැන් ගත කරන ජීවිතය ගැන. ඔවුන්ට මොන විධියෙන්වත් ජීවත් වන්න බැහැ. එම නිසා ආධාර මුදලක්වත් දෙන ලෙස ඉල්ලා තිබෙනවා.

ඉඩම් කච්චේරි පැවැත්වීමත් ඇත්තෙන්ම ඉතාමත් කනගාටුදායකයි. තමුන්නාන්සෙගෙ නොයෙක් විධියෙ පෙළඹීම් ඇති බව මට දැනගන්න ලැබුණා. පොලොන්නරුවෙ ඉඩම් කච්චේරි පවත්වන විට තමුන්නාන්සෙ වුවමනා නැති අන්දමට ඒකට අතගසන නිසා නියම අන්දමට නිලධාරීන්ට කටයුතු කර ගෙන යන්න බැහැ. බොහෝ විට ඉඩම් කච්චේරි පවත්වන විට තමුන්නාන්සේගේ නැරවිකාරයින්, තමුන්නාන්සේගෙන් තුන්වූ කැබලි අරගෙන ඇවිත් ඒවායේ නම් ලැයිස්තුවලට ඇතුළත් කරන්න යාම නිසා සුදුස්සන් තෝරා ගන්න බැරිව ඉඩම් කච්චේරි පවත්වන්නෙ නැතුව, කල් දැමූ අවස්ථා තිබෙනවා. මා කියන්නෙ සම්පූර්ණ ඇත්ත. අවශ්‍ය නම් තමුන්නාන්සේට මම ඒ අයගෙ නම් වුණත් ඉදිරිපත් කරන්නම්. තමුන්නාන්සේ ළඟට එන නියෝජිතයින්, තමුන්නාන්සේගේ නම විකුණා නොයෙකුත් අන්දමේ වැඩ කරනවා. තමුන්නාන්සෙ එසේ එන පුද්ගලයන්ට අසු වෙනවා. ඒ විධියට කටයුතු කරන්න යාම නිසා දැන් තමුන්නාන්සේගේ නම නරක් වී ගොස් තිබෙනවා. මේ සියල්ලම වෙන්නෙ තමුන්නාන්සෙගෙ ළඟින් කැර කෙන මිනිසුන් නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇතැම් අවස්ථාවලදී ඉඩම් දෙනවාය කියා ගම්මුන්ගෙන් රුපියල් දහය හමාර, රුපියල් සිය දෙසිය ආදී වශයෙන් අරගෙන තිබෙනවා. සමහර විට තමුන්නාන්සේ මේවා ගැන දන්නෙ නැතුව ඇති. ඒ අය තමුන්නාන්සේ සමග ඇති හිතවත්කම් උඩ ඒ විධියට එසේ පැමිණෙන අයට සල කනවා. කුඹුක්කන් ආරුඔය බී. ඕ. පී. 298 ඉඩම් කච්චේරිය පැවති අවස්ථාවේදී, 1960 අවුරුද්දේදී මා තමුන්නාන්සේ ළඟට ඇවිත් කාරණා පැහැදිලි කර දුන්නා, බී.ඕ.පී 306 යේ ගංවතුරෙන් යට වන කොටසේ අයට ඒ ඉඩම් වෙනුවට බී.ඕ.පී. 298 අවලංගු කරන ලද කොටස්වලින් ඉඩම් දෙන්නටය කියා. තමුන්නාන්සෙ ඒක භාර ගත්තා පමණක් නොවෙයි එය ක්‍රියාත්මක කරන බවටත් පොරොන්දුවක් දුන්නා. නමුත් ඒ සඳහා පැවති ඉඩම් කච්චේරියේදි තමුන්නාන්සෙට කියා කොහොම හරි අත්සන් කරවා ගෙන, විසිපස් දෙනකුගෙ නම් ඇතුළත් වච්චෝරුවක් ඉදිරිපත් කර තිබෙනවා. ඉඩම් කැබලි 34 යි දෙන්න තිබෙන්නෙ: ඉදිරිපත් කළ වච්චෝරුවෙම නම් 25 ක් තිබෙනවා. මේ නිසා ඉඩම් බලාපොරොත්තුවෙන් බොහෝ කාලයක පටන් සිටි උදවියට කරදර ඇති වුණා. පසුව, ඉඩම් කච්චේරිය කල් දමා, ගොවි කාරක සභාවල, ග්‍රාම සංවර්ධන සභාවල සභාපතිවරුන් ඉඩම් නිලධාරි තැන ආදීන් එකතු වී සාකච්ඡා කර අවසානයේදී තීරණයක් ගත්තා, ඉඩම් ලැබීමට ඉතාමත් සුදුසු අයවලුන් 34 දෙනා ගැන. ඊට පසුව තවත් නම් දෙකක් ඇතුළත් කරන්න උත්සාහයක් ගත්තා, තමුන්නාන්සේගෙන් තුන්ඩු කැබැල්ලක් අරගෙන. 34 ක් ඒ වන විට තෝරාගෙන තිබුණා නම්, ඒ අය ඉතාමත් සුදුස්සන් හැටියට පිළිගත්තා නම්, තවත් නම් දෙකක් ඊට ඇතුළත් කරන්න ගියාම ඇති වන්නෙ විශාල ගාලගෝට්ටියක් නොවේද ? ඒ නිසා ඉඩම් කච්චේරි නැවතත් කල් යන බවක් පෙනෙනවා. ඇමතිතුමාට එම ලේඛනය එවා අනුමතිය ගන්නට ඇතැයි මා හිතනවා. මේ විධියට වැඩ කරන්නට අමාරුයි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

මට එවන පෙත්සම් සේරම, ඇමතිවරයා වශයෙන් මා පරීක්ෂා කරනවා.

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)

තමුන්නාන්සේ ඒවා පරීක්ෂා කරන්නටය කියා යැව්වාම ඒ නිලධාරීන් භය වෙනවා. තමුන්නාන්සේගේ ලියුම් කැබැලි අරන් යන මිනිසුන් එතැනට ගිහින් ඒ නිලධාරීන් අමැතිතුමා ලවා මාරු කරවනවා යැයි තර්ජනය කර නොයෙකුත් බලපෑම් කරනවා. ඇමතිතුමාගේ ලියුම් කැබැල්ල දැක්ක හැටියේම ඒ නිලධාරීන් භය වෙන්නේ, එතුමා මොනවා හෝ කරදරයක් කරන්නට පුළුවන් නිසයි. එම නිසා අයුත්තක් වුණත් කරන්නට ඒ නිලධාරීන් පෙළඹෙනවා. විශේෂයෙන් ඇමතිතුමා වටේ කරකැවෙන කීප දෙනකු ඉන්නවා. ඒ කීප දෙනාගේ නම් මේ ගරු සභාව තුළ භය නැතිව කියන්නට වුණත් පුළුවන්. ඒ පළාතේ මහජනයා ඔවුන් ගැන දන්නවා. එම නිසා තමුන්නාන්සේ ඒ උදවියගෙන් සෑහෙන තරම් පරෙස්සම් වුණොත්, මේ ඉඩම් කච්චේරි බොහොම පිරිසිදු විධියට කරගෙන යන්නට පුළුවන්කම ලැබෙනවා.

ඉඩම් කච්චේරි පවත්වන්නට ඉඩම් නිලධාරීන් ඉන්නවා. ඒ වාගේම ඉඩම් බෙදන ක්‍රමය පිළිබඳව මධ්‍යම ආණ්ඩුවේ යම් යම් නීති-රීති තිබෙනවා. ඒ නීති-රීති අනුව නිදහසේ ඉඩම් කච්චේරි පවත්වන්නට ඒ නිලධාරීන්ට ඉඩ දෙන්නට ඕනෑ. මා වුණත් ඒ කටයුතුවලට ඇඟිලි ගැසීම හරි නැහැ. ඇමතිතුමා හෝ වෙන කෙනකු හෝ වුණත් ඒ කටයුතුවලට ඇඟිලි ගැසීම වැරදියි. යම්කිසි අකටයුත්තක් සිදු වී තිබෙනවා නම් ඒ ගැන සාධාරණ පරීක්ෂණයක් කරනවා මිසක්, එතැන තවත් වැරදි ඇති වන විධියට කටයුතු කිරීම හොඳ නැති බවයි මා කියන්නේ.

මාදුරුඔය ව්‍යාපාරය සම්බන්ධයෙන් සහනයක් සලසන්නට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා නේද? දැන්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මයා.]

අපේ කොට්ඨාශය ගැන තමුන්නාන්සේ නොසලකා හැර තිබෙන බවක් පෙනෙනවා. මොන හේතුවක් උඩ එසේ කරනවා දැයි මා දන්නේ නැහැ. මගේ කොට්ඨාශයේ දුක් විඳින කොටසටත් සාධාරණය ඉෂ්ට වන්නට ඕනෑ. අපේය කියා කොල්ලෙකුට ඉඩම් කැබැල්ලක් දෙන්නටත් අද ක්‍රමයක් නැහැ. මොන විධියෙන් හෝ බොරු සමිති හදාගෙන ඒ අය තම-තමන්ගේ හිතවතුන්ට ඉඩම් දෙනවා. "මේ ගමේ සියයකට ඉඩම් දෙන්නැයි" කියා "රෙකමන්" කර මා ලියුම් කැබැල්ලක් දුන්නොත්, කවදාවත් ඒක කෙරෙන්නේ නැහැ. මොනවා හෝ නීතියක් හරස් කර එය කරන්නට බැ කියනවා. අපත් තමුන්නාන්සේලා වාගේම බොහොම වෙහෙස මහන්සි වී, පලු ගස් කපාගෙන එහෙ දුක් වින්දා. දැන් තමුන්නාන්සේ මොන තත්ත්වයෙන් හිටියත් අපේ ප්‍රදේශය සංවර්ධනය වෙනවා දකින්නට වෙන කවරකුටත් වඩා තමුන්නාන්සේ සතුටු වෙනවා ඇති. එහෙම නම් අවංකව අපට උදව්වක් වශයෙන් හෝ රට, ජාතිය, ආගම නිසා හෝ ඒ සේවය කර දෙන්නට ඕනෑ.

සින්නක්කර ඔප්පු පිට ඉඩම් ලබා දීම ගැනත් කියන්නට ඕනෑ. ආණ්ඩුවෙන් සින්නක්කර ඔප්පු පිට ඉඩම් ලැබෙන්නේ නැති නිසා ලොකු කරදරයක් ඇති වී තිබෙනවා. ඒ නිසා කිසිම ණයක් ගන්නට ඒ ගොවීන්ට පුළුවන්කමක් නැහැ. සින්නක්කර ඔප්පු පිට ගොවීන්ට ඉඩම් ලබා දෙන බව තමුන්නාන්සේලාගේ පළමු වැනි රාජාසන කථාවෙන් කීවා. ඒ වැඩ පිළිවෙළ දැන් සම්පූර්ණයෙන්ම ආපස්සට ගිහින් නැත්නම් යටපත් වී ගිහින්. මේ ඉඩම්වලට සින්නක්කර ඔප්පු ලබා දෙනවා නම්, ඒ ඔප්පු තබා බැංකුවෙන් මුදල් ණයට ගන්නට පුළුවන්. ඒ ඔප්පු නැති නිසා අද ගොවීන්ට බැංකුවෙන් ණය ගන්නටවත් පුළුවන්කමක් නැහැ. මහාජනයාගේ බැංකුව යන අදහස ඇති මහජන බැංකු තිබුණාට, ඒ බැංකු සීමා වී තිබෙන්නේ සල්ලිකාරයන්ට පමණයි. පොඩි මිනිසුන්ට මේ බැංකුවලින් ණය ගන්නට පුළුවන්කමක් නැහැ. ගරු ඇමතිතුමා ඒ ඉඩම් නිරවුල් කර සින්නක්කර ඔප්පු ලබා දෙනවා නම්, ඒ ඔප්පු තබා සල්ලි කීයක් හෝ ගෙන තමන්ගේ ගේ-දොර වැඩ දියුණු කර ගන්නට හෝ තමන්ගේ ගොවිතැන් කටයුතු දියුණු කර ගන්නට ඒ මිනිසුන්ට පුළුවන්කම ලැබෙනවා. ඇමතිතුමා ඒ යුතුකම ඉක්මණින්ම ඉෂ්ට කර දුන්නොත් මේ රටේ ගොවිතැනට එයින් විශාල යහපතක් වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඉඩම් ආඥා පනත වෙනස් කිරීම දැන් කැබිනට් මණ්ඩලයේ සැලකිල්ලට භාජන වෙමින් තිබෙනවා.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)

මේ රජයටත් දැන් අවුරුදු 3 ක් විතර ගත වී තිබෙනවා. තමුන්නාන්සේලා දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවලින් ඒ පිළිබඳ වාර්තා ලබාගෙන අවුරුදු දෙකක් විතර වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඉඩම් ආඥා පනත නිසා බොහොම කර දරයි. [බාධා කිරීම්]

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)

ගොවීන්ට ණය දෙන්නට බොහොම උත්සාහයක් ගන්නවා. සියයට 12 හේ පොළියටලු, ණය දෙන්නට යන්නේ. ගොවීන් ඒ තරම් ණය ඉල්ලන්නේ නැහැ. සින්නක්කර ඔප්පු තිබෙනවා නම් සාධාරණ පොළියකට ණයක් ගන්නට පුළුවන්. සින්නක්කර ඔප්පු නැති නිසා ණයක් ගන්නටවත් හැටියක් නැහැ.

අනෙක් කාරණය ඉඩම් මැනීම සම්බන්ධවයි. ඉඩම් මැනීම හරියාකාරව කෙරෙන්නේ නැහැ. 1947 දුන් ඉඩම් තවමත් මැනලා නැහැ. 1950 දී පමණ ලැබුණු මගේ පොල් ඉඩමේ තිබෙන යාය මැනලා නැහැ; කුඹුරු මැනලා නැහැ; ගොඩ ඉඩම් මැනලා නැහැ. තවමත් ඒවා එහෙමමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1957-58 කාලයේදී කීවා මට මතකයි, "මිනින්දෝරු හිඟය නිසා ඉඩම් මැනීම ප්‍රමාද වෙනවා, දැන් මිනින්දෝරුවන් පුහුණු කරගෙන යනවා" කියා. ඒ මිනින්දෝරු හිඟය තවමත් තිබෙනවාදැයි මා දැන ගන්නට කැමතියි. අපේ ඉඩම් තවම මැනලා නැහැ. මා ඉන්නා බී. ඕ. පී. 305 කොටසේ ඉඩම් තවම මැනලා, ගල් දමා ගිහින් නැහැ. බී. ඕ. පී. 316 ත් එහෙමයි.

අ. භා. 6.30

සමහර කරුණු මේ ගරු සභාවේ කථා කරන්න තරම්වත් වටින්නේ නැති ඉතා සුළු කරුණුයි. එහෙත් පොඩි වැඩකට පවා අද ඇමතිතුමා ළඟට එන්නට සිදු වී තිබෙනවා. වතුර පොඩ්ඩක් ලබා ගන්න වත් අද ඇමතිතුමා ළඟට එන්නට සිදු වී තිබෙනවා. මීට වඩා සැලකිල්ලෙන් මේ වැඩ කරන්නැයි ඒ නිලධාරීන්ට කියන්නට ඕනෑ.

පොළොන්නරු ප්‍රදේශයේ තිබෙන, වාරි මාර්ග දෙපාර්තමේන්තුවට අයත් පාරවල් නියම විධියට නඩත්තු කරන්නට බැරි නම් කරුණාකර ඒවා පී. ඩබ්ලිව්. ඩී. එකට වත් භාර දෙන්න. ඒ පාරවල් ගල් දමන්නේවත් නැහැ. ඒවාට වැය කරන නැත් නම් වෙන් කරන මුදල් නොයෙකුත් දූෂණවලට ලක් වෙනවා. අද ගල් ගෙනැවිත් බැවාම, හෙට රෑට ආයෙත් ඒ ගල් පටවා ගෙන ගොස් වෙනත් තැනක බානවා. මේ විධියේ වංචනික වැඩයි, කෙරෙන්නේ. ඒවා නියම විධියට කරන්නට බැරි නම් පී. ඩබ්ලිව්. ඩී. එකටවත් භාර දී ඇමතිතුමාගේ ඇඟ බේරා ගන්න. මෙය මහ කරදරයක් නොවෙයිද? බස් එකක් ගමන් කරවන්නට පාර හොඳ නැතැයි කියනවා. බලහත්කාරයෙන් ඉඩම්වල පදිංචි වූවන්ට දඩ ගසනවා. ඒ අයට පසුව "පර්මිට්" දෙන කොට දඩයකුත් ගෙවන්නට සිදු වෙනවා. දඩය ගෙවීමෙන් පසුවයි, "පර්මිට්" එක ගන්නට පුළුවන් වන්නේ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා ඒ ගැන ඇසුවා. ඒක දඩයක් නොවෙයි. ඒක කලින් පදිංචිව සිටි අවුරුදු ගණනට බද්දක්.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)

බද්දත් ගෙවන්න ඕනෑ. දඩයක් ගෙවන්නත් ඕනෑ. නගරබදව ඇති පර්චස් පහළොවේ විස්සේ ඉඩම් කැබෙලිවල තක්සේරුව වැඩි යයි කියමින් ඒවායේ පදිංචි අයට රුපියල් හයසියයක් හත්සියයක් ගෙවන්නැයි කියනවා. ඒ මුදල ගෙවන්නට බැරි නිසා ඒ ඉඩම්වල පදිංචි අයට ඔප්පු ලබා ගන්නට අපහසු වී තිබෙනවා.

මෙම අමාත්‍යාංශය යටතේ මුලින්ම සාකච්ඡාව ආරම්භ කළ අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ වික්‍රමසිංහ) වනාත විල්ලුව ගැන සඳහන් කළා. මාත් ළඟදී ඒ පැත්තේ ගියා. මන්නාරමට යන පාරේ තිබෙන වනාත විල්ලුවෙහි පස ඉතාමත්ම සාරවත් වන අතර ඒ පස පොල් වගාවටත් පළතුරු වගාවටත් ඉතාමත්ම යෝග්‍යයි. එහෙත් ජලය හිඟකම එහි ඇති ලොකුම ප්‍රශ්නයයි. ජලය නැතිකම නිසා එහි ඉඩම් ඇති සමහර අයට දැන් ඒවා අතහැර දමන්නටත් සිදු වී තිබෙනවා. එහි කෙසෙල් හොඳින් වැවෙනවා. එහෙත් එහි කෙරෙන වගාවලින් නිෂ්පාදනය වන දේවල් සාධාරණ මිළකට අලෙවි කර ගන්නට පුළුවන්කමක් නැහැ. ඒ එක ප්‍රශ්නයක්. අනෙක් අතින් එහි වගාවන් ඇති කිරීම සඳහා ජල පහසුව නැති වීම ලොකුම ප්‍රශ්නයක්. එහි වැවෙන මයියොක්කා ගසකින් රාත්තල් විසිපහක් තිහක් ගළවා ගන්නට පුළුවන් වුණත් මයියොක්කා රාත්තලක මිළ ශත දෙකක් පමණයි. කෙසෙල් ගෙඩියක් ශතයයි; දෙකයි. වෙළඳ දෙපාර්තමේන්තුව පවා එහි කෙසෙල් ගෙඩි ගන්නේ ශත එක හමාර ගණනේයි. මේක හරිම අසාධාරණයි. එහි නිෂ්පාදනය වන කෘෂි ද්‍රව්‍යවලට නියම මිළක් ලබා දීමට ක්‍රියා කළ යුතුයි. එහි ඉඩම් ලබාගෙන සිටින උදවියට දැන් ඒවා අතහැර දමන්නට පවා සිතී ඇති බව මා මුලින් කීවා. අක්කර විසිපහ බැගින් ලබාගෙන ඇති මෙම ඉඩම් දැන් මුස්ලිම් ධනවතුන්ට විකිණීමේ යටිකූට්ටු වැඩ පිළිවෙළක්ද තිබෙන බවට ආරංචියක් තිබෙනවා. දැනට ඉඩම් ලබාගෙන සිටින අයට ඒවා එපා වන්නට කටයුතු සලස්වන් නොහොත් ඒ නිසා විය හැකියි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මයා.]

එහි බොන්නට පවා වතුර නැහැ. ඊශ්‍රායල් ක්‍රමයට එහි ළිං හාරා ජලය ලබා දෙන්නට අදහස් කළත් තවම නම් ඒ වැඩ පිළිවෙළ හරියාකාර ලෙස ක්‍රියාත්මක වන්නේ නැහැ. අඩි තුන්සියයක් ගැඹුර හා අඟල් හයක් විෂ්කම්භය ඇති ඒ නල ළිංවලින් තවමත් වතුර බෙදා හරින්නට බැරි වී ඇත්තේ අවශ්‍ය කරන බට නැති කම නිසාලු. ගමක් ගානේ වතුර බෙදා හරින්නේ නැතිව, නල මාර්ගයෙන් වතුර බෙදා හරින්නේ නැතිව එහි වගාවන් කර ගෙන යන්නට පුළුවන්කමක් නැහැ. දැනට නිසි පරිදි වතුර බෙදා හැරීමේ ක්‍රමයක් නැහැ. බීමට පවා වතුර ගෙන යෑම සඳහා සමහරුන්ට සැතපුම් දෙකක් තුනක් මඟ ගෙවා මහ පාරට එන්නට සිදු වී තිබෙනවා. බොන වතුර බෙදා හරින ලොරි මහ පාරේ මිස අතුරු පාරවල ධාවනය නොකරන නිසා එහි සිටින මිනිසුන්ට බීමට වතුර ටික ගෙන යෑමට සැතපුම් දෙකක් තුනක් එන්නට සිදු වී තිබෙනවා. මේ කරදරකාරී ජීවිතය දැන් එහි සිටින ගොවීන්ට එපා වෙලා. තවද, මේ ඉඩම්වල ඔප්පු ලබා ගැනීමටත් දැනට අපහසුවක් තිබෙනවා. මොකක්දෝ ජාතිවාදයක් ඉස්මතු කරගෙන යටිකූට්ටු වැඩ පිළිවෙළක් ගෙන යමින් වෙනත් අය ඉඩම් අල්ලා ගන්නට මාන බලන බව පේනවා. එසේ නැත්නම් 1963 දී දෙන ලද මෙම ඉඩම් වලට තවමත් ඔප්පු නොදී ඇත්තේ මන්ද? මධ්‍යම පංක්ති ක්‍රමය යටතේ දෙන ලද ඉඩම්වලට දැනට සෑහෙන මුදලක් වියදම් කර තිබෙන බව පේනවා. ඒ ඉඩම්වලට ඔප්පු දෙනවා නම් එම ඔප්පු බැඳ මුදල් ලබාගෙන හෝ ඒවා සංවර්ධනය කරන්නට පුළුවනි. එසේ හෙයින් හැකි තරම් ඉක්මනින් එම ඉඩම්වලට ඔප්පු දෙන හැටියට මා ඉල්ලා සිටිනවා. ඒ ඉඩම්වලට ඉක්මනින්ම ඔප්පු දෙන ලෙස පුත්තලමේ දිසාපතිතුමාට නියෝග කරන්න.

අප අපේ ඉතිහාසය ගැන ආඩම්බර වෙනවා. අපේ පැරණි වැව් අමුණු දැන් බුල්ඩෝසර් යොදවා විනාශ කරගෙන යනවා. දැන් ගෙන යන වැඩ පිළිවෙළ අනුව මහවැලි ගඟ ව්‍යාපාරය හෝ උඩවලවේ ව්‍යාපාරය හෝ කවදා සාර්ථක වේදැයි කියන්නට බැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ලබන මාසය අවසානයේදී වලවේ ජලාශය බැඳ අවසාන කරනවා.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)

එහෙම නම් මාදුරුඔය ව්‍යාපාරයේ කරදර වී සිටින දුප්පත් මිනිසුන්ට වලවේ ව්‍යාපාරයෙහි හෝ ඉඩම් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. උඩ වලවෙන් හරි කොහෙන් හරි මේ මිනිසුන්ට ඉඩම් දෙනවාද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

හිඟුරක්වැව.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)

හිඟුරක්වැව 1970 දී නොවැ අවසාන කරන්නෙ? 1970 වන තුරු කොහොමද මේ මිනිසුන් ජීවත්වෙන්නෙ? හිඟුරක්වැව 1970 දී අවසාන කරනවාය කීවාට සමහර විට 1975 වෙයි, එය අවසාන කරන විට. තමුන්නාන්සේ ඔය කියන තරමට වැඩ කෙරෙන්නේ නැහැ. බණ්ඩාරනායක ප්‍රතිපත්තියට පිටින් ගියාය, ඒ නිසා මා අර පැත්තට ගියාය, මේ පැත්තට ගියාය කියා තමුන්නාන්සේ කියන්නට පුළුවනි. ඔය මොකක් හරි කියා තමුන්නාන්සේ ඇඟ බේරා ගන්නට පුළුවනි. නමුත් අපට එහෙම ඇඟ බේරා ගන්නට බැහැ. අපට ජීවත් වෙන්නට ඕනෑ.

තමුන්නාන්සේ මොන විධියකින්වත් වැව් හාරන්නට මහන්සි ගන්නේ නැහැ. පරාක්‍රම සමුද්‍රයත් දැන් හාරන්නට සිද්ධ වී තිබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

හාරන්නට?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)
ඔව්, භාරන්නට සිද්ධ වී තිබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මම වැව් හැරීම භාර ගන්නේ නැහැ.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)
ඇයි ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒක දැන් තෝරා දෙන්න බොහොම අමාරුයි.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)
වැව් භාරන්නෙත් නැහැ. වැව් හරියට බඳින්නෙත් නැහැ. මනම්පිටිය ප්‍රදේශයේ වැව් සම්පූර්ණයෙන්ම අමතක කර දමා තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මනම්පිටිය ප්‍රදේශයේ කොපමණ කුඩා වැව් තිබෙනවාද ? ඒ වැව්වල "බන්ඩ්" සියල්ලම සමතලා කර දමා තිබෙනවා. අඟුලන වැවේ "බන්ඩ්" එක අඩි හතරක් පහක් භාරල දමල තිබෙනවා. ඒවාගේම වාන් සාදා තිබෙන්නේ කුඹුරු මැද්දෙන් ජලය බැස යන විධියටයි. කොන්ත්‍රාත්කරුවන් කළ වැඩවල හැටි තමයි මේ. නිලධාරීන් ඒවා බලන්නට යන්නෙත් නැහැ. කොන්ත්‍රාත්කරුවන් කෙසේ හෝ මුදල් ලබා ගන්නවා. ගල්වැව ව්‍යාපාරය ගැනත් තමුන්නාන්සේ දන්නවා. කඳුරු වෙල සත්ව ගොවිපොළ අල්ලා ගෙන ගොවිතැන් කළ උදවිය ලොකු කරදරයකට පත් වුණා. හදිසි නීති යටතේ යුද්ධ හමුදාව ගිහින් සේරම විනාශ කර දැමුවා. ගොයම විනාශ කර දැමුවා. ඊට පසුව අතරමං වූ මිනිසුන්ටයි තමුන්නාන්සේ ගල්වැව දුන්නෙ. නමුත් ගල්වැවෙන් තවම එක කන්නයකටවත් හරියට ගොවිතැන් කරන්නට බැහැ. වාන කැඩී කුඹුරු මැද්දෙන් ජලය ගලා ගෙන යනවා. වානෙන් ජලය පිටවීම නතර කරන්නට ඕනෑ ගොවිතැන් කරන්නට. දැන් හය මාසයකට පමණ කලිනුත් මා වාරිමාර්ග නිලධාරීන් සමග ගිහින් ඒ ප්‍රදේශය පරීක්ෂා කර බැලුවා. නමුත් මේ දක්වා ඒ පිළිබඳව කිසිවක් කර නැහැ. ඒවාගේම ප්‍රධාන ඇල කී පොළකින් කැඩී තිබෙනවාද ? වානෙන් යන ජලය නිසා ප්‍රධාන ඇල කැඩී ගොස් තිබෙනවා. එතකොට පහළට ජලය ගලා ගෙන යන්නේ නැහැ. මේ කරුණු ගැන මා ගරු ඇමතිතුමාට විශේෂයෙන් මතක් කරනවා. මනම්පිටිය ප්‍රදේශය වියලි ප්‍රදේශයක්. මාස හතරෙ පහේ ජලය ලැබෙන්නේ නැහැ. වෙනකක් තබා ඒ ප්‍රදේශයේ මිනිසුන්ට බොන්නටවත් ජලය නැහැ. මේ තත්ත්වය ගැන වහාම ක්‍රියා කරන මෙන් මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමා නියෝජනය කරන කොට්ඨාශය ගැන මා යමක් කියන්නට අදහස් කරන්නේ නැහැ. නමුත් තමුන්නාන්සේගේ ඡන්ද කොට්ඨාශයට හැම දෙයක්ම වැඩිපුර තිබෙනවා. විදුලි බලයත් තමුන්නාන්සේගේ කොට්ඨාශයේ වැඩිපුර තිබෙනවා. නමුත් පොළොන්නරුවට කිසිම දෙයක් නැහැ. පොළොන්නරුව නගරයේ පවා විදුලි බලය දිනපතාම ඇනහිටිනවා. යන්ත්‍රෝපකරණවලට කුමක් සිදුවී තිබෙනවාද කියා මා දන්නේ නැහැ. වරකට කවුඩුල්ලෙන් නවතිනවා. වරකට මෙහෙන් නවතිනවා. කුමක් සිදුවී තිබෙනවාද කියා මා දන්නේ නැහැ. අපට නගර යටවත් විදුලි එළිය හරියට ලැබෙන්නේ නැහැ. නමුත් තමුන්නාන්සේගේ කොට්ඨාශයේ පාරවල්වලට පවා විදුලි බලය සපයා ගෙන යනවා. චන්ද්‍රනපොකුණ කෙළවර පැත්තෙන් දික් කරන්නට පුළුවන් නම් අපේ ජනපද ව්‍යාපාරයටත් විදුලිය ලබා ගන්නට පුළුවනි. දැන් මගකට ගිහින් තිබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒ ආණ්ඩුවේ හාල් මෝලට.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)

නමුත් අපේ පැත්තෙත් හාල් මෝල් තිබෙනවා නෙවැ. අපටත් විදුලි බලය දුන්නොත් හුඟක් ප්‍රයෝජන ගන්නට පුළුවනි. ගෙවල්වලටත් ගන්නට පුළුවනි. මැදපත්තු මැදගම් සභාවට, සැතපුම් භාගයක් අවට ප්‍රදේශයට විදුලිය සපයනවාය කියා කිව්වා. ඒකට ඇස්තමේන්තු පවා පිළියෙළ කර තිබෙනවා. විදුලි බලය වුවමනා අයගේ නාම ලේඛන පවා අර ගත්තා. අවශ්‍ය සියලුම දේවල් කළා. නමුත් දැනට අවුරුදු දෙකක් පමණ ගතවී තිබෙනවා. මේ දක්වා ඒ පිළිබඳව කිසිවක් කර නැහැ. ඒ කාරණය ගැනත් මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා.

මේ කරුණු ගැන එකින් එකට විස්තර කරන්නට මා කැමති නැහැ. තමුන්නාන්සේට නරක නාමය එන්නේ වැඩි වශයෙන්ම තමුන්නාන්සේ වට කරගෙන සිටින නිලධාරීනුත් තමුන්නාන්සේගේ ආධාරකරුවන් වශයෙන් සිටින අයත් කරන දූෂණ නිසයි. තමුන්නාන්සේ අවුරුදු ගණනාවක් තිස්සේ මේ රට සංවර්ධනය කිරීමේ කටයුතුවලට අත ගිත යෙදුවා. නමුත් රට ස්වයංපෝෂිත වුණෙත් නැහැ ; තමුන්නාන්සේට මඩ ගැසීම නතර වුණෙත් නැහැ ; තමුන්නාන්සේ ඔය පදවියෙන් ඉවත් වුණෙත් නැහැ. තමුන්නාන්සේ ඔය ස්ථානයේ සිටිනවා නම් මේ ප්‍රශ්න ගැන වහාම ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න. වැරදි කරන නිලධාරීන් මොකක් කිව්වත් තමුන්නාන්සේ භාර ගන්නවා. එමනිසා නිලධාරීන් තමුන්නාන්සේට භය නැහැ. ඔවුන් කුමක් කිව්වත් තමුන්නාන්සේ භාර ගන්නවා.

ගිනිපෙට්ටි පාලම ගැන විශේෂ පරීක්ෂණයක් කරන්නටය කියා මා කිව්වා. එවැනි පරීක්ෂණයක් කළා නම් තමුන්නාන්සේටම කරුණු අවබෝධ කර ගන්නට තිබුණා. අක්කර හත්දහස් ගණනක ගොයම සම්පූර්ණයෙන්ම විනාශ වුණා. වැලි ගෝනි ටික දමන්නත් දවස් 20 ක් පමණ ගත වුණා. ඒ ස්ථානයට ගෙනාපු සිමෙන්ති කොට්ටවලිනුත් කොට්ට 25 ක් 30 ක් විකුණා ගෙන තිබෙනවා. මිනිසුන්ගේ පණ යන අවස්ථාවේදී නිලධාරීන් එකතුවී සිමෙන්ති කොට්ට ටිකත් විකුණා ගෙන තිබෙනවා. ඒවාගේම "බන්ඩ්" එකත් දවස් හතරක් පහක් යන විට කැඩී ගියා. ඊටපසු නැවත සෑදුවා. හදිසි වැඩක් වුණත් ඒ විධියටයි කළේ. ගොයම සම්පූර්ණයෙන්ම විනාශ වී ගියා. ඒ අන්දමටයි අද මේ වැඩ කටයුතු කෙරෙන්නෙ.

නිකම් ඡන්ද ගන්නට ; නැත්නම් මිනිසුන්ගේ සිත් හොඳ කරන්නට අප ආහාර නිෂ්පාදනය කරනවාය, 1970 දී නවත් හාල් සේරුවක් නිකම් දෙන්නට බලාපොරොත්තු වෙනවාය කිව්වාට මදි. මේ වැඩ පිළිවෙළවල් හරියාකාරව ක්‍රියාත්මක කරන්නට ඕනෑ. හැන්ද තිබෙන්නෙ තමුන්නාන්සෙගෙ අතෙයි. මේ රට සංවර්ධනය කළ යුතුය කියා තමුනාන්සේ තුළ අවංක හැඟීමක් ඇති. පක්ෂ භේදයක් නැතිව අප කවුරුත් වෙහෙස මහන්සිවී මේ රට සංවර්ධනය කළ යුතුය කියා අප තුළත් අවංක හැඟීමක් තිබෙනවා. ලංකාවේ ජීවත් වන සෑම කෙනෙකුම ආහාර නිෂ්පාදනයට උදව් කළ යුතුයි. අප මේ විවේචනය කරන්නේ තමුන්නාන්සේට මඩ ගැසීමටය කියා වරදවා තේරුම් ගන්නට එපා. අප මේ විවේචනය කරන්නේ තමුන්නාන්සේ මේවායින් පාඩමක් ඉගෙන ගෙන පරණ වැරදි අත් හැර, අමතක කර අනාගතයේදීවත් වැඩියෙන් වැඩ කරන්නට හොඳ වැඩ පිළිවෙළක් පිළියෙළ කරාවිය යන බලාපොරොත්තුවෙනුයි.

**එච්. බී. ඒකනායක මයා.** (මාවතගම)
*(திரு. எச். பி. ஏக்கநாயக்க—மாவத்தகம)*
(Mr. H. B. Ekanayake—Mawatagama)

ගරු සභාපතිතුමනි, පොළොන්නරුවේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසු කථා කරන්නට අවසරය ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මා එසේ කියන්නේ පොළොන්නරුවේ ගරු මන්ත්‍රීතුමා මොනවා කිව්වත් පොළොන්නරුව ඇතුළු රජරට ජනතාව කවදාවත් ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිවර ගරු සී. පී. ද සිල්වා මැතිතුමා අමතක නොකරන බව මා දන්නා නිසයි. කිසිම සැකයක් නැතිව මට කියන්නට පුළුවනි, පොළොන්නරුව ප්‍රදේශයේ ජනතාව ඒ ගරු ඇමතිතුමාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැනටමත් මින්නේරියේ දෙවියෝ යන විරුදාවලිය දී තිබෙන බව. පොළොන්නරුවේ මිනිසුන්, මින්නේරියේ දෙවියන් හැටියට විරුදාවලියක් ලබා සිටින ශ්‍රේෂ්ඨ පුද්ගලයකු වශයෙන් දැනටමත් එතුමා පිළිගෙන අවසානයි. උඩවලවේ යෝජනා ක්‍රමය සාර්ථක වුණාම නිසැකවම එතුමා උඩවලවේ දෙවියෝ යන විරුදාවලියටත් හිමිකරුවකු වන බව මට කියන්නට පුළුවනි.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)
කතරගම දෙවියෝ නොවෙයිද ?

**ඒකනායක මයා.**
*(திரு. ஏக்கநாயக்க)*
(Mr. Ekanayake)
උඩවලවේ දෙවියන් හැටියට එතුමා වැඩි කල් යන්නට පෙර විරුදාවලියක් ලබන බවට මට ඒකාන්ත විශ්වාසයක් තිබෙනවා. අපේ ගරු ඇමතිතුමාට එරෙහිව නොයෙක් නොයෙක් ගර්ජන තර්ජන එල්ල කරන්නේ මොන කාරණයක් නිසාදැයි අප දන්නවා. 1964 දී ලක් මැණියන්ගේ පිරිසිදු ලේ ආරක්ෂා කිරීම පිණිසත්, අපේ සර්වබල ඡන්දය අපට ආරක්ෂා කර දීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම පිණිසත් එතුමා ගත් පියවර, ක්‍රියා මාර්ගය නිසා විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලා එතුමාට විරුද්ධව සටන් කරන බව අප දන්නවා. ඒ සම්බන්ධයෙන් ඊට වඩා යමක් කියන්නට මා මේ අවස්ථාවේ බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ කොයි හැටි වෙතත් අපේ ගරු ඇමතිතුමා පොළොන්නරුවේ ගරු මන්ත්‍රීවරයා වශයෙන් සිටි කාලය මට හොඳට මතකයි. ඒ කාලයේ මාත් රජයේ සේවකයකු වශයෙන් ඒ ප්‍රදේශයේ සේවය කළා. ගරු ඇමතිතුමා වැව් ආරක්ෂා කරමින්, වාරි මාර්ග පහසුකම් ඇති කර දෙමින්, ගැමි ජනතාවට කොයි තරම් විශාල සේවයක් ඒ කාලයේදී කර තිබේදැයි මට ස්ථිරවම කියන්නට පුළුවනි. පොළොන්නරුවට ඒ තරම් වැදගත් සේවයක් ගරු ඇමතිතුමා අතින් සිදු වී නැතැයි පොළොන්නරුවේ ගරු මන්ත්‍රීතුමා කොයි තරම් වේගයෙන් කෑගසා කිව්වත් හිතට එක[illegible] නම් [illegible] වෙනස් කරන්නට පුළුවන් එවැන්නක් එතුමාට කියන්නට පුළුවන් කමක් ඇතැයි මා නම් විශ්වාස කරන්නේ නැහැ.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)
තිබෙන අඩුපාඩුකම් ගැනයි මා කිව්වේ.

**ඒකනායක මයා.**
*(திரு. ஏக்கநாயக்க)*
(Mr. Ekanayake)
අඩුපාඩුකම් කොහෙත් තිබෙනවා. අඩුපාඩුකම් නැතිව වැඩ කරන්නට කාටවත් බැහැ. විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලා සෑහෙන කාලයක් මේ රටේ පාලනය ගෙන ගියා. අඩුපාඩු සම්පූර්ණ කරන්නට ලැබුණාද ?

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)
ඒ කාලයේදීත් ඉඩම් ඇමතිවරයා හැටියට හිටියේ වර්තමාන ඇමතිතුමාමයි.

අ. භා. 6.45

**ඒකනායක මයා.**
*(திரு. ஏக்கநாயக்க)*
(Mr. Ekanayake)
තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ගරු ඇමතිවරයකු වශයෙන් සේවය කරද්දී තමුන්නාන්සේලා ට එතුමාගෙන් නියම සේවයක් ලබා ගන්නට බැරි වුණා නම් ඊට වැරදිකාරයෝ කවුරුද ? අපට ඒ ගැන කරන්නට දෙයක් නැහැ. එහෙත් අපේ ආණ්ඩුවේ ඉඩම් ඇමතිවරයා වශයෙන් සේවය කළ අවුරුදු දෙකහමාරක් තරම් වූ කාල සීමාව ඇතුළත ඉතාමත් විශාල සේවයක් අපට නම් ලබා ගන්නට පුළුවන් වූ බව ප්‍රීතියෙන් සහ ආඩම්බරයෙන් සඳහන් කරන්නට කැමතියි. ඒ නිසා, තමුන්නාන්සේලා කොයි තරම් හයියෙන් කෑ ගැහැව්වත්, තමුන්නාන්සේලාට කොයි තරම් කරුණු කියා දුන්නත්, තමුන්නාන්සේලාගේ හිත්වල තිබෙන කුණු නම් අහක්කර දමන්නට පුළුවන් වන්නේ නැහැ. කොයි තරම් උදාර සේවයක් කළත් [illegible] වෙනස් කරන්නට පුළුවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒකනායක මයා.]

කමක් නැති බව අප දන්නවා. ඉතාමත් කෙටි කාලයකින් වාරිමාර්ග පසසුකම් ලබා දී සංවර්ධන වැඩ කටයුතු හරියාකාර ඉටු කර, මේ රට ආහාරය අතින් ස්වයංපෝෂිත කළත්, මේ රටේ ජනතාවට උසස් තත්ත්වයක් ලබා දුන්නත් විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලාගෙන් නම් ප්‍රසංශාවක් ලබා ගන්නට පුළුවන් වේතැයි මා හිතන්නේ නැහැ. එහෙත් අපේ බලාපොරොත්තුව නම් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවත් ඉඩම් දෙපාර්තමේන්තුවත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවත්, විදුලි බල දෙපාර්තමේන්තුවත් යන මේ හැම ආයතනයක්ම එකම එක බැම්මෙන් එකට බැඳී මේ රටේ කෘෂිකර්මාන්තය නියම තත්ත්වයට ගෙනැවිත් මේ රට ස්වයංපෝෂිත කිරීමයි. ඒකයි අපේ ගරු ඇමතිතුමා ඇතුළු ආණ්ඩුවේත් අපේත් පරමාර්ථය. ඒ ගැන මීට වඩා යමක් කියන්නට මා බලාපොරොත්තුවන්නේ නැහැ. මගේ කොට්ඨාශය ගැන යමක් කියන්නටයි මගේ අදහස.

මා නියෝජනය කරන මාවතගම ඡන්ද දායක කොට්ඨාශයේ තවමත් සුළු සුළු අඩු පාඩුකම් තිබෙනවා. ඒවා කෙරෙහි ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන්නට කැමතියි. මාවතගම ප්‍රදේශය තුළ ආණ්ඩුවට අයිති ඉඩම් විශාල වශයෙන් නැහැ. ඒ බව ගරු ඇමතිතුමා දන්නවා. ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ පසු ගිය ආණ්ඩුව ඉඩම් කිහිපයක් ලබා දුන්න පමණයි කළේ. ඊට වැඩි යමක් ඊට පසු ඒ සම්බන්ධයෙන් සිදු වී නැහැ. ඒ ගැන කියන්නට සිදු වීම ගැන මා කනගාටු වෙනවා. මේ ගැන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඒසම්බන්ධයෙන් ප්‍රමුඛත්ව ලැයිස්තු ඉදිරිපත් කරන්නැයි අපට කියා තිබෙනවා. ලැයිස්තු ඉදිරිපත් කළත් එයින් ඒ තරම් ප්‍රයෝජනයක් ලැබුණේ නැහැ. මාවතගම කොට්ඨාශය තුළ තිබෙන ආණ්ඩුවේ ඉඩම් ප්‍රමාණය සීමා සහිත නිසාත්, ඒවා දැනටමත් බෙදා දී අවසන් නිසාත්, ඊට වඩා ඉඩම් ප්‍රමාණයක් ලබා ගන්නට පුළුවන්කමක් නැහැ කිව්වොත් එය ඉතාමත් අසාධාරණයි. නොයෙක් දෙනා ඇත් ඉඩම් නැතිකම නිසා දුකට පත් වී කාලය ගත කරනවා. ඒ අයට බරපතල ප්‍රශ්න රාශියකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. ඒ නිසා හැකි තාක් ඉක්මනින් ඉඩම් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

කැලෑ දෙපාර්තමේන්තුව ගැන යමක් නොකියා බැහැ. මීට පෙරත් කීප වතාවක්ම කැලෑ දෙපාර්තමේන්තුව ගැන මා කරුණු සඳහන් කළා. පාර්ලිමේන්තුවේ කථා කරන අවස්ථාවලදීත් නොයෙක් වතාවල මේ ගැන මා කරුණු කියා තිබෙනවා. මගේ ආසනයට අයත් ප්‍රදේශයේ අක්කර හයසියයකට, හත්සියයකට වඩා ඇතැයි මා හිතන්නේ නැහැ. මාවතගමට අල්ලපු ආසනවලින් එකක් ගලගෙදර; අනෙක රඹුක්කන. ඔය දෙකේම උදවිය වරින්වර ඇවිත් මාවතගම ප්‍රදේශයේ ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගැනීම කාලයක් තිස්සේ කෙරීගෙන ගියා. තව තවත් එය කෙරීගෙන යනවා. ඒ අයට තවත් අල්ලාගන්නට බැරිවෙලා තියෙන්නේ මාර්ග පහසුකම් නැති නිසායයි නිලධාරීන් කියනවා. දෙපාර්තමේන්තුවෙන් ගිහිල්ලා වට කළොත් ඒ උදවිය පැන යන බවයි කියන්නේ. ආහාර නිෂ්පාදනය කිරීම සඳහා අසල්වාසී ගම්වැසියන්ට කෙටි බදු ක්‍රමයට ඉඩම් දෙන්නටය කියා මා යෝජනා කළා. ඒ ප්‍රදේශයේ කුඩා ඉඩම් තිබෙනවා. ඒවාවත් දෙන්නය කියා මා යෝජනා කර තිබෙනවා. එහෙත් ඒ පිළිබඳව යම්කිසි ක්‍රියාමාර්ගයක් තවමත් අර ගෙන නැහැ. ඒ ගැනත් කල්පනා කර බලන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

අපේ ගරු ඇමතිතුමා ඉතාමත්ම කාර්යක්ෂමයි. සමහර විට කඩදාසිය දුන් වහාම නියෝග නිකුත් කරනවා. එහෙත් දෙපාර්තමේන්තු නිලධාරීන් ඒවා යටපත් කරගෙන කටයුතු කරනවා. ඒ ගැන ඇමතිතුමා කල්පනාකාරීව ක්‍රියා කළ යුතුයි. අපේ මේ රජය අප්‍රසාදයට පත් කිරීමට නිලධාරීන් විසින් නොයෙකුත් කූට ව්‍යාපාර ගෙන යනවා. ඒ නිසා ගරු ඇමතිතුමා දෙන නියෝග හරියාකාර ක්‍රියාත්මක වෙනවාද කියන කරුණ ගැන පරීක්ෂාකාරීව සිටින ලෙස මා මතක් කර නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එමෙන්ම රාජාංගන ඉඩම් ව්‍යාපාරය ගැනත් මතක් කරන්නට ඕනෑ. රාජාංගන ව්‍යාපාරය යටතේ ඉඩම් දීම සඳහා මේ ළඟදී කුරුණෑගල කච්චේරියේදී ඉඩම් කච්චේරියක් පැවැත්තුවා. ඒ අවස්ථාවේදී මගේ ආසනයෙන් 17 දෙනෙක් පමණ තේරුණා. එහෙත් එහි පදිංචිවීම සඳහා ගියාට පසුව ඔවුන්ට සිදු වුණේ ආපසු එන්නයි. එයට හේතුව මේකයි: ඔවුන්ට ඉඩම් පෙන්නුවෙත් නැහැ; දුන්නෙත් නැහැ; සුද්ධ කරලත් නැහැ. ඒ අය පදිංචිය සඳහා ගියේ තමන් සතුව තිබුණු හරකා බාන ගේ දොර ආදිය විකුණා මුදල් ටිකක් අතේ ඇතිවයි. එහෙත් එහි පදිංචිවීමට ක්‍රමයක් නැතිවීම නිසා ඔවුන්ට අසාධාරණයක් සිදු වුණා. මේ කරුණ සම්බන්ධව කුරුණෑගල දිසාපතිවරයා සමග මා සාකච්ඡා කළා. ඒ සම්බන්ධව ඔහු කීවේ ඉඩම් කච්චේරිය කුරුණෑගල පැවැත්වූ නමුත් ඒ ඉඩම් පාලනය වන්නේ අනුරාධපුර කච්චේරියෙන් නිසා කුරුණෑගල දිසාපතිවරයාට කළ හැකි යමක් නොමැති බවයි. ඒ නිසා රාජාංගන ව්‍යාපාරයේ වම් ඉවුර කුරුණෑගල දිස්ත්‍රික්කයට අරගෙන කුරුණෑගල දිසාපතිවරයා යටතේ ඉඩම් නිලධාරියකු පත් කර කට යුතු කරන්නේ නම් අර අන්දමේ අසාධාරණයකට මුහුණ පාන්නට ගොවීන්ට සිදු වන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන ගරු ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ල යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

එමෙන්ම මේ අමාත්‍යාංශය යටතේ කථා කරන විට ගොවි හමුදාව ගැන සඳහන් නොකරම බැහැ. මේ ළඟදී ඇති කළ ව්‍යාපාරවලින් ඉක්මණින් සංවර්ධනයක් ඇති කිරීමට ඇතිකළ දෙය නම් මේ ගොවි හමුදාව නමැති භට හමුදාව පිහිටුවීම බව කියන්නට ඕනෑ. එයින් විශාල සේවයක් සිදු වී තිබෙනවා. ගොවි හමුදාව පිහිටුවා මාස තුනක් යන්නට කලින් අත්තරගල්ල වැව අඩි දෙකක් උස්සා විශාල වතුර ප්‍රමාණයක් රඳවා ගැනීමට හැකිවන අන්දමට සකස් කර තිබෙනවා. දැන් ඒ අය වෙනත් කටයුතුවල යොදවන්නට යනවා. ඒ මගින් රැකීරක්ෂා ප්‍රශ්නය විස ඳෙන අතරම, මේ රටේ සංවර්ධනයත් ඇති වීම ඒකාන්තයි. ඒ නිසා මේ ගොවි හමුදා භටයන්ගේ සේවය ඉතාමත්ම අමරණීය බව කියන්නට ඕනෑ. එමෙන්ම ඒ මගින් මේ රටේ ජනතාවට විශාල සේවයක් වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා විසින් 1965 සිටම වැදගත් යෝජනා ක්‍රමයක් යෝජනා කර තිබෙනවා. එනම් කොස්පොතුඔය වම් ඉවුරේ යෝජනා ක්‍රමයයි. එය පරීක්‍ෂා කර සැලැස්ම හදා වියදම ගණන් බලා ඔක්කොම ඉවරයි. එහෙත් එය ක්‍රියාත්මක නොවන්නේ කුමන කරුණක් නිසාද කියා මට නම් තේරෙන්නේ නැහැ. මේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළොත් අක්කර 5,000ක් පමණ සංවර්ධනය කරන්නට පුළුවන් වන නිසා ගොවීන්ට විශාල සෙතක් සැලසෙනවා. එමෙන්ම ගොවියා බලා සිටියදීම පහළට ගලා යන ජලය ප්‍රයෝජනයට ගන්නටත් පුළුවන් වෙනවා. මේ යෝජනා ක්‍රමයට වැව් 10 ක් පමණ අයත් වෙනවා. ඒ වැව්වලට විශාල ප්‍රමාණයක් ජලය එක්රැස් වන නිසා එම යෝජනා ක්‍රමය මගේ කොට්ඨාශයට පමණක් නොව වාරියපොළ කොට්ඨාශයටත් වැදගත් වෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගොස් මේ ස්ථානය පරීක්ෂා කළා. එයින් හෙළි වී තිබෙනවා මෙය පැරණි වාරිමාර්ග ක්‍රමයක් තිබුණු ස්ථානයක් බව. වීරමන් දිසාපතිතුමා කුරුණෑගල සිටි කාලයේදී එතුමත් ගොස් මේ ස්ථානය පරීක්ෂා කළා. මෙය ඉතාමත් යෝග්‍ය වාරිමාර්ග ක්‍රමයක් බවත් එය ක්‍රියාත්මක කළ යුතු බවත් එතුමා ප්‍රකාශ කර තිබෙනවා. එම නිසා, එය ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මා මතක් කරන්නේ විදුලි බලය සම්බන්ධවයි. විදුලි බල කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශයට ස්තුතිවන්න විය යුතු බව පළමුකොටම මා ප්‍රකාශ කරන්නට කැමතියි. විශේෂයෙන්ම, වැබොඩ ප්‍රදේශයට විදුලි බලය සැපයීම ගැන මා ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. දැනට විදුලි බලය දී තිබෙන්නේ වැබොඩ කොටසකට පමණක් නිසා එය බෝයගොඩ දක්වා දීර්ඝ කරන ලෙස මා යෝජනා කර තිබෙනවා. එසේ දීර්ඝ කළහොත් එය ගලගෙදර ආසනයටත් ඉන් එහා ප්‍රදේශවල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒකනායක මයා.]

ටත් ප්‍රයෝජනවත් වන නිසා මගේ ඒ යෝජනාවත් ඉක්මනින් ක්‍රියාත්මක කරන ලෙසත් ගරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රමය ගැනත් වචනයක් කියන්නට කැමතියි. මෙය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නොයෙක් වර අපෙනුත් කරුණු විමසා තිබෙනවා. සමීක්ෂණ පවත්වා තිබෙන බවත් අපට දැනගන්නට ලැබුණා. එහෙත් තව ම එය ක්‍රියාත්මක වන පියවරක් ගෙන නැහැ. ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වුණොත් සුළු කර්මාන්ත ආදිය ඇති කිරීම සඳහාත් විශාල සේවයක් සැල සෙනවා. එම නිසා එයද ඉක්මනින් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ගරු සභාපතිතුමාට ස්තුති කරමින් මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනවා.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (අගලවත්ත)

*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*

(Dr. Colvin R. de Silva—Agalawatta)

ගරු සභාපතිතුමනි, වැඩි බැරෑරුම් ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නට නැති නිසා මට වුවමනා කරන්නේ විනාඩි 10 ක කාලයක් පමණයි. එය මට ලබා දීම ගැන මා තමුන්නාන්සේට කෘතඥ වෙනවා. ඉත්තෑපාන ගම්කාර්ය සභා කොට්ඨාශයේ තිබෙන්නාවූ විශාල කුඹුරු යායවල් සම්බන්ධයෙන් අද ඇති වී තිබෙන තත්ත්වය ගැන ගරු ඇමතිතුමාගේ හිත යොමු කොට, එම වෙල් යායවලින් බෙන්තර ගඟට ජලය බැස යාමට තිබෙන්නාවූ මාර්ග පිළිබඳව කිසියම් පියවරක් පුළුවන් තරම් ඉක්මනින් ගන්නා ලෙස එතුමාගෙන් ඉල්ලා සිටීමටයි මා බලාපොරොත්තු වන්නේ.

පසු ගිය දවස්වල අතුරු මැතිවරණ කටයුතු සඳහා අගලවත්ත ප්‍රදේශයට යන්නට ගරු ඇමතිතුමාටත් සිදු වුණු නිසා, ඉත්තෑපාන ප්‍රදේශයෙහි විශාල වෙල් යායවල් තිබෙන බව එතුමා දකින්නට ඇති. එම කුඹුරු අවුරුද්දෙන් අවුරුද්ද කොපමණ වගා කළා[illegible] මේදී ඒවා නිසරු වන බවත් ගරු ඇමතිතුමා දන්නවා ඇතැයි මා විශ්වාස කරනවා. එසේ නිසරු වීමට හේතු කීප යක් තිබෙනවා. එක් හේතුවක් සෑම අවුරුද්දේම පාහේ බොහෝම තදින් ගංවතුර ගැලීමයි. මෙසේ ගංවතුර ගැලීමට හේතුව කුමක්ද යන බව මා ඊයේ පෙරේයිදා ටිකක් සෝදිසි කර බැලුවා. එවිට මට දැනගන්නට ලැබුණේ, මෙම වෙල් යායවලට එකතු වන වැහි වතුර බෙන්තර ගඟට බැස යාමට තිබෙන මාර්ග වල කිසියම් අවහිරයක් ඇති වී තිබෙන බවයි. ඒ අවහිරකම් මොනවාද යන්න විස්තර සහිතව ඇමතිතුමාට පැහැදිලි කර දෙන්නට තරම් තවම ඒවා පිළිබඳ විස්තර මා දන්නේ නැහැ. එතරම් දුරට කරුණු පරීක්ෂා කර බැලීමට මට තවම අවස්ථාවක්, කාලයක්, ලැබුණේ නැහැ.

එහෙත් මා ඊයෙ පෙරෙයිදා ඒ ප්‍රදේශයට ගිය අවස්ථාවේදී එහි ජනතාවගෙන් මට එක් කරුණක් දැනගන්නට ලැබුණා. එය, ගරු ඇමතිතුමාට ඉතා ඉක්මනින්ම ප්‍රතිකර්මයක් යොදන්නට පුළුවන් දෙයක්. මෙම කුඹුරු නිසරු වීමට එක් ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ කරිජ්ජ ගැහීමයි. මෙය බෙන්තර ගඟ දෙපැත්තේම කුඹුරුවලට තිබෙන අමාරුකමක්. ඒ ගැන වාරිමාර්ග දෙපාර්තමේන්තුව මීට අවුරුදු ගණනකට ඉහත යම්කිසි වැඩ වග යක් කර තිබෙන බව මා මුලින්ම මතක් කරනවා. එනම් විශාල වේල්ලක් බැඳීමයි. විශාල වේල්ලක් බැඳ දොරවල් 25 ක්ම බැඳ තිබෙන බව මට දැනුම් දී තිබෙනවා. මා ඒ ස්ථානයට ගිහින් බැලුවේ නැහැ තවම. ඒ දොරවල් 25 දැන් බොහොම පරණ වී තිබෙන අතර, නිසි විධියට ප්‍රතිසංස්කරණ, "රෙපයාර්" කටයුතු, නොකරන නිසා දැන් ඒවායින් කරිජ්ජ ගැසීම නැවත්වීම වෙනුවට කරිජ්ජ ඒ දොරවල් යටින් බේරී එනවා. මෙය මට දැනුම් දී තිබෙන දෙයක්. ඒ නිසා එය ඇත්තක් නම් මේ ඉදිරි මාස කීපය තුළදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් තමුන්නාන්සේට මේ කටයුත්ත කර දෙන්න පුළුවන්. මා දැන් නැගී සිටියේ විශේෂයෙන්ම ඒ ඉල්ලීම කරන්නයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා දෙහිවල-ගල්කිස්ස ප්‍රදේශයේ සිටින නිසා කුඹුරු ගැන කථා කරනවා ඇසෙන විට තමුන්නාන්සේලා ටිකක් පුදුම වෙන්නට ඉඩ තිබුණත්, අත්තිඩිය පළාතේ විශාල වෙල් යායක් තිබෙන බව තමුන්නාන්සේට මතක ඇති. වැල්ල වත්ත-ගල්කිස්ස ප්‍රදේශය වෙනුවෙන් පෙනී සිටි කාලයේ ඔය කරිජ්ජ ප්‍රශ්නය ගැන මා දැනුම් දුන් අවස්ථාවේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් විශාල දොරක් බඳවා දැන් මා හිතනවා, ඒ කුඹුරු යාය වපුරනවා පමණක් නොව, අද එයින් සෑහෙන අස්වැන්නක්ද ලබන බව. ඒ නිසා මා දැන් ඉදිරිපත් කළ ප්‍රශ්නය පිළිබඳවත් හැකි පමණ ඉක්මනින් ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
මම ඒක භාරගන්නම්.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R .de Silva)

තවත් එක් කාරණයක් මතක් කරන්න තිබෙනවා. ඒක නම් මාසෙකින් දෙකකින් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. කෙසේ වෙතත් ඒ ගැන ටිකක් පරීක්ෂා කර බලා වැඩපිළිවෙළක් සකස් කරන ලෙස මා ඉතා ඕනෑකමෙන් ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේට මතක ඇති වතුර ගැලීමේ ප්‍රශ්නය ගැන මා කලින් මතක් කළ බව. වතුර ගැලීම නිසා ඒ කුඹුරු සේදී යනවා. කොපමණ පෝර දැම්මත් ඒ පෝර සේදී යනවා. පෝර සේදී යන ගතියක් තිබෙනවා නම් කුඹුරෙන් ප්‍රයෝජන ගන්න බැහැ. ඒ වාගේම ගොයම් පැළ වූ පසු වතුර ගලා දින හත අටක් රැඳී තිබුණොත් සම්පූර්ණයෙන්ම ඒ ගොයම විනාශ වී යනවා. මේ කාරණා පෞද්ගලිකව දන්නවාය කියා මා කියන්නේ නැහැ. එහෙත් මා ඉදිරිපත් කරන්නේ මට දැනුම් දෙන ලද කරුණුයි.

කුඹුරු ගැනත් මා හිතනවා කරුණු ඉගෙනගෙන පසුව හොඳින් කථා කරන්න පුළුවන් වේවිය කියා. කුඹුරු ගැන කථා කරන විට සමහර අය හිතනවා, මඩේ එරුණොත් විතරයි කුඹුරු ගැන කියන්න පුළුවන් කියා. එහෙත් සභාපතිතුමණි, කෘෂි කර්මය පිළිබඳව සිටින ලොකුම විශෙෂඥයන් කවදාවත් කුඹුරකට බැස නැහැ. විශෙෂඥයෙකු වන්න කල්පනා කරන තැනැත්තා මඩේ එරෙන්න ඕනෑ නැහැ. කෙසේ වෙතත් ඔය ප්‍රශ්න ගැන එපමණ දැනීමක් මට නැහැ. පසුව සොයා බලා ඉගෙනගැනීමට බලාපොරොත්තු වෙනවා.

අ. භා. 7

මා කලින් කිව්වා වාගේ, මේ පිළිබඳව තිබෙන ලොකුම පාඩුව වතුර ගලාගෙන විත් සෑම අවුරුද්දකම කුඹුරු සේදී පාලු වී යාමයි. එම නිසා එසේ කුඹුරට එන වතුර බෙන්තර ගඟට හැරවීමේ වැඩපිළිවෙළක් සකස් කරන්න ඕනෑ. මෙය ප්‍රාදේශීය වශයෙන් කළ යුතු දෙයක් නොවෙයි. ඉතාම පුළුල් විධියට සැලැස්මක් ඇතුව කළ යුතු වැඩක්. එය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දැනුම් තේරුම් ඇති ඉංජිනේරු මහත්වරුන්ගෙන් අසා බලා සකස් කළ යුතුව තිබෙන සැලැස්මක්. මා ඒ ගැන වැඩි යමක් කියන්නේ නැහැ.

මේ ඇමතිතුමාට අයිති නැති වුවද තවත් කාරණයක් කියන්නට සභාපතිතුමාගේ අවසරය බලාපොරොත්තු වෙනවා. ඉත්තෑපාන ගම්කාර්ය සභා ප්‍රදේශයක් වෙනම තිබෙනවා. එහි ගම්කායර්‍ය සභාපතිතුමා දැන් අවුරුදු 30 ක් නිස්සේම සිටින එකම පුද්ගලයාමයි. එහි වැරදි ගැන මා කථා කරන්නට අදහස් කරනවා නොවෙයි. එහෙත් යම් කිසි ගම්කාර්ය සභාවක් නිසි විධියට වැඩ කරන්ට ඉල්ලන්නේ නැතිනම් එය ඇමතිවරයකුට අමාරුවක් වෙනවා. අවුරුදු 30 ක් මුළුල්ලේ එකම ගම්සභාපතිවරයකු ඇතිව කටයුතු කළ ඒ ඉත්තෑපාන ගම්කාර්ය සභාවෙන් කරන්නට තිබෙන කිසිම සේවයක් කෙරී නැති බව මා නිර්භයව කියනවා. ඒ ගම්සභාවට අයත් කාර්යාලය ගැන කියනවා නම්, දැන් කාලයේ හරක් මඩුවක් එයට වඩා දියුණු බව කියන්නට ඕනෑ. ඒ ගම්කාර්ය සභාව, මෙතෙක් කල් අවුරුදුපතා ඒ ප්‍රදේශයේ ඇති වූ වතුර ගැලීමේ ප්‍රශ්නය පිළිබඳව ඇමතිතුමා සමග සහ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කර ඒ ප්‍රශ්නය විසඳා ගැනීමට උත්සාහ දැරුවා නම් ඒ සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් යොදා ගන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]
තිබුණු බවයි, මගේ විශ්වාසය. ඒ ගම් කාර්ය සභාවෙන් කළ යුතු ඒ ඉල්ලීම මෑතදී ඒ පළාතේ නියෝජිතයා වශයෙන් තේරී පත් වුණු මට ඉදිරිපත් කරන්නට සිදු වී ඇත්තේ කවරුන් විසින් හෝ එය කළ යුතු නිසයි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva
ඒක කරන්නම්.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
එය කර දෙනවා නම් කිසිම සැකයක් නැතිව ඉත්තෑපාන ප්‍රදේශයේ ජනතාව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වන බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි.

එස්. බී. හේරත් මයා. (හිරියාල)
(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)
(Mr. S. B. Herat—Hiriyala)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මට වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මා ප්‍රථමයෙන්ම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමාගේ වැය ශීර්ෂ යටතේ කථා කරන්නට මා ඉතා සතුටු වෙනවා, එසේම ආඩම්බර වෙනවා.

විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකු ම කීවා, ඇමතිතුමා දීර්ඝ කාලයක සිට ඉඩම් ඇමති හැටියට සේවය කළ බව. මාත් ආණ්ඩුවේ සේවකයකු හැටියට අවුරුදු ගණනාවක්ම එතුමා යටතේ සේවය කළ නිසා එතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන මේ අවස්ථාව ඉතා වැදගත් එකක් හැටියට මා සලකනවා.

ඉඩම් කච්චේරි නොපැවැත්වීම නිසා දුප්පත් මහජනතාවට බොහොම අවහිර ඇති වී තිබෙන බව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අසන්නට ලැබුණා. 1956 සිට 1965 දක්වා තිබුණු ආණ්ඩුවලින් ඉඩම් කච්චේරි කීයක් පැවැත්වුවාද කියා මා අහන්නට කැමතියි. ඒ කාලයේදී ඉඩම් කච්චේරි නොපැවැත්වීම නිසා ගම් පුළුල් නොකිරීම නිසා, ගම්බද පවුල්වල දූ දරුවන් ලොකු වී ඒ පවුල්වලට ඉඩම් මදි වීම හේතුකොටගෙන බලෙන් ඉඩම් ඇල්ලීම නිසා අපේ ලංකාවේ වටිනා කැලෑ නටබුන් වී විනාශ වූ බවට සියලුම ගරු මන්ත්‍රීවරුන් සාක්ෂි දරනවා ඇති. මගේ හිරියාල ආසනයේ පමණක්—පොඩි ගණනක් නොවෙයි—අක්කර 20,000 ක් පමණ මේ අන්දමට විනාශ කර, වටිනාකම නැතිකර, බලෙන් අල්ලාගෙන තිබෙන අතර, එසේ කළ දුප්පත් ජනතාවට නඩු හබවලට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. එසේ සිදු වුණේ පසුගිය ආණ්ඩු ඉඩම් සංවර්ධනය සම්බන්ධව, ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය සම්බන්ධව, ජනපද ව්‍යාපාර සම්බන්ධව හරියාකාර වැඩ නොකළ නිසයි. මේ රජය පිහිටුවන කාලයේදී මුළු දිස්ත්‍රික්කයේම වැඩ කටයුතු කරන්ට කච්චේරියේ සිටියේ ඉඩම් නිලධාරීන් එක් කෙනෙකු හෝ දෙන්නෙකු පමණක් බව මා ඒ මන්ත්‍රීවරුන්ට මතක් කරන්ට කැමතියි. එහෙත් මේ රජය බලයට පත් වීමෙන් පසුව සෑම ආදායම් පාලක නිලධාරි මහත්මයෙකුම ඉඩම් නිලධාරියකු හැටියට පත් කළා. පමණක් නොව කච්චේරිවල සේවය කරන ජ්‍යෙෂ්ඨ ලිපිකරු මහතුන් කීප දෙනකු පවා ඒ තනතුරුවලට පත් කරන්ට යෙදුණා. දැන් එක දිස්ත්‍රික්කයට ඉඩම් නිලධාරීන් 10 ක් 15 ක් තරම පත් කර සිටිනවා. මගේ හිරියාල ආසනයේ පමණක් මාසයකට ඉඩම් කට්ටි 100 ක් 200 ක් තරම දැන් බෙදා දෙන නිසා මා ඒ සම්බන්ධයෙන් ඇමතිතුමාට ප්‍රශංසා කරනවා. ඉඩම් කච්චේරි නොපැවැත්වීම නිසා දුකට පත් වී සිටින බව එක් මන්ත්‍රීවරයෙක් දැන් ප්‍රකාශ කළා. එය ඇත්තක්දැයි මා දන්නෙ නැහැ. ඒ තත්ත්වය ගැන මට පුදුමයි. කෙසේ වෙතත් එතුමාගේ ඉඩම් බෙදා දීමේ ව්‍යාපාරය ගැන අපි ඇමතිතුමාට ප්‍රශංසා කරන්ට ඕනෑ.

ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය ගැනත් වචනයක් කියන්ට ඕනෑ. ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයේදී අපට ඉතා භයානක තත්ත්වයකට මුහුණපාන්න සිදු වී තිබෙනවා. ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ අපි ඉඩම් බෙදා දෙන්න යන විට ලොකු ධනපති මුදලාලිලා හා ලොකු ධනපති මහත්වරුන් ඒවාට බාධා කිරීම ඉතා කණගාටුදායකයි. ලොකු සෙනෙට් මන්ත්‍රීවරයෙකුත් අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආසනයේ විශාල ඉඩම් කට්ටියක් බලෙන් අල්ලාගෙන සිටීම ගැන මා කනගාටු වෙනවා. ලොකු මහත සෙනෙට් මන්ත්‍රීවරයෙක් අපේ ප්‍රදේශයේ විශාල ඉඩම් කට්ටියක් අල්ලාගෙන සිටිනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඒ කවුද?

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)

ඕනෑ නම් කියන්නම්. ඒ. ආර්. එම්. හමීම් සෙනෙට් මන්ත්‍රීතුමායි. එතුමා ලොකු ඉඩම් කට්ටියක් අල්ලා ගෙන සිටිනවා. ඒ ඉඩම් කට්ටිය ඒ ගමට තිබෙන එකම ලොකු ඉඩම් කට්ටියයි. ඒ ඉඩම් අල්ලාගෙන තිබෙන්නේ කොහොමදැයි කිව්වොත් තමුන්නාන්සේලා කනගාටු වෙයි. තුවක්කු, කඩු, කිරිච්චි සහිතව ලොරිවල මිනිසුන් දමාගෙන ගිහින් බුරියානි ආදිය දීල තමයි, ඔය ගම්මුන්ගේ ඉඩම් අල්ලා ගෙන තිබෙන්නේ. දැන් ඒ ඉඩම් බෙදා දෙන්ට ගියාම ආණ්ඩුවේ නිලධාරීන්ට නොයෙක් තර්ජන පැමිණෙනවා. ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ දැන් ඉඩම් බෙදා දෙන විට ඒ ඉඩම් කට්ටි ලැබෙන්නේ පැරණි ගම්මුන්ට නොව පිටින් පැමිණි මුදලාලිලාට නැත්නම් ධනපති මහත්වරුන්ටයි. ඒ ආසනයේම වැඩිපුර ඉඩම් තිබෙන කොටස් තිබෙනවා. ඒ ප්‍රදේශවලින් ඉඩම් ලබා ගන්ට මේ මුදලාලිලා හෝ ධනපති මහත්වරුන් ඉදිරිපත් වෙනවා නම් ඒවා ඔවුන්ට ලබා දෙන්ට අපි සැම වේලේම සූදානම් බව ප්‍රකාශ කරන්ට කැමතියි. ඒ සෙනෙට් මන්ත්‍රීතුමා හෝ වෙනත් ධනපති මුදලාලිලා හෝ එවැනි ඉඩම් වැඩිපුර තිබෙන ප්‍රදේශයකින් ඉඩම් ලබා ගත්තා නම් අපි සන්තෝෂයෙන් ඒ මහත්වරුන් පිළිගන්නා බව මතක් කරන්ට ඕනෑ. එපමණක් නොව එවැනි ප්‍රදේශවලින් ඒ මහත්වරුන් ලබා ගන්නා ඉඩම් රැක බලා ගෙන වැඩි දියුණු කර දීමට ආධාර කරන්ටත් හිරියාල ජනතාව සැම අවස්ථාවකදීම සූදානම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ ඉඩම් කට්ටි බෙදා දීගෙන යනවා. ඒවාට අවහිර කම් තිබෙන බව දැන් ප්‍රකාශ වුණා. ඒ අවහිර නැති කරන්ට ක්‍රමයක් තිබෙන බව මා ඇමතිතුමාට මතක් කරන්ට කැමතියි. එනම්, ඉඩම් කච්චේරි පැවැත්වීමේදී පැරණි ගම්මුන්ට ප්‍රමුඛත්වය දිය යුතු බවටත් පසුව පිට පළාත්වල ඉඩම් නැති උදවිය ගැන සලකා බැලිය යුතු බවටත් නිලධාරීන්ට උපදෙස් දිය යුතුයි.

ඊළඟට මා මගේ ප්‍රීතිය ප්‍රකාශ කරන්ට කැමතියි, අපේ ප්‍රදේශයේ කොලනිවල වැඩ කටයුතු ඉතා සාර්ථක අන්දමින් කර ගෙන යාම සම්බන්ධයෙන්. ගිය අවුරුද්දේ ගෙවල් 50 ක් පමණ හැදුවා. පසුගිය කාලයේ මහජනතාවට කිව්වා, "අපට මේ ගෙවල් හදන්න සල්ලි නැහැ, තමුන්නාන්සේලා ගෙවල් හදා ගන්න" කියා. එහෙත් ඒ දුප්පත් ජනතාවට ගෙවල් හදා ගන්න බැරි වුණා. ඉන් පසුව තමයි, මේ ගෙවල් සෑදීමේ වැඩ පිළිවෙල මේ රජය මගින් ආරම්භ කර පසුගිය අවුරුද්දේ අපේ ප්‍රදේශයේ මා කලින් සඳහන් කළ ගෙවල් 50 හදන්ට යෙදුනේ. මේ අවුරුද්දේ තවත් ගෙවල් 100 ක් හදන්ට සූදානම් වීම ගැන මා සන්තෝෂ වෙනවා. එම කොළනිය සඳහා වෙනත් ගොඩනැගිලි සෑදීමටද යෝජනා කර ගෙන යනවා. ඒ පිළිබඳව ගරු ඇමතිතුමාටත් නිලධාරී මහත්වරුන්ටත් අප ප්‍රශංසා කරනවා; ස්තුතිවන්ත වෙනවා. මීට අවුරුදු පහකට හයකට පමණ ඉහත එම කොළනිවලට ගෙන ගොස් පදිංචි කරවන ලද ජනතාවට ගමන් කිරීම සඳහා සුදුසු පරිදි සකස් කරන ලද පාරවල් නැහැ. එම ජනතාවට අවශ්‍ය කරන ගෙවල් සාදන අවස්ථාවලදීම ඒවාට යාම සඳහා අවශ්‍ය කරන පාරවලුත් සාදා දෙන්නටය කියා මා ගරු ඇමතිතුමාට මතක් කර සිටිනවා. හිරියාල ආසනයේ ඉඩම් කොළණි ක්‍රමයට දී තිබෙනවා. කොළනි ක්‍රම කීපයක් හිරියාල ආසනයට අයිතියි. හක්වටනා ඔය, කිඹුල්වානා ඔය, සියඹලංගමුව වැව සහ තඹගල්ල යනාදී වශයෙන් ඒ කොළනි ක්‍රම හඳුන්වා දෙන්නට පුළුවනි. මෙම කොළනිවල වැඩ කටයුතු හුඟ කලක සිට ඇනහිට තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 7. 15

පසුගිය කාල සීමාවේදී හක්වටනා ඔය කොළනියේ වැඩ හුඟක් දුරට ඇනහිට තිබුණා. එහෙත් ගිය අවුරුද්ද තුළදී සෑහෙන ප්‍රමාණයක් එහි වැඩ කටයුතු කෙරී තිබීම ගැන ගරු ඇමතිතුමාටත් එම දෙපාර්තමේන්තුවටත් මා ස්තුතිවන්ත වෙනවා. එවාගේම එන අවුරුද්දටත් එහි වැඩවලින් සෑහෙන ප්‍රමාණයක් කරන්නට භාර ගෙන තිබීම ගැන සතුටු වෙනවා. එම කොළනි සම්බන්ධයෙන් වැඩ කරන නිලධාරි මහතුන්ගෙන් මා විශෙෂ ඉල්ලීමක් කරන්නට කැමතියි. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් වාගේ අපි මෙම සභාව ඉදිරියේදී ඇමතිතුමාගේ අඩුපාඩුකම් සොයන්නට යන්නේවත් එතුමාට දොස් පවරන්නේවත් නැහැ. අප කියා සිටින්නේ ඉතා උනන්දුවෙන් මෙම කොළනිවල වැඩ කටයුතු කර දුප්පත් ජනතාවට මුහුණ පාන්නට සිදු වී තිබෙන කරදර හිරිහැරවලින් ඔවුන් මුදවා දෙන හැටියටයි. හිරියාල වැනි දුෂ්කර ප්‍රදේශවලට විශේෂ වශයෙන්ම ආධාර මුදල් වෙන් කර දී කොළනිවලට අවශ්‍ය ගොඩනැගිලි සහ වාරිමාර්ග ක්‍රම යනාදිය සකස් කර දී ඉතා ඉක්මණින් ඒවා දියුණු කර ලන හැටියට මා කියා සිටිනවා. හක්වටනාඔය කොළනි ක්‍රමය යටතේ ඉඩම් කට්ටි 500 ගණනක් තිබෙනවා. ඒ ඉඩම් කට්ටිවලට ජල පහසුව නැහැ. ජලය හිඟකම නිසා කුඹුරු රාශියක් විනාශ වෙනවා. එම නිසා ඒ කොළනි ක්‍රමයට ඉක්මණින් ජල පහසුව සලසා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා. ජලය ප්‍රමාණවත් නැති නිසා හක්වටනා ඔයට වෙනත් ඔයක් යා කරන්නට ඉංජිනේරු අංශය කටයුතු සූදානම් කරගෙන යන බව අසන්නට ලැබී තිබෙනවා. එය කළහොත් ඉතාමත් සාර්ථක අන්දමින් වැඩ කටයුතු දියුණු කරන්නට හැකි වේයයි අප විශ්වාස කරනවා.

වාරිමාර්ග සම්බන්ධයෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මා කල්පනා කරනවා. එම ආසනයේ බතලගොඩ වැව නමින් ලොකු වැවක් තිබෙනවා. එම වැඩ සම්බන්ධයෙන් අඩුපාඩුකම් රාශියක් පවතිනවා. ගරු ඇමතිතුමා ළඟට ඇවිත් මා එම වැවේ වැඩ කටයුතු රාශියක් ගැන සඳහන් කළා. එම අවස්ථාවේදීම ගරු ඇමතිතුමා අණ කළා, ඉතා ඉක්මණින්ම එහි කටයුතු කිරීම පිණිස. මා ඒ වෙනුවෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒවාගේම එම වාරිමාර්ග අධ්‍යක්ෂතුමාත් අනිකුත් ඉංජිනේරුවරුත් ඉතා උනන්දුවෙන් එම කටයුතුවල නිරත වීම ගැන මා එතුමන්ලාටත් ස්තුතිවන්ත වෙනවා.

බතලගොඩ වැව ආදී වැව් රාශියක් තිබෙනවා. මෙම වැව්වලින් අක්කර හය දහසක් පමණ වගා කරනවාය කියා වාරි මාර්ග නිලධාරීන් දන්වා ඇතත් ප්‍රදේශයේ මන්ත්‍රීවරයා වශයෙන් මට කියන්න පුළුවනි, අක්කර දස දහසක ප්‍රමාණයක් දැනට වැඩ කරගෙන යන බව. අදත් අස්වැද්දීම් කරගෙන යනවා, දෙපාර්තමේන්තුවේ ගණන්හිලව්වලට නොවැටෙන. මෙම අක්කර දස දහසෙන් අක්කර පන් දහසක් පමණ ඉඩෝරය නිසා වගා කර ගන්න බැරි වී යනවා. ඇතැම් විට ඉඩෝරයක් නැතත් වුවමනා ප්‍රමාණයට ජලය නොමැති කම නිසා යල සහ මහ කන්නවලදී අක්කර දෙදහසක් පමණ වගා කරන්න බැරි වී යනවා. සමහර විට ඇතැම් අය කියන්න පුළුවනි, මෙම යෝජනා ක්‍රියාත්මක කරන්න විශාල මුදලක් වැය වෙනවාය කියා. එසේ වුණත් යම් මුදලක් වියදම් කළොත් එයින් ඉක්මනින් ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වෙනවා. මන්ද? අක්කර දස දහසක ප්‍රමාණය යල කන්නයේ වැඩ කර ගන්න ලැබුනොත් අනික් කන්නයේ දී ඉන් ප්‍රතිඵල ලබාගන්න පුළුවන් වන නිසයි. එමනිසා, පස් හාරන යන්ත්‍ර කීපයක් යොදවා බතලගොඩ වැව හාරා ගැනීමට ලැබුණොත් එයින් විශාල සෙතක් ප්‍රදේශයේ ගොවි ජනතාවට ලැබෙනවා. මේ වැව පතුල මඩ සහිත නොවෙයි, තද පසක් තිබෙන්නෙ. එම නිසා පහසුවෙන් එම පස ඉවත් කර ගන්න පුළුවනි. එහෙම හාරා බේසමක් වාගේ සකස් කර ගත හොත් අවශ්‍ය පොම්ප යොදා වතුර රැස් කර තබා ගන්න, ඈඳුරු ඔය සිට මේ වැවට පහසුවෙන් ජලය ලබාගන්න පුළුවනි.

මා දන්නා හැටියට, ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙන් දැනටමත් ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබෙනවා, මෙයට අලුතෙන් ගේට්ටු දෙකක් දමන්න. එසේ ගේට්ටු දෙකක් සවි කරවා ගන්න ලැබුනොත් ඉතා පහසුවෙන් ජලය වැවට හරවා ගන්න පුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වත් වෙනවා. ඔය වාගේ සුළු සුළු අඩුපාඩු කම් සකස් කර ගත්තොත් මේ වැවෙන් විශාල ප්‍රයෝජනයක් සැලසෙනවා. ගරු ඇමතිතුමා උඩවලවේ වාගේ විශාල වාරි මාර්ග ක්‍රම සකස් කර ගෙන යනවා. මෙම කටයුතු පිළිබඳව ඇමතිතුමා විශාල උනන්දුවක් දක්වන බව පෙනෙනවා. ඇත්තවශයෙන්ම ඒවායේ සාර්ථකභාවය ගැනත් අප සතුටු වෙනවා. නමුත් මෙවැනි විශාල වාරිමාර්ග ක්‍රමවලින් ප්‍රතිඵල ලැබීමට අවුරුදු ගණනාවක් යනවා. ජනපද පිහිටුවීම ආදී කටයුතු සඳහාත් විශාල මුදලක් වැය කරන බව අප දන්නවා. නමුත් මෙවැනි විශාල වාරිමාර්ග සඳහා යන මුදලින් සියයට දහයක ප්‍රමාණයක්වත් මෙබඳු වැව් සකස් කිරීමට යොදනව නම් මා හිතන අන්දමට ඉතා ඉක්මනින් ඒවායින් ප්‍රතිඵල ලබා ගන්න පුළුවනි. මා එසේ කියන්නෙ, එක් කන්නයකදී සකස් කළොත් අනික් කන්නයේදී අස්වැන්න ලබාගන්න පුළුවන් වන නිසයි. එම නිසා, මගේ ඉල්ලීම ඉටු කර දීමට, මෙම වැව ගැඹුරු කර දීමට තමුන්නාන්සේ උනන්දු වෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නොයෙක් නොයෙක් කාරණා සඳහා දෙපර්තමේන්තුවල නිලධාරීන් සමග සටන් කිරීමට සිදුවන අවස්ථා තිබෙනවා. එසේ වුණත් නිලධාරීන්ගේ සහාය නොමැතිව මේ කටයුතු කොයි ලෙසකින්වත් කර ගෙන යන්න බැරි බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. එම නිසා, නිලධාරීන්ගේ සහයෝගයෙන් මේ වැඩ ටික ඉක්මනින් කර දීමට තමුන්නාන්සේ කල්පනා කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන් කැලෑ දෙපාර්තමේන්තුව ගැනත් යමක් සඳහන් කරන්න ඕනෑ. හිරියාල ප්‍රදේශයේ ඇති අක්කර පහළොස් දහසක්-විසි දහසක් පමණ වන කැලෑ ඉඩම්වලින් සෑහෙන ප්‍රමාණයක් බලයෙන් අල්ලා ගැනීම නිසා ඒවා විනාශ වී යන තත්ත්වයක් ඇති වී තිබෙනවා. මේ කාරණය ගැන මා ගරු ඇමතිතුමාට මෙයට පෙර දැන්නුවා. මේ තත්ත්වය මග හැර වීමට, ඉක්මනින් සුදුසු වැඩ පිළිවෙළක් අනුගමනය කරන ලෙස ඉල්ලා සිටියා. ඒ වාගේම ඉතුරු වී තිබෙන කැලෑ ටිකත්, අළුත් වගාවනුත් ආරක්ෂා කිරීම පිණිස කටයුතු කරන හැටියට ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටියා. ඒ සඳහා මැල්සිරිපුර ප්‍රදේශයේ කාර්යාලයක් විවෘත කරන ලෙස මා ඉල්ලූ අවස්ථාවේදී, වහාම කාර්යාලයක් විවෘත කර දෙන බවට ඇමතිතුමා පොරොන්දු වුණා. ඒ ගැන දෙපාර්තමේන්තුවට දන්වා තිබෙනවා. වැඩි කල් යන්නට ප්‍රථමයෙන් ඒ කාර්යාලය විවෘත කර දේවි යැයි මා හිතනවා.

හැම දෙපාර්තමේන්තුවකම වාගේ සුළු සුළු අඩුපාඩුකම් තිබෙනවා. පසුගිය රජය කාලයේ හැම දෙපාර්තමේන්තුවකම පාහේ වැඩ දුර්වල වී තිබුණ බව, මාත් රජයේ සේවකයකු වශයෙන් වැඩ කළ නිසා දන්නවා. ඒ නිසා තමයි, අප කොයි තරම් උත්සාහ කළත් අපට වුවමනා තරම් වේගයෙන් මේ කටයුතු කරන්නට බැරි වී තිබෙන්නේ. හිරියාල ආසනයේ පමණක් නොව දිස්ත්‍රික්ක හතර පහකම මා වැඩ කර තිබෙනවා. ඒ දිස්ත්‍රික්ක හතර පහේම වැඩ කෙරෙන්නේ ඒ අන්දමටයි. අපේ රට දියුණු කරන්නට නම්, ආහාර යුද්ධයෙන් ජය ගන්නට නම් අප මේ කටයුතු ඉක්මණින් කර ගන්නට ඕනෑ. කල් යන්න කල් යන්න වතුර සැපයීමත්, ඒ නිසාම ආහාර වගාවත් දුර්වල වෙනවා. එහෙම වුණොත් අපේ කාලය තුළ අප අදහස් කරන පිළිවෙළට කටයුතු කර ගන්නට පුළුවන් වේයැයි මා හිතන්නේ නැහැ.

විදුලි බලය සම්බන්ධයෙනුත් වචනයක් දෙකක් කියන්නට ඕනෑ. විදුලි බල කම්බි හිරියාල ආසනය හරහා කීප ප්‍රදේශයකින්ම යනවා. ඒ ගැන අප සන්තෝෂයි. ඉබ්බාගමුව කෝරළයටත් දැන් කිට්ටු කර තිබෙනවා. හිරිපිටිය, ගනේවත්ත, පෝල්පිතිගම, මොරගොල්ලාගම, මඩහපොළ යන කෝරළවලත් ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර තිබෙනවා. එක් වරම බැරි වුණත් පුළුවන් තරම් ඉක්මණින් ඒ ප්‍රදේශවලටත් විදුලි බලය ලැබේයැයි මා විශ්වාස කරනවා.

මේ ජාතික රජය මඟින් ගෙන යන ආහාර වගා කිරීමේ ව්‍යාපාරය සාර්ථක අන්දමට ගෙන යන්නට නම් විශේෂයෙන්ම අපේ ප්‍රදේශයට වුවමනා කරන්නේ ජලයයි. ඒ නිසා ජලය අපේ ප්‍රදේශවලට ඉතාමත් ඉක්මණින් ලබා දිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. බී. හේරත් මයා.]

සුතුයි. ඒ ජලය ඉතා ඉක්මණින් ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා. එසේම ගරු ඉඩම් ඇමතිතුමාටත්, අපේ රාජකාරි කටයුතු කර දෙන නිලධාරි මණ්ඩලවලටත් ප්‍රශංසා කරනවා. එසේම මේ අවසථාව ලබා දීම ගැන ගරු නියෝජ්‍ය සභාපතිතුමාටත් ස්තුති කරමින්, මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

නියෝජ්‍ය සභාපතිතුමනි, අද අප සාකච්ඡා කරන්නේ ඉතාමත් වැදගත් අමාත්‍යාංශයක්. ලංකා ආණ්ඩුව යටතේ තිබෙන අමාත්‍යාංශවලින් ඉතාමත් වැදගත් අමාත්‍යාංශය, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශයයැයි මා හිතනවා. ඉඩම්, ගංගා, ඇළ-දොළ, ඔයවල් වනාන්තර, විදුලි බලය, ගොවි ජනපද ආදී වශයෙන් ලංකාවේ සංවර්ධනයට නැත්නම් ස්වයංපෝෂණයට අදාළ හැම ව්‍යාපාර යක්ම සාර්ථක කිරීමේ විශාල වැඩ කොට සක් මේ අමාත්‍යාංශයට පැවරී තිබෙන බව, මේ අමාත්‍යාංශයට අයත් අංශ දෙස බැලුවාම පෙනී යනවා.

ලංකාව ස්වාභාවික සම්පත්වලින් පෝෂිත රටක්. ඒ ස්වාභාවික සම්පත් අතුරින් අපට තිබෙන ලොකුම සම්පත තමයි, ජල සම්පත. මධ්‍යම ප්‍රදේශයෙන් පටන් ගෙන දස අත විහිදී යන ගංගා රාශියක් මේ රටේ තිබෙනවා. එවැනි තත්ත්වයක් ලෝකයේ වෙන කිසිම රටක නැහැ. ඒ අතින් බලන විට අපේ රට වාසනාවන් තයි. ජල සම්පත ගැන සලකන විට කෘෂි කර්මාන්තය අතින් අපේ රටට හොඳ අනාගතයක් තිබෙනවා යයි සිතා අපට ආඩම්බර වන්නට පුළුවනි. ඒ වගේම අපේ රටේ තිබෙන ගංගා ප්‍රයෝජනයට ගෙන ජල විදුලිය නිපදවා කාර්මික සංවර්ධනයක් ඇති කර ජාතික ධනය වර්ධනය කරගැනීමටද පුළුවන් තත්ත්වයක් තිබෙනවා.

අ. භා. 7.30

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට තිබෙන මෙම ජල සම්පත දැන් ජල විපතක් බවට පත්වී තිබෙන්නේ ගංගා සංවර්ධනය කිරීමට, ගංගා හීලෑ කිරීමට නියම සැලැස්මක් නැති නිසයි. නියම අන්දමේ සැලැස්මක් නැති නිසා අපේ ජල සම්පත ගොවියාට ඇති ලොකුම කරදරයක් බවට පත් වී තිබෙනවා. අවශ්‍ය වේලාවට ජලය නැතිකම හා අනවශ්‍ය වේලාවට ජලය වැඩි වීම නිසා අද අපේ රටේ ජල සම්පතින් ගොවියාට ඇති වී තිබෙන කරදරය ඉතා විශාලයි. අපේ ජල සම්පත රටේ ප්‍රයෝජනය සඳහා ගොවියාගේ යහපත සඳහා යොදවා ගන්නට නියම විධියේ වැඩ පිළිවෙළක් සකස් කරන්නට බැරි නම් කවදාවත් අපට මේ රට ස්වයංපෝෂිත කරන්නට පුළුවන් වන්නේ නැහැ. ජල විපත නිසා අද මාතර දිස්ත්‍රික්කයේ ගොවියන් පමණක් නොව සාමාන්‍ය ජනතාව විශාල පිරිසක්ද අමාරු කම්වලට මුහුණ පා සිටිනවා. විශාල පිරිසක් අවුරුදු පතා ජල ගැල්මෙන් පීඩා ලබනවා. ගෙවල් දොරවල් විනාශ වී යෑම නිසා බොහෝ දෙනා අනාථභාවයට පත් වෙනවා. මහජනයාට මුහුණ පාන්නට සිදු වන මේ විපතින් ඔවුන් ගලවා ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඉඩම් අමාත්‍යාංශයට පුළුවනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිරන්තරයෙන් ජල ගැල්මට ගොදුරු වන මහ ජනයා එයින් ගලවා ගැනීමටත්, ජල ගැල්මට ගොදුරු වන මහජනයාට සමාජ සේවා අංශයෙන් නිරන්තරයෙන් ගෙවනු ලබන මුදල් නතර කර ගැනීමටත්, දුප්පත් මහජනතාවට හොඳ ජීවන තත්ත්වයක් ලබා දීමටත් හැකි වන පරිද්දෙන් ලොකු මිනිසුන්ට අයත් ජලයෙන් යට නොවන ඉඩම් ගෙන ඒවායේ දුප්පත් මහජනතාව පදිංචි කරවීමට ක්‍රියා කරන්නේදැයි මා මේ අවුරුද්දේ ජනවාරි මාසයේ 21 වැනිදා මෙම ගරු සභාවේදී ප්‍රශ්නයක් ඇසුවා. මාතර නගරයට ආසන්නවම අක්කර 29 ක ඉඩමක් තිබෙනවා. එහි ගස් කොළන් ඒ තරම් සරුසාර නැහැ. නිසරු පොල් වගාවකින් යුත් නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාට (ඩොනල්ඩ් ජේ. රණවීර මයා.) අයත් එම ඉඩම ගංවතුරෙන් පීඩා ලබන මිනිසුන්ට බෙදා දෙනවාදැයි ප්‍රශ්න කළ විට ඉඩම් ඇමතිතුමා කීවේ ඒ ඉඩම නොගන්නා බව හා ඒ වෙනුවට විකල්ප ඉඩමක් ගන්නා බවයි. මේ විකල්ප ඉඩම තිබෙන්නේ කොහේද, කවදා එය අත්පත් කර ගන්නවාද, කවදා එහි අර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගංවතුරෙන් පීඩා වන මිනිසුන් පදිංචි කර වනවාදැයි දන්නේ නැහැ. ගන්නට පුළුවන් ඉඩමක් තිබෙද්දී, එක් වරක් ගෙන නැවත ආපසු දෙන ලද ඉඩමක් තිබෙද්දී ඒ ගැන නොසලකා වෙනත් ඉඩම් සෙවීමේ තේරුම කුමක්දැයි මා දන්නේ නැහැ. මා නියෝජනය කරන කොට්ඨාශයේ මහජනයාට තිබෙන ලොකුම ප්‍රශ්නය ඉඩම් නොමැතිකමයි. අවුරුදු හතළිහක් පණහක් තිස්සේ අනුන්ගේ ඉඩම්වල පදිංචි වූවන්ට නිරායාසයෙන්ම එම ඉඩම් අයිති වන බවට විශ්වාසයක් ඇතත් පරම්පරා දෙක තුනක් තිස්සේ ඒ විධියේ ඉඩම්වල පදිංචි වී සිටින්නන් දැන් ඒවායින් දොට්ට දමාගෙන යනවා. දැන් ඒ මිනිසුන්ට ලොකු අමාරුවකට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. ඉඩම් නැති අයට ඉඩම් ලබා දීම ඉඩම් අමාත්‍යාංශයෙන් සිදු විය යුත්තක්. මාතර ප්‍රදේශයේ පවරා ගතයුතු ඉඩම් ගණනාවක් මා යෝජනා කර තිබෙනවා. කනත්තෙගොඩ අප්පුගෙහේන, හිරිදෙනි කන්ද මාළිගාතැන්න, වෙලේගොඩ නාරෝදෙ කුරුඳුවත්ත, ගොඩගම රාවත්ත යන මේ ඉඩම් පවරාගෙන මිනිසුන්ට බෙදා දිය යුතුය කියා මා යෝජනා කර තිබෙනවා. මේ කටයුතු පිළිබඳව ඉඩම් අමාත්‍යාංශයේ සෑහෙන ප්‍රමාදයක් තිබෙන බව මා කණගාටුවෙන් කියනවා.

ඉඩම් ඇමතිතුමාට ඕනෑකමක් තිබුණත් නැතත් ඉඩම් අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ නිසා සෑහෙන ප්‍රමාදයක් තිබෙනවා. රාවත්ත කියන ඉඩම පවරා ගැනීම පිළිබඳව දැනගන්නට මා ඊයෙ පෙරේදා සහකාර ලේකම් හමුවන්නට ගියා. රාවත්ත කියන ඉඩම අත්කර ගැනීම සම්බන්ධව අණපනත්වල 4 වන ඡේදය අනුව වුවමනා කරන සියලුම ලියකියවිලි සකස් කර තිබෙනවාය, 5 වන ඡේදය අනුව ඉඩම් ඇමතිතුමාගේ අත්සන ගන්නට කුමක් කර තිබෙනවාද කියා මා ඒ සහකාර ලේකම්ගෙන් විමසුවා. දැන් ඒ ගැන කියන්නට බැරිය, පසුව එන්නය කියා ඒ මහත්මයා මට පිළිතුරු දුන්නා. ඇයි දැන්මම කියන්නට බැරිද කියා නැවතත් ප්‍රශ්න කළා. ඒ අවස්ථාවේදී ටිකක් කල්පනා කර, බොහොම නොසැලකිලිමත් අන්දමට, දවස් දෙකකින් ආවොත් උත්තරයක් දෙන්නම්ය කිව්වා. මා මන්ත්‍රීවරයකු බව එතුමා දැනගත්තාද කියා මා දන්නේ නැහැ. මන්ත්‍රීවරයකුට හෝ වේවා සාමාන්‍ය කෙනෙකුට හෝ වේවා සියලු දෙනාටම එක සමාන අන්දමින් සෑහෙන සැලකිල්ලක් දක්වා කථා කරන්නට මේ නිලධාරීන් ඉගෙන ගන්නට ඕනෑ. මා මාතර කොට්ඨාශයේ මන්ත්‍රීය කියා සෑහෙන පිළිතුරක් ලබා ගන්නට මට පුළුවන්කම තිබුණා; නමුත් මා එහෙම කළේ නැහැ. මෙන්න ඉඩම් අමාත්‍යාංශය වැඩ කරන හැටි. උත්තරයක් දෙන්න දවස් දෙකකින් එන්නය කියා සහකාර ලේකම්තුමා මට කිව්වා. කිසිම දෙයක් නොකර, කිසිම ලිපි ගොනුවක් නොබලා, වාඩි වී සිටගෙනම තව දවස් දෙකකින් එන්නය කිව්වා. එහෙම නම් හෙට එන්නම්ය කියා මා කිව්වා.

ඊට පසු දිනත් මා ගියා. ඒ අවස්ථාවේදී ලිපිකරුවකුද කවුද කැඳවා ඒක ඉඩම් අමාත්‍යාංශයට යවා තිබෙනවාය, අමාත්‍යාංශයෙන් තවම මේ ගැන මොකුත් කර නැත, කිව්වා. මේ විධියටයි අද ඉඩම් අමාත්‍යාංශය වැඩ කරගෙන යන්නෙ. මේ ආවේ කවුද, ඔහු කොහි සිට ආවාද, මේ කාරණය ගැන ඔහුට තිබෙන වුවමනාව මොකක්ද, ආදිය ගැන කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ. මට නොසැලකුවාට නම් කමක් නැහැ. මන්ත්‍රීය කිව්වා නම් මට සැලකුම් ගන්නට තිබුණා. මා වුවමනාවෙන්ම මන්ත්‍රීය කිව්වේ නැහැ. මේ අන්දමට අපේ නිලධාරීන් වැඩ කරන්නෙ. අපටත් මේ විධියට සලකනවා නම් ගම්බද දුප්පත් ගොවීනට කෙසේ සලකනවා ඇත්ද?

දුප්පත් ගොවියකු තමුන්නාන්සේ ළඟට ආවාය කියමු. තමුන්නාන්සෙ කොහේ ඉඳලද ආවෙ, තමුන්නාන්සේට මොකක්ද තිබෙන වුවමනාව, මොකක්ද මේ ඉඩම, හොඳයි මා ඒ ගැන බලන්නම්ය, ආදී වශයෙන් තමුන්නාන්සේ වුණත් ඒ ගොවියාට මොකක් හරි කියනවා නොවේද?

නමුත් ඉඩම් අමාත්‍යාංශයේ නිලධාරීන් පරණ ක්‍රමයට ඇට්ටර විධියටයි වැඩ කරන්නෙ. මා කණගාටුවෙන් මේක කියන්නෙ. ඕනෑම කාර්යාලයකට ගිහින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]
ඕනෑම කාරණයක් ගැන දැනගන්නට මේ රටේ සෑම පුරවැසියකුටම අයිතියක් තිබෙනවා. මේ නිලධාරීන්ට වැටුප් ගෙවන්නේ මහජන මුදල්වලිනුයි. එම නිසා මහජනතාවට මේ නිලධාරීන්ට යුතුකමක් තිබෙනවා. මේ කරුණු ගැන නිලධාරීන්ට වඩා මහජනතාවට අයිතියක් තිබෙනවා. නමුත් මේ විධියටයි ඉඩම් අමාත්‍යාංශයේ නිලධාරීන් වැඩ කරන්නෙ. සහකාර ලේකම්වරයකු ක්‍රියා කළ අයුරුයි මා දැන් කිව්වෙ.

ගොඩගම රාවත්ත කියන ඉඩම පවරා ගැනීම දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවත් අනුමත කර තිබෙන අතර ඒ පිළිබඳව මූලික ලියකියවිලි සියල්ලක්ම පිළියෙළ කර තිබෙන බව මා මතක් කරනවා. ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රම යටතේ මේ ඉඩම ගන්නට යනවාය, මේ ඉඩම අරන් බෙදා දෙනවාය කියා දැන් ඒ පළාතේ තමුන් නාන්සේලාට සම්බන්ධකම් තිබෙන නොයෙක් සංවිධාන මුදල් එකතු කරමින් දූෂණ ව්‍යාපාරයක් ගෙන යනවා. නිලධාරීන් මේ විධියට ක්‍රියා කරනවා නම් මේ දූෂණ නවත්වන්නේ කොහොමද? නිලධාරීන්ගේ මුවාවෙන් යටිකූට්ටු ව්‍යාපාර ගෙන යන්නන් සිටින නිසා වෙන්නට ඇති මෙහෙම වැඩ කෙරෙන්නේ. කිසිම දෙයක් කියන්නේ නැතිව උගුඩුවා වගේ, එහෙම නැත්නම් මෝල් ගහ ගිළපු මිනිහා වගේ මා දිහා බලාගෙනයි හිටියේ. ඇයි එහෙම කරන්නේ එවැනි දෙයක් නැත්නම්? ඔන්න ඔය විධියටයි ඇතැම් නිලධාරීන් ක්‍රියා කරන්නේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගැන කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) කථා කළ නිසා ඒ ගැන වැඩිය කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් කැරණක් දෙකක් ගැන පමණක් සඳහන් කරන්නට කැමතියි. මෙපමණ කාලයක් මාතර ප්‍රදේශයට අවශ්‍ය වී තිබුණු වාරිමාර්ග කාර්යාලය ළඟදී ලැබෙන්නට යනවා. ඒ ගැන සන්තෝෂය පළ කරන්නට ඕනෑ. මාතර දිස්ත්‍රික්කයේ කුඹුරු අක්කර 49,000ක් තිබෙන අතර ගාලු දිස්ත්‍රික්කයේ තිබෙන්නේ කුඹුරු අක්කර 35,000ක් පමණයි. අක්කර 35,000ක් පමණක් තිබෙන ගාලු දිස්ත්‍රික්කයටයි වාරිමාර්ග කාර්යාලයක් මෙතෙක් කල් තිබෙන්නේ. කුඹුරු අක්කර 49,000ක් තිබෙන මාතර දිස්ත්‍රික්කයට එවැනි කාර්යාලයක් දෙන්නට, වාරිමාර්ග පහසුකම් ලබා දෙන්නට, මීට පෙර මේ අමාත්‍යාංශයට පුළුවන්කමක් තිබුණේ නැහැ. නිෂ්පාදනය අතින් බැලුවත් ගාලු දිස්ත්‍රික්කයට වැඩි ප්‍රමාණයක් මාතර දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය වෙනවා. අවසාන මොහොතේදීවත් මාතර දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවක් සපුරා ලීමට මහන්සි ගැනීම ගැන ස්තුතිවන්ත වෙනවා. මාතර පළාත ගැන මේ තරම් නොසැලකිල්ලෙන් ක්‍රියා කරන්නේ මන්දැයි අහන්නට අපට සිද්ධ වෙලා තිබෙනවා.

දිස්ත්‍රික් වන කාර්යාලය ගැනත් වචනයක් කියන්නට ඕනෑ. වන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලය—Divisional Forest Office—ඇත්ත වශයෙන්ම තිබෙන්නට ඕනෑ ගාල්ලේ නොව මාතර බවයි මා කියා සිටින්නේ. වන අඩවි ප්‍රදේශ ගැන සලකා බැලුවොත් වන දෙපාර්තමේන්තුවේ වන අඩවි විශාල සංඛ්‍යාවක් තිබෙන්නේ ගාලු දිස්ත්‍රික්කයේ නොව මාතර දිස්ත්‍රික්කයේ බව කියන්නට පුළුවනි. ඒ නිසා ගාල්ලේ තිබෙන ප්‍රාදේශීය වන කාර්යාලය ඇත්ත වශයෙන්ම මාතරටයි ගෙන යන්නට ඕනෑ. එසේ කිරීම කාරණා කීපයකින්ම ප්‍රයෝජනවත් වෙනවා. වන අඩවි සංඛ්‍යාව වැඩි නිසා නිලධාරීන්ට වැඩි වශයෙන් මාතර ප්‍රදේශයේ ගමන් කරන්නට සිදු වෙනවා. මාතරට ප්‍රාදේශීය කාර්යාලය ගෙන ගියොත් මාතර ප්‍රදේශයේ ගමන් බිමන් ආදිය වැඩි වියදමක් නැතිව කරන්නට පුළුවන් වෙනවා. ඒ වාගේම කාර්යක්ෂම ලෙසත් වැඩ කරගෙන යාමට එය ප්‍රයෝජනවත් වෙනවා. ගමන් ගාස්තුව වශයෙන් දිනට වැය කරනු ලබන විශාල මුදල් ප්‍රමාණයෙන් සැහෙන කොටසක් ඉතිරි කර ගන්නටත් පුළුවන් වෙනවා. ඒ නිසා වන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලය මාතර නගරයේ තබන්නට පුළුවන් නම් එය මා කියන්නේ ගාල්ලේ තිබෙනවාට වඩා ප්‍රයෝජනවත් බවයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.** (මීගමුව)
*(திரு. என். டென்சில் பெர்னாண்டோ—நீர் கொழும்பு)*
(Mr. N. Denzil Fernando—Negombo)

බලපිටියේ ගරු මන්ත්‍රීතුමා ඊට ඉඩ දෙන එකක් නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බලපිටියේ ගරු මන්ත්‍රීතුමා ඒ තරම් අසාධාරණ විධියට ක්‍රියා කරන්නේ නැති බව මා හොඳාකාර දන්නවා.

ගෙවල් හදාගන්න බලාපොරොත්තු වන ජනයාට පෞද්ගලික ජාවාරම්කාර පුද්ගලයන්ගෙන් දාව ලබා ගැනීමට සිදු වන නිසා නොයෙක් අපහසුකම් ඇති වන බව සලකා ඊට ප්‍රතිකර්මයක් වශයෙන් ආණ්ඩුව මගින් දව ගබඩා ඇති කරන ලෙස ඉදිරිපත් කළ යෝජනාව ක්‍රියාත්මක කරන බවට ගරු ඇමතිතුමා පාර්ලිමේන්තුවේ දී පොදු පොරොන්දුවක් දී තිබෙන නමුත් තවමත් එය ක්‍රියාත්මක වී නැති බව කනගාටුවෙන් සඳහන් කරනවා. කවුදෝ කී පරිදි ඉඩම් අමාත්‍යාංශය තවමත් ගොලු බෙලි ගමනකයි යෙදී සිටින්නේ. මේ අංශයටත් ඒ චෝදනාවමයි ඉදිරිපත් කරන්නට මට සිදු වී තිබෙන්නේ. මා එය කියන්නේ කනගාටුවෙන්. මහජනයාට ජාවාරම්කාරයින්ගෙන් බේරී තමන්ගේ වැඩ කටයුතු කරගෙන යාමට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබෙන යෝජනාවට ප්‍රමුඛත්වය දී ඉක්මනින් ක්‍රියා කරන මෙන් ඉල්ලා සිටිනවා. දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා නියම අන්දමට සහයෝගය ලැබෙන්නේ නැහැ. ඒ නිසයි මේ අන්දමට කටයුතු කෙරෙන්නේ. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා ලක්සලක් විවෘත කළා. මේ කටයුත්ත කරන්න මේ අයට බැරි ඇයි? මා හිතන විධියට මේවාට හරස් කපන්නේ ජාවාරම්කාරයින්ට සම්බන්ධකම් ඇති අයයි. කැලෑ නිලධාරීන් ජාවාරම්කාරයින් සමග හවුල් වී කටයුතු කරනවා. ජාවාරම්කාරයින්ගේ දැව ගබඩාවල වැඩි වශයෙන්ම තිබෙන්නේ රජයේ කැලෑවල ලීයි. ඒවා ඒ අන්දමට කරගෙන යන්නේ කැලෑ නිලධාරීන්ගේ සම්බන්ධකම් ඇතිවයි. රජයෙන් දැව ගබඩා පිහිටෙව්වොත් ඒ අයගේ ජාවාරම්වලට පහර වදින නිසා ඒ අය මේවා පිහිටුවීම ප්‍රමාද කිරීමට කටයුතු කරනවා යයි මා කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනපද සම්බන්ධව හිරියාල ගරු මන්ත්‍රීතුමා (එස්. බී. හේරත් මයා.) කරුණු ඉදිරිපත් කළා. කොළනි ක්‍රමය යටතේ ඉඩම් බෙදා දෙනවා වගේම ඒවා සංවර්ධනය කිරීමටත් වැඩ පිළිවෙළවල් සකස් කළ යුතුයි. පසුගිය රජය මගින් කැකනදුරේ ඊව්ඊව් වත්තෙන් අක්කර සිය ගණනක් බෙදා දී තිබෙනවා. දැනට එහි පවුල් 400 ක් පමණ පදිංචි වී සිටිනවා. එහි තිබෙන පාරවල මිනිසුන්ට ගමන් කරන්නට බැහැ. එවැනි ජනපද ඇති කළ විට සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය ආදි අනිකුත් අමාත්‍යාංශත් සම්බන්ධ කරගෙන සංවර්ධන වැඩ පිළිවෙළවල් ඇති කරන්නට ඕනෑ. ඉඩම් කැබැලි කර මිනිසුන්ට බෙදා දී ඔවුන්ගේ සෞඛ්‍යය, අධ්‍යාපනය, සදාචාරය, සංස්කෘතිය දියුණු කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරන්නේ නැත්නම් මිනිසුන් පදිංචි කිරීමෙන් පමණක් වැඩක් වන්නේ නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ස්ථිර බෙහෙත් ශාලාවක් බැරිනම් සංචාරක බෙහෙත් ශාලාවත් ඒවායේ ඇති කරන්නට ඕනෑ. එමෙන්ම සමුපකාර සමිතියක් ඇති කරන්නට ඕනෑ. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ආධාර ඇතිව පාරවල් සකස් කරන්නට ඕනෑ. ශ්‍රමදාන ව්‍යාපාරවලට මහජනතාව පොළඹවා ගන්නට ඕනෑ. ඒ අන්දමේ ක්‍රමවත් වැඩ පිළිවෙළවල් ඇති කළ යුතුයි. දැනට එවැනි ජනපදවල මිනිසුන් පදිංචි කරන්නේ ලෙඩක් හැදුණු අය එක්තරා ගමකට ගෙනගොස් දමන්නා වගෙයි. මිනිසුන් ජනපදයට ගෙනගොස් දමනවා; ඊට පසුව ඔවුන් ගැන බලන්නෙත් නැහැ; ඒ පළාතටවත් යන්නෙත් නැහැ. එසේ කිරීමෙන් ඔවුන්ට සෙතක් සැලසෙන්නේ නැහැ.

අ. භා. 7.45

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

එවැනි ජනපදවලට සෞඛ්‍ය, අධ්‍යාපන, සමුපකාර ආදී අමාත්‍යාංශවලින් ඉල්ලන ගොඩනැගිලි ඉඩම් අමාත්‍යාංශය මගින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

හදා දෙනවා. එය කරන්නේ සම්බන්ධතා මණ්ඩල මාර්ගයෙන්. ඒ ඒ අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කරන ප්ලෑන්වලට අනුව ඔවුන්ට අවශ්‍ය ගොඩනැගිලි ඉඩම් අමාත්‍යාංශය මගින් හදා දෙනවා. එහෙත් ඒවා පාලනය කරන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බොහොම ස්තුතියි. මා කියන්නේ පාලනය කිරීමක් ගැන නොවෙයි. අප ඉඩම් බෙදා දී මිනිසුන් පදිංචි කරනවා වගේම අනික් වැඩත් බලාගන්ට ඕනෑ. අනිකුත් අමාත්‍යාංශත් හවුල් කරගෙන ඒ ඒ අඩු පාඩු සම්පූර්ණ කරන්නට ඕනෑ. ඒකයි මා කියන්නේ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

අවශ්‍ය ගොඩනැගිලි අපි හදා දෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

තවමත් ඒ වැඩ පිළිවෙළ හරියාකාර සකස් වී නැහැ. කැකනදුරේ ව්‍යාපාරය ගැන බලන්න.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ ගැන මම කියන්නම්. සම්බන්ධතා මණ්ඩලය මාර්ගයෙන් ඒ ඒ පහසුකම් සලසන ලෙස ඉල්ලා සිටි විට ඔවුන් ඉල්ලන ගොඩනැගිලි අපි හදා දෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මේ සම්බන්ධතා කාරක සභා තීරණ ගැන මගේ කිසිම විශ්වාසයක් නැහැ. සමහර අමාත්‍යාංශ සම්බන්ධතා කාරක සභාවල තීරණවලට සලකන්නේ නැහැ. මගේ කොට්ඨාශයේ පාරකට සම්බන්ධතා කාරක සභාවේ උග්‍ර ප්‍රමුඛත්වය දී තිබෙනවා. එහෙත් තවමත් ඒ කටයුත්ත කෙරී නැහැ. පාරේ යන විට දණ්නාලියක් එරෙනවා. සම්බන්ධතා කාරක සභාව මගින් වාර ගණනාවක්ම මේ කරුණ ඉදිරිපත් කළා. එහෙත් කෙරෙන්නේ නැහැ. එවැනි තත්ත්වයක් ඇති නිසා ඒ සම්බන්ධතා මණ්ඩල ගැන තිබුණු මගේ විශ්වාසය නැති වී තිබෙනවා. මේ සම්බන්ධතා මණ්ඩල පිහිටුවන අවස්ථාවේ මා ඒවාට සම්බන්ධ වුණේ ලොකු විශ්වාසයකින්. එහෙත් ඒ විශ්වාසය සුන් වී තිබෙනවා.

තවත් කරුණක් කියන්නට ඕනෑ. මේ කැකනදුරේ පිට්පිට් වත්තේ ඇති ජනපද ගෙවල්වලට මුදල් දුන්නාය කියන ආවේශයෙන් මෙහි විශාල හොරකමක් නැත්නම් වංචාවක් සිදු වී තිබෙනවාය කියා මා කියනවා. ඒ නිසා මේ ජනපදයේ ගෙවල් සෑදීම පිණිස කොපමණ මුදලක් වෙන් කර තිබෙනවාද කියා මා අහනවා. ගෙවල් හදා ගැනීමට කී දෙනකුට මුදල් දී තිබෙනවාද, වැසිකිළි තනා ගැනීමට කී දෙනකුට මුදල් දී තිබෙනවාද, ළිං කපා ගැනීමට කීදෙනකුට මුදල් දී තිබෙනවාද යනු පිළිබඳව වාර්තාවක් ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඉදිරිපත් කරන්නම්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මට දැනගන්නට තිබෙන හැටියට නම්, මේ ජනපදවල වැඩ කළ නිලධාරීන් 'මහජන මුදල්, ආණ්ඩුවේ මුදල්, වංචා කර තිබෙනවා. ඒ ගැන සොයා බලන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට මා කථා කරන්නේ උඩ වලවේ සම්බන්ධවයි. කඹුරුපිටියෙ ගරු මන්ත්‍රීතුමාත් (පද්සි වික්‍රමසිංහ මයා) මේ ගැන කරුණු කිව්වා. දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවේදී දිසාපතිතුමා කළ ප්‍රකාශය මෙසේයි: "උඩ වලවේ ඉඩම් ලබා ගන්නට නම් මෙන්න මේ කරුණු සම්පූර්ණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විය යුතුයි. (1) වයස අවුරුදු 22 ත් 30 ත් අතර විය යුතුයි. (2) ගොවිතැන සම්බන්ධව දැනීමක් ඇති අය විය යුතුයි. (3) විශෙෂයෙන් ගොවිතැන සම්බන්ධව ඉගෙනීමක් ඇති අය විය යුතුයි. (4) අනාගතයේදී මණ්ඩලයේ වැඩ කටයුතු සම්බන්ධ ලිපි කියවීමට හා ලිවීමට හැකි අය විය යුතුයි. (5) විවාහක අය සම්බන්ධයෙන්—කෘෂිකර්මය හා ගෘහ කර්මාන්තය ගැන දැනීමක් ඇති භාර්යාවන් සිටිය යුතුයි. (6) ඉඩම් නොමැති අය විය යුතුයි." මට නම් මෙය තේරෙන්නේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මටත් තේරෙන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

විශෙෂයෙන්ම, ඉඩමක් ඉල්ලන කෙනකු විවාහකයකු නම් ඔහුගේ භාර්යාවත් කෘෂිකර්මය හා ගෘහ කර්මාන්තය දැන සිටිය යුතුයයි කීමේ අදහස කුමක්දැයි මට නම් තේරුම් ගන්නට බැහැ. කෙනකුට ඉඩමක් දෙන්නට ඔහුගේ භාර්යාවගේ සුදුසුකම් මොනවාටද?

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணண்டோ)*
(Mr. Denzil Fernando)

වැඩි සහයෝගය ලබා ගන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

සහයෝගයක් ගැන නොවෙයි මෙතැන කියා තිබෙන්නේ. ගොවියා මෙන්ම ගොවියාගේ භාර්යාවත් කෘෂිකර්මාන්තයත් ගෘහ කර්මාන්තයත් දැන සිටිය යුතුයි, මෙහි සඳහන් වන හැටියට. මේ නිසා කඹුරුපිටියෙ ගරු මන්ත්‍රීතුමා කෙළේ සාධාරණ ඉල්ලීමක්. මෙය දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. හක්මන ගරු මන්ත්‍රීතුමාත් (එස්. හෙට්ටිගේ මයා.) අප සමග එකඟ වෙනවා. ඒ අනුව, මාතර, හක්මන, කඹුරුපිටිය යන කොට්ඨාශ තුනම සම්බන්ධයෙන් එකම අදහසයි දරන්නේ. අප ඉල්ලා සිටින්නේ මේ තෝරාගැනීම් අවලංගු කොට නැවත ඉල්ලුම් පත්‍ර කැඳවා තෝරාගැනීමක් කරන ලෙසයි.

ඊළඟට මා කථා කරන්නට අදහස් කරන්නේ ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය ගැනයි. මේ සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් කීපදෙනකුම කළ කථා මා අසාගෙන සිටියා. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය පැත්තට කාන්තාවන් යවන්නට එපායයි රත්ගම ගරු මන්ත්‍රීතුමා (ඩී. ඊ. තිලකරත්න මයා.) කිව්වා. ඒ තරමටම එහි තත්ත්වය භයානකයි. මෙම මණ්ඩලයට පස්ස දොරෙන් සේවක සේවිකාවන් බඳවා ගන්න බව තවත් ගරු මන්ත්‍රීවරුන් කිව්වා. මේ හැම දේකටම වඩා භයානක තත්ත්වයක් ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයෙහි තිබෙනවා. එනම්, මේ මණ්ඩලය ගරු ඇමතිතුමාටවත් අගමැතිතුමාටවත් රජයටවත් වග නොකියන ස්වාධීන ආයතනයක් වශයෙන් කටයුතු කිරීමයි. මගේ විශ්වාසයේ හැටියට නම් ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය ක්‍රියා කරන්නේ ඒ විධියටයි.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணண்டோ)*
(Mr. Denzil Fernando)

නෑ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

නෑ? තමුන්නාන්සේ දන්නේ කොහොමද? තමුන්නාන්සේ දන්න උලව්වක් තිබෙනවායැ? මේක හරි හැටි දන්නේ අපයි. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට අයත් ජීප් රථ රාත්‍රී කාලයේදී තිබෙන්නේ කොහේදැයි ගිහින් බලන්න. ඒවා තිබෙන්නේ සිනමා ශාලා ළඟ. නිලධාරියාගේ කාරෙකට පැට්‍රෝල් ගැලුමක් ගේන්න මණ්ඩලයේ ජීප්රථ එලවාගෙන පැට්රෝල් ගබඩාවලට එනවා.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணண்டோ)*
(Mr. Denzil Fernando)

ඒක නම් බොරුවක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බොරු නම් ගිහින් බලන්න. තමුන්නාන්සේලා ඔය විධියට ක්‍රියා කරන නිසා තමයි ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය අද හොර ගුහාවක් බවට පරිවර්තනය වී තිබෙන්නේ.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

ඒ, ඒ දවස්වල.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
Mr. Tudawe)

ඔක තමයි තමුන්නාන්සේලාට හැදිලා තිබෙන වසංගතය. හරියාකාර ප්‍රශ්න දෙස බලා ඒවායෙහි තිබෙන වැරදි හරි ගස්සන්නට කටයුතු කරන්නේ නැහැ. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ සිටින නිලධාරීන් කිසිවකු මා අඳුනන්නේ නැහැ. ඒ කිසිවකු සමග මා කවදාවත් කතාබස් කරලාවත් නැහැ.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

උඩවලවේට ආවා නම් එහි කොච්චර ලස්සණට වැඩ කෙරෙනවාද යන බව තමුන්නාන්සේට බලා ගන්නට තිබුණා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

උඩවලවේ වැඩ කරනවා තමයි. තමුන්නාන්සේලා ගිහින් බලාගෙන ආවාට තමුන්නාන්සේලාගේ ඔලුව හොඳට තබාගෙන නොවෙයි බලා තිබෙන්නේ. බ්‍රැන්ඩි බීලා නොවේද බැලුවේ ?

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

අපි ඒවා කරන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

එක දෙක වෙලායි පේන්නෙ.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

අපි නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා ඒක දන්නේ නැහැ. ඉස්සෙල්ලාම මන්ත්‍රීවරුන්ගේ ඔලුව නරක් කර ඊට පසුවයි පෙන්වා තිබෙන්නේ.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

Sir, I rise to a point of Order. The hon. Member said that we had taken liquor when we went there. He must withdraw that statement.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
Mr. Tudawe)

ඔය ඕඩර් ඕනෑ නැහැ. මා කියන්නේ බෝතල්වල දමා බෙදා දුන් බවයි.

**කාරක සභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

Order, please. I do not——

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

You can take any amount of liquor.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

None of us took any liquor ; I do not know whether any of the Members of the Opposition took liquor.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

නියෝජ්‍ය සභාපතිතුමනි, බ්‍රැන්ඩි බිව්වත් වෙන මොනවා බිව්වත් මගේ ඒ ගැන කිසිම විරුද්ධත්වයක් නැහැ. මා කියන්නේ බීම ගැන නොවෙයි. බීම ගැන මා චෝදනා කරන්නේ නැහැ. මා කිව්වේ, බොහෝම හොඳට වැඩ කෙරෙනවාය කියා මිගමුව ගරු මන්ත්‍රීතුමා කී බවයි. හොඳට වැඩ කෙරෙනවා නම් බොහෝම හොඳයි. අප ඒ ගැන සතුටුයි. මම එහෙ ගියේ නැහැ.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

ඇයි ආවේ නැත්තේ ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்காரத்ன)*
(Mr. Ilangaratne)

බ්‍රැන්ඩි බොන්න බැරි නිසා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ආවේ නැත්තේ ඇයි කියා ඇසීම පුදුම ප්‍රශ්නයක්. බලන්න එන්න අප අදහස් කරනවා. හැබැයි බලන්න ආවාට පස්සෙ මෙයිට වඩා දේවල් කියන්න අපට සිද්ධ වේවි.

ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ නිලධාරි මණ්ඩලයට අයිති උපකරණ, මෝටර් රථ ජීප් රථ ආදී වාහන තම තමන්ට ඕනෑ විධියට පාවිච්චි කරන බව පෙනී යනවා. තමන්ගේ පෞද්ගලික වැඩ වලට ඒවා යොදවනවා. මහජන මුදල් බොහෝසෙයින් නාස්ති වන විධියට වැඩ කරනවා. රත්ගම ගරු මන්ත්‍රීතුමාත් තවත් මන්ත්‍රීවරුන් කීප දෙනකුත් ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය ගඳ ගහන මණ්ඩලයක් හැටියට හැඳින්නුවා. ඒ අනුව මාත් ඉල්ලා සිටිනවා මෙම මණ්ඩලය සම්බන්ධයෙන් යම් කිසි කොමිෂන් සභාවක් පත් කර දූෂණ සම්බන්ධයෙන් කරුණු ප්‍රකාශ කිරීමට එහි සේවකයන්ටත් මහජනයාටත් අවස්ථාවක් සලසා දෙන්නය කියා. සේව කයන්ගේ සම්පූර්ණ සහයෝගය නැතිව, වැඩ කරන උදවියගේ සහයෝගය නැතිව කිසිම මණ්ඩලයක කටයුතු සාර්ථක ලෙස කර ගෙන යන්න පුළුවන්කමක් නැහැ. මණ්ඩලයක වැඩ කටයුතු පමණක් නොව, මොනම වැඩක් වුවද, ඒ වැඩෙහි යෙදී සිටින උදවියගේ සහයෝගය ලැබෙන්නේ නැත් නම් සාර්ථක ලෙස කර ගෙන යන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා සේවකයන්ට අවස්ථාවක් දිය යුතුයි. සමහර විට අප ඉදිරිපත් කරන මේ කරුණු වැරදි වෙන්න පුළුවන්. එහෙත් කොමිෂන් සභාවක් පත් කිරීමෙන් මේවා ගැන සොයා බලන්න පුළුවන්. තමුන්නාන්සේලාගේ යුතුකමක් තිබෙනවා මේවා ගැන සොයා බලන්න. අප මේ පෞද්ගලික තරහකින් කරන ඉල්ලීමක් නොවෙයි. රටට තිබෙන ආදරය නිසා, මේ ව්‍යාපාරය ඉදිරියට ගෙන යාම සඳහා අපට තිබෙන ඕනෑකම සහ ආශාව නිසයි අප මෙසේ කරුණු ඉදිරිපත් කරන්නේ.

ඊ ළඟට උස් බිම් ජනපද යෝජනා ක්‍රම පිළිබඳව වචන කීපයක් ප්‍රකාශ කරන්න තිබෙනවා. විශෙෂයෙන්ම කලුබෝවිටියන සහ දැරන්ගල ප්‍රදේශවල ගොවීන් සමග අප සාකච්ඡා පවත්වා තිබෙනවා. ඒවායේ වැඩ කරන ගොවීන් තුළ විශාල අප්‍රසාදයක් ඇති වී තිබෙනවා. ඊට හේතුව මොකක්ද? මේ ජනපදවල ඉඩම් මෙ පමණ කල් බෙදා දුන්නේ දිසාපතිතුමා යටතේ ඇති සමුපකාර ක්‍රමයක් මාර්ග යෙනුයි. ඒ ක්‍රමය අනුව බොහෝම ලක්ෂණට වැඩ කටයුතු කෙරීගෙන ආවා. දෙනියාය මොරවක් කෝරළේ ආදී ප්‍රදේශවලට ගිය මට එය දකින්න ලැබුණා. දැන් මේ යෝජනා ක්‍රමය රාජ්‍ය වැවිලි සංස්ථාවට භාර දෙන්නට යන බව සැල වී තිබෙනවා. රාජ්‍ය වැවිලි සංස්ථාව වැවිලි සම්පූර්ණයෙන් බංකොලොත් කර තිබෙන නිසා අපට ඒ ගැන කිසිම විශ්වාසයක් තබන්න බැහැ. එම යෝජනා ක්‍රමයේ වැඩ කරන ගොවියන් මාතර කඹුරුපිටිය ආදී නොයෙක් නොයෙක් ප්‍රදේශවලින් ගිහින් තිබෙන අයයි. එහි නැවතී මහත් දුක් විඳිමින් ඔවුන් ඒ වැඩ කටයුතු කරගෙන යනවා. ඒ උදවිය තුළ ලොකු ආශාවක් තිබෙනවා, ඒ වගාවන් හිසාම අත්දමින් සාර්ථකව කිරීමෙන් රට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

ට සේවයක් කරන්න. එවැනි තත්ත්ව යක් තිබියදී මෙය රාජ්‍ය වැව්ලි සංස්ථා වට භාර දුන්නොත්, මෙම ව්‍යාපාරයද අනිකුත් ව්‍යාපාර මෙන් සම්පූර්ණයෙන්ම නාස්ති වී යනවා ඇති. මේක විනාශ වී යනවා. තමුන්නාන්සේ රාජ්‍ය වැව්ලි සංස්ථාවට දිගටම මේ පාලනය ගෙන යාමට ඉඩ දෙනවා නම් එය මොරවක් කෝරළයේ උස් බිම් ජනපදවල තේ වගා කරන ජනතාවට කරන ඉතාම ලොකු ද්‍රෝහිකමක්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ ජනපද රාජ්‍ය වැව්ලි සංස්ථාවට භාර දී නැහැ. තේ ෆැක්ටරියේ තේ හැදීම පමණයි, රාජ්‍ය වැව්ලි සංස්ථාවට භාර දී තිබෙන්නේ. ඒ ජනපද වාසීන් ගේ තේ දළු අරගෙන ෆැක්ටරියේ තේ හදනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒ ෆැක්ටරියේ වැඩ කරන නිලධාරීන් ගේ දුර්වලකම නිසා තමයි, ඒ අයට ලැබෙන ආදායම අඩු වී තිබෙන්නේ. ඒ නිසයි, ඔවුන් තුළ කලකිරීමක් ඇති වී තිබෙන්නේ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

හැම සුමානෙම වෙන්දේසියේ තේ මිල ගණන් මා බලනවා. අද පත්‍රයේ තිබෙන මිල ගණනත් මා දැක්කා. ඒ මිල හොඳයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

කීයද මිල ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මන්ත්‍රීතුමා බලන්න අද පත්‍රයේ තිබෙන මිළ.

අ. භා. 8

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මේ රාජ්‍ය වැව්ලි සංස්ථාව අතගැසූ සෑම දෙයක්ම විනාශ වී ගියා. ඒ නිසා මේ කට යුත්ත රාජ්‍ය වැව්ලි සංස්ථාවෙන් ඉවත් කර සම්පූර්ණයෙන් ඒ ගොවීන්ටම භාර දෙන්න ඕනෑ. ඒ සඳහා ගොවීන්ට ආධාර දෙන්නය කියා දිසාපතිතුමාට කියන්න. රාජ්‍ය වැව්ලි සංසථාවේ නිලධාරීන් තමයි, මෙය සම්පූර්ණයෙන්ම විනාශ කර දමන්නේ. නිලධාරීන්ට පාලනය කරන්නට දී මෙය කරන්නට බැහැ. දිසාපතිතුමාගේ පාලනය යටතේ ඒ ෆැක්ටරියේ වැඩ කිරීම ගොවීන්ට භාර දෙන්න. සිදු වන්නේ කුමක්ද කියා ඔවුන්ට මේ වැඩය භාර දී බලන්න. එසේ කළොත් ඒ උස් බිම් ජන පදවල තේ වගාවෙන් මීට වඩා සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් බව මා අවං කව ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ජල ගැල්ම වැළැක්වීමට සෑහෙන අන්දමේ වැඩ පිළිවෙළක් නැති නිසා මාතර දිස්ත්‍රික් කයේ ගොවීන් ණය සහන හරියාකාර පාවිච්චි කිරීමට භයෙන් සිටිනවා. මාතර දිස්ත්‍රික්කයේ ගොවීන් 35,000 ක් 40,000ක් පමණ සිටින නමුත්, ආණ්ඩුවෙන් දෙන ණය මුදල ගන්නට 5,000 කට වඩා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර නැහැ. ඔවුන් ණය ලබා ගන්නට බයයි. ඔවුන්ගේ ගොවිතැන් කොයිවෙලාවේ විනාශවේද කියන්නට බැහැ. ගොවිතැන් විනාශ වුණාම අස්වැන්න රක් ෂණ ක්‍රමයෙන් සෑහෙන ආධාර මුදලක් ලබා ගන්නට බැහැ. ඒ නිසා ගොවීන් ණය මුදල් ලබා ගන්නේ නැහැ. ඔවුන්ගේ ගොවිතැන ආරක්ෂා සහිතව කරගන්නට පුළු වන් තත්ත්වයක් තියෙනවාය කියා ඔවුන් ට විශ්වාසයක් නැහැ. ඇත්ත වශයෙන්ම මේ තත්ත්වයන් යටතේ, වාරිමාර්ග කාර්යා ලයකුත් නැතිව, ගොවි ණයත් සෑහෙන ප්‍රමාණයක් නොදී, මේ දිස්ත්‍රික්කයේ ගොවීන්ට සෑහෙන අස්වැන්නක් ලබා ගැනීමට පුළුවන් වී තිබෙන්නේ කෘෂිකර්ම නිලධාරීන් අවංක සේවයක් කරන නිසයි. අප සෑම අවස්ථාවකදීම නිලධාරීන් කෙරෙහි විරුද්ධත්වයක් දක්වන්නේ නැහැ. මාතර කෘෂිකර්ම නිලධාරීන් හොඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවංක සේවයක් කරන බව මේ සභාවේදී කියන්නට ඕනෑ. කෘෂිකර්ම ව්‍යාප්ති අංශයේ නිලධාරි මහත්වරුනුත් සම්පූර්ණ උත්සාහය දරා ඒ වැඩ කටයුතු සංවිධානය කර ගෙන යනවා.

ඒ නිලධාරීන්ට අතිකුත් ආධාර ලැබෙනවා නම්, වාරිමාර්ග කාර්යාලයක් ලැබෙනවා නම්, ගංවතුර වැළැක්වීමේ වැඩ පිළිවෙළක් ඇති කරනවා නම්, දැනට වඩා සාර්ථක ලෙස වැඩ කටයුතු කරන්නට පුළුවන්. සමහර විට දැන් විශාල වාරිමාර්ග ක්‍රමයක තබා සුළු ඇලකවත් වැඩ හරියාකාර කර ගැනීමට බැරි වෙනවා. සුළු වාරිමාර්ග ක්‍රම තමයි, ඒ අයට වැඩියෙන්ම පිහිට වන්නේ. ඒවා සකස් කර දීමට වැඩ පිළිවෙළක් තිබෙනවා නම් අස්වැන්න මීට වඩා විශාල ප්‍රමාණයකින් වැඩි කර ගන්නට පුළුවන් බව ප්‍රකාශ කරන්නට සතුටුයි. මේ අවස්ථාවේ මා මීට වඩා කථා කරන්ට බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ අවස්ථාව ලබා දීම ගැන නියෝජ්‍ය සභාපතිතුමාට ස්තුති කරන අතර ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ප්‍රශ්න සම්බන්ධයෙන් එතුමාගේ සැලකිල්ල යොමු කරන්න කියා.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

ගරු සභාපතිතුමනි, හැම වෙලේම මාතර මන්ත්‍රීතුමා (තුඩාවෙ මයා.) කථා කර අවසාන වූ විට මා කථා කරන්ට බලාපොරොත්තුවෙන් සිටිනවා යයි සාමාන්‍ය හැඟීමක් තිබුණා. මා පෞද්ගලික වශයෙන් ඒ මන්ත්‍රීතුමාට කියන්ට සතුටුයි, එවැනි කූට ප්‍රයෝගයක් මා තුළ තිබුණේ නැති බව. මේ අවස්ථාව මට ලැබෙන බව දැනුම් දුන්න නිසයි, මා කථා කරන්ට අදහස් කළේ.

මාතර ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන්ට යෙදුණු බොහෝ කරුණු සම්බන්ධයෙන් මා එතුමාට මගේ සතුට ප්‍රකාශ කරන්ට කැමතියි. එහෙත් එතුමා සඳහන් කළ එක කනගාටුදායක කරුණක් ගැන මතක් කරන්ට ඕනෑ. ඒ මන්ත්‍රීතුමා තමන්ගේ වුවමනාවක් ඉෂ්ට කර ගන්ට අමාත්‍යාංශයට ගිය අවස්ථාවකදී එක්තරා නිලධාරි මහත්මයකු එතුමාගේ වුවමනාව ඉෂ්ට කර නොදීම නිසා එතුමා තුළ හිත් වේදනාවක් ඇති වී තිබෙනව. ඒ නිලධාරියා කවුදැයි සොයාගෙන තමන්ගේ තත්ත්වයත් ඔහුට අවබෝධ කර දී තමන්ගේ වැඩය කරවා ගත්ත නම් මා පෞද්ගලික වශයෙන් ඒ මන්ත්‍රීතුමාට මීට වඩා ප්‍රශංසා කරනව. ඒ අංශයේ එක නිළධාරියකු වරදක් කළ නිසා අපි මේ ස්ථානයේ සිට ඒ අංශයේ සෑම නිලධාරියකුටම චෝදනා කරනව නම් ඒක වැරදි බව මාතර මන්ත්‍රීතුමාගේ හිත් වේදනාව තුනී වී ගිය අවස්ථාවකදී එතුමාට අවබෝධ වෙනුව ඇති.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මම හැම දෙනාටම චෝදනා කරන්නෙ නැහැ. ඒ වගේ නිලධාරීනුත් අමාත්‍යාංශයේ සිටින බවයි මම කිව්වෙ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

නැහැ. එහෙම කියනව නම් මම පිළිගන්නව. කථා කරද්දී කිව්වෙ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එහෙමයි කියායි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා හැම දෙනාම අදහස් කළේ නැහැ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

එහෙම අදහස් කළේ නැහැ කියා මේ අවස්ථාවෙදිවත් කීම ගැන මා තමුන්නාන්සේට ප්‍රශංසා කරනව. හේතුව මේකයි: සමහරවිට දෙපාර්තමේන්තුවේ එක නිලධාරියෙක් තමුන්නාන්සේට වරදක් කරන්ට පුළුවනි. ඒ නිසා හැම දෙනාටම චෝදනා කරනව නම් ඒක යුතුකමක් නොවෙයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා හැම දෙනාටම චෝදනා එල්ල කරන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අතපත්තු මයා.**

*(திரு. அத்தபத்து)*

(Mr. Atapattu)

මම ඒ ප්‍රකාශය පිළිගන්නව. තමුන්නාන්සේ එහෙම කියන නිසා ඒ නිලධාරීන්ටත් හිත් අමාරුවක් ඇති කර ගන්න වුවමනාවක් නැහැ. මම කියන්නෙ උදාහරණයක් හැටියටයි. සමහරවිට අපට යම් කෙනෙකුගෙන් යම් වරදක් සිදු වුණාම අපි සැම දෙනාටම එක විධියට චෝදනා කළාම දෙපාර්තමේන්තුවල සේවය කරන නිලධාරීන් තුළ ලොකු කලකිරීමක් ඇති වෙනව. ඒ මහත්වරුන්ටත් අපට බණින්ට අවස්ථාවක් නොලැබෙන නිසා "අපි කොච්චර කළත් අපට ලැබෙන්නෙ ඔය ටික තමයි" කියන විධියේ හැඟීමක් නිලධාරීන් තුළ ඇති වෙනව. එය කෙනෙකුගෙන් සිදු වූ දෙයක් හැටියට සඳහන් කර වරද හරිගැස්සීම ගැන මා මාතර මන්ත්‍රීතුමාට (තුඩාවේ මයා.) ස්තුති කරනව. මන්ත්‍රීතුමා ඒ සිද්ධිය ගැන සඳහන් කරද්දී කිව්ව, තමා කවුදැයි ඒ නිලධාරියාට හඳුන්වා දුන්නේ නැත කියා. ඒ අමාත්‍යාංශයට යන විට එතුමා ගියේ මාතර තුඩාවෙ මහත්මයා හැටියට නොවන බව ගරු මන්ත්‍රීතුමා කල්පනා කරන්ට ඕනෑ. තමුන්නාන්සේ එහි ගියේ මාතර ඡන්ද කොට්ඨාශයේ සියලු දෙනා වෙනුවෙන් වග කිවයුතු මන්ත්‍රීවරයා හැටියටයි. තමුන්නාන්සේ මන්ත්‍රීවරයා බව ඒ නිලධාරීන්ට සංඥාවක් මගින් හෝ දැන්නුව නම් සිරිතක් වශයෙන් පළාත නියෝජනය කරන තමුන්නාන්සේට සාමාන්‍ය කෙනෙකුට වඩා හොඳින් සලකන බව තමුන්නාන්සේ පිළිගන්න ඕනෑ. අපි රහත් වෙලා නැහැ; පෘථග්ජන මිනිස්සු. එවැනි අවබෝධයක් ඒ නිලධාරීන්ට දුන්න නම් තමුන්නාන්සේගේ හිත රිදෙන විධියේ සිද්ධියක් ඇති වන්නෙ නැහැ. ඒ සම්බන්ධයෙන් මා එතුමාට මතක් කරන්නෙ එපමණයි.

ගරු සභාපතිතුමනි, අපේ ඇමතිතුමා සම්බන්ධයෙන් එක්තරා හොඳ දෙයක් මේ විවාදයේදී පෙනී ගියා. මේ වන තුරු කථා කළ මන්ත්‍රීතුමන්ලාගෙන් හුඟක් දුරට තරමක ප්‍රශංසා ගරු ඇමතිතුමාට ලැබී ගෙන ගියා. පසුගිය වාරයේත්, ඊට කලින් වාරයේත් මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු සාකච්ඡාවට භාජන වෙද්දී සම්පූර්ණයෙන්ම අපේ ඇමතිතුමාට දෙහි කැපීමක් තමයි, සිදු වුණේ. අද තත්ත්වය බැලුවාම සාමාන්‍යයෙන් බොහෝ මන්ත්‍රීවරුන් එතුමාට ලොකු ප්‍රශංසාවක් නොකළත්, වැඩි වරදක් පෙන්වා පහර දෙන්ට උත්සාහ කළේ නැහැ. "තමුන්නාන්සේ අපේ ආණ්ඩුවේ ඉඳගෙන අවුරුදු ගණනාවක් කිසිවක් කළේ නැහැ; තමුන්නාන්සේ ඔය ආණ්ඩුවටත් කරන්නෙ ඒ ටිකයි" ආදි වශයෙන් එදා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් එතුමාට පහර දුන් බව මට මතකයි. අද ඒ කථා හුඟක් දුරට අඩු වී තිබෙනව. එය ඉතා ප්‍රශංසනීය දෙයක් හැටියටයි, මට හැඟෙන්නෙ. ඊට හේතුව කුමක්ද? එතුමා ජාතික රජයේ ඇමතිවරයකු වූවායින් පසු, ඊට ප්‍රථම එතුමාගේ යම් යම් අඩුපාඩුකම් තිබුණා නම් ඒ අඩුපාඩුකම් සියල්ල නැති වී තිබෙන බව දැන් තමුන්නාන්සේලාට අවබෝධ වී තිබෙන බව මට පෙනී යනවා. පසුගිය කාලයේ යම් අන්දමක දුර්වලතාවන් තිබුණා නම් අද එතුමා ඒවා මග හැරගෙන මෙම වැඩ කටයුතු ඉතා ලස්සන පිළිවෙළට පවත්වා ගෙන යන බවයි පෙනෙන්නේ.

මාතර කුඹුරු යාය පිළිබඳව මාතර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමාත් (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) ඒ පිළිබඳව කීප විටක්ම ප්‍රකාශ කළා. අප කුඩා කාලයේ සිටම දැක පුරුදු මාතර කුඹුරු යාය දියුණු කරන්නට අපහසු වී තිබුණේ වාරිමාර්ග ක්‍රමවල පවතින පැටලිලි ස්වභාව නිසයි. එය කවුරුන් විසිනුත් පිළිගන්නවා. එහෙත් අද දවසේ ඒ සම්බන්ධයෙන් නව වැඩ පිළිවෙළක් ගෙන යන බව දැන ගන්නට ලැබුණා. අපේ අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් ඔය කිරල යායවල් සම්පූර්ණයෙන්ම විනාශ කර දමා ඒ කුඹුරු යාය නියම කුඹුරු බිමක් කර ගැනීමට එම සැලැස්මට අනුව හැකි වේවායි අප ප්‍රාර්ථනය කරනවා.

ඉඩම් වතුරට යට වීම පිළිබඳව මාතර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. වතුරින් යට වන ඉඩම්වල වෙසෙන උදවියට ඒ ඉඩම් වෙනුවට දීම සඳහා ඇමතිතුමා ඉඩම් වගයක් ගැනීමට යෝජනා කර තිබෙන බවත් යම් යම් දේශපාලන බලපෑම් නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙතුවක් කලක් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවුණු බවත් ප්‍රකාශ වුණා. එවැනි දෙයක් තිබෙනවා නම් ඒ ගැන නොසලකා වහාම එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන ලෙසත්, ඕනෑම බලසම්පන්න කෙනෙකු සතු ඉඩමක් ඒ සඳහා ලබා ගන්නා හැටිය ටත්, ගරු ඇමතිතුමාට මා කියා සිටියා. මෙවැනි රටකට හිතකර වැඩ පිළිවෙළක් ගෙන යාමට අපට දේශපාලන බලපෑම් වුවමනා නැහැ.

මා මෙතෙක් වේලා කතා කළේ අතිරේක දේවලුයි. මගේ පළාතේ කෘෂිකර්ම කට යුතු සහ වාරිමාර්ග කටයුතු පිළිබඳව වචන යක් දෙකක් කතා කරන්නට ඕනෑ. මගේ ආසනය, හම්බන්තොට දිස්ත්‍රික්කයට අයිති ආසන තුනෙන් එකක්. මගේ ආසන යත් මුල්කිරිගල ආසනයත් හැමදාම වාගේ වාරිමාර්ග අතින් ඉතා දුර්වල තත්ත්වය කයි තියෙන්නේ. තිස්සමහාරාමයේ අමුතු අන්දමක වාරිමාර්ග ව්‍යාපාරයක් ක්‍රියාත් මක වී අවුරුදු ගණනාවක් ගත වී තිබෙනවා. එම නිසා එහි වාරිමාර්ග අතින් කරදර වන්නට වුවමනා නැහැ.

බෙලිඅත්ත කොට්ඨාශයටත් මුල්කිරිගල කොට්ඨාශයටත් වාරිමාර්ග ක්‍රම දෙකක් තිබුණා. කිරම ඇල ක්‍රමය සහ ඌරුබොකු ඇල ක්‍රමයයි, ඒ. කිරම ඇලේ යම් තරමක් අමුණු තිබුණා නම් ඒවායින් සියයට 95 ක්ම වාගේ පස් බැම් හැටියටයි හඳුන් වන්නට පුළුවන් වන්නේ. වාරිමාර්ග ක්‍රම අතින් දියුණු ප්‍රදේශවල ජීවත් වන මන්ත්‍රී වරුන් සමහරවිට පස් බැම් ගැන පුදුම වන්නට පුළුවනි. යම්කිසි කුඹුරක් වැඩ කරන්න පටන් ගත්තාම ඊට පස් බැම්මක් බඳිනවා. අවට තියෙන වැඩකට නැති පොල් ගස් ටිකක් යොදා පස් බැම්මක් සකස් කරගෙනත් ඒ කුඹුර වගා කරනවා. එදාම රාත්‍රියේ නිදාගන්නට ගිය අතරේ ඒක කඩාගෙන ගියාම අර කුඹුරත් ඉවරයි ; වාරි මාර්ගයත් ඉවරයි. ඒ අන්දමට කුඩම්මාගේ සැලකිල්ලක් තමයි, එම ගොවි ජනතාවට ලැබුණේ. එහි වාරිමාර්ග කටයුතු පිළිබඳව යමක් කරන්නට ගිය අවුරුද්දේ පටන් ගත්තා. දැනටමත් බැම් පහක තරම වැඩ පටන් ගෙන තිබෙන බව මම ආඩම්බර යෙන් කියනවා. මා විශ්වාස කරනවා, තව අවුරුද්දක් තරම ගත වන විට එහි වාරි මාර්ග ක්‍රම අංගසම්පූර්ණ වෙන්නට පුළුව නැයි කියා.

කිරම ඇලේ ජල කර්මාන්තයක් ඌරු බොකු ඇලේ ජල කර්මාන්තයත් යන ජල කර්මාන්ත දෙකට අදාල වන විදියේ අළුත් සැලැස්මක් පිළිබඳව අවුරුදු 10ක 12ක වේලේ පටන් ප්ලෑන් සාදා තිබෙනවා. එහි වැඩ පටන් ගන්නට ඕනෑය කිය කියා තිබුණා. ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ගිය අවුරුද්දේ අයවැය ලේඛන යට මුරුතවෙල ජල ව්‍යාපාරය ඇතුළත් කර තිබීම ගැන. ඇඹිලිපිටියේ බැම්ම අව සාන වුණායින් පසු එහි යොදවා තිබෙන යන්ත්‍ර යනාදිය ගෙනැවිත් එම ජල කර් මාන්තයේ වැඩ පටන් ගන්නවායැයි අසන්නට ලැබී තිබෙනවා. අවුරුදු දෙක තුනක් තුළදී, තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙ මුලාදෑනින් උනන්දු කර මේ බැම්ම සම්පූර්ණ කර දෙන්න පුළුවන් නම් උතුරු සහ දකුණු ගිරුවා පත්තුවේ වාරිමාර්ග කටයුතු සම්බන්ධයෙන්, ගොවි තැන සම්බන්ධයෙන්, රජයට හෝ වාරි මාර්ග අමාත්‍යාංශයට ඉදිරියට වැඩි විය දමක් කරන්න වුවමනා වෙන්නෙ නැති බව තමුන්නාන්සේට කියන්න කැමතියි. ඒ අතරම මතක් කරන්න සතුටුයි, අපේ දිස්ත්‍රික්කය භාර ඇතැම් මුලාදෑනින් සිටිනවා, මුලාදෑනින්ගෙන් සියයට 95 ක් 97 ක් පමණ නොකඩවා දවසකට පැය 18 ක් වැඩ කරන. අප දිස්ත්‍රික්කය නියෝජනය කරන දිසාපතිතුමා ඇතුළු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, මෙය උසස් ව්‍යාපාර යක්ය යන අවංක හැඟීමෙන් යුක්තව —ලැබෙන පඩියට නොව, ජාතික සේවයක් හැටියට සලකා—වැඩ කරන බව විශේෂ යෙන්ම මේ අවස්ථාවේදී ආඩම්බරයෙන් සඳහන් කරනවා. මෙවැනි මුලාදෑණින් සිටින නිසා අපේ ව්‍යාපාර සාර්ථක වනවා පමණක් නොවෙයි, අපේ රට වැඩි කල් යන්ට මත්තෙන් ස්වයංපෝෂිත වනවා ටත් කිසිම අනුමානයක් නැහැ.

අ. භා. 8.15

අකුරුස්සෙ ගරු මන්ත්‍රීවරයා ඉඩම් බෙදා දීම ගැන සඳහන් කළා. ගරු නියෝජ්‍ය සභා පතිතුමනි, 1964 අවුරුද්දේදී ගෝනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

දෙනිය ප්‍රදේශයේ අක්කර පන්සිය හතලිස් ගණනක් පමණ වන ඉඩමක් කැබලි කර මුල්ගිරිගල, බෙලිඅත්ත ආදී ප්‍රදේශවල දුප්පත් මහජනතාවට බෙදා දීම පිණිස ඉඩම් කච්චේරියක් පැවැත්තුවා. ඒ ඉඩම්වල පදිංචි කිරීමට අදහස් කරන අයවලුන් පවා ඒ අවස්ථාවේදී තෝරා ගත්තා. අදත් ඒ ඉඩම ඒ ආකාරයෙන්ම තිබෙනවා. එදා තෝරා ගත් පුද්ගලයන්ගෙන් ඇතැම් දෙනෙක් මිය ගිහින්, ඒ අයගෙ දූදරුවන්ටවත් එම ඉඩම්වල පදිංචියට යාම ගැන බලාපොරොත්තුවක් තබන්න පුළුවන්ද කියා මා දන්නෙ නැහැ. කෙසේ වුණත් ජාතික ආණ්ඩුව පිහිටුවන තුරු ඉඩම් බෙදා දී පුද්ගලයන් පදිංචි කරවීමට කිසිම උනන්දුවක් ගෙන නැහැ. එමනිසා, හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධතා සභාවේදී මේ කාරණය ගැන මා පෙන්වා දුන් විට ඉඩම් කැබලි කර දීමට මිනින්දෝරුවන් නොමැතිකම නිසා ප්‍රමාද වී ඇති බවක් මුලින් දැනගන්න ලැබුණා. බොහොම වෙහෙස වී සර්වෙයර්-ජනරාල් මහතාට දන්වා වුවමනා කරන මිනින්දෝරුවන් පත් කරගෙන ඉඩම් කැබලි කර දීමට යන විට, මෙම ඉඩම් සියල්ලම ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට යටත් වන නිසා බෙදා දෙන්න පුළුවන්කමක් නැතැයි දන්වා එවා තිබෙනවා. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට මේ ඉඩම් කොයි ලෙසටත් ඇතුළත් වන්න බැරි බව කීවාම, තවදුරටත් ඒ ගැන පරීක්ෂා කර බලා, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට නොවෙයි, බලාපොරොත්තු වන මුරුතවල ව්‍යාපාරයට යට වන නිසා දෙන්න බැරිය කියා අපට නැවතත් දන්වා තිබෙනවා.

මුරුතවෙල ව්‍යාපාරයට ඒ ප්‍රදේශ යට වනවාද නැද්ද කියා මට කියන්න බැහැ. මුරුතවල ව්‍යාපාරයට යට වුණත් මෙම ඉඩම් ගොඩ ඉඩම් හැටියටම තිබෙනවා මිස කුඹුරු ගොවිතැන් කරන්න ලැබෙන්නෙ නැහැ. එමනිසා, අවුරුදු ගණනාවක් තිස්සෙ මෙම ඉඩම්වල පදිංචි වීමේ බලාපොරොත්තුවෙන් සිටි උදවියට අක්කර පහ බැගින් දෙන්න බැරි නම් ඊට අඩු ප්‍රමාණයක්වත් දී ඒ ප්‍රදේශයේ පදිංචි කරවීමට කටයුතු යොදන ලෙසෙ ඉල්ලා සිටින අතර මුරුතවල ව්‍යාපාරය පටන් ගන්න වුණත් තවත් අවුරුදු තුන-හතරක් ගත වන නිසා, කිසිම වගාවක් නොකර මෙම වගා කළ හැකි ඉඩම් තබා ගැනීම මහ පවක් බවත් තමුන්නාන්සේට මතක් කර දෙන්න කැමතියි. එමනිසා සඳහන් කරන ලද මේ කාරණා ගැන කල්පනා කර බලා, තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවල නිලධාරීන් උනන්දු කර මේ කටයුතු කර දෙන්න පුළුවන් නම්, වෙන දෙයක් නැතත් ප්‍රදේශයේ දුප්පත් ජනතාවගේ පිං තමුන්නාන්සේට ලැබෙනවාට කිසිම අනුමානයක් නැහැ. ඒ හැර නොයෙකුත් ආහාර වර්ග වගා කළ හැකි පොළොව, නොයෙකුත් බලාපොරොත්තු පිට වගා නොකර නිදැල්ලෙ තිබෙන්න ඉඩ හැරියොත් එයින් රටට ලැබෙන්නෙ අවාසියක්. ඒ නිසයි, මා තමුන්නාන්සේට ඒ සම්බන්ධයෙන් කියන්නේ.

ඒ වාගේම තවත් එක ව්‍යාපාරයක් තිබෙනවා, තංගලුවෙල ව්‍යාපාරය කියා. ඒ සැලැස්ම අවුරුදු 12 ක්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තිබුණා. ගිය අවුරුද්දේ ඇස්තමේන්තුවලට ඒ ව්‍යාපාරය ඇතුළත් කර නොතිබුණේ, මුදල් අමාත්‍යාංශයේ බල පෑමක් නිසායැයි මා හිතනවා. ගිය අවුරුද්දේ ඇස්තමේන්තුවලට ඇතුළත් නොවුණත් මගේ පින්සෙන්ඩු වීම නිසා කැබිනට් මණ්ඩලයෙන් අතිරේක මුදලක් අනුමත වී දැන් ඒ වැඩ කරගෙන යන බව පෙනෙන්නට තිබෙනවා. තංගලුවෙල ව්‍යාපාරය අවුරුද්දකින් නැත්නම් දෙකකින් නිම කරන්නට ඉඩම් ඇමතිතුමාට පුළුවන් වුණොත්, එතුමා අවුරුදු 10 ක් 15 ක් ඉඩම් ඇමති හැටියට සිටීමේ ප්‍රයෝජනය අපේ දිස්ත්‍රික්කයට ලැබුණා වෙනවාට කිසිම අඩමානයක් නැහැ. ඒ කටයුතු ඉතා ඉක්මනින් නිම කර දෙන හැටියට ගරු ඇමතිතුමාගෙනුත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන නිලධාරීන්ගෙනුත් ඉල්ලා සිටිනවා. කේන්ති ගියාම ටිකක් වේගවත් ස්වරූපයෙන් කථා කරන සිරිතක් තිබෙනවා. එම නිසා අර ගරු මන්ත්‍රීතුමාගේ කථාව නිසා යම්කිසි චිත්ත පීඩාවක් වුණා නම් අනුකම්පා කර, ඒ ගැන එතරම් දුරට කල්පනා නොකරන හැටියට ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

මට අනුකම්පා කරන්නට ඕනෑ නැහැ.

අතපත්තු මයා.

(திரு. அத்தபத்து)

(Mr. Atapattu)

නෑ, නෑ. ඔහේට අනුකම්පා කරන්නේ නැහැ. අනුකම්පා කරන්න කීවේ මටයි. ඔහේ වෙනුවෙන් එපමණ දුරට මා කථා කරන්නේ නැහැ.

හාල් සේරුවක් කැපූ අවස්ථාවේ සිට මේ අයවැය විවාදය දක්වාත් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කීවේ, "හාල් හිඟයක් නෑ, සේරුවක් කැපුවේ බොරු වටයි" කියායි. එහෙත් මට පුදුම හිතුණා අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) "ආහාර අතින් ඉතාමත් අමාරු, ඉතා උග්‍ර තත්ත්වයකට රට මුහුණ පා තිබෙන අවස්ථාවකදී මේ විධියට වැඩ කරනවා නම් කොහොමද—"

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

"හාල් සේරුවක් කපා දැමීම නිසා මහ ජනයා අමාරුවේ වැටී සිටින මෙවැනි අවස්ථාවක" කියායි, එතුමා කීවේ.

අතපත්තු මයා.

(திரு. அத்தபத்து)

(Mr. Atapattu)

තමුන්නාන්සේ ඕනෑ එකක් අනික් පැත්තට පෙරළයි. එතුමාගේ කථාව හෙට "හැන්සාඩ්" වාර්තාව ලැබුණාම අරගෙන බලන්න. එතුමා කීවේ, "මෙවැනි අමාරු තත්ත්වයක් රටේ තිබෙන විට වැඩ කරන්නේ මේ විධියට නම්, කොහොමද මේ අමාරු තත්ත්වය පිරිමහන්නේ" කියායි. තමුන්නාන්සේ එතුමාගේ කථාවට කන් නොදෙන්න ඇති. සමහර විට තමුන්නාන්සේ ඒ කථාවට එකඟ නැතුවා වෙන්නට ඇති. ගිය සතිය නැත්නම් ඊට කලින් සතිය දක්වාම තමුන්නාන්සේලා කීවේ, "ලෝකයේ කොයිම රටකවත් ආහාර හිඟයක් නැත, සල්ලි නැති නිසා යෙදූ උපක්‍රමයක් මේ හාල් සේරුව කැපීම" කියායි.

ඉලංගරත්න මයා.

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

ආහාර හිඟයක් ලෝකයේ නැහැ; ලංකාවේ තිබෙනවා.

අතපත්තු මයා.

(திரு. அத்தபத்து)

(Mr. Atapattu)

තමුන්නාන්සේලා ඔය බණේ ඕනෑම තැනකට ගිහින් කියයි. තමුන්නාන්සේලා මොන දේ කීවත්, හාල් හිඟයක් තිබෙන බව හිතට එකඟව පිළිගන්නවා.

ඉලංගරත්න මයා.

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

පරිප්පු, සුදු ලූනු, කරවල.

අතපත්තු මයා.

(திரு. அத்தபத்து)

(Mr. Atapattu)

දැන් පරිප්පු, සුදු ලූනු, කරවල ගැන මහ ලොකුවට කෑ ගහනවා. තමුන්නාන්සේලාගේ කාලයේ ඔය අමාරුකම් තිබුණේ නැද්ද? ටයර් එකක් බැටරි කෑල්ලක් ගන්න බැරිව තිබුණු කාලය දැන් මතක නැද්ද? මේ රටේ මිනිසුන්ට මතක නැති වන සිරිතක් තිබෙනවා. එදා අප වින්ද දුක් අප දන්නවා. පරිප්පු නැති වුණාට එක් කෙනකුවත් මැරුණේ නැහැ. එක්දහස් නමසිය හතළිස් ගණන්වල අප මොන තරම් දුර්භික්ෂයකට මුහුණ පෑවාද? සමහර විට තමුන්නාන්සේලා වෙන දේවල් කරන කාලයේ අප මහජනයා වෙනුවෙන් වැඩ කළා.

ඉලංගරත්න මයා.

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

අපේ කාලයේ ඇපල්, මුද්දප්පලම් තිබුණේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)

තමුන්නාන්සේලා මේක සමච්චලයකට අරගෙන. කන්න වුවමනා නම් ඇපල්, මුද්‍රප්පලම් තිබෙනවා. ඇපල් මුද්‍රප්පලම් නැතැයි කියා අප තමුන්නාන්සේලාට දොස් කීවාද? ආහාර කථාව වැඩිපුර කියන්නට එපා. නගරයට—කොළඹට—නම් ඒ කථාව හොඳයි. හැබැයි, පිටිසරට නම් ඒ කථාව කියන්නට එපා. කොත්තමල්ලි නැති බව හැමෝම කියනවා. කොත්තමල්ලි නැතැයි මාතර ගරු මන්ත්‍රීතුමාත් (තුඩාවේ මයා.) කියනවා මට ඇහුණා. මාතර ප්‍රදේශයේ නම් සමහර විට කොත්තමල්ලි නැතිව ඇති. කොත්තමල්ලි, දුරු, මිරිස්, උම්බලකඩ අපේ පිටිසර ඕනෑම සමුපකාර කඩයක තිබෙනවා, විකුණා ගන්නට බැරි තත්වයක.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

"නෙස්ප්‍රේ"?

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)

"නෙස්ප්‍රේ" පවා අපේ පිටිසර පළාත්වල තිබෙනවා. ගිය වර කොළඹ එන අවස්ථාවේදී, අපේ සමුපකාර කඩයෙන් "නෙස්ප්‍රේ" ටින් එකක් ගෙනාවා. ඒ අය කීවා, "මේවා විකුණා ගන්නටත් බැහැ" කියා.

හේමචන්ද්‍ර සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)
(திரு. ஹேமச்சந்திர சிறிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)
(Mr. Hemachandra Sirisena—First Akurana)

අවුරුදු කීයක් හාල් සේරුව නොමිළයේ දෙන්නට තමුන්නාන්සේලා පොරොන්දු වෙනවාද?

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)

මා හාල් සේරුව කැපුවෙත් නැහැ. මට දෙනවාය කියා පොරොන්දු වෙන්නටත් බැහැ. හොඳයි, තමුන්නාන්සේලාට කොපමණ කාලයක් ඕනෑද? අපේ පාර්ලිමේන්තු කාලය ඉවර වන තුරු දෙනවා.

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிறிசேன)
(Mr. Hemachandra Sirisena)

අපට හාල් සේරු දෙකම නොමිළයේ ඕනෑ.

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)

තමුන්නාන්සේලා සරමයි බැනියමත් නොමිළයේ ඉල්ලයි. මහජනයා බීඩිත් නොමිළයේම ඉල්ලාවි. එතකොට ඒවාත් නොමිළයේම දෙනවා දැයි මා අකුරණ පළමුවන ගරු මන්ත්‍රීතුමාගෙන් අහනවා. බීඩිත් නිකම් ඉල්ලාවි. සිගරට් සුරුට්ටුත් නිකම් ඉල්ලාවි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

"අලිඩොං"? ඒවත් නිකම් ඉල්ලාවි.

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிறிசேன)
(Mr. Hemachandra Sirisena)

"අලිඩොං" නිසා තමයි, අලින්ගෙන් අස් වැන්න පාළු නොවන්නේ.

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)

මට තව සුළු වේලාවක් කථා කරන්නට තිබෙනවා. මා කථා කරගෙන ගියේ ආහාර වගාව ගැනයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

බෙලිඅත්තේ හාල් සේරුවක මිළ ශත 85ක් බව තමුන්නාන්සේ කීවා. එහෙත් මා බෙලිඅත්තේ කෙනකුගෙන් ඇසූ විට ඔහු කිවේ එහි හාල් සේරුවක් රුපියල් 1.10ක් බවයි.

අතපත්තු මයා.

(திரு. அத்தபத்து)

(Mr. Atapattu)

තමුන්නාන්සේලාට මුණ ගැහෙන්නේ වැරදි මිනිසුන් නොවැ. ඒක නොවැ ඔය කරදරේ. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ සිටින සියල්ලන්ම අරහෙන් මෙහෙන් ගත් නුසුදුස්සන් බව මාතර ගරු මන්ත්‍රීතුමා කීවා.

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

දූෂණ නැද්ද? දූෂණ තියෙන බව පිළි ගන්නේ නැද්ද?

අතපත්තු මයා.

(திரு. அத்தபத்து)

(Mr. Atapattu)

දූෂණ තිබෙනවා යයි මා නම් කියන්නේ නැහැ. යම් කෙනෙකුට චෝදනාවක් කරන්නට පෙර ඒ චෝදනාව සාධාරණ බව, සත්‍ය බව මට ඒත්තු යන්නට ඕනෑ. එක එක්කෙනා යම් යම් දේ කී පලියට මට ඒවා පිළිගන්නට වුවමනාවක් නැහැ. එවැනි දූෂණ තිබෙන බවක් මට දැනගන්නට ලැබුණොත් ඇමතිතුමාගෙන් හෝ "බෝඩ්" එකෙන් හෝ අසා බලනවා. අනෙක් අය දැන ගත්තාම වාගේ නොව මා දැනගත්තොත් නම් ටිකක් හයියෙන් ක්‍රියා කරනවා. හැබැයි දැනගන්නා තුරු මා චෝදනා කරන්නට යන්නේ නැහැ.

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

මගේ ඇසින් දැක තිබෙනවා එහි වාහන බයස්කෝප් ශාලා ළඟ.

අතපත්තු මයා.

(திரு. அத்தபத்து)

(Mr. Atapattu)

මාතර ගරු මන්ත්‍රීතුමා වාගේ මා නම් දැන් බයස්කෝප් ශාලාවලට යන්නේ නැහැ. ඒ නිසා මට නම් ඒවා දකින්නට ලැබී නැහැ. මා බයස්කෝප් බැලූ කාලය දැන් ඉවර වෙලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කථා කරගෙන ගියේ ආහාර වගාව් සම්බන්ධ වයි. පසුගියදා ඉන්දියාවේ කේරළයේ ජනයා විශාල පිරිසක් එහි ප්‍රධාන ඇමති වරයාගේ ගෙය වටලාගෙන "එක්කෝ අපට හාල් දියල්ලා. එහෙම නැත්නම් අපට වෙඩි තබා දමපල්ලා" යනුවෙන් කෑගැසූ බව කේරළයේ පුවත්පතක පළ වුණා. අද ඉන්දියාවේ තිබෙන්නේ ඒ වගේ අමාරු තත්ත්වයක්.

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

ඉන්දියාවේ ජනගහණය කීයද?

අතපත්තු මයා.

(திரு. அத்தபத்து)

(Mr. Atapattu)

ඉන්දියාවේ ජනගහණය වැඩි නිසා තමයි, ඉන්දියාවට ඔය තරම් හාල් වුවමනා වී තිබෙන්නේ. හොඳයි, අපේ ජනගහණය ඊට හුඟක් අඩු වුණත් අපටත් තවම පිටරටින් හාල් ගෙන්වා ගන්නේ නැතිව බැහැ නේද? පසුගිය සතියේ හෝ ඊට එහා සතියේ අපේ ආණ්ඩුව හාල් ටොන් දහදාහක් ඉන්දියාවට පරිත්‍යාග කළා. අප අමාරුවේන් සිටියදීත් අපට වඩා අමාරුවෙන් සිටින ඉන්දියාවට කරන ලද ඒ පරිත්‍යාගයෙන් අපේ බෞද්ධකම හොඳ හැටි පෙනී යනවා නේද? ඒ පරිත්‍යාගය කරන්නට පුළුවන් වීම ගැන අප සතුටුයි. නිකම් බොරුවට කෑ ගසන්නට වුවමනා නැති බව මා මාතර ගරු මන්ත්‍රීතුමාට මතක් කරන අතර ඔය බොරු ව්‍යාපාර ගැන යම් දවසක මහජනයාට දැන ගන්නට ලැබෙනු ඇති බවද මතක් කරන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉලංගරත්න මයා.
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

"ඇත්ත" පත්තරේ කියවන්නෙ නැද්ද ?

අතපත්තු මයා.
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

"ඇත්ත" පත්තරේ තියෙන පච කිය වන්නේ මොකටද ?

**එකල්හි වේලාව අ. භා. 8.30 වූයෙන්, මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.**

**කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි ; නැවත රැස් වීම 1967 අගෝස්තු 29 වන අඟහරුවාදා.**

*நேரம் பி. ப. 8.30 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி சபைக்கு அறிவிக்கும் பொருட்டு உப அக்கிராசனர், அக்கிராசனத்திலிருந்து நீங்கினார்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது ; மீண்டும் கூடுவது : செவ்வாய்க்கிழமை, 29 ஓகஸ்ட் 1967.*

*It being 8.30 p.m., the Deputy Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Tuesday, 29th August 1967.*

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**එකල්හි වේලාව අ. භා. 8.30 පසුකර තුබූයෙන් කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 8.31 ට, 1967 අගෝස්තු 24 වන දින සභාසම්මතිය අනුව, 1967 අගෝස්තු 29 වන අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.**

*அப்போது பி. ப. 8.30 மணி பிந்திவிடவே குழுக்களின் உப அக்கிராசனர் வினா விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்.*

*அதன்படி, சபை பி.ப. 8.31 மணிக்கு, சபை அதனது 1967 ஓகஸ்ட் 24 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க, 1967, ஓகஸ்ட் 29 ஆம் தேதி செவ்வாய்க்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.*

*And it being past 8.30 p.m.,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned the House without Question put.*

*Adjourned accordingly at 8.31* P.M. *until 9.30* A.M. *on Tuesday, 29th August 1967, pursuant to the Resolution of the House of 24th August 1967.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

## WRITTEN ANSWER TO QUESTION

### කුරුවිට කෝරළේ ජනතා කොමිටියේ සාමාජික ශෛල්‍ය වෛද්‍යවරයාගේ ප්‍රකාශය

### குறுவிட்ட கோறளை மக்கள் குழுவைச் சேர்ந்த வைத்திய அதிகாரியினது கூற்று

### STATEMENT OF MEDICAL OFFICER, PEOPLE'S COMMITTEE, KURUWITI KORALE

**44/67**

**පී. බී. විජයසුන්දර මයා.** (කිරිඇල්ල)

(திரு. பீ. பி. விஜயசுந்தர—கிரியல்ல)

(Mr. P. B. Wijesundara—Kiriella)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රත්නපුර කුරුවිටි කෝරළේ ජනතා කොමිටියේ සාමාජිකයකු වන රජයේ ශෛල්‍ය වෛද්‍යවරයකු කොත්තමල්ලි සහ සුදුලූනු ලක්වැසි ජනතාවට එතරම් අවශ්‍ය නැතැයි පැවසූ බව එතුමා දන්නවාද? (ආ) මේ සම්බන්ධව රත්නපුර රෝහල් අධිකාරි තැන විසින් කරුණු විමසූ විට එය අසත්‍ය චෝදනාවක් බවත්, එම චෝදනාව කරන ලද්දේ "අනාගත දේශපාලන පරාජයක් ලබන තැනැත්තෙකුය" යි එකී ශෛල්‍ය වෛද්‍යවරයා ලිපියකින් පිළිතුරු දී ඇති බවත් එතුමා දන්නවාද? (ඉ) අසත්‍ය චෝදනාවක් තමාට කෙනෙක් කළා නම්, දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක පවා පළවූ මෙම ප්‍රවෘත්තිය උඩ එකී පුවත පළ කළ පත්‍රයට සහ චෝදනාව ඉදිරිපත් කළ පුද්ගලයාට විරුද්ධව නඩු මගට බැසීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන් අවසරය නොපතා චෝදනාව ඉදිරිපත් කළ අයට දේශපාලන වශයෙන් ලියවිලි මගින් චෝදනා කිරීමට එකී වෛද්‍ය නිලධාරියාට බලයක් තිබේද? (ඊ) ඉහතකී කරුණු සත්‍ය නම් එකී වෛද්‍ය නිලධාරියාගේ ප්‍රකාශය ගැන ජනතා කොමිටියේ සාමාජිකයින්ගෙනුත් සාක්ෂි විභාග කර ඔහුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට එතුමා සෞඛ්‍ය සේවා අධිකාරිවරයාට නියෝග කරනවාද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) இரத்தினபுரி, குறுவிட்ட கோறளை மக்கள் குழுவின் உறுப்பினராகிய அரசாங்க அறுவை வைத்தியரொருவர், கொத்தமல்லியும் உள்ளியும் இலங்கை மக்களுக்கு அவ்வளவு இன்றியமையாதவை அல்லவென்று தெரிவித்ததை அவர் அறிவாரா? (ஆ) இவ்விடயம் சம்பந்தமாக இரத்தினபுரி வைத்திய நிலைய மேலதிகாரி அவர்கள் காரணம் கேட்டபோது, அது பொய்யான குற்றச்சாட்டென்றும், அந்தக் குற்றச்சாட்டை சுமத்தியவர் எதிர்கால அரசியல் தோல்வியடையும் ஒருவர் என்றும் அந்த அறுவை வைத்தியர் கடிதமூலம் பதிலளித்திருப்பதையும் அவர் அறிவாரா? (இ) பொய்யான குற்றச்சாட்டொன்றை எவராவது ஒருவர், தம்மீது சுமத்தினுல், தினசரிப் பத்திரிகைகளில்கூட வெளிவந்த இச்செய்திக்காக அச்செய்தியை வெளியிட்ட பத்திரிகைகளுக்கும் குற்றம் சாட்டியவருக்கும் எதிராக வழக்குத் தொடரச் சுகாதார சேவை அதிபரின் அனுமதியைக் கோராமல், குற்றம் சாட்டியவருக்கும் எதிராக வழக்குத் தொடரச் சுகாதார சேவை அதிபரின் அனுமதியைக் கோராமல், குற்றம் சாட்டியவருக்கு அரசியல் ரீதியில் கடிதமூலம் குற்றம் சுமத்த அவ் வைத்தியருக்கு அதிகாரமுண்டா? (ஈ) மேலே கூறப்பட்டு உள்ளவை சரியானுல், அவ்வைத்தியர் வெளியிட்ட கருத்து சம்பந்தமாக மக்கள் குழு உறுப்பினர்களிடமும் சாட்சியம் பெற்று, விசாரித்தறிந்து அவருக்கு எதிராக ஒழுங்கு நடவடிக்கை எடுக்குமாறு சுகாதார சேவை அதிபர் அவர்களுக்கு அவர் உத்தரவிடுவாரா?*

asked the Minister of Health: (*a*) Is he aware that a government surgeon who is a member of the People's Committee of Kuruwiti Korale, Ratnapura, has stated that coriander and garlic are not particularly essential for the people of Ceylon? (*b*) Is he aware that when the Superintendent of the Ratnapura Hospital made inquiries in this connection, the surgeon replied by letter that it was a false charge and that the charge had been made by "a person who will suffer a political defeat in the future"? (*c*) If some person has made a false charge against him, does this medical officer have the right to make accusations of a political nature in writing against the person who made the charge instead of seeking permis-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයසුන්දර මයා.]

sion from the Director of Health Services to sue the newspaper which published the news report and the person who made the charge, on the basis of the report published in a daily newspaper? (*d*) If the above facts are correct, will he instruct the Director of Health Services to obtain the evidence of the members of the People's Committee too regarding the statement of the medical officer and to take disciplinary action against him?



ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (සෞඛ්‍ය ඇමති)

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—சுகாதார அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Health)

(අ) නැත. (ආ) නැත. (ඉ) පැන නොනඟී. (ඊ) පැන නොනඟී.

*(அ) இல்லை. (ஆ) இல்லை. (இ) இந்த வினா எழவில்லை. (ஈ) இந்த வினா எழவில்லை.*

(*a*) No. (*b*) No. (*c*) Does not arise. (*d*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org